ශ්‍රී ලංකා ඉඩම් සංවර්ධනය කිරීමේ සංස්ථාව

# 2023 වර්ෂය සඳහා
# වාර්ෂික වාර්තාව සහ ගිණුම්

නාගරික සංවර්ධන සහ නිවාස අමාත්‍යාංශය

## අපගේ දැක්ම

ජාතික සංවර්ධන ප්‍රතිපත්තිවලට සමගාමීව පරිසර හිතකාමී සහ තිරසාර පරිසරයක් නිර්මාණය කිරීම සහ කළමනාකරණය කිරීම.

## අපගේ මෙහෙවර

ඉහළ නිපුණතාවක් සහිත අභිප්‍රේරිත ශ්‍රම බලකායක් මඟින් ජනතාවගේ ජීවන තත්ත්වය නංවාලීම සඳහා වැසි ජල අපවහනය, තෙත්බිම් කළමනාකරණය සහ යටිතල පහසුකම් සංවර්ධනය පිළිබඳ ඉංජිනේරු සේවා සැපයීම.

# පටුන


| | පිටු අංකය |
|---|---|
| සභාපතිතුමාගේ පණිවුඩය | 01 |
| සාමාන්‍යාධිකාරිතුමියගේ පණිවුඩය | 02 |
| ආයතනික තොරතුරු | 04 |
| අධ්‍යක්ෂ මණ්ඩලය | 05 |
| ජ්‍යෙෂ්ඨ කළමනාකරණ කණ්ඩායම | 06 |
| මෙහෙයුම් සමාලෝචනය | 07-57 |
| විගණන කළමනාකරණ කමිටු වාර්තාව | 58 |
| මූල්‍ය සමාලෝචනය | 59 |
| අධ්‍යක්ෂ මණ්ඩල වාර්තාව | 60 |
| විගණකාධිපතිවරයාගේ වාර්තාව | 61-91 |
| විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය | 92 |
| මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය | 93 |
| හිමිකම වෙනස්වීම පිළිබඳ ප්‍රකාශනය | 94 |
| මූල්‍ය ප්‍රවාහ ප්‍රකාශනය | 95 |
| වැදගත් ගිණුම් ප්‍රතිපත්ති | 96-100 |
| මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන් | 101-111 |
| අගය එකතු කිරීමේ ප්‍රකාශනය | 112 |
| සංස්ථාවේ මූල්‍යමය විශේෂතා | 113 |

# සභාපතිවරයාගේ පණිවුඩය

ශ්‍රී ලංකා ඉඩම් සංවර්ධනය කිරීමේ සංස්ථාවේ (SLLDC) 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ මූල්‍ය වර්ෂය සඳහා වන වාර්ෂික වාර්තාව සහ විගණනය කරන ලද මූල්‍ය ගිණුම් ඉදිරිපත් කිරීමට ලැබීම මහත් සතුටකි.

2022 මාර්තු මාසයේදී ශ්‍රී ලංකා ඉඩම් සංවර්ධනය කිරීමේ සංස්ථාවේ සභාපති ලෙස වගකීම් භාර ගැනීමෙන් පසු, මෙය මාගේ වෘත්තීය ජීවිතයේ මෙතෙක් පැවති වඩාත්ම සිත් ගන්නාසුලු හා අභියෝගාත්මක කාලපරිච්ඡේදය බව අවධාරණය කිරීමට කැමැත්තෙමි.

රටේ පවතින ආර්ථික අර්බුදය හමුවේ වුවද, තිරසාර සංවර්ධනය ප්‍රවර්ධනය කරන විවිධ ව්‍යාපාර කළඹක් අධීක්ෂණය කිරීම සඳහා කාර්යක්ෂම මූලපිරීම් ක්‍රියාත්මක කිරීම තුළින් SLLDC 2023 වසර සාර්ථක අවසානයක් කරා ගෙන යාමට හැකි වූ බව ප්‍රකාශ කිරීමට ලැබීම මට මහත් සතුටකි. ඍජු ව්‍යාපෘති වියදම් සැලකිය යුතු ලෙස අඩු කිරීමට හේතු වූ විවිධ පිරිවැය අඩු කිරීමේ උපාය මාර්ග ක්‍රියාත්මක කරමින් විභව ආයෝජන අවස්ථා හඳුනා ගැනීම සඳහා උත්සාහයන් දරන ලදී.

රාජ්‍ය සතු විශාල ඉංජිනේරු සංවිධානයක් ලෙස, මූල්‍ය කාර්යසාධනයට අමතරව පාරිසරික, සමාජීය හා පාලනමය සාධක සඳහා සමාන වැදගත්කමක් ලබා දෙන වඩාත් තිරසර ව්‍යාපාර ආකෘති අනුගමනය කිරීම අපගේ වගකීමක් ලෙස අප සලකමු. එබැවින්, එහි සමාජ වගකීම ඉටු කිරීමේදී, කොළඹ මහ නගර කලාපයේ ගංවතුර අවදානම අවම කිරීම සඳහා භාණ්ඩාගාර අයවැය වෙන්කිරීම්වලට එහා ගිය ගංවතුර අවම කිරීමේ මෙහෙයුම් සංස්ථාව විසින් අඛණ්ඩව සිදු කරන ලදී. තත්‍ය කාලීන කාලගුණික දත්ත ආදානයන් ජල විද්‍යාත්මක-ජලගතික ආකෘතිකරණය සමඟ ඒකාබද්ධ කරන තත්‍ය කාලීන ගංවතුර නිරීක්ෂණ හා අනතුරු ඇඟවීමේ පද්ධතියක් වන ඒකාබද්ධ ගංවතුර කළමනාකරණ පද්ධතිය (IFMS) සාර්ථකව ක්‍රියාත්මක කිරීම මඟින් කොළඹ කලාපයේ ගංවතුර තත්ත්වය අවම කිරීමට හැකි විය.

ඉදිකිරීම් කර්මාන්තය සඳහා අක්වෙරළ වැලි අඛණ්ඩව සැපයීම සහතික කිරීම සඳහා, පෞද්ගලික-පොදු හවුල්කාරිත්ව ආකෘති වැනි විවිධ ආයෝජන විකල්ප අප විසින් විමර්ශනය කරන ලදී.

ව්‍යාපාරික මෙහෙයුම්වල කාර්යක්ෂමතාව උපරිම කිරීම සඳහා, ප්‍රසම්පාදන, ගිණුම්කරණ, ව්‍යාපෘති කළමනාකරණය සහ අනෙකුත් සාමාන්‍ය ව්‍යාපාරික කටයුතු කළමනාකරණය කිරීම සඳහා ERP (ව්‍යවසාය සම්පත් සැලසුම්කරණය) මෘදුකාංග භාවිතය SLLDC විසින් පුළුල් කරන ලදී.

මෙම කාලසීමාව සාර්ථකව නිම කිරීමට ඔවුන්ගේ අගනා මඟපෙන්වීම හා නායකත්වය සඳහා පහත සඳහන් පුද්ගලයින්ට මාගේ හෘදයාංගම කෘතඥතාව පළ කිරීමට ලැබීම සතුටකි: අතිගරු ජනාධිපතිතුමා, ගරු අගමැතිතුමා, ගරු නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යතුමා, සහ කැබිනට් අමාත්‍යාංශයේ ලේකම්තුමා. මෙම අතිශයින් අභියෝගාත්මක වසර පුරා, සංස්ථාවේ ධනාත්මක කාර්යසාධනයට දායක වූ ඔවුන්ගේ කැපවීම හා සහයෝගිතාවය සඳහා SLLDC හි ජ්‍යෙෂ්ඨ කළමනාකාරිත්වයට මාගේ හෘදයාංගම ස්තූතිය පුද කරමි. මෙම දුෂ්කර කාලපරිච්ඡේදය තුළ ඔවුන්ගේ දායකත්වය හා කැපවීම සඳහා අපගේ සේවකයින්ට මාගේ කෘතඥතාවය පළ කිරීමට කැමැත්තෙමි. අධ්‍යක්ෂ මණ්ඩලය වෙනුවෙන්, වසර පුරා SLLDC වෙත ලබා දුන් සහයෝගය සඳහා අපගේ සියලුම පාර්ශ්වකරුවන්ට මාගේ කෘතඥතාවය පළ කිරීමට කැමැත්තෙමි, ඔවුන්ගේ සහයෝගය නොමැතිව වත්මන් කාර්යසාධනය ළඟා කර ගැනීමට නොහැකි වනු ඇත. මහජනතාව ඇතුළු අපගේ සියලුම පාරිභෝගිකයින්ට මාගේ හෘදයාංගම කෘතඥතාවය පළ කරන අතර ඉදිරි මූල්‍ය වර්ෂය තුළ වඩාත් කාර්යක්ෂම අයුරින් ඔවුන්ගේ අවශ්‍යතා සපුරාලීමට බලාපොරොත්තු වෙමි. තවද, වසර පුරා ලබා දුන් අගනා නායකත්වය හා සහයෝගය සඳහා මාගේ සෙසු අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයින්ට මාගේ හෘදයාංගම ස්තූතිය පුද කිරීමට කැමැත්තෙමි.

ශ්‍රී ලංකාවේ දශක පහකට වැඩි කාලයක් තිස්සේ වගකිවයුතු සංස්ථාපිත ආයතනයක් ලෙස, තිරසර සංවර්ධනය ප්‍රවර්ධනය කරන, සහ අපගේ ආර්ථිකය යළි නගාසිටුම සඳහා ධනාත්මක දායකත්වයක් සපයන, අපගේ සියලුම ව්‍යාපාරික කටයුතු සහ කළමනාකරණ ක්‍රියාපටිපාටිවල සමාජ වගවීම, පාරිසරික ආරක්ෂකත්වය, සහ ආර්ථික ශක්‍යතාව යන මූලික වටිනාකම් ආරක්ෂා කිරීමේ අපගේ කැපවීම අප දිගටම පවත්වා ගෙන යන බව සඳහන් කරමින් මම අවසන් කරමි.

**ඉංජි. හිරාන් එස්. බාලසූරිය**
**රියර් අද්මිරාල්**
**සභාපති**
2024 ජනවාරි 15

# සාමාන්‍යාධිකාරිතුමියගේ පණිවුඩය

2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා වන ශ්‍රී ලංකා ඉඩම් සංවර්ධනය කිරීමේ සංස්ථාවේ වාර්ෂික වාර්තාව සහ විගණනය කරන ලද මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීමට ලැබීම පිළිබඳව මම සතුටු වෙමි. රටේ අභියෝගාත්මක ආර්ථික පරිසරය තුළ වුවද, මෙම වර්ෂය ධනාත්මක හා ලාභදායී ලෙස අවසන් විය.

සංස්ථාව රුපියල් මිලියන 5,431 ක ආදායමක් සහ රුපියල් මිලියන 938 ක බදු පසු ලාභයක් වාර්තා කළේය. මෙයට සේවාදායක හා ස්වයං ව්‍යාපෘති වලින් උත්පාදනය වූ ආදායම ද ඇතුළත් වේ. එනම් ඇළ මාර්ග හා වැව් හැරීම, ගොඩකිරීම් හා ඉදිකිරීම් ව්‍යාපෘති, දේශීය කර්මාන්ත සඳහා අක්වෙරළ වැලි අලෙවිය සහ කෙරවලපිටිය අපද්‍රව්‍ය උද්‍යානයේ ඝන අපද්‍රව්‍ය කළමනාකරණය යන කටයුතු වලින් ලද ආදායම් වේ.

වේරැස් ගඟ වැසි ජල අපවහන හා පරිසරය වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය යටතේ කොහුවල, පැපිලියාන, රත්තනපිටිය, දෙල්කඳ, බෙල්ලන්විල, බොරලැස්ගමුව, වේරහැර, බෝකුන්දර සහ කරදියාන යන ප්‍රදේශවල පසුගිය වසර 20 තුළ පීඩාවට පත් වූ 700,000 කට අධික ජනතාවකගේ ගංවතුර ගැටලුවලට විසඳුම් ලබාදී ඇත. එය අපගේ අභ්‍යන්තර ඉංජිනේරු විද්‍යා විශේෂඥයින් විසින් ශ්‍රී ලංකා රජයේ අරමුදල්වලින් ක්‍රියාත්මක කරන ලද සංස්ථා ඉතිහාසයට අලුතින් එකතු කරන මං සලකුණක් සනිටුහන් කරන ලද ව්‍යාපෘතියකි. මෙම ව්‍යාපෘතිය යටතේ ජනතාවගේ ජීවන තත්ත්වය නංවාලමින් දකුණු-කොළඹ තදාසන්න ප්‍රදේශවල ව්‍යුහයන් සමඟ කිලෝමීටර් 50ක පමණ ජලාපවහන ජාලයක් සම්පූර්ණ කරමින් ඇවිදින මංතීරු සහ විනෝදාත්මක ස්ථාන සහිත වැව් 10ක් සංවර්ධනය කර ඇත.

කොළොන්නාව වැසි ජල අපවහන සහ පරිසර වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතියකැලණි ගඟ ගංවතුර තැනිතලාවේ කොළොන්නාව ප්‍රදේශය තුළ හා ඒ අවට ජලාපවහන මාර්ග හරස් ව්‍යුහයන් වැඩිදියුණු කිරීමෙන් ජලාපවහන පද්ධතියේ ඇති බාධක ඉවත් කිරීම සඳහාය ප්‍රධාන වශයෙන් ක්‍රියාත්මක කරන ලදී. 2023 වසර අවසානය වන විට සිදු කරන ලද කාර්යයන්වල සමුච්චිත වටිනාකම රුපියල් මිලියන 836.76 කි. 2023 වසර තුළදී, ඇළ මාර්ග නඩත්තු කිරීමේ කාර්යයන්, දහම්වෙළ, පස්සන්න සහ සැලලිහිණි මාවත ද්විතීයික ඇළ මාර්ගයන්හි සහ ඒවාට අදාළ ජල විද්‍යාත්මක ව්‍යුහයන්හි විස්තරාත්මක ඉංජිනේරු සැලසුම් සකස් කිරීම, තුප්පාවෙළ වැව සැකසීම, මජීඩ්වත්ත සතරැස් බෝක්කුව ඉදිකිරීම, බෝපත්ත සතරැස් බෝක්කුව ඉදිකිරීම, වෙන්නවත්ත සතරැස් බෝක්කුව ඉදිකිරීම සහ ඊට අදාළ අත්පත් කර ගැනීමේ කටයුතු සාර්ථකව නිම කර ඇත.

කොළඹ පුරවර නාගරික සංවර්ධන ව්‍යාපෘතිය යටතේ, ශාන්ත සෙබස්තියන් උතුරු දියගුළු, ශාන්ත සෙබස්තියන් දකුණු දියගුළු සහ අඹතලේ යන වැසි ජල අපවහන පොම්පාගාර තුනක ඉදිකිරීම් සම්පූර්ණ කිරීමෙන් මෙන්ම නව මෝදර වැසි ජල අපවහන උමඟ සහ කොළඹ ඇළ පද්ධතිය තුළ ගංවතුර දොරටු ව්‍යුහයන් හයක් ද සමඟින් ඇළ මාර්ග ප්‍රවාහන ධාරිතාව වැඩි කිරීම සහ කොළඹ ජලාපවහන පද්ධතියේ පිටවන ධාරිතාව වැඩි දියුණු කිරීම මඟින් කොළඹ නගරයේ ගංවතුර ආරක්ෂණ මට්ටම උසස් කර ඇත. ඊට අමතරව, තත්‍ය කාලීන දත්ත සහ පුරෝකථන දත්ත සමඟ ක්‍රියා කරන ශ්‍රී ලංකාවේ නවීන ජල කළමනාකරණ මධ්‍යස්ථානයක ඒකාබද්ධ ගංවතුර කළමනාකරණ පද්ධතියක් (IFMS) ස්ථාපිත කර ඇත. ගංවතුර අවම කිරීම සඳහා ඉහත සඳහන් ගංවතුර පාලන පහසුකම් ක්‍රියාත්මක කිරීමට IFMS අවශ්‍ය උපදෙස් නිකුත් කරයි. ඉහත සංවර්ධිත පද්ධතිය හරහා කාලෝචිත ගංවතුර අවම කිරීමේ මෙහෙයුම් සමඟින්, SLLDC හට කොළඹ නගරයේ ගංවතුර හානිය විශාල ලෙස අඩු කර ගත හැකි විය.

ශ්‍රී ලංකා ඉඩම් සංවර්ධනය කිරීමේ සංස්ථාව වත්තල සහ කැළණිය ප්‍රදේශවල ගංවතුර අවම කිරීමේ අරමුණින් ඔලියමුල්ල වැසි ජල අපවහන සහ පරිසරය වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය ක්‍රියාත්මක කළේය. අනාගත යටිතල පහසුකම් සඳහා ඉඩම් සංවර්ධනය කිරීම සහ කැළණිය සහ වත්තල ප්‍රදේශවල ජනතාවගේ ජීවනෝපාය වැඩිදියුණු කිරීම මෙම ව්‍යාපෘතියේ අනෙකුත් අරමුණු වේ.

යෝජිත ව්‍යාපෘතිය ප්‍රධාන වශයෙන් තත්පර 15m3/s සහ 20 m3/s ධාරිතාවයෙන් යුත් පොම්පාගාර 02ක්, පෑලියගොඩ - පුත්තලම ප්‍රධාන මාර්ගයේ පාලම නැවත ඉදිකිරීම, ඉවුරු ඉදිකිරීම සහ වැව් හැරීම, ඇළ මාර්ග ප්‍රතිසංස්කරණය සහ මෙම ව්‍යාපෘති ප්‍රදේශයේ හඳුනාගත් නිවාස නැවත ස්ථානගත කිරීම සමඟ විනෝදාස්වාද ක්‍රියාකාරකම් සඳහා ඉදිකිරීම් සිදුකිරීමෙන් සමන්විත වේ. 2023 වසර අවසානය වන විට ව්‍යාපෘතිය සඳහා රු. මිලියන 2,348.16 ක් භාවිතා කර ඇති අතර පොම්පාගාරය- II හි ඉදිකිරීම්වලින් 97% ක ප්‍රගතියක් ලබා ඇත.

රටේ ආර්ථික තත්ත්වයත් සමඟ තරඟකාරී ලංසු තැබීම් මඟින් බාහිර ඉදිකිරීම් කොන්ත්‍රාත් ලබා ගැනීමට සංස්ථාව ක්‍රියාශීලී ක්‍රියාමාර්ග ගත් අතර වයඹ, උතුරු මැද, නැඟෙනහිර සහ දකුණු පළාත්වල සුළු වාරිමාර්ග යෝජනා ක්‍රම ප්‍රතිසංස්කරණය කිරීම සඳහා ලෝක බැංකුවේ ආධාර යටතේ ක්‍රියාත්මක වන දේශගුණ සුහුරු ඒකාබද්ධ කෘෂිකාර්මික ව්‍යාපෘතිය (CSIAP) යටතේ රු. මිලියන 450ක් පමණ වටිනාකමකින් යුත් කොන්ත්‍රාත් අටක් (8) ලබා ගැනීමට සංස්ථාව සමත් විය. සැලසුම් කරන ලද පරිදි ඉදිකිරීම් කටයුතු ක්‍රියාත්මක කර ඇති අතර, ඉදිරියේදී තවත් එවැනි කොන්ත්‍රාත්තු ලබා ගැනීම සඳහා ලංසු තැබීමේ ක්‍රියාවලිය ශක්තිමත් කර ඇත.

සියලුම ප්‍රධාන මෙහෙයුම් ක්ෂේත්‍ර වලදී, සංස්ථාව සිය සමස්ත ඵලදායිතාව, කාර්යක්ෂමතාව සහ ලාභදායිත්වය වැඩිදියුණු කරගෙන ඇති අතර එමඟින් සමාලෝචිත වර්ෂය තුළ සංස්ථාවේ අරමුණු සාක්ෂාත් කර ගෙන ඇත.

සංස්ථාවේ ආචාර ධර්ම රාමුව තුළ ඉංජිනේරු විශිෂ්ටත්වය සහ සම්පත් භාවිතා කරමින් තිරසාර, පරිසර හිතකාමී යටිතල පහසුකම් සංවර්ධනය සඳහා උපාය මාර්ගික හවුල්කරුවෙකු ලෙස අපගේ සංස්ථාව රටේ ආර්ථිකයට සැලකිය යුතු දායකත්වයක් ලබා දී ඇත.

අවසාන වශයෙන්, 2023 වර්ෂය සඳහා අප සැලසුම් කළ වැඩකටයුතු කඩිනම් කිරීම සඳහා ලබාදුන් මගපෙන්වීම සහ නායකත්වය පිළිබඳව ගරු අමාත්‍යතුමාට සහ නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යාංශයේ ලේකම්තුමාට සහ අපගේ සංස්ථාවේ සභාපතිතුමාට මාගේ අවංක කෘතඥතාව පළ කිරීමට මෙය අවස්ථාවක් කර ගනිමි.

ශ්‍රී ලංකා ඉඩම් සංවර්ධනය කිරීමේ සංස්ථාව 2024 සඳහා සූදානම් වෙමින් සිටින මෙම අවස්ථාවේ, ඔවුන්ගේ වටිනා උපදෙස් සහ අඛණ්ඩ සහයෝගය සඳහා අධ්‍යක්ෂ මණ්ඩලයට මම ස්තූතිවන්ත වෙමි. අභියෝගාත්මක වසරක් තුළ ඉහත දක්වා ඇති ප්‍රතිඵල ලබාදීම සම්බන්ධයෙන් ජ්‍යෙෂ්ඨ කළමනාකාරීත්වයට සහ සංස්ථාවේ සියලුම සේවකයන්ට ස්තූතිය පුද කිරීමටද මෙය අවස්ථාවක් කර ගනිමි. අමාත්‍යාංශයේ සහ රාජ්‍ය අමාත්‍යාංශවල විෂය පථය යටතේ පවතින අනෙකුත් ආයතනවල නිලධාරීන්ට, අපගේ සැපයුම්කරුවන්ට, කොන්ත්‍රාත්කරුවන්ට සහ සමාලෝචිත වර්ෂය සාර්ථක කර ගැනීමට විවිධ ආකාරවලින් අපට උපකාර කළ අනෙකුත් සියලුම පාර්ශ්වකරුවන්ට මගේ කෘතඥතාව පුද කිරීමට කැමැත්තෙමි.

**ඉංජි. ශ්‍රීමතී සේනාධීර**
**සාමාන්‍යාධිකාරී**
2024 ජනවාරි 23

# ආයතනික තොරතුරු

**නීතිමය තත්ත්වය**

ශ්‍රී ලංකා ඉඩම් සංවර්ධනය කිරීමේ සංස්ථාව (මින් පෙර කොළඹ දිස්ත්‍රික්කයේ (පහත් බිම්) ගොඩකිරීමේ සහ සංවර්ධනය කිරීමේ මණ්ඩලය යනුවෙන් සහ ඉන් පසුව ශ්‍රී ලංකා ඉඩම් ගොඩකිරීමේ සහ සංවර්ධනය කිරීමේ සංස්ථාව ලෙස හඳුන්වනු ලැබූ) 1968 අංක 15 දරන පාර්ලිමේන්තු පනතින් සංස්ථාගත කරන ලදී. 1976 අංක 27 දරන සංශෝධන පනතින් සංස්ථාවේ පරමාර්ථ පුළුල් කරන ලදී. 1982 අංක 52 දරන සංශෝධන පනතින් මණ්ඩලයේ නම ශ්‍රී ලංකා ඉඩම් ගොඩකිරීමේ සහ සංවර්ධනය කිරීමේ සංස්ථාව යනුවෙන් වෙනස් කොට මුළු දිවයිනම ආවරණය වන පරිදි එහි අධිකාරි බලය පුළුල් කරන ලදී. 2006 අංක 35 සහ 2021 අංක13 දරන පනතින් ඉහත කී පනත තවදුරටත් සංශෝධනය කරන ලද අතර අනවසර ගොඩකිරීම් සහ ජල මූලාශ්‍ර දූෂණය කිරීමට එරෙහිව නීතිමය ක්‍රියාමාර්ග ගැනීමේ බලය එමගින් සංස්ථාව වෙත පවරා ඇත. තවද, 2019 අංක 11 දරන පනතින් සංස්ථාව, ශ්‍රී ලංකා ඉඩම් සංවර්ධනය කිරීමේ සංස්ථාව ලෙස නැවත නම් කරන ලදී.

**ප්‍රධාන කාර්යාලය**

අංක 3, ශ්‍රී ජයවර්ධනපුර මාවත
වැලිකඩ
රාජගිරිය.
දුරකථන අංකය: 2867369
ඊ-මේල්: mail@sllrdc.lk
වෙබ් අඩවිය: www.landdevelopment.lk

**ප්‍රාදේශීය කාර්යාල**

- **උතුරු කොළඹ**
  ප්‍රාදේශීය ඉංජිනේරු කාර්යාලය
  අවිස්සාවේල්ල පාර
  ඔරුගොඩවත්ත
  වැල්ලම්පිටිය
  දුරකථන අංකය :2532600

- **නැගෙනහිර කොළඹ**
  ප්‍රාදේශීය ඉංජිනේරු කාර්යාලය
  අංක. 28/10 ඒ කිරිමණ්ඩල මාවත
  නාවල
  රාජගිරිය
  දුරකථන අංකය; 2863205

- **දකුණු කොළඹ**
  ප්‍රාදේශීය ඉංජිනේරු කාර්යාලය
  අංක 19, ස්ටැෆෝඩ් පාර,
  කොළඹ 06
  දුරකථන අංකය: 2589862

- **මුතුරාජවෙල**
  ප්‍රාදේශීය ඉංජිනේරු කාර්යාලය
  අංක 123, කෙළවරපිටිය
  හැඳල, වත්තල.
  දුරකථන අංකය: 3193130

**අනුබද්ධිත සමාගම්**

- සීමාසහිත ඉඩම් ගොඩකිරීමේ සහ සංවර්ධනය
  කිරීමේ සමාගම (REDECO)
  අංක 28/10ඒ, කිරිමණ්ඩල මාවත
  නාවල
  රාජගිරිය
  දුරකථන අංකය:2876608
  ඊ-මේල්: lrdcltd1@gmail.com

- එල්.ආර්.ඩී.සී. සර්විසස් (පෞද්.) සමාගම
  අංක 28/10, කිරිමණ්ඩල මාවත
  නාවල
  රාජගිරිය
  දුරකථන අංකය. 2861948
  ඊ-මේල්: info@lrdcservices.com

**විගණකවරුන්**

විගණකාධිපති
විගණකාධිපති දෙපාර්තමේන්තුව
**306/72,** පොල්දූව
බත්තරමුල්ල.

**බැංකුකරුවන්**

ලංකා බැංකුව
මහජන බැංකුව

**නීති උපදේශකවරුන්**

නීතිපති
නීතිපති දෙපාර්තමේන්තුව
අළුත්කඩේ
කොළඹ 12.

# අධ්‍යක්ෂ මණ්ඩලය

| නම | තනතුර | කාල පරිච්ඡේදය |
|---|---|---|
| රියර් අද්මිරාල් හිරාන් බාලසූරිය මහතා | සභාපති<br>ශ්‍රී ලංකා ඉඩම් සංවර්ධනය කිරීමේ සංස්ථාව | 14.03.2022 - සිට මේ දක්වා |
| ඉංජි. අජිත් ගුණසේකර මහතා | අධ්‍යක්ෂ ජනරාල්<br>වාරිමාර්ග දෙපාර්තමේන්තුව<br>නිල බලයෙන් පත් වූ සාමාජික | 04.07.2023 - සිට මේ දක්වා |
| ඩී.ඒ.එච්. පියතිලක මහතා | අතිරේක ලේකම්<br>නිල බලයෙන් පත් වූ සාමාජික | 04.04.2022 සිට මේ දක්වා |
| ගාමිණී හේවගේ මහතා | අධ්‍යක්ෂ ජනරාල්<br>ජාතික භෞතික සැලසුම් දෙපාර්තමේන්තුව | 04.04.2022 සිට මේ දක්වා |
| ආනන්ද හරිස්චන්ද්‍ර මහතා | අධ්‍යක්ෂ | 09.08.2022 සිට මේ දක්වා |
| තිස්ස ගුණවර්ධන මහතා | අධ්‍යක්ෂ<br>නීතිඥ | 09.08.2022 සිට මේ දක්වා |
| ඩී.එස්. දිසානායක මහතා | අධ්‍යක්ෂ<br>යාන්ත්‍රික ඉංජිනේරු | 09.08.2022 සිට මේ දක්වා |
| එස්. තාර්ශන් මහතා | අධ්‍යක්ෂ<br>රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව<br>මුදල් අමාත්‍යාංශය | 10.10.2023 සිට මේ දක්වා |

**2023 වර්ෂය තුළ ඉල්ලා අස් වූ අධ්‍යක්ෂවරුන්**

| | | |
|---|---|---|
| ඉංජි. දීපිකා ත්‍රිමාවිතාන | අධ්‍යක්ෂ ජනරාල්<br>වාරිමාර්ග දෙපාර්තමේන්තුව | 02.01.2023 - 04.07.2023 |
| එස්.ඒ. සී. කුලතිලක මහත්මිය | භාණ්ඩාගාර නියෝජිත<br>අධ්‍යක්ෂ ජනරාල් කළමනාකරණ විගණන | 03.03.2022 - 26.09.2023 |

# ජ්‍යෙෂ්ඨ කළමනාකරණ කණ්ඩායම

| | | | |
|---|---|---|---|
| 01 | සභාපති | - | රියර් අද්මිරාල් ඉංජි. හිරාන් බාලසූරිය මහතා |
| 02 | සාමාන්‍යාධිකාරි | - | ඉංජි. එම්.ඒ.එස්.එම්.කේ. සේනාධීර මිය |
| 03 | අතිරේක සාමාන්‍යාධිකාරි (ක්‍රියාත්මක කිරීම්) | - | ඉංජි. සී.බී අමරසිංහ මහතා |
| 04 | අතිරේක සාමාන්‍යාධිකාරි (සැලසුම් සහ නිර්මාණ) | - | ඉංජි. ඩබ්ලිව්.ආර්.සී. ප්‍රනාන්දු මහතා |
| 05 | නියෝජ්‍ය සාමාන්‍යාධිකාරි (ජලාපවහන සහ ගොඩකිරීම්) | - | ඉංජි. එස්.පී. මුතුමාල මහතා |
| 06 | නියෝජ්‍ය සාමාන්‍යාධිකාරි (නාගරික ජල කළමනාකරණ) | - | ඉංජි. ඒ.එච්. තුෂාරි මිය |
| 07 | නියෝජ්‍ය සාමාන්‍යාධිකාරි (ඉදිකිරීම්) | - | ඉංජි. වයි.පී.සී. ද සිල්වා මහතා |
| 08 | නියෝජ්‍ය සාමාන්‍යාධිකාරි ( තෙත්බිම් කළමනාකරණ) | - | ආචාර්ය එස්.කේ.එන්.එස්. විජයරත්න මහතා |
| 09 | නියෝජ්‍ය සාමාන්‍යාධිකාරි (පර්යේෂණ සහ සැලසුම්) | - | ඉංජි. ඩබ්ලිව්.එච්. කීර්තිරත්න මහතා |
| 10 | නියෝජ්‍ය සාමාන්‍යාධිකාරි (විශේෂ ව්‍යාපෘති) | - | ඉංජි. ආර්.එම්.එන්.ඩී. රත්නායක මහතා |
| 11 | නියෝජ්‍ය සාමාන්‍යාධිකාරි (සැලසුම්) | - | ඉංජි. ඕ.වී.ඩබ්ලිව්.ආර්. ගුණතිලක මහතා |
| 12 | නියෝජ්‍ය සාමාන්‍යාධිකාරි ( පිරියත සහ යන්ත්‍රෝපකරණ ) | - | ඉංජි. එස්.ආර්.එම්. ප්‍රසාද් මහතා |
| 13 | නියෝජ්‍ය සාමාන්‍යාධිකාරි (මානව සම්පත් සංවර්ධන) | - | මේජර් ජෙනරාල් ඊ.කේ.ජේ.කේ. විජයසිරි මහතා (විශ්‍රාමික) |
| 14 | නියෝජ්‍ය සාමාන්‍යාධිකාරි (මුදල්) | - | ජේ.ඒ.පී.කේ. ජයසිංහ මහතා |
| 15 | නියෝජ්‍ය සාමාන්‍යාධිකාරි (ඉඩම් සහ අළෙවි) | - | ඒ.ඒ.එච්. කමලසිරි මහතා |
| 16 | නියෝජ්‍ය සාමාන්‍යාධිකාරි (සැපයුම්) | - | එස්.ඩී. ධර්මරත්න මහතා |
| 17 | නියෝජ්‍ය සාමාන්‍යාධිකාරි (අභ්‍යන්තර විගණක) | - | ඒ.එල්.ඒ.එස්.කේ. අබේගොඩ මහතා |
| 18 | ප්‍රධාන නීති නිලධාරි | - | එච්.කේ.කේ.ඩබ්ලිව්. ඒකනායක මිය |
| 19 | සහකාර සාමාන්‍යාධිකාරි (පාරිසරික) | - | ඉංජි. පී.එම්.පී. විජේරත්න මිය |
| 20 | සහකාර සාමාන්‍යාධිකාරි (ජලාපවහන සහ ව්‍යුහාත්මක සැලසුම්) | - | ඉංජි. එස්.එන්. ගමගේ මිය |
| 21 | සහකාර සාමාන්‍යාධිකාරි (ඉදිකිරීම්) | - | ඉංජි. කේ.එම්.එන්.කේ. රණසිංහ මහතා |
| 22 | සහකාර සාමාන්‍යාධිකාරි (ව්‍යාපෘති සහ ප්‍රසම්පාදන) | - | ඉංජි. එම්.එම්.එම්. මවුෆර් මහතා |
| 23 | සහකාර සාමාන්‍යාධිකාරි (සැලසුම්) | - | ඉංජි. එන්.පී.එස්. ද සිල්වා මිය |
| 24 | සහකාර සාමාන්‍යාධිකාරි (ජලාපවහන) | - | ඉංජි. එස්.එම්.පී.ඩී. සිරිවර්ධන මහතා |
| 25 | සහකාර සාමාන්‍යාධිකාරි (තෙත්බිම් කළමනාකරණ) | - | ඉංජි. එන්.ඒ.ඒ.එස්.වී නිශ්ශංක මිය |
| 26 | සහකාර සාමාන්‍යාධිකාරි (පර්යේෂණ සහ සැලසුම්) | - | ඉංජි. පී.පී. විනීතා මිය |
| 27 | සහකාර සාමාන්‍යාධිකාරි (වාස්තුවිද්‍යා) | - | කේ.එම්.එස්.බී. අතපත්තු මහතා |
| 28 | සහකාර සාමාන්‍යාධිකාරි (මානව සම්පත් සංවර්ධන) | - | එල්. ත්‍රීමාවිතාන මහතා |
| 29 | සහකාර සාමාන්‍යාධිකාරි (ඉඩම් සහ අළෙවි) | - | එන්.ඒ. වික්‍රමනායක මහතා |
| 30 | සහකාර සාමාන්‍යාධිකාරි (මුදල්) | - | එස්.එම්.ඒ.ජී.කේ. සම්මන්දප්පෙරුම මිය |

# මෙහෙයුම් සමාලෝචනය

## ජලාපවහන සහ ගොඩකිරීමේ අංශය

### 1. භාණ්ඩාගාර අරමුදල් ලැබූ ව්‍යාපෘති

#### 1.1 ඇළ මාර්ග, ජලාශ සහ ඇවිදීමේ මංතීරු නඩත්තු කිරීම

කොළඹ සහ ඒ අවට ප්‍රධාන ඇළ මාර්ග ජාලය නඩත්තු කිරීම ශ්‍රී ලංකා ඉඩම් සංවර්ධනය කිරීමේ සංස්ථාවේ (SLLDC) එක් කාර්යයකි. භාණ්ඩාගාරය මගින් මේ සඳහා අරමුදල් සපයනු ලබයි.

2023 වසර සඳහා භාණ්ඩාගාර අරමුදල් භාවිතා කරමින් කොළඹ පුරවර ප්‍රදේශයේ සහ තදාසන්න ප්‍රදේශවල පිහිටි ඇළ මාර්ග, වැව්, ඇවිදීමේ මංතීරු සහ විනෝදාත්මක ප්‍රදේශ නඩත්තු කිරීම සඳහා ජලාපවහන හා ගොඩකිරීමේ අංශය විසින් රු.මි. 223.19 ක් භාවිතා කර ඇත.

**ඇළ මාර්ග නඩත්තු කිරීම:**

පරිසර දූෂණයෙන් තොර පිරිසිදු හා ආකර්ෂණීය පරිසරයක් සහතික කිරීම සඳහා කොළඹ මහනගර කලාපය තුළ සහ ඒ අවට;

- කි.මී. 44 ක් දිගින් යුත් ප්‍රධාන ඇළ මාර්ග
- කි.මී. 52 ක් දිගින් යුත් ද්විතියික ඇළ මාර්ග

**වැව්/ජලාශ නඩත්තු කිරීම:**

- දියවන්නා (දියත උයන) වැව
- අංගොඩ මැල්පුර වැව
- රුක්මල්ගම වැව
- පාර්ලිමේන්තු වැව
- බෙල්ලන්විල වැව
- තලවතුගොඩ වැව
- රම්පලාවත්ත පොකුණ
- කිඹුලාවල වැව

**අවිදීමේ මංතීරු නඩත්තු කිරීම**

- දියත උයන
- ජපන් මිත්‍රත්ව මාර්ගය
- කිඹුලාවල
- චන්ද්‍රිකා කුමාරණතුංග මාවත, මාලඹේ
- බෙල්ලන්විල
- නුගේගොඩ තෙත්බිම් උද්‍යානය
- බොරලැස්ගමුව “කෙළිමඩල”




**මුළු ප්‍රධාන ඇළ මාර්ග දිග: කි.මී. 44.25**
**මුළු කුඩා ඇළ මාර්ග දිග: කි.මී. 52.82**

**i. ඇළ මාර්ග, වැව් සහ ඇවිදීමේ මංතීරු නඩත්තු කිරීම සහ ප්‍රතිසංස්කරණය කිරීම**
**ii. කොළඹ නගරය තුළ සහ අවට ප්‍රධාන ඇළ මාර්ග, කුඩා ඇළ මාර්ග සහ ද්විතීයික ඇළ මාර්ග නඩත්තු කිරීම**

ප්‍රාදේශීය ගංවතුර වැළැක්වීම කොළඹ සහ ඒ අවට ඇළ මාර්ග නඩත්තු කිරීමේ ප්‍රධාන අරමුණ වන අතර ප්‍රාදේශීය ගංවතුර වැළැක්වීම සඳහා කොළඹ මහ නගර සභාව සහ අනෙකුත් අදාළ පාර්ශ්වකාර නියෝජිතායතනවල මැදිහත්වීමෙන් සිදු කර ඇත.

ඇළ මාර්ග නඩත්තු කාර්යයන්වලට පහත සඳහන් දෑ ඇතුලත් විය,

- මතුපිට පිරිසිදු කිරීම.
- ඇළ ඉවුරු නඩත්තු කිරීම සහ කැලෑව ශුද්ධ පවිත්‍ර කිරීම
- ඇළ මාර්ග හැරීමේ කාර්යයන් සහ හාරා ඉවත් කරනු ලබන දෑ ප්‍රවාහනය කිරීම
- ගේබියන් බිත්ති භාවිතා කරමින් ඇළ ඉවුරු ආරක්ෂා කිරීම
- දියවළ පිරිසිදු කිරීම සහ පැති කාණු ආදිය පිරිසිදු කිරීම
- ඇළ මාර්ගවල රක්ෂිත මාර්ග නඩත්තු කිරීම

අතින් පිරිසිදු කිරීමට අමතරව, ඇළ ඉවුරු සහ ඒ අවට ප්‍රදේශ හැරීමට හා පිරිසිදු කිරීමට ඩ්‍රෙජර්, කැණීම් යන්ත්‍ර, බැකෝ යන්ත්‍ර, ට්‍රැක්ටර් සහ ට්‍රක් රථ වැනි බර යාන්ත්‍රික උපකරණ සංස්ථාව විසින් යොදවනු ලැබේ.

මෙහෙයුම් කටයුතු සඳහා, SLLDC විසින් ඔරුගොඩවත්ත (උතුරු කොළඹ), නාවල කිරිමණ්ඩල මාවත (නැගෙනහිර කොළඹ) සහ කිරුළපන (දකුණු කොළඹ) යන ස්ථානවල පිහිටි ප්‍රාදේශීය කාර්යාල 03ක් පවත්වාගෙන යයි.




**i.i. අ උතුරු කොළඹ ප්‍රදේශයේ ඇළ මාර්ග නඩත්තු කිරීම**


ශාන්ත සෙබස්තියන් දකුණු ඇළ මාර්ගය



**දෙමටගොඩ ඇළ මාර්ගය**

- **ප්‍රධාන ගැටලු**

අනෙකුත් ප්‍රදේශවලට වඩා උතුරු කොළඹ ප්‍රදේශවල ඇළ මාර්ග ආසන්නයේ නේවාසික ජනගහනය වැඩි වශයෙන් දක්නට ලැබේ. ඇළ ආශ්‍රිතව ජීවත් වන ජනතාව ඉහළ අධ්‍යාපන මට්ටමක නොසිටින අතර ඇළෙහි සෞන්දර්යාත්මක වටිනාකම පිළිබඳ අඩු අවබෝධයක් ඇති අතර ඝන අපද්‍රව්‍ය කළමනාකරණයට වගකිව යුතු පළාත් පාලන ආයතන මෙම ප්‍රදේශවලින් කසළ එකතු කිරීමේ විධිමත් ක්‍රමවේදයක් ක්‍රියාත්මක කර නොමැත.

එබැවින් ඔවුන්ගේ පහසුව තකා ඝන අපද්‍රව්‍ය සහ අපද්‍රව්‍ය නල මාර්ග ඇළ මාර්ගයට බැහැර කිරීම සිදු කරනු ලැබේ. නඩත්තු කිරීම යටතේ ඇළ මාර්ගවල ඝන අපද්‍රව්‍ය එක්රැස් කිරීම ප්‍රධාන කාර්යයක් විය. ජලයෙහි ඇති අපද්‍රව්‍ය හසුකර ගැනීම සහ එකතු කිරීම දුෂ්කර, පිරිවැය ඵලදායී නොවන ජලාශවලට සහ ඒවායේ ජෛව විවිධත්වයට හානි සිදු වන ක්‍රියාවලියකි.


අසල්වැසියන් විසින් ඇළ මාර්ගයට ඝන අපද්‍රව්‍ය බැහැර කිරීම



ඇළ ඉවුරට ඝන අපද්‍රව්‍ය බැහැර කිරීම

**1.1.1. ආ නැගෙනහිර කොළඹ ප්‍රදේශයේ ඇළ මාර්ග නඩත්තු කිරීම**



හීන් ඇළ මාර්ගය



කෝට්ටේ ඇළ මාර්ගය

### 1.1.1. ඇ. දකුණු කොළඹ ප්‍රදේශයේ ඇළ මාර්ග නඩත්තු කිරීම



වැල්ලවත්ත ඇළ මාර්ගය



දෙහිවල ඇළ මාර්ගය

- **ප්‍රධාන ගැටලු**

ඇළ ආශ්‍රිතව ජීවත් වන ජනතාව විසින් කැළිකසළ/ඝන අපද්‍රව්‍ය ඇළ මාර්ගවලට බැහැර කිරීම සිදු කරනු ලැබේ. අවසානයේදී මෙම පාවෙන ඝන අපද්‍රව්‍ය දෙහිවල සහ වැල්ලවත්ත පිටවාන හරහා මුහුදට එකතු වීම සිදු වේ. මෙමඟින් වෙරළබඩ පරිසරයේ ජෛව විවිධත්වය පිරිහීම සිදු විය හැක. අවම කිරීමේ ක්‍රමය ලෙස, පාවෙන ඝන අපද්‍රව්‍ය වෙන කර ගැනීම සඳහා කසළ බාධක හඳුන්වා දී ඇති අතර එය තරමක් දුරට විසඳුමක් වනු ඇත. එබැවින්, SLLDC විසින් දිනපතා සිදු කරනු ලබන මතුපිට පිරිසිදු කිරීම මෙහි ප්‍රධාන ක්‍රියාකාරකමකි. ජලයෙහි පවතින අපද්‍රව්‍ය හසුකර ගැනීම සහ එකතු කිරීම දුෂ්කර මෙන්ම පිරිවැය ඵලදායී නොවන කාර්යයකි.





2023 වර්ෂය තුළ SLLDC කොළඹ ඇළ මාර්ග ජාලය නඩත්තු කිරීම සඳහා සහභාගී වී ඇති අතර සිදු කර ඇති මුළු කාර්යයන්වල වටිනාකම රු. මිලියන 223.19 කි.

### i.ii. හැමිල්ටන් ඇළ මාර්ගය නඩත්තු කිරීම

2023 වර්ෂයේදී හැමිල්ටන් ඇළ මාර්ගයේ කැලණි ගඟ අන්තයේ මීගමුව කලපුව දක්වා (දිග කි.මී. 14.3) සහ මහ ඔය අන්තය දක්වා (දිග කි.මී. 7.7ක) අවශ්‍ය අවස්ථාවල නිරන්තර නඩත්තු කටයුතු සිදු කරන ලදී. මෙහෙයුම් කටයුතු සඳහා, SLLDC විසින් කෙරවලපිටියේ පිහිටා ඇති මුතුරාජවෙල ප්‍රාදේශීය කාර්යාලය පවත්වාගෙන යනු ලැබේ.

ඇළ මාර්ග නඩත්තු කාර්යයන්වලට පහත සඳහන් දෑ ඇතුලත් විය,

- මතුපිට පිරිසිදු කිරීම
- ඇළ ඉවුරු නඩත්තු කිරීම
- ඇළ මාර්ග හැරීමේ කාර්යයන් සහ හාරා ඉවත් කරනු ලබන දෑ ප්‍රවාහනය කිරීම
- ගේබියන් පෙට්ටි භාවිතා කරමින් ඇළ ඉවුරු ආරක්ෂා කිරීම





ඒ අනුව, 2023 වර්ෂය සඳහා සිදු කරන ලද නඩත්තු කටයුතුවල මුළු වටිනාකම රු. මිලියන 19.94 කි.

### i.iii. කොළඹ අවට ප්‍රදේශයේ වැව්/පොකුණු නඩත්තු කිරීම

පාර්ලිමේන්තුව පවා ජලයෙන් යට වූ 2010 නොවැම්බර් 11 වැනි දින පෙර නොවූ විරූ ගංවතුරකට විසඳුමක් ලෙස SLLDC විසින් ජලාපවහන යෝජනා කිහිපයක් ක්‍රියාත්මක කරන ලදී. මහා භාණ්ඩාගාර අරමුදල් යටතේ එම ජලාපවහන පද්ධති ගංවතුර සමයේදී පාර්ලිමේන්තුව සහ ඒ අවට ප්‍රදේශ වන වෝටර්ස් එජ් කිඹුලාවල වැනි ප්‍රදේශ ජලයෙන් යටවීමෙන් ආරක්ෂා කිරීම සඳහා නිරන්තරයෙන් නඩත්තු කිරීම් සිදු කරන ලදී.

බෙල්ලන්විල ප්‍රදේශ, කොළඹ නගරයේ දකුණු ප්‍රදේශය තුළ පිහිටා ඇති ශීඝ්‍රයෙන් සංවර්ධනය වන ප්‍රදේශයක් වේ. මෙම ප්‍රදේශය අධික වර්ෂාවකදී නිරන්තරයෙන් ජලයෙන් යට වේ. වේරැස් ගඟ වැසි ජල සංවර්ධන ව්‍යාපෘතිය යටතේ මෙම ප්‍රදේශයේ සමාජ හා සංස්කෘතික පසුබිම වැඩිදියුණු කිරීම සඳහා උපකාර වන කෘෂිකාර්මික ඉඩම් සමඟ වැව් සහ ඇළ මාර්ග පද්ධති නිර්මාණය කිරීම වැනි දිගුකාලීන ගංවතුර අවම කිරීමේ කාර්යයන් ක්‍රියාත්මක කරන ලදී.

නඩත්තු කාර්යයන්වලට පහත සඳහන් කාර්යයන් ඇතුලත් විය,

- පෝෂණ ඇළ මාර්ග පද්ධතිය නඩත්තු කිරීම
- ජලාශය මතුපිට පිරිසිදු කිරීම
- ඇළ ඉවුර, රක්ෂිත ප්‍රදේශය, සීමා මායිම්, ඇවිදීමේ මාර්ගය සහ විනෝදාත්මක ප්‍රදේශ නඩත්තු කිරීම.
- වැව/පොකුණ හැරීම මඟින් ගංවතුර රඳවා ගැනීමේ හැකියාව වැඩි දියුණු කිරීම
- වැව්/පොකුණු අනවසරයෙන් අත්පත් කර ගැනීම පාලනය කිරීම

**A. දියවන්නා ජලාශයේ ඇළ මාර්ග/ වැව්**



**B. කිඹුලාවල පිහිටි ඇළ මාර්ග/ වැව්**





**C. බෙල්ලන්විල සහ බොරලැස්ගමුව පිහිටි ඇළ මාර්ග / වැව්**





මෙම ව්‍යාපෘතියේ ප්‍රතිලාභ වන්නේ,

- අනවසර අත් පත් කර ගැනීම් වැළැක්වීම
- ඝන අපද්‍රව්‍ය කළමනාකරණය.
- ජලාශවල ජලයේ ගුණාත්මක බව වැඩි දියුණු කිරීම.

පාර්ලිමේන්තුවේ ඉහළ ජල පෝෂක ප්‍රදේශය සහ ඒ අවට පදිංචිකරුවන්ට විශේෂයෙන් ප්‍රතිලාභ ලැබී ඇති අතර සමස්තයක් ලෙස කොළඹ ප්‍රදේශයටම ගංවතුර ආරක්ෂණයෙන් ප්‍රතිලාභ ලැබී ඇත.

2023 වර්ෂය තුළ කොළඹ අවට වැව්/පොකුණු සහ ඒ ආශ්‍රිත ජල පෝෂක නඩත්තු කාර්යයන්වල මුළු වටිනාකම රු. මිලියන 90.56 කි.

### i.iv. කොළඹ ප්‍රදේශයේ සූර්ය ආලෝක පද්ධතිය ඇතුළු වැව්/පොකුණු, ඇවිදීමේ මංතීරු සහ වාහන නැවැත්වීමේ ස්ථාන නඩත්තු කිරීම

වාණිජ අගනුවර සහ එහි තදාසන්න ප්‍රදේශය ආදර්ශ හරිත, පවිත්‍ර සහ මහජන හිතකාමී නගරයක් ලෙස සංවර්ධනය කිරීම සඳහා කොළඹ පුරවර නාගරික සංවර්ධන ව්‍යාපෘතිය යටතේ ව්‍යාපෘති කිහිපයක් සම්පූර්ණ කරන ලදී. දියත උයන උද්‍යානය, වැව, නාවල තෙත්බිම් උද්‍යානය, ජපන්-ශ්‍රී ලංකා මිත්‍රත්ව මාර්ගය, රම්පලාවත්ත වැව සහ කිඹුලාවල ප්‍රදේශය සංවර්ධනය කිරීම මෙම ව්‍යාපෘතිය යටතේ වන සංවර්ධනය කිරීම් කිහිපයකි.

මෙම ව්‍යාපෘති යටතේ ජපාන මිත්‍ර මාර්ගය, වෝටර්ස් ඒජ්, කිඹුලාවල, චන්ද්‍රිකා කුමාරණතුංග මාවත වැනි ජල රැඳවුම් ප්‍රදේශවලට යාබද ප්‍රධාන මාර්ග සහ අනෙකුත් වැදගත් ස්ථාන ජල තරංගවලින් සිදු වන ඛාදනය වීමෙන් ආරක්ෂා කිරීම සඳහා පරිසර හිතකාමී තණ පිඩැලි අල්ලන ලද ද්විතීයික ඇළ ඉවුරු, නිර්මාණය කරන ලද රැඳවුම් පොකුණු හඳුන්වා දී ඇත. එසේම ඉඩම් අනවසරයෙන් අත් පත් කර ගැනීම වැළැක්වීම සඳහා ඇවිදීමේ මාර්ග හඳුන්වා දී ඇත.

මෙම උද්‍යාන නඩත්තු කිරීම SLLDC විසින් සිදු කර ඇත

- ජලාශ පිරිසිදු කිරීම සහ නඩත්තු කිරීම
- අවට හරිත පරිසරයක් නිර්මාණය කරමින් තණ පිඩලි අල්ලන ලද ප්‍රදේශය නඩත්තු කිරීම
- සංවර්ධිත නාගරික භූමි අලංකරණය සහ වාහන නැවැත්වීමේ ප්‍රදේශ නඩත්තු කිරීම (ඉවුර ඔස්සේ ගස් සිටුවීම)
- සමාජ ක්‍රියාකාරකම් සඳහා නිර්මාණය කරන ලද ස්ථාන නිර්මාණය කිරීම සහ නඩත්තු කිරීම
- සංචාරක පාදක ව්‍යාපාර මඟින් නව රැකියා අවස්ථා ඇති වීම සහ අලංකාරය දර්ශනක් ඇති වීම

#### A. වෝටර්ස් එජ් හි ඇවිදීමේ මංතීරුව නඩත්තු කිරීම





දියතඋයන ඇවිදීමේ මංතීරුව

#### B. කිඹුලාවල ඇවිදීමේ මංතීරුව නඩත්තු කිරීම





ජපන් මිත්‍රත්ව ඇවිදීමේ මාර්ගය





කිඹුලාවල ඇවිදීමේ මාර්ගය

#### C. නැගෙනහිර කොළඹ ප්‍රදේශයේ ඇවිදීමේ මංතීරු නඩත්තු කිරීම




පාගොඩ තෙත්බිම් උද්‍යානය

**D. බෙල්ලන්විල ප්‍රදේශයේ ඇවිදීමේ මංතීරුව නඩත්තු කිරීම**




බෙල්ලන්විල, බොරලැස්ගමුව ඇවිදීමේ මංතීරු

මෙම ව්‍යාපෘතියේ ප්‍රතිලාභ වන්නේ,

- අනවසර අත් පත් කර ගැනීම් වැළැක්වීම
- ජලාශය, වාහන නැවැත්වීමේ ස්ථාන සහ සේවා මාර්ගය පිරිසිදු කිරීම මගින් එම ප්‍රදේශය අවට ව්‍යායාම සඳහා ජනතාව පෙළඹවීමෙන් ජනතාවගේ සෞඛ්‍යය වැඩි දියුණු කිරීම.
- ජලාශවල ජලයේ ගුණාත්මක බව වැඩි දියුණු කිරීම.
- සූර්ය ආලෝක පද්ධතිය භාවිතයෙන් පිරිවැය අවම කිරීම

2023 වර්ෂය සඳහා සිදු කරන ලද කාර්යයන්වල මුළු වටිනාකම රු. මිලියන 67.42 කි.

**Ii. වර්ෂා කාල/ගංවතුර කාලවලදී ඇළ මාර්ග, වැව් සහ ජලාපවහන ව්‍යුහයන් පිරිසිදු කිරීම (SLLDC විෂය පථයට අයත් නොවන ඇළ මාර්ග, වැව් සහ ජලාපවහන ව්‍යුහයන්)**

කිසිදු ආයතනයක විෂය පථය යටතට නොගැනෙන බොහෝ ද්විතියික ඇළ මාර්ග කිසිදු ආයතනයක් විසින් නඩත්තු කිරීමක් සිදු නොකරමින් පවතී. වගකිව යුතු නොවන බැවින් සෑම ආයතනයක්ම මෙම කාර්යයෙන් ඉවත් වී ඇත. මෙහි ප්‍රතිඵලයක් ලෙස ඇළ මාර්ග පළල අඩුවීම සහ ඇළ මාර්ග අවහිර වීම හේතුවෙන් සුළු ගංවතුර ගැටලු රැසක් ඇති විය. මෙම ගැටලුව අවම කිරීම සඳහා මෙම ද්විතියික ඇළ මාර්ග සහ සම්බන්ධක ඇළ මාර්ග වැඩිදියුණු කිරීම අවශ්‍ය වේ. එබැවින් මෙම ද්විතියික ඇළ මාර්ග නඩත්තු කිරීමද SLLDC විසින් සිදු කරඇත. එසේම පවතින ද්විතියික ඇළ මාර්ග වැඩිදියුණු කිරීම හේතුවෙන් ගංවතුරෙන් තොර පරිසරයක් ඇති වේ.

මෙම ව්‍යාපෘතියේන ප්‍රධාන ක්‍රියාකාරකම් පහත පරිදි වේ,

- ඇළ මාර්ග හා එහි රක්ෂිත අනවසරයෙන් අත් පත් කර ගැනීමෙන් වැළැක්වීම
- නඩත්තු කටයුතු සඳහා අවශ්‍ය ප්‍රවේශ මාර්ග ලබා දීම
- ඝන අපද්‍රව්‍ය බැහැර කිරීම, මලාපවහන බැහැර කිරීම පාලනය කිරීම

මෙම ව්‍යාපෘතියේ අරමුණු වන්නේ,

- ස්ථානීය ගංවතුර හේතුවෙන් මහජනතාවට සිදුවන අපහසුතාවයන් වැළැක්වීම
- සම්පූර්ණ ඇළ පද්ධතියේ වඩා හොඳ සම්බන්ධතාවයක් ඇති කිරීම
- මුළු පරිසරයම පිරිසිදුව හා අලංකාරව තබා ගැනීම

ඒ අනුව 2023 වසර සඳහා මෙම ඇළ මාර්ග නඩත්තු කාර්යයන්වල මුළු වටිනාකම රු. මිලියන 12.35 කි.

**කොළඹ මහනගර ප්‍රදේශය තුළ පිහිටි ඇළ මාර්ග/වැව් පිරිසිදු කිරීම (කදිරානවත්ත ඇළ මාර්ගය)**





**පැලියගොඩ ප්‍රදේශයේ ඇළ මාර්ග/වැව් පිරිසිදු කිරීම (පැලියගොඩ මැනිං වෙළඳපොළ ඇළ මාර්ගය)**


පෙර



පසු

**Iii. ආපදා තත්ත්වයකදී ඉල්ලා සිටින විට පොදු ස්ථානවල ජලාපවහනය වැඩිදියුණු කිරීම සහ ගංවතුර සම්බන්ධ ගැටලු සඳහා පිළියම් යෙදීම**

නිරන්තර ගංවතුර ශ්‍රී ලංකාවේ ස්වාභාවික උවදුරුවල වඩාත්ම විනාශකාරී ආකාරයයි. ජීවිත හානි සහ දේපළ හානි යන දෙකටම අදාළව මෙය සත්‍යයකි. එය ස්වභාවික උපද්‍රවවල වඩාත් ප්‍රචලිත ආකාරය ද වේ. මෙම තත්ත්වය වළක්වා ගැනීම සඳහා මහජනතාවට බලපාන ගැටලු නිරාකරණය කර ගැනීමට පිළියම් යෙදිය යුතු වේ.

පසුගිය වසර තුළ පාර්ලිමේන්තු පරිශ්‍රයේ සහ ඒ අවට පිහිටි පොදු ස්ථාන, සමිති සහ ආගමික ස්ථාන ඔවුන්ගේ පරිශ්‍රවල ඒ අවට ඇති ජලාපවහන ගැටලු විසඳීමට අපගේ කඩිනම් සහය ලබා දෙන ලෙස ඉල්ලා සිටියේය.

2023 වර්ෂය සඳහා සිදු කරන ලද කාර්යයන්වල මුළු වටිනාකම රු. මිලියන 1.51 කි.

**පාර්ලිමේන්තු පරිශ්‍රයේ සහ ඒ අවට ජලාපවහන වැඩිදියුණු කිරීම් සහ ගංවතුර ආශ්‍රිත ගැටලු සඳහා පිළියම් යෙදීම**





**අධික වර්ෂාව හේතුවෙන් හැමිල්ටන් ඇළ මාර්ගයට (මීගමුව) විශාල ගස් කඩා වැටීම**





**Iv. කළු ඔය ද්‍රෝණියේ ඇළ මාර්ග නඩත්තු කිරීම**

කළු ඔය ද්‍රෝණියේ නේවාසික හා කර්මාන්ත අංශයේ අඛණ්ඩ වර්ධනයක් අත්කර ගෙන තිබේ. ඉඩම් මිල අඩු වීම හේතුවෙන් එය නව පදිංචිකරුවන් ආකර්ෂණය කරගෙන ඇත. කොළඹ ජනගහනය වර්ධනය වනවිට එය අනාගත නාගරික ව්‍යාප්තිය සඳහා ප්‍රමුඛතා ප්‍රදේශයක් ලෙස දැන් ඉලක්ක කර ඇත. මෙම වේගවත් සංවර්ධනයත් සමඟ ස්වාභාවික උවදුරුවලට ලක් වීමේ අවදානම අවම කිරීම සඳහා වැසි ජල අපවහන ඇතුළු නාගරික යටිතල පහසුකම් කෙරෙහි වැඩි අවධානයක් අවශ්‍ය වේ.
SLLDC විසින් අවශ්‍ය අවස්ථාවලදී ප්‍රධාන සහ කුඩා ඇළ මාර්ගවල ඇළ මාර්ග හැරීම, මඩ ඉවත් කිරීම සහ ඇළ ඉවුරු ආරක්ෂණ කාර්යයන් සිදු කරනු ලැබේ.

**ව්‍යාපෘතියේ අරමුණු පහත පරිදි වේ,**

- වැසි ජල අපවහන පද්ධතිය වැඩිදියුණු කිරීමෙන් ගංවතුර හානිය අවම කිරීම
- ගංවතුර අවදානම අඩු කිරීමෙන් (හෝ කළමනාකරණය කිරීමෙන්) ජීවන තත්ත්වය ඉහළ නැංවීම
- ප්‍රජාව සඳහා සුරක්ෂිතභාවය සහ ආරක්ෂාව වැඩි දියුණු කිරීම
- සමාජ හා වාණිජ කටයුතුවලට සිදු වන බාධා අවම කිරීම
- පදිංචිකරුවන්ගේ සෞඛ්‍ය අවදානම අඩු කිරීම
- වඩාත් ආකර්ෂණීය නාගරික පරිසරයක් නිර්මාණය කිරීම

2023 වර්ෂය සඳහා සිදු කරන ලද කාර්යයන්වල මුළු වටිනාකම රු. මිලියන 11.27 කි.







**V. ඇළ මාර්ග නිවැරදි කිරීමේ හා නව ඇළ ඉවුරු ආරක්ෂණ කාර්යයන් (ගේබියන් කාර්යයන්, පෝරු වැඹ, RRM බැමි, RCC බැමි ආදිය)**

භාණ්ඩාගාර අරමුදල් වෙන්කිරීම යටතේ කොළඹ ප්‍රධාන ඇළ මාර්ග පද්ධතියෙහි ජලාපවහන අවශ්‍යතා සපුරාලීම පිණිස ඇළ ඉවුරු ප්‍රතිසංස්කරණය කිරීම හා වැඩිදියුණු කිරීම සඳහා වෙන් කරන ලදී.

වර්ෂ 1992 සිට 1998 දක්වා කාලය තුළ ඇළ ඉවුරු වැඩිදියුණු කිරීමේ කාර්යයන් ආදිය සමඟින් කොළඹ සහ ඒ අවට ඇළ මාර්ග පද්ධතිය සංවර්ධනය වූ අතර විවිධ මානව ක්‍රියාකාරකම් සහ ඇළ ඉවුරු ස්වාභාවික ඛාදනය හේතුවෙන් මේ වනවිට ඇළ ඉවුරුවලින් කොටසක් හානියට ලක් වී ඇත.

ඉහත කරුණු සලකා බලා ඇළ ඉවුරු සේදී යෑම හා කඩා වැටීමෙන් වැළැක්වීම සඳහා උතුරු කොළඹ ප්‍රදේශය, දකුණු කොළඹ ප්‍රදේශය සහ නැගෙනහිර කොළඹ ප්‍රදේශය සහ එහි තදාසන්න ප්‍රදේශවල ප්‍රධාන ඇළ මාර්ගවල ඉවුරු ආරක්ෂා කිරීමටත්, පවත්වා ගත හැකි උපරිම පළල පවත්වා ගැනීම සඳහා ඇළ ඉවුරු නිසි පරිදි සීමා නිර්ණය කිරීමටත් යෝජනා කරනු ලැබේ.

මෙම ව්‍යාපෘතිය යටතේ මෙම ප්‍රදේශවල පහත සංවර්ධන කටයුතු සිදු කර ඇත.

මීගමුව, ඒත්තුකාල සහ උස්වැටකෙයියාව, මුතුරාජවෙල අසල හැමිල්ටන් ඇළ ආශ්‍රිතව ඇළ ඉවුරු වැඩිදියුණු කිරීම. 2023 වර්ෂය සඳහා සිදු කරන ලද මුළු කාර්යයන්වල වටිනාකම රු. මිලියන 2.74 කි.







**Vi. ලුනාව ඇළ මාර්ග පද්ධතියේ N1, N1-iii, S1 සහ S2 ඇළ මාර්ග හැරීම, ප්‍රතිසංස්කරණය කිරීම සහ නඩත්තු කිරීම සහ ලුනාව වැව හා එහි අවට නාගරික භූමි අලංකරණ කාර්යයන්**

උතුරින් දෙහිවල-ගල්කිස්ස මහ නගර සභා බලප්‍රදේශයේ සිට දකුණින් මොරටුව මහ නගර සභා බලප්‍රදේශය දක්වා කිලෝමීටර් 6.15 ක් ආවරණය වන පරිදි කොළඹ දිස්ත්‍රික්කයේ දකුණින් ලුනාව වැව පිහිටා ඇත. කලපුව ව්‍යසනය කරා ගමන් කරමින් සිටියදී 2000 ජූලි මාසයේදී රජය විසින් ජාත්‍යන්තර අරමුදල් යොදා ගනිමින් ලුනාව පරිසරය වැඩිදියුණු කිරීමේ සහ ප්‍රජා සංවර්ධන ව්‍යාපෘතිය දියත් කරන ලදී

යෝජිත ව්‍යාපෘති ප්‍රදේශය තුළ උතුරේ සිට දකුණට විහිදෙන පහත් බිම් හරහා ගොස් ලුනාව වැවට ගලා බසින ප්‍රධාන ඇළ මාර්ගය ලුනාව ඇළ මාර්ගය වේ. මෙම ද්‍රෝණිය කුඩා ද්‍රෝණි රැසකින් සමන්විත වන අතර එමඟින් වැවේ බටහිර සහ දකුණු ප්‍රදේශවල වැසි ජලය කෙලින්ම වැවට ගලා යයි. ලුනාව වැව, අඟුලාන දුම්රිය ස්ථානයට දකුණින් පිහිටි දුම්රිය පාලම යටින් මුහුදට සම්බන්ධ වේ.











වාර්ෂිකව SLLDC ප්‍රධාන ඇළ මාර්ග පද්ධතියේ කොටස නඩත්තු කිරීම සිදු කරයි. කලපු ප්‍රදේශය හා ඒ අවට සහ ප්‍රධාන ඇළ මාර්ග පද්ධතියේ කොටසක ද හැරීම් සහ සමහර පුනරුත්ථාපන කටයුතු සිදු කළ යුතු වේ. ඒ අනුව සමාජ වගකීමක් ලෙස මහජනතාවට ප්‍රසන්න පරිසරයක් නිර්මාණය කිරීම සඳහා SLLDC ප්‍රධාන ඇළ පද්ධතියේ පිරිසිදු කිරීමේ සහ හැරීම් කටයුතු සඳහා සහභාගී වී ඇත.

මෙම ව්‍යාපෘතියේ ප්‍රතිඵල වන්නේ,

- ජනතාවගේ සෞඛ්‍ය සම්පන්න ජීවිතය සඳහා නාගරික ප්‍රදේශවල සනීපාරක්ෂක පරිසරයක් නිර්මාණය කිරීම සහ වැසි ජල අපවහන පද්ධතිය වැඩිදියුණු කිරීම තුළින් නගරයේ ගෞරවය ඉහළ මට්ටමක තබා ගැනීම.
- අධ්‍යාපනය ඇතුළු ආර්ථික හා සංස්කෘතික කටයුතු සඳහා වන ව්‍යාපෘති සඳහා බොහෝ විට ගංවතුර බාධා ඇති වීම වැළැක්වීම.
- නාගරික ප්‍රදේශයෙන් වැසි ජලය එක් රැස් වන ඇළ මාර්ගවල සහ මුහුදු ජලයේ තත්ත්වය වැඩිදියුණු කිරීම.
- ප්‍රධාන ඇළ පද්ධතියේ කොටසක් හැරීම, පිරිසිදු කිරීම හා නඩත්තු කිරීම මඟින් ප්‍රසන්න පරිසරයක් ඇති කිරීම.
- රොන්මඩ ඉවත් කිරීම මඟින් ඇළ මාර්ගයේ ජලය රැගෙන යාමේ ධාරිතාව වැඩි කිරීම.
- වැවට සහ ඇළ මාර්ග පද්ධතියට එක් වන අපද්‍රව්‍ය පාලනය කිරීම.
- ඇළ මාර්ග සහ කලපු සඳහා වෙන්කර ඇති භූමිය අනවසරයෙන් අත්පත් කර ගැනීම සහ එහි සිදු වන නීති විරෝධී ක්‍රියා වැළැක්වීම.

ඒ අනුව 2023 වර්ෂය සඳහා සිදු කරන ලද කාර්යයන්වල මුළු වටිනාකම රු. මිලියන 9.83 කි.

**Vii. කොළඹ - කටුනායක අධිවේගී මාර්ගය (CKE) ඔස්සේ පැරණි ඕලන්ද ඇළ මාර්ගය සහ ඊට සම්බන්ධිත ජලාශ නඩත්තු කිරීම)**









ඒ අනුව, පැරණි ඕලන්ද ඇළ මාර්ග සහ සම්බන්ධිත ජලාශ නඩත්තු කිරීමෙහි SLLDC නිරන්තරයෙන් නිරත වන අතර 2023 වර්ෂය සඳහා සිදු කරන ලද මුළු කාර්යයන්වල වටිනාකම රු. මිලියන 17.42 කි.

<u>**ගංවතුර වැළැක්වීමේ ක්‍රියාකාරකම්**</u>

**i. පැලියගොඩ පවතින පොම්පාගාරය වැඩිදියුණු කිරීම සහ එහි වාර්ෂික නඩත්තු හා මෙහෙයුම් කාර්යයන්**

කැලණි ගඟේ පහළ කොටසෙහි ඉහළ ගංවතුර මට්ටම්වලදී පැලියගොඩ ප්‍රදේශයේ වැසි ජලය පොම්ප කිරීම සඳහා පැලියගොඩ දැනට පවතින පොම්පාගාරය ඉදි කරන ලදී. එය වර්තමානයේ SLLDC විසින් මෙහෙයුම් හා නඩත්තු කිරීම් සිදු කරනු ලබන සිරස් අක්ෂීය පොම්ප (විදුලියෙන් ධාවනය වන) 2 කින් සමන්විත වේ.

2023 වර්ෂයේ අයවැය ප්‍රතිපාදන මඟින්, SLLDC දැනට පවතින පැලියගොඩ පොම්පාගාරය සහ ඒ වෙත ගලා එන ඇළ මාර්ග නඩත්තු කිරීම සඳහා සහභාගී වී ඇත

ප්‍රධාන අරමුණු වූයේ,

- ➢ පවතින පොම්පාගාරය සහ එහි පෝෂණ ඇළ මාර්ගය ප්‍රතිසංස්කරණය කිරීම
- ➢ වාර්ෂික මෙහෙයුම් සහ නඩත්තු කාර්යයන්







ඉහත ව්‍යාපෘතිය සඳහා 2023 වර්ෂය තුළ සිදු කරන ලද කාර්යයන්වල මුළු වටිනාකම රු. මිලියන 4.51 කි.

**ii. කොළඹින් පිටත ජලාපවහන වැඩිදියුණු කිරීම සහ නාගරික භූමි අලංකරණ ව්‍යාපෘති**

ගංවතුර අවදානම අවම කිරීම සඳහා කොළඹ දිස්ත්‍රික්කයෙන් පිටත ප්‍රධාන නගර සහ ස්ථානවල වැව් ප්‍රතිසංස්කරණය කිරීම, රොන්මඩ ඉවත් කිරීම සහ අත්පත් කරගන්නන් විසින් සිදු කරනු ලබන අනවසර ගොඩකිරීම් හැරීම, වැව් බැම්ම ඔස්සේ අඩිපාර ඉදිකිරීම, පරිසරය පිරිසිදුව තබා ගැනීම සහ සංවර්ධනයට අදාළ ඇළ මාර්ග පද්ධතිය වඩාත් හොඳින් සම්බන්ධ කිරීම යනාදිය මෙම ව්‍යාපෘතිවල විෂය පථය වේ.

මෙම ව්‍යාපෘතියේ අනෙකුත් ප්‍රතිලාභ වන්නේ,

- රඳවා ගැනීමේ ධාරිතාව වැඩි කිරීම සහ නාගරික භූමි අලංකරණය මගින් ගංවතුරෙන් තොර, පරිසර හිතකාමී හරිත පරිසරයක් නිර්මාණය කිරීම
- ඉඩම් ගොඩකිරීමේ කටයුතු සඳහා අනවසරයෙන් අත්පත් කර ගැනීම වැළැක්වීම
- ඝන අපද්‍රව්‍ය කළමනාකරණය
- ජලාපවහන වැඩිදියුණු කිරීම්
- නාගරික භූමි අලංකරණය

2023 අයවැය ප්‍රතිපාදන කාලය තුළ, SLLDC මෙම කාණ්ඩය යටතේ පහත සඳහන් ව්‍යාපෘති සඳහා සහභාගී වී ඇති අතර, 2023 වසර සඳහා සිදු කරන ලද මුළු කාර්යන්වල වටිනාකම රු. මිලියන 70.38 කි.

- පානදුර ජලාපවහන වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය
- රත්මලාන යුනිවෝටෙක් හි ඇළ මාර්ගය හැරීමේ කටයුතු
- එඬේරමුල්ල ප්‍රදේශයේ ජලාපවහන පහසුකම් වැඩිදියුණු කිරීම
- වේවැල්දූව ඇළ මාර්ගය හැරීම සහ පිරිසිදු කිරීම
- වැලිසර ප්‍රදේශයේ ජලාපවහන වැඩිදියුණු කිරීමේ කටයුතු
- කටාන - ගම්පහ දිස්ත්‍රික්කයේ කිඹුලාපිටිය ඔයේ රොන්මඩ ඉවත් කිරීමේ කාර්යයන්
- බියගම ප්‍රදේශයේ ජලාපවහන වැඩිදියුණු කිරීමේ කාර්යයවන්
- ගලේවෙල වහකෝට්ටේ පිහිටි වැවේ මතුපිට පිරිසිදු කිරීමේ කාර්යයන්
- කැලණිය - ටයර් හන්දියේ ඇළ මාර්ගවල මතුපිට පිරිසිදු කිරීමේ කාර්යයන්
- පැලියගොඩ පොම්පාගාර ඇළ මාර්ගයේ මතුපිට පිරිසිදු කිරීමේ කාර්යයන්

**බියගම ප්‍රදේශයේ ජල අපවහනය වැඩිදියුණු කිරීමේ කාර්යයන්**


පෙර


පසු

**කිඹුලාපිටිය ඔයෙහි රොන්මඩ ඉවත් කිරීමේ කාර්යයන් කටාන-ගම්පහ දිස්ත්‍රික්කය**


පෙර


පසු

**v. පාර්ලිමේන්තු ඉහළ ජල පෝෂක ප්‍රදේශයේ සහ එහි අවට ප්‍රදේශයේ ජලාපවහනය සහ පාරිසරික වැඩි දියුණු කිරීමේ කාර්යයන්**

හරිත නගර සංකල්පය සඳහා පරිසරය වැඩිදියුණු කිරීම මඟින් පාර්ලිමේන්තු පරිශ්‍රය සහ ඒ අවට ගංවතුර අවම කිරීම සහ ඉහළ ජල පෝෂක ප්‍රදේශවල තෙත්බිම් සංරක්ෂණය කිරීම ව්‍යාපෘතියේ ප්‍රධාන අරමුණ වේ.

මෙම ව්‍යාපෘතියේ අනෙකුත් ප්‍රතිලාභ වන්නේ,

- රඳවාගැනීමේ ධාරිතාව වැඩි කිරීම සහ නාගරික භූමි අලංකරණය මඟින් ගංවතුරෙන් තොර, පරිසර හිතකාමී හරිත පරිසරයක් නිර්මාණය කිරීම
- අනවසර ඉඩම් අත් පත් කර ගන්නන් විසින් සිදු කරන ගොඩකිරීමේ ක්‍රියාකාරකම් වැළැක්වීම
- ඝන අපද්‍රව්‍ය කළමනාකරණය
- ජලයේ ගුණාත්මකභාවය වැඩි දියුණු වීම
- ජලාපවහන වැඩිදියුණු වීම
- නාගරික භූමි අලංකරණය

2023 වර්ෂය සඳහා සිදු කරන ලද කාර්යයන්වල මුළු වටිනාකම රු. මිලියන 4.49 කි.




පෙර


පසු

**බේරේ වැවෙහි ජල කඳ සහ එහි අවට නඩත්තු කිරීමේ කාර්යයන්**

ශාන්ත සෙබස්තියන් ඇළ හරහා එන ජලය සහ නාගරීකරණය වූ මෙම ජල පෝෂකය හරහා ගලා එන ජලය බේරේ වැවට එක් රැස් වේ. එබැවින් වැව දූෂණය වීමට තුඩු දෙන නාගරික හා කාර්මික අපද්‍රව්‍ය සහ අපජලය සාමාන්‍යයෙන් වැව් ජලයට එක් වේ. ඒ අනුව බේරේ වැවේ ඇති විය හැකි හායනය අවම කිරීම සඳහා බේරේ වැවේ ජලාශය සහ ඒ අවට අවශ්‍ය නඩත්තු කටයුතු සිදු කිරීමට SLLDC සම්බන්ධ විය.

මෙම ව්‍යාපෘතියේ ප්‍රධාන අරමුණ බේරේ වැවේ ජල කඳ සහ ඒ අවට නඩත්තු කිරීමයි. බේරේ වැව කොළඹ නගරයේ මැද කොටසේ පිහිටා ඇති අතර බේරේ වැවේ විශාලත්වය අක්කර 161.2 කි. බේරේ වැවෙහි ජල කඳ පහත සඳහන් ප්‍රධාන කොටස්වලින් සමන්විත වේ;

• නැගෙනහිර වැව (අක්කර 100.6)
• ගාලු මුවදොර වැව (අක්කර 5.4)
• බටහිර වැව (අක්කර 21.3)
• නිරිතදිග වැව (අක්කර 27.2)
• කැලණි මිටියාවත ද්‍රෝණිය (පටු කොටස (Finger Section)) (අක්කර 2.5)
• ප්‍රධාන ද්‍රෝණිය (පාවෙන වෙළඳපොළ) ප්‍රදේශය (අක්කර 4.2) සහ ශාන්ත සෙබස්තියන් ඇළ නැගෙනහිර බේරේ වැවට සම්බන්ධ වන අතර ප්‍රධාන වශයෙන් ගාලුමුවදොර වැවේ සිට මුහුදට ජලය මුහුදට ගලා යයි.








වර්ෂා කාලයේදී



2023 වර්ෂය සඳහා සිදු කරන ලද කාර්යයන්වල මුළු වටිනාකම රු. මිලියන 20.24 කි

**කොලොන්නාව වැසි ජල අපවහන සහ පරිසර වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය**

වාර්ෂිකව SLLDC කොලොන්නාව ප්‍රදේශයේ ප්‍රධාන ඇල පද්ධතිය නඩත්තු කරනු ලැබේ. එසේම කොලොන්නාව ප්‍රදේශයේ ගංවතුර අවම කිරීම සඳහා කොලොන්නාව ප්‍රදේශයේ සහ ඒ අවට උප ඇළ මාර්ග කිහිපයක කැනීම් සහ මතුපිට පිරිසිදු කිරීම් සිදු කර ඇත.

එනම්,
• කිත්තම්පහුව ඇළ මාර්ගය
• දහම්වෙළ ඇළ මාර්ගය
• සැළලිහිණි මාවත ඇළ මාර්ගය
• පස්සැන්න ඇළ මාර්ගය සහ උප ඇළ මාර්ග ප්‍රධාන ඇළ මාර්ගවලට සම්බන්ධ වේ

2023 වර්ෂය සඳහා සිදු කරන ලද මුළු කාර්යන්වල වටිනාකම රු. මිලියන 75.70 කි.





වර්ෂා කාලයේදී



පිරිසිදු කිරීමෙන් පසු

**සේවාදායක ව්‍යාපෘති - 2023**

1. **කොටුගොඩ. ජා-ඇළ රානාක්ක වැවෙහි යෝජිත ප්‍රතිසංස්කරණ කාර්යයන්**

| | |
|---|---|
| සේවාදායකයා | : නාගරික සංවර්ධන, අපද්‍රව්‍ය බැහැර කිරීම සහ ප්‍රජා පවිත්‍රතා රාජ්‍ය අමාත්‍යාංශය |
| ආරම්භක දිනය | : 2021.07.05 |
| ව්‍යාපෘති තත්ත්වය | : 2023.02.28 |
| ඇස්තමේන්තුගත පිරිවැය | : රු.මිලියන146.98 (අවිනිශ්චිතතා සහ VAT හැර) |

2023 වර්ෂයේ සිදු කළ කාර්යයන්: රු.මිලියන 146.98

**කාර්යයන්වල විෂය පථය**

• පොකුණ හෑරීම (ප්‍රදේශය වර්ග මීටර් 72,843- ගැඹුර මීටර් 1 දක්වා)
• ඇවිදීමේ මාර්ගය සකස් කිරීම
• වානේ පාලම ඉදිකිරීම (විශාලත්වය මීටර් 6 x මීටර් 3)
• පැති බිත්ති සහිත කුඹහ බෝක්කු ඉදිකිරීම
• පෙරැදි ආසන ඒකක සැපයීම සහ සවි කිරීම
• බැම්ම සකස් කිරීමේ කාර්යයන් සහ සපත්තු පාලම ඉදිකිරීම
• ක්‍රීඩා පිටිය සකස් කිරීම
• රථගාල ඉදිකිරීම
• භූමි අලංකරණ කටයුතු









**2. හෝලුවාගොඩ යෝජිත පරිසර කෘෂි උද්‍යානය - ගාල්ල**

| | | |
|---|---|---|
| සේවාදායකයා | : | නාගරික සංවර්ධන, අපද්‍රව්‍ය බැහැර කිරීම සහ ප්‍රජා පවිත්‍රතා රාජ්‍ය අමාත්‍යාංශය |
| ආරම්භක දිනය | : | 26.01.2021 |
| ව්‍යාපෘති තත්ත්වය | : | භාරදීමට සූදානම් කර ඇත |
| ඇස්තමේන්තු පිරිවැය | : | රු. මිලියන 341.96 (අවිනිශ්චිතතා සහ VAT හැර) |

2023 දෙසැම්බර් අවසානය දක්වා සිදු කර ඇති සමුච්චිත කාර්යයන්: රු. මිලියන 397.04

සම්පූර්ණ කරන ලද වැඩ අයිතම
- මීටර් 8 ක වානේ පාලම් 02
- මීටර් 4 ක වානේ පාලම
- වැව හෑරීම සහ සෑදීම
- වෙළඳපළ ප්‍රදේශයේ ජල අපවහන කාර්යයන්
- වෙළඳපළ ප්‍රදේශයේ පිරවීමේ කාර්යයන්
- වෙළඳපළ ප්‍රදේශයේ බෑවුමේ කළුගල් ඇතිරීමේ කාර්යයන්
- වෙළඳපළ ප්‍රදේශයේ බෑවුම කොන්ක්‍රීට් කිරීමේ සහ පඩිපෙළ කොන්ක්‍රීට් කිරීමේ කාර්යයන්
- කුඹහ බෝක්කු 06ක් ඉදිකිරීම
- යෝජිත ළමා උද්‍යාන ප්‍රදේශය සඳහා ක්‍රීඩා උපකරණ සැපයීම සහ ස්ථාපනය කිරීම
- දිර්ඝ කළ බෝක්කුවක් ඉදිකිරීම
- ඇවිදීමේ මංතීරුව සැකසීම

ඉතිරි වැඩ අයිතම
- වැවේ හෑරීම් කටයුතු සඳහා නැවත යොමු වීම
- 2024.02.01 දින UDA විසින් අලුතින් යෝජිත කාණු ඉදිකිරීම









### 3. කෙරවලපිටියේ IIHS සඳහා යෝජිත විශ්වවිද්‍යාල මණ්ඩපය අසල වැලිඔය ඇළ මාර්ගය සහ ඇළ ඉවුරු සංවර්ධනය කිරීම

සේවාදායකයා : ජාත්‍යන්තර සෞඛ්‍ය විද්‍යා (පෞද්) සමාගම - IIHS
ආරම්භක දිනය : 21.08.2022
ව්‍යාපෘති තත්ත්වය : *ගෙවීම් ප්‍රමාද වීම හේතුවෙන් තාවකාලිකව අත්හිටුවා ඇත*
ඇස්තමේන්තු පිරිවැය : රු.මිලියන 79.77 (අවිනිශ්චිතතා සහ VAT හැර)
2023 දක්වා සිදු කර ඇති කාර්යයන් : රු.මිලියන 55.64

සම්පූර්ණ කරන ලද වැඩ අයිතම
- ඇළ මාර්ලය හෑරීම
- මතුපිට පිරිසිදු කිරීම
- ඇල ඉවුරු සකස් කිරීම
- බැම්මේ ඉහළ මට්ටම ඉහළ නැංවීම (මීටර් MSL + 1.55 දක්වා)

ඉතිරි වැඩ අයිතම
- බැම්මේ ඉහළ මට්ටම ඉහළ නැංවීම (මීටර් MSL + 1.8 m දක්වා)
- ඉරිගල් ආරක්ෂාව
- තණ පිඩලි ඇල්ලීම
- කරඳ ගස් සිටුවීම








### 4. ගම්පහ ප්‍රදේශයේ තෝරාගත් ඇළ මාර්ග හෑරීමේ සහ පිරිසිදු කිරීමේ කාර්යයන්

සේවාදායකයා : දිස්ත්‍රික් ලේකම් - ගම්පහ
ආරම්භක දිනය : 03.11.2022
ව්‍යාපෘති තත්ත්වය : 23.07.2023
ඇස්තමේන්තු පිරිවැය: රු. මිලියන 14.53 (අවිනිශ්චිතතා සහ VAT හැර)
2023 දෙසැම්බර් අවසානය දක්වා සිදු කර ඇති සමුච්චිත කාර්යයන් : රු. මිලියන 14.53

සම්පූර්ණ කරන ලද වැඩ අයිතම

ගම්පහ ප්‍රදේශයේ ඇළ මාර්ග 07ක් පිරිසිදු කිරීම

- ජරු ඇළ මාර්ගය (මීටර් 250)
- කළු කොටුව ඇළ මාර්ගය (මීටර් 650)
- කුණ්ඩි විල ඇළ මාර්ගය (මීටර් 1,360)
- කළු කොළ විල සම්බන්ධක ඇළ මාර්ගය (මීටර් 450)
- පල්ලෙවෙල දුම්රිය ස්ථානය අසල ඇළ මාර්ගය - ඉහළ ඇළ (මීටර් 2,100)
- හොරකදවිල ඇළ මාර්ගය (මීටර් 1,100)
- පල්ලෙවෙල දුම්රිය ස්ථානය අසල ඇළ මාර්ගය - පහළ ඇළ (මීටර් 410)










**5. භාණ්ඩ ප්‍රවාහනය සඳහා පහසුකම් සැලසීම සඳහා හැමිල්ටන් ඇළ පිටවාන ආසන්නයේ හෑරීමේ කාර්යයන්**

සේවාදායකයා : ලක්දනව් සමාගම

**අදියර I**

ආරම්භක දිනය : 08.11.2022
සම්පූර්ණ කළ දිනය : 21.02.2023

ඇස්තමේන්තුගත පිරිවැය : රු. මිලියන 21.69 (අවිනිශ්චිතතා සහ VAT හැර)
2023 දෙසැම්බර් අවසානය දක්වා සිදු කර ඇති සමුච්චිත කාර්යයන්: රු. මිලියන: 24.56
2023දෙසැම්බර් අවසානය දක්වා ලැබී ඇති සමුච්චිත ගෙවීම් රු. මිලියන: 24.56

සම්පූර්ණ කරන ලද වැඩ අයිතම

- හැමිල්ටන් ඇළ පිටවාන හෑරීමේ කාර්යයන්
- හාරන ලද ද්‍රව්‍ය කෙරවලපිටියට ප්‍රවාහනය කිරීම

**අදියර II**

ආරම්භක දිනය : 01.12.2023
සම්පූර්ණ කළ දිනය : 15.12.2023
ඇස්තමේන්තුගත පිරිවැය : රු. මිලියන 12.97 (අවිනිශ්චිතතා සහ VAT හැර)
2023 දෙසැම්බර් අවසානය දක්වා සිදු කර ඇති සමුච්චිත කාර්යයන්: රු. මිලියන: 6.47
2023දෙසැම්බර් අවසානය දක්වා ලැබී ඇති සමුච්චිත ගෙවීම් රු. මිලියන: 6.47

සම්පූර්ණ කරන ලද වැඩ අයිතම

- හැමිල්ටන් ඇළ පිටවාන හෑරීමේ කාර්යයන්
- හාරන ලද ද්‍රව්‍ය කෙරවලපිටියට ප්‍රවාහනය කිරීම

# වේරැස් ගඟ වැසි ජල අපවහන සහ පරිසරය වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය

1. **හැඳින්වීම**

කොළඹ සහ තදාසන්න නගරවල සිදු වන සීඝ්‍ර නාගරීකරණය හේතුවෙන් සැලසුම් නොකළ ඉඩම් ගොඩකිරීම් සහ ඇළ මාර්ග අනවසරයෙන් අත් පත් කර ගැනීම් ඉහළ ගොස් ඇත. සෑම වසරකම පාහේ වර්ෂා කාලයේදී නුගේගොඩ, රත්තනපිටිය, බොරලැස්ගමුව, පිළියන්දල සහ වේරහැර යන ප්‍රදේශවල ඇති වන දැවැන්ත ගංවතුර තත්ත්වය අත්විඳිමින් පවතී. ශ්‍රී ලංකා ඉඩම් සංවර්ධනය කිරීමේ සංස්ථාව (SLLDC) ජපන් අන්තර්ජාතික සහයෝගිතා නියෝජිතායතනයේ (JICA) සහාය ඇතිව කොළඹ පුරවර කලාපය සඳහා විස්තීර්ණ ප්‍රධාන අපවහන සැලැස්මක් සකස් කරන ලදී. අධ්‍යයනයේ නිර්දේශයන්ට අනුව, වේරැස් ගඟ වැසි ජල අපවහන හා පරිසර වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය 2011 වර්ෂයේදී දියත් කරන ලදී.

ඉහත සඳහන් ව්‍යාපෘතියේ ඉදිකිරීම් කාර්යයන් SLLDC විසින් ආරම්භ කිරීම සඳහා 2013 අගෝස්තු 30 වන දින අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබාගෙන ඇත. ප්‍රධාන ගංවතුර පාලන ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ හැකියාව ඇති එකම ආයතනය ලෙස ශ්‍රී ලංකා ඉඩම් සංවර්ධනය කිරීමේ සංස්ථාවට සම්පූර්ණ සැලසුම් කටයුතු සහ ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම හා ඉදිකිරීමට සිදු වී ඇත. මෙම ව්‍යාපෘතියේ සංශෝධිත ඇස්තමේන්තුගත පිරිවැය රු.මිලියන 11,050 කි.

**වේරැස් ගඟ වැසි ජල අපවහන සහ පරිසරය වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය යනු ගුරුත්වාකර්ෂණය යටතේ ගලා යන ගංවතුරෙන් තොර ඇළ මාර්ග පද්ධතියක් ගොඩනැගීම සඳහා දේශීය ඉංජිනේරු තාක්ෂණික විශේෂඥතාව භාවිතා කරන ජාතිය සඳහා වන ආයෝජනයකි.**

**ව්‍යාපෘතියේ නඩත්තු කටයුතු අඛණ්ඩව සිදු කෙරෙන අතර ව්‍යාපෘතියේ සම්පූර්ණ කරන ලද කොටස් වලින් මහජනතාව උපරිම ප්‍රතිලාභ භුක්ති විඳිති.**

## 2. ඇළ මාර්ග, වැව්, ඇවිදීමේ මංතීරු සහ රැඳවුම් ප්‍රදේශ නඩත්තු කිරීමේ කාර්යයන්

### 2.1 ඇළ මාර්ග නඩත්තු කිරීම

වේරැස් ගඟ ව්‍යාපෘතියේ ගංවතුර වැළැක්වීම සඳහා කිලෝමීටර් 30ක් පමණ දිග ඇළ මාර්ග (ප්‍රධාන, ද්විතීයික සහ තෘතීයික) ඇතුළත් සංවර්ධිත ජලාපවහන පද්ධතිය නඩත්තු කිරීමට ප්‍රමුඛත්වය ලබා දීම.



**2.1-1 කොන්ක්‍රීට් ඇළ මාර්ගය**
කොන්ක්‍රීට් ඇළ මාර්ගයේ මුළු දිග – ආසන්න වශයෙන් කි.මී.2.5



**2.1-2 කුඹහ කොන්ක්‍රීට් ඇළ මාර්ගය**
ඇළ මාර්ගයේ මුළු දිග – ආසන්න වශයෙන් කි.මී. 0.5





**2.1-3 ගේබියන් ඇළ මාර්ගය**
මුළු ගේබියන් දිග – ආසන්න වශයෙන් කි.මී. 3.5

### 2.2 වැව් නඩත්තු කිරීම

ව්‍යාපෘතිය යටතේ, ජල රැඳවුම් ධාරිතාව ඉහළ නැංවීම සඳහා දළ වශයෙන් හෙක්ටයාර් 40ක රැඳවුම් ප්‍රදේශ පොකුණු සහ වැව් ලෙස සංවර්ධනය කෙරේ.
ජලය රඳවා ගැනීමේ හැකියාව වැඩිදියුණු කරන අතරම, ඇවිදීමේ මංතීරු ළමා ක්‍රීඩා පෙදෙස, විවෘත ව්‍යායාම් ශාලාව ආදිය සමඟින් මහජනතාවගේ විනෝදාත්මක ක්‍රියාකාරකම් වැඩි දියුණු කරන ලදී.



**2.2-1 මානෙල් මාවත වැව**

- වැවේ මුළු වර්ගඵලය - ආසන්න වශයෙන් හෙක්. 0.5
- වැව් බැම්ම ඔස්සේ මාර්ගයේ දිග – ආසන්න වශයෙන් 0.5
- ද්විතියික ඇළ මාර්ගයේ දිග – ආසන්න වශයෙන් කි.මී.0.5
- හරිත දැලෙහි දිග – ආසන්න වශයෙන් කි.මී.0.5



**2.2-2 පැපිලියාන වැව**

- වැවේ මුළු වර්ගඵලය - ආසන්න වශයෙන් හෙක්. 2.0
- වැව් බැම්ම ඔස්සේ මාර්ගයේ දිග – ආසන්න වශයෙන් කි.මී.0.9
- ද්විතියික ඇළ මාර්ගයේ දිග – ආසන්න වශයෙන් කි.මී.1.2
- හරිත දැලෙහි දිග – ආසන්න වශයෙන් කි.මී.1.2



**2.2-3 වෙළ පාර වැව**

- වැවේ මුළු වර්ගඵලය – ආසන්න වශයෙන් හෙක්.1.1
- වැව් බැම්ම ඔස්සේ මාර්ගයේ දිග – ආසන්න වශයෙන් කි.මී.0.5
- ද්විතියික ඇළ මාර්ගයේ දිග – ආසන්න වශයෙන් කි.මී.0.5
- හරිත දැලෙහි දිග – ආසන්න වශයෙන් කි.මී.0.5



**2.2-4 වෙළ මාවත වැව**

- වැවේ මුළු වර්ගඵලය – ආසන්න වශයෙන් හෙක්.0.5
- වැව් බැම්ම ඔස්සේ මාර්ගයේ දිග – ආසන්න වශයෙන් කි.මී.0.6
- ද්විතියික ඇළ මාර්ගයේ දිග – ආසන්න වශයෙන් කි.මී.0.5
- හරිත දැලෙහි දිග – ආසන්න වශයෙන් කි.මී.0.5



**2.2-5 වේරහැර වැව**

- වැවේ මුළු වර්ගඵලය – ආසන්න වශයෙන් හෙක්. 2.0
- වැව් බැම්ම ඔස්සේ මාර්ගයේ දිග – 0.9 km
- ද්විතියික ඇළ මාර්ගයේ දිග – ආසන්න වශයෙන් කි.මී.1.0
- හරිත දැලෙහි දිග – ආසන්න වශයෙන් කි.මී.1.0



**2.2-6 රබර් වත්ත වැව**

- වැවේ මුළු වර්ගඵලය – ආසන්න වශයෙන් හෙක්.4.0
- වැව් බැම්ම ඔස්සේ මාර්ගයේ දිග – 2.0
- ද්විතියික ඇළ මාර්ගයේ දිග – ආසන්න වශයෙන් කි.මී.2.0
- හරිත දැලෙහි දිග – ආසන්න වශයෙන් කි.මී.2.0



**2.2-7 සූරියමල් මාවත වැව**

- වැවේ මුළු වර්ගඵලය – ආසන්න වශයෙන් හෙක්. 5.0c
- වැව් බැම්ම ඔස්සේ මාර්ගයේ දිග – 1.2
- ද්විතියික ඇළ මාර්ගයේ දිග – ආසන්න වශයෙන් කි.මී.1.0
- හරිත දැලෙහි දිග – ආසන්න වශයෙන් කි.මී.1.0

### 2.3 වගුරු බිම් නඩත්තු කිරීම

මුල් ව්‍යාපෘති සැලැස්මේ කොටසක් ලෙස, අත්පත් කරගත් වගුරු බිම් ඒවායේ ස්වාභාවික තත්ත්වය පවත්වා ගැනීමට සහ අත්පත් කර ගත් රඳවා ගැනීමේ ධාරිතාව ආරක්ෂා කර ගැනීම සඳහා ඉතා වැදගත් වේ. එබැවින්, ව්‍යාපෘතිය මගින් මහ ඇළ, බෙල්ලන්විල, පිල්ලෑව, කටුවාවල, නාවින්න, සුනේත්‍රාදේවි සහ වේරැස් ගඟ රැඳවුම් ප්‍රදේශ වල රැඳවුම් ධාරිතාව පවත්වාගෙන යයි.

ඊට අමතරව ජලය නිදහස්ව ගලායාම පවත්වා ගැනීම සඳහා පිටවැල්ල පාලම සහ කොස්පලාන පාලම අතර වේරැස් ගඟ වගුරු බිම (ආසන්න වශයෙන් හෙක්ටයාර 88) පිරිසිදු කිරීම අවශ්‍ය වූ විට සිදු කර ඇත.





**2.3-1** වේරැස් ගහ නඩත්තු කිරීම

# පර්යේෂණ සහ සැලසුම් අංශය

පර්යේෂණ සහ සැලසුම් (R&D) අංශය යනු SLLDC හි උපදේශන අංශයයි. මෙම අංශය ව්‍යුහාත්මක හා ජලාපවහන යන ඉංජිනේරු ඒකකය, ගෘහ නිර්මාණාත්මක ඒකකය, ප්‍රමාණ සමීක්ෂණ ඒකකය, ඉංජිනේරුමය ද්‍රව්‍ය පරීක්ෂණ රසායනාගාරය සහ මැනුම් ඒකකය යන ඒකකවලින් සමන්විත වන අතර සියලුම ඒකක එක්ව අංශයේ අරමුණු ඉටුකර ගැනීමට කටයුතු කරයි.

මූලික වශයෙන්, ඉංජිනේරු ඒකකය ජල විද්‍යාත්මක සහ ද්‍රාව විද්‍යාත්මක සැලසුම් සහ ව්‍යුහාත්මක සැලසුම් යන ක්ෂේත්‍රවල ඉංජිනේරු සේවා සපයයි. ගෘහ නිර්මාණාත්මක ඒකකය ගොඩනැගිලි ව්‍යාපෘති සහ භූමි අලංකරණ කටයුතු සඳහා ගෘහ නිර්මාණාත්මක සැලසුම් පිළිබඳ ඔවුන්ගේ ප්‍රවීණත්වය සපයන අතර අනෙකුත් අංශ විසින් මෙම ඒකක දෙක වෙත භාරදී ඇති ව්‍යාපෘති නිම කිරීමට අවශ්‍ය තාක්ෂණික සහාය ලබා දේ

## I. ඉංජිනේරු සහ ගෘහ නිර්මාණාත්මක අංශය

සාමාන්‍යයෙන් 2023 වර්ෂයේ සිදු කරන ලද කාර්යයන් පහත පරිදි වර්ගීකරණය කළ හැක.

1. සේවාදායක ව්‍යාපෘති
2. භාණ්ඩාගාර අරමුදල් ලැබූ ව්‍යාපෘති
3. ස්වයං ව්‍යාපෘති

1. සේවාදායක ව්‍යාපෘති

RDA, UDA සහ බස්නාහිර පළාතේ පළාත් පාලන ආයතන පර්යේෂණ සහ සංවර්ධන අංශයේ වැදගත්ම සේවාදායකයන් වේ .

RDA වෙතින් භාරගත් ව්‍යාපෘති

අධිවේගී මාර්ග ව්‍යාපෘති සඳහා ප්‍රධාන ජලාපවහන අධ්‍යයනය සිදු කිරීම සඳහා RDA විසින් SLLDC වෙත භාර දී තිබුණි. ඒ අනුව 2023 වර්ෂය තුළ පර්යේෂණ සහ සංවර්ධන අංශය විසින් යෝජිත රුවන්පුර අධිවේගී මාර්ග ව්‍යාපෘතිය සඳහා සහ මධ්‍යම අධිවේගී මාර්ග ව්‍යාපෘතිය සඳහා ජල විද්‍යාත්මක හා ද්‍රාව විද්‍යාත්මක අධ්‍යයනයන් සිදු කර ඇත.

**යෝජිත රුන්පුර අධිවේගී මාර්ග ව්‍යාපෘතිය**

රුවන්පුර අධිවේගී මාර්ගය සඳහා ජල විද්‍යාත්මක සහ ද්‍රාව විද්‍යාත්මක අධ්‍යයනය සිදුකිරීම පර්යේෂණ සහ සංවර්ධන අංශයට ප්‍රදානය කර ඇත. යෝජිත රුවන්පුර අධිවේගී මාර්ග ව්‍යාපෘතිය කහතුඩුවෙන් ආරම්භ වී ඉංගිරිය හරහා ගොස් රත්නපුර දිස්ත්‍රික්කයේ කහවත්තෙන් අවසන් වේ. මාර්ගයේ සම්පූර්ණ දිග කිලෝමීටර 77 ක් පමණ වේ. රූප සටහන 01 හි දැක්වෙන පරිදි ව්‍යාපෘතිය කොටස් 3 කින් සමන්විත වේ. අධ්‍යයනය සඳහා වන මුළු උපදේශන ගාස්තුව 2023 වර්ෂය දක්වා රු.මිලියන 31කි. මේ වන විට I කොටසේ සැලසුම්වලින් 60%ක් නිම කර ඇති අතර I කොටසේ සහ II කොටසේ EIA වාර්තාව අවසන් කර ඇත.




රූපය 01: රුවන්පුර අධිවේගී මාර්ග ව්‍යාපෘතිය සඳහා යෝජිත අනුරේඛය

**යෝජිත මධ්‍යම අධිවේගී මාර්ග ව්‍යාපෘතිය**

යෝජිත මධ්‍යම අධිවේගී මාර්ග ව්‍යාපෘතිය සඳහා ජල විද්‍යාත්මක හා ද්‍රාව විද්‍යාත්මක අධ්‍යයනය පර්යේෂණ හා සැලසුම් අංශයට ප්‍රදානය කර ඇත. අධිවේගී මාර්ගය කඩවතින් ආරම්භ වී කුරුණෑගල නගරය හරහා ගොස් 02 රූපයෙහි දැක්වෙන පරිදි දඹුල්ලෙන් අවසන් වේ. අධිවේගී මාර්ගයේ මුළු දිග කිලෝමීටර් 185 ක් පමණ වේ. අධ්‍යයනය සඳහා මුළු උපදේශන ගාස්තුව රු. මිලියන 62.5 කි

ප්‍රධාන ජල විද්‍යාත්මක හා ද්‍රාව විද්‍යාත්මක අධ්‍යයනය 2015 වසරට පෙර අවසන් කර ඇත. 2023 වර්ෂයේදී, 01 වැනි කොටසේ සහ 03 වැනි කොටසේ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ අදියරේදී උපදේශන සේවා සැපයීම සඳහා SLLDC වෙතින් ඉල්ලා සිටින ලදී. R&D අංශය සාර්ථකව අවශ්‍ය සේවා සපයන ලදී.




රූපය 02: **මධ්‍යම අධිවේගී මාර්ග ව්‍යාපෘතිය යෝජිත අනුරේඛය**

**කුරුණෑගල යෝජිත මහහැරයෑමේ මාර්ගය**

කුරුණෑගල නගරය ආශ්‍රිතව පවතින රථවාහන තදබදය මගහරවා ගැනීම සඳහා මහහැරයෑමේ මාර්ගයක් ඉදිකිරීමට මාර්ග සංවර්ධන අධිකාරිය විසින් සැලසුම් කරන ලදී. යෝජිත මහහැරයෑමේ මාර්ගයේ දිග කිලෝමීටර 3.5 ක් පමණ වේ. මහහැරයෑමේ මාර්ගය සඳහා යෝජිත අනුරේඛය 03 රූපයෙහි දැක්වේ. RDA වෙත හරස් ජලාපවහන අවශ්‍යතා සැපයීම SLLDC කාර්යය විය.




03 රූපය: කුරුණෑගල මහහැරයෑමේ මාර්ගය සඳහා යෝජිත අනුරේඛය

- වෙනත් ආයතන

**මහනගර සභාව – මීනුවන්ගොඩ**

නාගරික සංවර්ධන අධිකාරිය (UDA) මීනුවන්ගොඩ නගරය සඳහා ප්‍රධාන සංවර්ධන යෝජනාවක් සකස් කර ඇත. උස් බිමක් නොමැතිවීම හේතුවෙන් සතිපොළට යාබදව පිහිටි කුඹුරු යාය සංවර්ධනය කිරීමට නාගරික සංවර්ධන අධිකාරිය සැලසුම් කරන ලදී. ඉහත සංවර්ධනය සඳහා ජලාපවහන සහ ගොඩකිරීමේ සැලැස්ම සකස් කිරීම SLLDC විසින් සිදු කරනු ලැබේ. ඒ අනුව SLLDC විසින් විස්තීර්ණ ජලාපවහන අධ්‍යයනයක් සිදු කර ව්‍යාපෘතිය සඳහා සවිස්තරාත්මක ජලාපවහන සැලැස්මක් සකස් කරන ලදී. අධ්‍යයනය සඳහා උපදේශන ගාස්තුව මිලියන 2.2 කි (VAT හැර)



රූපය 04: මීනුවන්ගොඩ නගර සංවර්ධන ව්‍යාපෘතියේ ව්‍යාපෘති ප්‍රදේශය

**ලංවිම ව්‍යාපෘති**

- **කටුකිතුල්ඔය දුම්රිය බෝක්කුවේ සහ ඉහළ කොත්මලේ විදුලි බලාගාරයේ සම්බන්ධිත ඇළ මාර්ගවලම රොන්මඩ ඉවත් කිරීම**

ඉහත ව්‍යාපෘතියේ ප්‍රධාන විෂය පථය වූයේ දුම්රිය බෝක්කුව, බෝක්කු පොකුණ සහ ප්‍රධාන පොකුණේ කොටසක් රොන්මඩ ඉවත් කිරීමයි. පර්යේෂණ සහ සංවර්ධන අංශය එම ස්ථානය පරීක්ෂා කර ව්‍යාපෘතිය පිරියත හා යන්ත්‍රෝපකරණ අංශය (P&E) සමඟ එක්ව සිදු කර ඇත. 2023 වර්ෂයේ සිදු කරන ලද කාර්යයන්වල මුළු වටිනාකම රු. මිලියන 35 කි.





රූපය 05: රොන්මඩ ඉවත් කිරීමේ ප්‍රගතිය

## 2. භාණ්ඩාගාර අරමුදල් ලැබූ ව්‍යාපෘති

**පිළියන්දල මහහැරයැමේ මාර්ගය සඳහා ජල අපවහන සහ පරිසර වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය**

පිළියන්දල නගරය කොළඹ පරිපාලන බල ප්‍රදේශයට තදාසන්නව පිහිටා ඇත. එබැවින් එය සංවර්ධනය සඳහා ඉහළ පීඩනයක් ලබා ගනී. පවතින නගරය දැනටමත් තදබදයෙන් යුක්ත වේ. එබැවින් අතහැර දැමූ කුඹුරු ඉඩමක් සංවර්ධනය කර බස් නැවතුම්පොළ, සති පොළ ආදිය එම ස්ථානයට ගෙන යමින් නගරය පුළුල් කිරීමට නාගරික සංවර්ධන අධිකාරිය විසින් යෝජනා කර ඇත. කොළඹ/හොරණ මාර්ගයේ වාහන තදබදය වළක්වා දකුණු අධිවේගී මාර්ගයට පහසුවෙන් ප්‍රවේශ වීම සඳහා ජාලියගොඩ සිට කැස්බෑව හන්දිය දක්වා මහහැරයැමේ මාර්ගයක් දැනටමත් ඉදිකර ඇත. 2023 වර්ෂය සඳහා භාණ්ඩාගාර ප්‍රතිපාදනය රු. මිලියන 0.4 කි. එම ප්‍රතිපාදනය මඟින් ආවරණය කරන ලද ප්‍රධාන කාර්යයන් පහත පරිදි වේ.

- මීටර් 3.5 පළල කොන්ක්‍රීට් කාණු ඉදිකිරීම
- අත්පත් කරගත් ඉඩමේ දැනට පවතින ඇළ මාර්ගය හෑරීම සහ පිරිසිදු කිරීම
- සවිස්තරාත්මක සැලසුම්



රූපය 06: පිළියන්දල ව්‍යාපෘතිය සඳහා පිරිසැලසුම් සැලැස්ම

**ජල මට්ටම් සහ විසර්ජන මැනුම් ව්‍යාපෘතිය**

ගංවතුර අවම කිරීමේ යෝජනා සකස් කිරීම සඳහා ප්‍රධාන ජලාපවහන අධ්‍යයනයන් සිදු කිරීම පර්යේෂණ සහ සංවර්ධන අංශයේ එක් ප්‍රධාන කාර්යයකි. ප්‍රධාන ජලාපවහන අධ්‍යයනය ජලාශ, වැව් සහ ප්‍රධාන ඇළ මාර්ගවල පවතින තත්ත්වය සහ හැසිරීම මත පදනම් වේ. ජල මට්ටම සහ විසර්ජන මිනුම් ජල අපවහන අධ්‍යයනයේදී භාවිතා කළ යුතු ඉතා වැදගත් පරාමිතීන් වේ.

දැනට, SLLDC විසින් ජල මට්ටම් කියවීම් එකතු කිරීම සඳහා පහත සඳහන් ද්‍රෝණි 7ක් තුළ ස්ථාන 126ක් හඳුනාගෙන ඇත.,

- බොල්ගොඩ ද්‍රෝණිය
- ජා-ඇල ද්‍රෝණිය
- මුදුන් ඇළ ද්‍රෝණිය
- කළු ඔය ද්‍රෝණිය
- මහ කොළඹ ද්‍රෝණිය
- කොළොන්නාව ද්‍රෝණිය
- බරවා ද්‍රෝණිය

2023 වර්ෂය සඳහා භාණ්ඩාගාර ප්‍රතිපාදනය රු. මිලියන 3කි.





රූපය 07: ජල මට්ටම් මිනුම් ස්ථාපනය කිරීම

**මුදුන් ඇළ ජල අපවහන හා පරිසරය වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතියේ සවිස්තර ජලාපවහන අධ්‍යයනය**

මුදුන් ඇළ ද්‍රෝණිය කැලණිය සහ බියගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ අතර පිහිටි ඉතා පැතලි හා පහත් ජල පෝෂක ප්‍රදේශයකි. එහි පහත් ස්වභාවය නිසා එය බොහෝ විට ගංවතුරට ලක් වේ. මෙය අගනුවර වන කොළඹට ආසන්නයේ පිහිටි ඉතා නාගරීකරණය වූ ප්‍රදේශයකි. එබැවින් මහජනතාවට සිදුවන අපහසුතාවයන් වැළැක්වීම සඳහා ගංවතුර අවම කිරීමට SLLDC සැලසුම් කර ඇත.




රූපය 08: පැලියගොඩ මුදුන් ඇළ උප ද්‍රෝණියේ ව්‍යාපෘති ප්‍රදේශය

මෙම අධ්‍යයනයේදී සලකා බලන ලද සැලසුම් ප්‍රතිලාභ කාලය වසර 25 කි. MIKE 11 මත පදනම් වූ ගංවතුර ආකෘතියක් සංවර්ධනය කරන ලද අතර විවිධ ගංවතුර අවම කිරීමේ අවස්ථා පරීක්ෂා කිරීමේ ප්‍රධාන මෙවලම ලෙස භාවිතා කරන ලදී. ව්‍යාපෘති ප්‍රදේශය පහත රූපය 09 හි දැක්වේ. 2023 වර්ෂය සඳහා භාණ්ඩාගාර ප්‍රතිපාදන රු. මිලියන 7.108 කි.

**බිඳුණු ඇළ ජල අපවහන වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය**

බිඳුණු ඇළ අවට සැලසුම් රහිත සංවර්ධනය හා නාගරීකරණය මෝසම් කාලය තුළ අවට ප්‍රදේශය නිතර ගංවතුර ඇතිවීමට හේතු වී ඇත. ඒ අනුව කළුතර දිස්ත්‍රික් ලේකම් කාර්යාලයෙන් කරන ලද ඉල්ලීමකට අනුව SLLDC විසින් කළුතර දිස්ත්‍රික්කය සඳහා ගංවතුර අවම කිරීමේ යෝජනාවක් සකස් කිරීමට කටයුතු කර ඇත. ගංවතුර අවම කරමින් වී වගාව යථා තත්ත්වයට පත් කිරීම සඳහා බිඳුණු ඇළ ප්‍රතිසංස්කරණය කර ප්‍රදේශයේ සමාජ-ආර්ථික තත්ත්වය නඟා සිටුවීම ව්‍යාපෘතියේ ප්‍රධාන අරමුණ වේ.




රූපය 09: බිඳුණු ඇළ ජලාපවහන වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය සඳහා පිරිසැලසුම් සැලැස්ම

**බස්නාහිර පළාතේ ස්ථානීය ජල අපවහන ගැටලු විසඳීම සඳහා ජල අපවහන සැලසුම් සකස් කිරීම**

ගංවතුර අවදානම අවම කිරීම සඳහා දත්ත රැස් කිරීම, සමීක්ෂණ කාර්යයන් සහ කොළඹ සහ පිටත ප්‍රදේශ සඳහා ප්‍රධාන ජලාපවහන සැලසුම් සකස් කිරීම සිදු කර ඇත. ප්‍රධාන ජලාපවහන යෝජනා 14ක් අවසන් කර ඇති අතර යෝජනා 6ක් ක්‍රියාත්මක වෙමින් පවතී.

| අංකය | විස්තරය | සටහන් |
|---|---|---|
| 1 | බොරලැස්ගමුව ප්‍රදේශයේ ස්ථානීය ගංවතුර ගැටලු | සම්පූර්ණ කර ඇත |
| 2 | සරණ ඇළ මාර්ගයේ ජලාපවහන සැලැස්ම | සම්පූර්ණ කර ඇත |
| 3 | ආරක්ෂක මූලස්ථාන ව්‍යාපෘතිය යටතේ කිංහදෙණිය වැව හෑරීම | සම්පූර්ණ කර ඇත |
| 4 | බොරලැස්ගමුව ජලාපවහනය වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය | සම්පූර්ණ කර ඇත |
| 5 | කොළඹ 8 රිජ්වේ ගොල්ෆ් ලින්ක් හි පර්යන්ත ඇළ ප්‍රතිසංස්කරණය කිරීම | සම්පූර්ණ කර ඇත |
| 6 | පැලියගොඩ දුටුගැමුණු වීදියේ ස්ථානීය ජලාපවහන ගැටලුව | සම්පූර්ණ කර ඇත |
| 7 | කටාන - කොණ්ඩගම්මුල්ල ප්‍රාථමික විද්‍යාලයේ ජලාපවහන ගැටලුව | සම්පූර්ණ කර ඇත |
| 8 | රාජසිංහ මාවතේ ගංවතුර ගැටලුව සඳහා වැසි ජල අපවහන යෝජනාව | සම්පූර්ණ කර ඇත |
| 9 | ඉඹුල්ගොඩ, රණගල පාර ස්ථානීය ජලාපවහන ගැටලුව | සම්පූර්ණ කර ඇත |
| 10 | සුමිතුරු උයන ප්‍රාදේශීය ජලාපවහන ගැටලුව - ගම්පහ | සම්පූර්ණ කර ඇත |
| 11 | පානදුර - ගල්පොත්ත මාර්ගයේ ගංවතුර ගැටලුව | සිදු කරමින් පවතී |
| 12 | කල්දෙරම්මඩුවත්ත ජලාපවහන සැලැස්ම | සිදු කරමින් පවතී |
| 13 | කම්බොක්කාව මාර්ගයේ ජලාපවහන සැලැස්ම - මිල්ලනිය | සම්පූර්ණ කර ඇත |
| 14 | අළුබෝමුල්ල සඳහා ජලාපවහන යෝජනාව | සම්පූර්ණ කර ඇත |
| 15 | එම්පයර් ලැන්ඩ් සඳහා ජලාපවහන යෝජනාව - පානදුර | සම්පූර්ණ කර ඇත |
| 16 | මාර්ග පද්ධතිය වැඩිදියුණු කිරීම - බුත්තල නගරය | සම්පූර්ණ කර ඇත |
| 17 | පුත්තලම ප්‍රදේශයේ ගංවතුර ගැටලුව | සිදු කරමින් පවතී |
| 18 | මාතර ගන්දර ගංවතුර ගැටලුව | සිදු කරමින් පවතී |
| 19 | කුරුණෑගල රෝහල ඉදිරිපිට වගුරු බිම් සංවර්ධනය | සිදු කරමින් පවතී |
| 20 | මාතර - දික්වැල්ල ප්‍රදේශයේ ස්ථානීය ගංවතුර ගැටලු | සිදු කරමින් පවතී |

## 3. ස්වයං ව්‍යාපෘති

අපගේ ඉදිකිරීම් කටයුතුවල ප්‍රමිතීන් තිරසරව පවත්වා ගැනීම සඳහා ව්‍යුහාත්මක, වාස්තු විද්‍යාත්මක, ජලාපවහන සැලසුම් සහ ප්‍රසම්පාදන ලේඛන මගින් පර්යේෂණ හා සැලසුම් අංශය සංස්ථාවේ අභ්‍යන්තර අංශ වෙත විශේෂඥ දැනුම ලබා දෙයි. 2023 වර්ෂය තුළ ව්‍යාපෘති කිහිපයක් භාර ගන්නා ලදී.

- **නුවරඑළිය සංචාරක බංගලාව අළුත්වැඩියා කිරීම**

දැනට පවතින තනි මහල් සංචාරක බංගලාව යල් පැන ගිය සහ ඌන ප්‍රයෝජිත වන අතර එය නිවාඩු කාලවලදී අමුත්තන්ගේ ඉහළ ඉල්ලුමකට ලක් නොවේ. එබැවින් දැනට පවතින මෙම ගොඩනැගිල්ලේ කාමර ධාරිතාව උපරිම කිරීමට, අලුත්වැඩියා කිරීමට සහ වැඩිදියුණු කිරීමට යෝජනා කර ඇත. එම ඉලක්කය සපුරා ගැනීම සඳහා පවතින ව්‍යුහයේ සම්පූර්ණ ප්‍රතිසංස්කරණය සිදු කර ඇත. තවද, හානියට පත් කොටස් වැඩිදියුණු කිරීම සහ අවශ්‍ය පරිදි යල් පැන ගිය ව්‍යුහයන් ඉවත් කිරීම සිදු කළ යුතු වේ.



රූපය 10: නුවරඑළිය සංචාරක බංගලාව අළුත්වැඩියා කිරීමේ ප්‍රගතිය

- **තෙත්බිම් අනවසරයෙන් අත්පත් කර ගැනීම වැළැක්වීමේ ව්‍යාපෘතිය – අදියර I – ගොතටුව ප්‍රදේශය**

ගංවතුර රඳවා ගැනීමේ අරමුණු සඳහා නඩත්තු කිරීම සහ කළමනාකරණය කිරීම සඳහා මෙම වගුරු බිම් සංස්ථාවට පවරා ඇති බැවින් ගොතටුව තෙත්බිම අනවසරයෙන් අත්පත් කර ගැනීමෙන් ආරක්ෂා කිරීමට SLLDC බොහෝ උත්සාහයන් ගෙන ඇත. ගොතටුව තෙත් බිම් ප්‍රදේශය සීඝ්‍රයෙන් නාගරීකරණය වීම හේතුවෙන් සෑම විටම අනවසරයෙන් අත්පත් කර ගැනීමට ලක් වූ ප්‍රධාන තෙත් බිම් වලින් එකකි. උපාය මාර්ගයක් ලෙස වාසස්ථාන ආරක්ෂා කර ගැනීම සඳහා ගොතටුව තෙත් බිම වටා පරිධියේ ඇළ මාර්ගයක් ඉදිකරන ලද අතර, එය යම් සාධනීය ප්‍රතිඵල ඇති කළත් අනවසරයෙන් අත්පත් කර ගැනීම් නැවැත්වීමට ප්‍රමාණවත් නොවීය. මෙය අනවසරයෙන් අත්පත් කර ගැනීම නැවැත්වීම සඳහා ඵලදායී උපාය මාර්ගයක් ලෙස හඳුනාගෙන ඇත.

මෙම උපායමාර්ගය තවදුරටත් ශක්තිමත් කිරීම සඳහා, නාගරික තෙත්බිම් සඳහා ඥානවන්ත භාවිත සංකල්පය ප්‍රවර්ධනය කරන අතරම, SLLDC මේ වනවිට ගොතටුව තෙත් බිම තෙත්බිම් උද්‍යානයක් බවට පත් කිරීමට සැලසුම් කරමින් සිටී. වගුරු බිමේ පරිධියේ සම්පූර්ණ දිග මීටර් 4000 කි. පළමු අදියර ලෙස, ඇවිදීමේ මාර්ගය නිම කිරීම සඳහා කිලෝමීටර 1.8 ක වට ප්‍රමාණයේ කවයක් තෝරා ගන්නා ලදී.




රූපය 11: යෝජිත පාපැදි මංතීරුව

- **අත්තිඩිය EMT පරීක්ෂණාගාරය සඳහා යෝජිත අලුත්වැඩියා කිරීම**

දැනට පවතින ගොඩනැගිල්ල බිම් මහල සහ ටෙරසය ඇතුළුව තට්ටු තුනකින් සමන්විත වේ. අනාගත අපේක්ෂාවන් සඳහා විභව පුළුල් කිරීමක් හෝ සංවර්ධනය කිරීමක් පෙන්නුම් කරමින් දෙවන මහලේ රසායනික පරීක්ෂණාගාරයක් ඉදිකිරීමට යෝජනා කරන ලදී.



රූපය12: සම්පූර්ණ කරන ලද වැඩපොළ පහසුකම් ගොඩනැගිල්ල

### I. ඉංජිනේරුමය ද්‍රව්‍ය පරීක්ෂා කිරීමේ පරීක්ෂණාගාරය

EMT රසායනාගාරය පස්, කොන්ක්‍රීට්, එක්රැස් වීම් සහ ජලය, අපජලය, රොන් මඩ, අවසාදිත ආදී ද්‍රව්‍ය සඳහා විවිධ පරීක්ෂණ සිදු කරයි. භ්‍රමණ (දෙවුම් මිහිවිදුමන), පිරිගැටුම හෝ අතින් විදීමේ (hand auguring) ශිල්පීය ක්‍රම භාවිතයෙන් මිහිවිදුමන විමර්ශන සිදු කෙරේ. EMT රසායනාගාරය සතුව YWE D45 භ්‍රමණ විදුම් යන්ත්‍රයක් සහ DANDO 2000 පිරිගැටුම් විදුම් යන්ත්‍රයක් ඇත. ICP-MS සහ මයික්‍රෝවේව් ඩයිජෙස්ටරය මගින් රසායනාගාරයේ විෂය පථය සහ ශක්තිය පුළුල් කරමින් ජලය, අපජලය, අවසාදිත, රොන් මඩ ආදියෙහි බැර ලෝහ විශ්ලේෂණ රාශියක් පරීක්ෂා කිරීමට පරීක්ෂණාගාරයට ඉඩ සලසයි.

EMT පරීක්ෂණාගාරය 2023 දී රු. මිලියන 43 ක ආදායමක් උපයා ඇත. එය 2023 දී SLLDC විසින් සිදු කරන ලද ව්‍යාපෘති රාශියකට සහාය වී ඇති අතර ඉන් කිහිපයක් පහත සඳහන් කර ඇත

- GCFC සහ EI ව්‍යාපෘතිය
- දියවන්නා ජලාශයේ ජල තත්ත්ව අධීක්ෂණය
- බෙරේ වැවේ ජල තත්ත්ව අධීක්ෂණය

- • හැමිල්ටන් ඇළ සහ අවට ඇළ මාර්ගවල ජල තත්ත්ව අධීක්ෂණය
- • ඔලියමුල්ල පොම්පාගාර ව්‍යාපෘතිය
- • කෙරවලපිටියේ IIHS බහුවිධ ව්‍යාපෘතිය යෝජිත සංවර්ධනය
- • මොරටුව - රත්මලාන ප්‍රදේශයේ වැසි ජල අපවහන අධ්‍යයනය
- • මීගහවත්ත පාරේ යෝජිත මීටර් 15 පළල පාලම්
- • මුදුන් ඇළ වැසි ජල අපවහන වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය
- • සූරියමල් මාවත බහුකාර්ය ගෘහස්ථ ක්‍රීඩා මධ්‍යස්ථානය

තවද, EMT රසායනාගාරය SLS 1397:2010 අනුව අංශු ප්‍රමාණය ව්‍යාප්තිය, ජලයේ ද්‍රාව්‍ය ක්ලෝරයිඩ් අන්තර්ගතය සහ අම්ල ද්‍රාව්‍ය කවච අන්තර්ගතය අධීක්ෂණය කිරීම මඟින් SLLDC විසින් නිෂ්පාදනය කරනු ලබන අක්වෙරළ වැලිවල ගුණාත්මකභාවය අධීක්ෂණය කරයි.

## II. ප්‍රමාණ සමීක්ෂණ අංශය

පහත සඳහන් කර ඇති ආකාරයේ ව්‍යාපෘතිවල පෙර කොන්ත්‍රාත් සහ පසු කොන්ත්‍රාත් ක්‍රියාකාරකම් මෙම අංශය මඟින් සිදු කරයි

- ගොඩනැගිලි සහ සිවිල් ඉංජිනේරු ව්‍යාපෘතිවල සියලුම ඉදිකිරීම්වල ප්‍රමාණයන් ලබා ගැනීම
- SLLDC විසින් සිදු කරනු ලබන ව්‍යාපෘති සඳහා ඇස්තමේන්තු සකස් කිරීම
- සංස්ථාව වෙත ඉදිකිරීම්, ගොඩකිරීම් සහ ජලාපවහන ආශ්‍රිත කාර්යයන් ලබා ගැනීම සඳහා විවෘත ටෙන්ඩර් සඳහා ලංසු තැබීමේ ක්‍රියාවලියට සහභාගී වීම.
- SLLDC විසින් සිදු කරන ලද ව්‍යාපෘතිවල අතුරු තක්සේරු කිරීම් සහ අවසාන ඇගයීම් සකස් කිරීම
- ටෙන්ඩර්කරුවන් සහ කොන්ත්‍රාත්කරුවන්ගේ පිරිවැය සකස් කිරීම, සාකච්ඡා කිරීම සහ විශ්ලේෂණය කිරීම
- කොන්ත්‍රාත් ලේඛන සකස් කිරීම
- විචලන ඇණවුම් සකස් කිරීම
- හිමිකම් සකස් කිරීම
- ද්‍රව්‍ය අවශ්‍යතා සකස් කිරීම
- ටෙන්ඩර් ලේඛන සකස් කිරීම
- ලංසුකරුගේ පූර්ව සුදුසුකම් ඇගයීම
- ටෙන්ඩර් ඇගයීම
- ටෙන්ඩර්කරුවන් සහ කොන්ත්‍රාත්කරුවන්ගේ පිරිවැය සකස් කිරීම, සාකච්ඡා කිරීම සහ විශ්ලේෂණය කිරීම
- පෙර ලංසු රැස්වීම් සහ ලංසු විවෘත කිරීමේ රැස්වීම් සඳහා සහභාගී වීම
- නිරන්තර වැඩපොළ පරිශ්‍රය සංචාර සිදු කිරීම
- කොන්ත්‍රාත්කරුගේ අතුරු සහ අවසාන ගෙවීම් සහතික පරීක්ෂා කිරීම සහ සහතික කිරීම
- කොන්ත්‍රාත්කරුගේ විචලන සහ හිමිකම් පරීක්ෂා කිරීම සහ සහතික කිරීම
- සේවාලාභීන්, උපදේශකයින් සහ කොන්ත්‍රාත්කරුවන් සමඟ මිල ගණන් සාකච්ඡා කිරීම
- ව්‍යාපෘති සම්බන්ධ රැස්වීම් සඳහා සහභාගී වීම
- කොන්ත්‍රාත් ලේඛන සකස් කිරීම

මෙම අංශය 2023 වර්ෂයේදී SLLDC විසින් සිදු කරන ලද ප්‍රධාන ව්‍යාපෘති සඳහා සේවා සපයන ලදී. තවද, ඉදිකිරීම් අංශය, ජලාපවහන සහ ගොඩකිරීමේ අංශය, යන්ත්‍රෝපකරණ සහ උපකරණ අංශය, තෙත්බිම් කළමනාකරණ අංශය සහ සැලසුම් සහ ව්‍යාපාර සංවර්ධන අංශයේ හැරීම්, ගොඩකිරීම්, ජලාපවහන සහ ඉදිකිරීම් කාර්යයන් සඳහා ප්‍රමාණ සමීක්ෂණ සේවා සපයන ලදී.

බාහිර හා අභ්‍යන්තර ව්‍යාපෘති සඳහා සපයන ලද ප්‍රමාණ සමීක්ෂණ සේවාවන්හි මුළු වටිනාකම රු. මිලියන 182 කි.

# තෙත්බිම් කළමනාකරණ අංශය

තෙත්බිම් කළමනාකරණ අංශය ස්ථාපිත කිරීම මඟින් විශේෂයෙන් ගංවතුර අවම කිරීමේ ක්‍රියාකාරකම්වලදී ස්වභාවික සම්පත් සංරක්ෂණය සහ උපාය මාර්ගික භාවිතය පිළිබඳ වගකීමක් දරයි.

ඒ අනුව තෙත්බිම් කළමනාකරණ අංශය කෙටි කාලීන, මධ්‍ය කාලීන සහ දිගු කාලීන සැලසුම් අනුව වාර්ෂික වැඩසටහන සකස් කරයි.

2023 වර්ෂයේදී තෙත්බිම් කළමනාකරණ අංශය දැනටමත් ආරම්භ කර ඇති වැඩසටහන මෙන්ම අංශයේ අයවැය ප්‍රතිපාදන අනුව අලුතින් හඳුනාගත් ව්‍යාපෘති ද අඛණ්ඩව පවත්වාගෙන යයි.

පසුගිය වසර කිහිපයක කාලය තුළ අපද්‍රව්‍ය ප්‍රධාන පාරිසරික ගැටලුවක් බවට පත් වී ඇති බැවින් එම අංශයය යටතේ කසළ කළමනාකරණ ඒකකයක් ස්ථාපිත කිරීමට තීරණය විය.

අප 2023 වර්ෂයේ නියමිත වැඩ සටහන් සියල්ලම පාහේ සාර්ථකව සාක්ෂාත් කර ගෙන ඇති අතර විස්තරාත්මකව විස්තර පහත දක්වා ඇත.

### දියසරු උද්‍යානය

ශ්‍රී ලංකාවේ පරිපාලන අගනුවර වන ශ්‍රී ජයවර්ධනපුර නගර මධ්‍යයේ පිහිටා ඇති දියසරු උද්‍යානය අක්කර 60ක් පුරා විහිදී ඇති විප්ලවීය නාගරික තෙත්බිම් මධ්‍යස්ථානයක් ලෙස පවතී. කාර්යබහුල නාගරික භූ දර්ශනය මධ්‍යයේ, මෙම අභයභූමිය නිස්කලංක වටපිටාවක් සපයන අතර, එහි ඇති විවිධ තෙත්බිම් වාසස්ථානවල සැරිසැරීමට අමුත්තන්ට ආරාධනා කරයි. ශ්‍රී ලංකා ඉඩම් සංවර්ධනය කිරීමේ සංස්ථාව මඟින් පාලනය වන දියසරු උද්‍යානය නාගරික තෙත්බිම් සංරක්ෂණය සඳහා ප්‍රදීපාගාරයක් ලෙස ක්‍රියා කරන අතර, එහි දැක්ම, මෙහෙවර සහ අරමුණු වන ජීවීන් සමඟ මානව පැවැත්ම සමගාමී කිරීමේ පෙළගස්වයි.
පාර්ලිමේන්තුවට සමීපව පිහිටා ඇති දියසරු උද්‍යානය වගුරු බිම්, ගංවතුරට ලක් වූ වනාන්තර, වැව් සහ පොකුණු ඇතුළු විවිධ තෙත්බිම් පරිසර පද්ධති වලින් සමන්විත වේ. උද්‍යානයේ උපයා මාර්ගික පිහිටීම, තෙත්බිම් සංරක්ෂණය පිළිබඳ අධ්‍යාපනය සහ දැනුවත් කිරීම සඳහා වේදිකාවක් සපයන අතරම, නාගරික ජීවිතයේ අවිවේකී තත්ත්වයෙන් මිදීමට ඉඩ සලසයි.
දියසරු උද්‍යානය නාගරික තෙත්බිම් සංරක්ෂණයේ ඉදිරියෙන්ම සිටින අතර, මෙම තීරණාත්මක පරිසර පද්ධති ආරක්ෂා කිරීම සහ සංරක්ෂණය කිරීම සඳහා විවිධ වැඩසටහන් ක්‍රියාත්මක කරයි. උද්‍යානයේ කළමනාකාරීත්වය මිනිස් ක්‍රියාකාරකම් සහ වනජීවීන් අතර සියුම් සමතුලිතතාවයක් පවත්වා ගැනීමට කැපවී සිටී. සංරක්ෂණ ප්‍රයත්නයන්ට වාසස්ථාන ප්‍රතිසංස්කරණය, ජල තත්ත්ව අධීක්ෂණය සහ තිරසර සංවර්ධන භාවිතයන් ඇතුළත් වේ.
දියසරු උද්‍යානය සන්නිවේදනය, අධ්‍යාපනය, සහභාගීත්වය සහ දැනුවත් කිරීමේ (CEPA) ක්‍රියාකාරකම්වල සක්‍රීයව නිරත වේ. තෙත්බිම් පරිසර පද්ධති සඳහා වගකීම සහ අගය කිරීම පිළිබඳ හැඟීමක් ඇති කරමින්, මෙම ක්‍රියාකාරකම් සෑම වයස් කාණ්ඩයකම පුද්ගලයන් සඳහා පහසුකම් සපයයි.

### 2023 වර්ෂයෙදී සිදු කරන ලද ප්‍රධාන ක්‍රියාකාරකම්



- අධ්‍යාපනික වැඩසටහන් - දියසරු උද්‍යානය පාසල් සහ විද්‍යාල ඉලක්ක කර ගනිමින් අධ්‍යාපනික වැඩසටහන් පවත්වන අතර, තෙත්බිම් පරිසර පද්ධති, ජෛව විවිධත්වය සහ සංරක්ෂණයේ වැදගත්කම පිළිබඳව සිසුන්ට අවබෝධයක් ලබා දේ.

- ප්‍රජා සහභාගීත්වය - උද්‍යානය විවිධ වැඩමුළු, සම්මන්ත්‍රණ සහ ස්වේච්ඡා වැඩසටහන් හරහා ප්‍රජා සහභාගීත්වය දිරිමත් කරයි. මෙමඟින් නාගරික තෙත් බිම් සංරක්ෂණය කිරීම සම්බන්ධයෙන් ප්‍රදේශවාසීන් අතර හිමිකාරිත්වය සහ වගකීම පිළිබඳ හැඟීමක් ඇති කරයි.

- දැනුම්වත් කිරීමේ ව්‍යාපාර - දියසරු උද්‍යානය තෙත්බිම් සංරක්ෂණය සහ තිරසර භාවිතයන් පිළිබඳ තොරතුරු බෙදා හැරීම සඳහා සමාජ මාධ්‍ය, සිදුවීම් සහ හවුල්කාරිත්වයන් උපයෝගී කර ගනිමින් පුළුල් ප්‍රේක්ෂක පිරිසක් වෙත ළඟා වීමට දැනුවත් කිරීමේ ව්‍යාපාර සංවිධානය කරයි. 2023 වර්ෂයේදී අධ්‍යාපනික වැඩසටහන්, වැඩමුළු, සම්මන්ත්‍රණ සහ ස්වේච්ඡා වැඩසටහන් 56ක් පවත්වා ඇත. මේස දින දර්ශනය මුද්‍රණය කිරීම 2023 වසරේ සිදු කරන ලද වඩාත්ම උද්යෝගිමත් ක්‍රියාකාරකමක් විය. එහි දියසරු උද්‍යානයේ කැපී පෙනෙන ස්ථාන ඡායාරූප ඇතුළත් වන අතර ස්වභාව සංරක්ෂණයට අදාළ සියලුම සමරු දිනයන් එක් එක් පිටුවෙහි සඳහන් කර ඇත.

දියසරු උද්‍යානය නාගරික තෙත්බිම් සංරක්ෂණය සඳහා ආදර්ශයක් වන අතර, සියුම් පරිසර පද්ධති සංරක්ෂණය කිරීම සමඟ මානව ක්‍රියාකාරකම් සාර්ථක ලෙස ඒකාබද්ධ කිරීම ප්‍රදර්ශනය කරයි. එහි දූරදර්ශී ප්‍රවේශය, අධ්‍යාපනය සඳහා ඇති කැපවීම සහ ක්‍රියාකාරී ප්‍රජා සහභාගීත්වය තුළින් උද්‍යානය ස්වභාවධර්මයට ආදරය කරන්නන්ට තෝතැන්නක් සපයනවා පමණක් නොව, නාගරික තෙත් බිම් ආරක්ෂා කිරීම සම්බන්ධයෙන් දැනුවත් කිරීම සහ වගකීම පිළිබඳ හැඟීමක් ඇති කිරීම සඳහා ප්‍රධාන කාර්යභාරයක් ඉටු කරයි. එහි සාර්ථකත්වයට සාක්ෂියක් ලෙස, දියසරු උද්‍යානය නාගරික අවකාශයන්ට ස්වභාවධර්මය සමග සුසංයෝගීව පැවතිය හැකි ආකාරය පිළිබඳ දීප්තිමත් උදාහරණයක් ලෙස පවතී.
මෙම නාගරික ස්වභාවික උද්‍යානය දේශීය ජනතාවට පමණක් නොව විදේශීය ජාතිකයන්ටද නිරාවරණය වේ. 2023 වර්ෂය තුළ විදේශීය ජාතිකයන් 411 ක් සහ දේශීය වැසියන් 61,046 ක් මෙම ස්ථානයට පැමිණ ඇත.

එසේම 2023 වසරේ මංගල රූගත කිරීම් 1541ක්, උපන්දින රූගත කිරීම් 992ක්, මොස්තර නිරූපණ රූගත කිරීම් 05ක්, පෙර රූගත කිරීම් 150ක්, ගර්භනී රූගත කිරීම් 24ක්, ටෙලිනාට්‍ය රූගත කිරීම් 05ක්, රූපවාහිනී සහ යූ ටියුබ් වැඩසටහන් 08ක් සහ පවුලේ රූගත කිරීම් 03ක් එම ස්ථානයේ සිදු කර ඇති අතර එමඟින් සැලකිය යුතු ආදායමක් උපයාගෙන ඇත. මෙම වටිනා ස්වභාවික පරිසර පද්ධතියේ ප්‍රමිතිය සංරක්ෂණය කිරීම හා පවත්වාගෙන යාම සඳහා භාණ්ඩාගාර ප්‍රතිපාදන යටතේ රු. මිලියන 33ක් වියදම් කර ඇත.

### බේරේ වැවෙහි ජල තත්ත්වය අධීක්ෂණය කිරීම සහ වැඩිදියුණු කිරීම



බහුවිධ භාවිතයන් සඳහා ඓතිහාසික වශයෙන් වැදගත් වන බේරේ වැව වසර ගණනාවක් පුරා දූෂණයට සහ හායනයට ලක්ව ඇත. ශ්‍රී ලංකා ඉඩම් සංවර්ධන සංස්ථාව (SLLDC), අනෙකුත් රජයේ පාර්ශ්වකරුවන් සමඟ එක්ව, 2012 වසරේ සිට වැවේ ජලයේ

ගුණාත්මකභාවය යථා තත්ත්වයට පත් කිරීම සඳහා පුළුල් ප්‍රවේශයක අවශ්‍යතාවය පිළිගනී.



SLLDC විසින් මසකට දෙවරක් පරීක්ෂණ පවත්වමින් තෝරාගත් ස්ථාන 34 ක බේරේ වැවේ ජල තත්ත්වය සක්‍රියව අධීක්ෂණය කරමින් සිටී. තක්සේරු කරන ලද පරාමිතිවලට වැවේ තත්ත්වය අවබෝධ කර ගැනීම සහ දූෂණ ප්‍රභවයන් හඳුනා ගැනීම සඳහා තීරණාත්මක විවිධ දර්ශක ඇතුළත් වේ. මේ අතර වැවේ දූෂිත ප්‍රදේශ ශාක භාවිතා කර පිරිසිදු කිරීම පිතල ශාක (phytoremediation) සඳහා බේරේ වැවට පාවෙන පිරිපහදු තෙත්බිම් (FTW) හඳුන්වා දෙන ලදී. කෙසේ වෙතත්, අධික දූෂක බර සහ සයිටොටොක්සින් සමුච්චය වීම හේතුවෙන් බේරේ වැවට අධික ලෙස දූෂණය වීම හේතුවෙන් මෙම ප්‍රවේශයේ සාර්ථකත්වයේ සීමාවක් පවතී.

එබැවින් නැනෝ බුබුළු වාතනය සහ නැනෝ කාබන් බාධකය ඇතුළත් අති නවීන ජපන් තාක්ෂණයක් හඳුන්වාදීම සඳහා Grepo PTE Ltd සමඟ සහයෝගයෙන් Grepo ලංකා බයෝසයන්ස් (පෞද්.) සමාගමෙ හි යෝජනාව SLLDC විසින් පිළිගනු ලැබීය. නැනෝ බුබුළු වාතනය, ජලජීවී වගාව සහ අපජල පවිත්‍රකරණය වැනි විවිධ යෙදුම්වල කාර්යක්ෂමතාව සඳහා ප්‍රසිද්ධියක් උසුලන අතර, බේරේ වැවේ ජල තත්ත්වය ඉහළ නැංවීම සඳහා යොදා ගනු ලැබේ.

නැනෝ බුබුළු වාතනය

- නැනෝමීටර 100 ට වඩා අඩු විෂ්කම්භයක් සහිත නැනෝ බුබුළු, සාම්ප්‍රදායික ක්‍රමවලට සාපේක්ෂව ඉහළ ඔක්සිජන් හුවමාරු කාර්යක්ෂමතාවයක් සපයයි.
- ඔක්සිජන් ද්‍රාවණය කිරීමය, පෝෂ්‍ය පදාර්ථ රැගෙන යාම සහ අපජල පිරිපහදු කිරීමේදී කාබනික ද්‍රව්‍ය බිඳහෙළීම වැඩිදියුණු කිරීම සඳහා ඵලදායී වේ.
- ඇල්ගී වර්ධනය සහ ආශ්‍රිත ගන්ධයන් අඩු කරමින් සවායු ක්ෂුද්‍ර ජීවීන්ගේ වර්ධනය වේගවත් කරයි

නැනෝ කාබන් බාධකය

- ව්‍යාධිජනක අක්‍රිය කිරීම සඳහා ප්‍රතික්‍රියාශීලී ඔක්සිජන් විශේෂ සෑදීම ප්‍රවර්ධනය කිරීම මඟින් නැනෝ කාබන් බාධකය, නැනෝ බුබුළු වාතනය සම්පූර්ණ කරයි.
- රසායනික ද්‍රව්‍ය සහ ආකලන ඒකාකාරව බෙදා හැරීම සහතික කරමින් ජලය මිශ්‍ර වීම වැඩි දියුණු කරයි.

දූෂණයට එරෙහිව සටන් කිරීම සඳහා නැනෝ බුබුළු වාතන උපාංග 40ක් උපාය මාර්ගිකව බේරේ වැව තුළ නිශ්චිත ස්ථානවල තැන්පත් කෙරේ. ජලයේ පැහැදිලි බව වැඩි දියුණු කිරීම සහ හානිකර සයනොබැක්ටීරියා ව්‍යාප්තිය අවම කිරීම ව්‍යාපෘතියේ අරමුණ වේ. නිත්‍ය අධීක්ෂණය මගින් ප්‍රගතිය තක්සේරු කරනු ලබන අතර, ලබා ගන්නා ප්‍රතිලාභ සඳහා කාබන් බැර ක්‍රමය යටතේ හිමිකම් කියනු ඇත.
බේරේ වැවේ ජලයේ ගුණාත්මක භාවය වැඩි දියුණු කිරීම සඳහා ජපන් තාක්ෂණය අනුගමනය කිරීම මෙම වැදගත් ජලාශය ප්‍රතිෂ්ඨාපනය කිරීමේ වැදගත් පියවරක් සනිටුහන් කරයි. ශ්‍රී ලංකා ඉඩම් සංවර්ධන සංස්ථාව සියලු පාර්ශ්වකරුවන් සමඟ සහයෝගිත්වයෙන් ව්‍යාපෘතියේ ප්‍රගතිය අධීක්ෂණය කිරීමට සහ ව්‍යාපෘතියේ අරමුණු සාක්ෂාත් කර ගැනීමට කැපවී සිටී. මෙම ප්‍රයත්නයේ සාර්ථකත්වය සෞඛ්‍ය සම්පන්න බේරේ වැවක් සහතික කරනවා පමණක් නොව පාරිසරික තිරසාරභාවයට දායක වන අතර අනාගත ජල ප්‍රතිසංස්කරණ ව්‍යාපෘති සඳහා පූර්වාදර්ශයක් සපයයි.

2023 වර්ෂයේදී අවශ්‍ය අනුමැතිය සහ මූලික උපකරණ ස්ථාපිත කිරීම ඇතුළුව සූදානම් කිරීමේ කටයුතු අවසන් කරන ලදී.

**කොළොන්නාව වැසි ජල අපවහන හා පරිසරය වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය (KSWD&EIP)**

ව්‍යාපෘති ප්‍රදේශය වර්ග කි.මී 17ක් වන අතර කොළඹ දිස්ත්‍රික්කයේ කොලොන්නාව ප්‍රාදේශීය ලේකම් බලප්‍රදේශය තුළ කොලොන්නාව නගර සභාව සහ කොටිකාවත්ත-මුල්ලේරියාව ප්‍රාදේශීය සභාව ලෙස පළාත් පාලන ආයතන දෙකක විෂය පථයට අයත් වේ. ග්‍රාම නිලධාරී වසම් 25ක් සම්පූර්ණයෙන් සහ ග්‍රාම නිලධාරී වසම් 10ක් අර්ධ වශයෙන් ව්‍යාපෘතිය යටතේ ආවරණය වේ. ව්‍යාපෘති ප්‍රදේශය තුළ 2012 වසරේ ජනගහනය පවුල් 40,125 ක පුද්ගලයන් 191,687 කි.




භූගෝලීය වශයෙන්, ව්‍යාපෘති ප්‍රදේශය කැලණි ගඟේ වම් ඉවුර ගංවතුර තැනිතලාවේ පිහිටා ඇති අතර කැලණි ගඟේ ගංවතුරෙන් කොළඹ නගරය ආරක්ෂා කිරීම සඳහා භාවඩ් ගංවතුර බැම්ම ඉදිකිරීමේ සිට කැලණි ගඟ ගොඩගැලීමෙන් ඇති වන ගංවතුරට එරෙහිව අනාරක්ෂිත ප්‍රදේශයක් ලෙස හඳුනාගෙන ඇත. පසුගිය දශක දෙක තුන තුළ ව්‍යාපෘති ප්‍රදේශය සැලසුම් රහිතව නාගරීකරණය වී ඇති අතර මේ වනවිට එය සංවර්ධිත ප්‍රදේශයක් ලෙස හඳුනාගත හැකිය.





ව්‍යාපෘති ප්‍රදේශය නිරන්තර අභ්‍යන්තර ගංවතුරට ඉතා අවදානමට ලක්වන අතර වරින් වර ඇති වන ගොඩබිම් ගංවතුර කැලණි ගඟේ සුළු ගංවතුර තත්ත්වයෙන් ආරක්ෂා වී ඇත. (වාරිමාර්ග දෙපාර්තමේන්තුව විසින් වර්ග කර ඇති පරිදි නාගලගම් වීදියේ ජල මට්ටම් මාපකයේ ගංගා ජල මට්ටම 5 m MSL යනු සුළු ගංවතුර මට්ටමයි)

කිත්තම්පහුව, සැළලිහිණි මාවත සහ දඹුතොට යන වැසි ජල අපවහන ඇළ මාර්ග පද්ධති තුනක් නම් කරන ලද ව්‍යාපෘති ප්‍රදේශයේ ඇති අතර ඒවා වැසි ජලය කැලණි ගඟට බැහැර කරයි. ජල රැඳවුම් ධාරිතාව ප්‍රමාණවත් නොවීම, අඩු ගලා යෑමේ ධාරිතාව සහ සැලසුම් නොකළ සංවර්ධනය සහ ජල රැඳවුම් ප්‍රදේශ, ඇළ මාර්ග හා ඇළ මාර්ග රක්ෂිතයන් අනවසරයෙන් අත්පත් කර ගැනීම හේතුවෙන් පවතින ජලාපවහන ඇළ මාර්ගවල ජලය බැස යෑමට බාධා ඇති වීම හේතුවෙන් ව්‍යාපෘති ප්‍රදේශය අභ්‍යන්තර ගංවතුරෙන් බලපෑමට ලක් වේ. SDG1, SDG9, SDG11, SDG13, SDG14 සහ SDG15 යන තිරසර සංවර්ධන ඉලක්ක සාක්ෂාත් කර ගැනීම සඳහා කොලොන්නාව ජලාපවහන ද්‍රෝණියේ නිරන්තර අභ්‍යන්තර ගංවතුර අවම කිරීම සඳහා O&M මාර්ග සමඟ ඇළ මාර්ග වැඩිදියුණු කිරීමේ ව්‍යුහාත්මක පියවර, පවතින හරස් මාර්ග ව්‍යුහයන් පුළුල් කිරීම, රඳවා තබා ගැනීමේ /රැඳවුම් පොකුණු නිර්මාණය කිරීම සහ පොම්පාගාර ස්ථාපිත කිරීමට  යෝජනා කෙරේ.













මෙම ව්‍යාපෘතිය 2018 දී ආරම්භ කරන ලද අතර 2022 දක්වා රු. මිලියන 581.97 ක වටිනාකමකින් යුත් ශක්‍යතා අධ්‍යයනය, සවිස්තරාත්මක ඉංජිනේරු සැලසුම් (දහම්වෙල ඇළ, පස්සන් ඇළ, සැළලිහිණි මාවත ඇළ), දැනට පවතින බෝක්කු 08 ක් පුළුල් කිරීම, මීටර් 650 ක් දිගින් යුත් ඇළ මාර්ග වැඩිදියුණු කිරීම, රැඳවුම් පොකුණ 01ක් නිර්මාණය කිරීම සහ ඇළ මාර්ග නඩත්තු කිරීම වැනි කාර්යයන් සම්පූර්ණ කර ඇත. 2023 වර්ෂයේදී රු. මිලියන 264.79 ක වටිනාකමකින් යුත් ද්විතීයික ඇළ සවිස්තරාත්මක ඉංජිනේරු සැලසුම් සකස් කිරීම, දඹුතොට ඇළ පද්ධතිය, ඇළ මාර්ග නඩත්තු කිරීමේ කාර්යයන්, බෝක්කු 03ක්  පුළුල් කිරීම, රැඳවුම් පොකුණ 01ක් සහ ඉඩම් අත්පත් කර ගැනීම සඳහා භූගෝලීය මැනුම් කාර්යයන් සිදු කරන ලදී.

ඇස්තමේන්තුගත ව්‍යාපෘති පිරිවැය රු. මිලියන 8300 ක් වන අතර එය භාණ්ඩාගාර අරමුදල් මඟින් සපයනු ඇත. ශක්‍යතා අධ්‍යයනය, සවිස්තරාත්මක ඉංජිනේරු සැලසුම් සහ ව්‍යාපෘති කළමනාකරණය, ඉඩම් අත්පත් කර ගැනීම සහ වන්දි ගෙවීම, ක්‍රියාත්මක කිරීම සහ මෙහෙයුම් කාර්යයන් සහ නඩත්තු කාර්යයන් මෙම ඇස්තමේන්තුවට ඇතුළත් වේ.

2023 වර්ෂය තුළ රටේ ආර්ථික අර්බුදය හේතුවෙන් ව්‍යාපෘති ප්‍රතිපාදන ප්‍රමාණවත් නොවූ අතර අත්‍යාවශ්‍ය කටයුතු ප්‍රථමයෙන් හඳුනා ගැනීමට තීරණය කර මුදල් ප්‍රතිපාදන සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබා ගන්නා ලදී. ඒ අනුව ව්‍යාපෘති කාලය 2027 දක්වා දීර්ඝ කිරීමට අමාත්‍ය මණ්ඩල අනුමැතිය හිමි වූ අතර 2024 වසර සඳහා අවශ්‍ය ප්‍රතිපාදන (රු. මිලියන 300) ප්‍රදානය කර ඇත.

**ශ්‍රී ලංකා ඉඩම් සංවර්ධනය කිරීමේ සංස්ථාව විසින් කළමනාකරණය කරනු ලබන කෙරවලපිටිය කසල කළමනාකරණ අංගනය**

අපද්‍රව්‍ය ජනනය වන පළාත් පාලන ආයතන (කොළඹ සහ උප නාගරික ප්‍රදේශය) සඳහා මධ්‍ය කාලීන විසඳුමක් ලෙස ශ්‍රී ලංකා ඉඩම් සංවර්ධනය කිරීමේ සංස්ථාව විසින් කෙරවලපිටිය කසල කළමනාකරණ  අංගනය (KWP) යෝජිත ප්‍රදේශයේ කොම්පෝස්ට් නිෂ්පාදන මධ්‍යස්ථානයක් 2017 ජුනි 1 වන දින සිට ආරම්භ කර ඇත. කොම්පෝස්ට් බලාගාරයේ ආරම්භක ධාරිතාව දිනකට මෙට්‍රික් ටොන් 100 කි. මෙම ව්‍යාපෘතියේ ප්‍රධාන අරමුණ මීතොටමුල්ල කුණු කන්ද කඩාවැටීමෙන් පසු විවෘත කසළ බැහැර කිරීමෙන් පරිසරයට සිදුවන හානිය අවම කිරීමයි. නීතිය බලාත්මක කිරීම සහ දැනුම්වත් කිරීම තුළින් ව්‍යාපෘතිය ආරම්භ කර මාස 9ක් ඇතුළත නාගරික ඝන අපද්‍රව්‍යවල (MSW) 100% ප්‍රභව වෙන් කිරීමක් ලබා ගැනීමට

ව්‍යාපෘතිය සමත් වී ඇත. මෙම ව්‍යාපෘතියේ ආරම්භක අදියරේදී KWP වෙත අපද්‍රව්‍ය මෙට්‍රික් ටොන් 750ක් ලැබී ඇති අතර දිරායන අපද්‍රව්‍ය මෙට්‍රික් ටොන් 550ක් කොම්පෝස්ට් කර දිරාපත් නොවන අපද්‍රව්‍ය මෙට්‍රික් ටොන් 200ක් ගබඩා කර ඇත. ලැබෙන මුළු කසල ප්‍රමාණය සකස් කිරීමට පවතින පහසුකම් ප්‍රමාණවත් නොවිණි. එබැවින් KWP හි නව පෙරන යන්ත්‍රයක් හඳුන්වාදීමෙන් කොම්පෝස්ට් නිෂ්පාදන ධාරිතාව වැඩි කිරීමට පියවර ගන්නා ලදී. හිතකර කාලගුණික තත්ත්වයන් යටතේ වර්තමාන දෛනික කොම්පෝස්ට් නිෂ්පාදනය මෙට්‍රික් ටොන් 30ක් පමණ වන අතර සම්පූර්ණ කොම්පෝස්ට් ප්‍රමාණයම විවෘත වෙළඳපොළට නිකුත් කෙරේ.

මේ වනවිට කෙරවලපිටියේ අපද්‍රව්‍ය මඟින් බලශක්තිය උත්පාදනය කිරීමේ ව්‍යාපෘතිය ආරම්භ කිරීම හේතුවෙන් දිනකට පැමිණෙන අපද්‍රව්‍ය ප්‍රමාණය මෙ.ටොන් 150 කි.

KWP - 2023 සම්බන්ධ වැදගත් විස්තර

- ලැබුණු මුළු අපද්‍රව්‍ය ප්‍රමාණය - මෙ.ටොන් 52,576.33
- සම්පූර්ණ කොම්පෝස්ට් අලෙවිය - මෙ.ටොන් 225.00
- අපද්‍රව්‍ය භාර ගැනීමෙන් ලද මුළු ආදායම - රු. 94,627,116.00
- කොම්පෝස්ට් අලෙවියෙන් ලද මුළු ආදායම - රු. 3,676,295.00

KWP කොම්පෝස්ට් පහසුකම කිරුම් පාලම්, 80 x 45 $m^2$ කොන්ක්‍රීට් තට්ටුව, වින්ඩ්‍රො ටර්නර්, කොම්පෝස්ට් පෙරන යන්ත්‍ර 3 කින්, ලෝන්ග් ආම් එක්ස්කැවේටර් යන්ත්‍ර 02 කින්, ෂෝර්ට් ආම් එක්ස්කැවේටර් යන්ත්‍ර 02 කින්, රෝද 06 ටිපර් රථ 02කින්, රෝද හතරේ ට්‍රැක්ටරයකින්, බැකෝ ලෝඩරය සහ ස්කිඩ් ස්ටියර් යන්ත්‍රයකින් සමන්විත වේ. වින්ඩෝ ටර්නර් යන්ත්‍රය මඟින් වාතනය කිරීමෙන් දිරාපත් වීමේ ක්‍රියාවලිය වැඩිදියුණු කිරීම හරහා කොම්පෝස්ට්වල ගුණාත්මකභාවය සහ අස්වැන්න වැඩිදියුණු කිරීම සිදු කරනු ලැබේ

කොම්පෝස්ට්වල ගුණාත්මක බව සහතික කිරීම සඳහා ප්‍රතීතනය ලත් රසායනාගාරවලින් වරින් වර කොම්පෝස්ට් තත්ත්ව පරීක්ෂාව සිදු කරනු ලැබේ. "මිහිජය" කොම්පෝස්ට් කෘෂිකාර්මික කටයුතු සඳහා යෝග්‍ය බව පරීක්ෂණ ප්‍රතිඵලවලින් තහවුරු විය. තවද, බැර ලෝහ අන්තර්ගතය ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය විසින් නිර්දේශ කර ඇති සම්මත උපරිම අවසර ලත් මට්ටමට වඩා බෙහෙවින් අඩු බව පරීක්ෂණ ප්‍රතිඵලයෙන් තහවුරු වී ඇත.

දිරාපත් නොවන අපද්‍රව්‍ය සඳහා විසඳුමක් ලබා දීම සඳහා පොලිතිලීන්, ප්ලාස්ටික් පයිරොලයිසිස් බලාගාරයක් පිහිටුවීම සඳහා SLLDC විසින් LOLC ඇඩ්වාන්ස් ටෙක්නොලොජීස් පෞද්. සමාගම වෙත අක්කර 4ක ඉඩමක් ලබා දී ඇත. LOLC විසින් දිනකට මෙට්‍රික් ටොන් 10ක සැකසුම් ධාරිතාවක් සහිත බලාගාරයක් පිහිටුවා ඇත. ඉදිරි වසරවලදී එය දිනකට මෙ.ටොන් 40 දක්වා වැඩි වනු ඇත.











**<u>තෙත්බිම් අනවසරයෙන් අත්පත් කරගැනීම වැළැක්වීමේ ව්‍යාපෘතිය - අදියර I – (ගොතටුව තෙත්බිම් උද්‍යානය)</u>**

**හැඳින්වීම**




1990 ගණන් වලදී, ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව අවට වගුරු බිම් අක්කර දහසක් (කුඹුරු ඇතුළුව) මහ කොළඹ ගංවතුර පාලනය සහ පරිසරය වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය යටතේ ජලය රඳවා තබා ගැනීමේ ප්‍රදේශ ලෙස පවත්වාගෙන යාමට රජය විසින් අත්පත් කර ගන්නා ලදී. පසුව මෙම අත්පත් කරගත් ඉඩම් ගංවතුර රඳවා තබා ගැනීමේ ප්‍රදේශ ලෙස පවත්වාගෙන යාම සඳහා ශ්‍රී ලංකා ඉඩම් සංවර්ධනය කිරීමේ සංස්ථාවට (SLLDC) පවරා දෙන ලදී. කෙසේ වෙතත්, කාලයත් සමඟ අනවසර ගොඩකිරීම් සහ අත්පත් කර ගැනීම් හේතුවෙන් අත්පත් කරගත් භූමි ප්‍රමාණය අඩු වී ඇති බව අනාවරණය විය. එබැවින් ඉතිරිව ඇති ගංවතුර රැඳවුම් ප්‍රදේශ ආරක්ෂා කිරීම සඳහා විසඳුමක් ලෙස අත්පත් කරගත් ඉඩම් සඳහා මායිම් නැවත විවෘත කිරීමේ ව්‍යාපෘතිය 2013 දී SLLDC විසින් ආරම්භ කරන ලදී. කොළඹ තෙත්බිම් සංකීර්ණය තුළ, ගොතටුව තෙත් බිම වැදගත් ගංවතුර රැඳවුම් ප්‍රදේශයක් ලෙස හඳුනාගෙන ඇති අතර, අනවසර අත්පත් කර ගැනීම්වලින් දැඩි තර්ජනයට ලක්ව ඇති ප්‍රධාන තෙත් බිම් කැබැල්ලක් බැවින්, මායිම් නැවත විවෘත කිරීම සහ මායිම් කණු ඉදිකිරීම ඉහළ ප්‍රමුඛතාවයකින් සිදු කර 2016 වර්ෂයේදී නිම කරන ලදී.

මෙම වගුරු බිම් ගංවතුර රඳවා තබා ගැනීමේ අරමුණු සඳහා නඩත්තු කිරීමට සහ කළමනාකරණය කිරීමට ආයතනයට පවරා ඇති බැවින් ගොතටුව තෙත්බිම අනවසර අත්පත් කර ගැනීම්වලින් ආරක්ෂා කිරීමට SLLDC බොහෝ උත්සාහයන් ගෙන ඇත. මෙම තෙත් බිමේ බොහෝ ප්‍රදේශ මීට පෙර ප්‍රධාන වශයෙන් සක්‍රිය කුඹුරු වූ අතර එය කොළඹ වැසියන් තෙත් බිම් හා සම්බන්ධ වූ සාම්ප්‍රදායික ක්‍රමය විය. කෙසේ වෙතත්, ඉඩම් අත්පත් කර ගැනීමත් සමඟ මෙම සම්බන්ධතාවය සම්පූර්ණයෙන්ම අවුල් වූ අතර, කොළඹ තෙත් බිම්වලින් මිනිසුන් වෙන් විය. කාලයාගේ ඇවෑමෙන් මිනිසුන් තෙත් බිම් ආක්‍රමණය කිරීමට උත්සාහ කළ අතර ගොතටුව තෙත් බිම් ප්‍රදේශය සීඝ්‍ර නාගරීකරණය හේතුවෙන් නිරන්තරයෙන් අනවසරයෙන් අත්පත් කර ගැනීමට ලක් වූ ප්‍රධාන තෙත් බිම්වලින් එකකි. උපාය මාර්ගයක් ලෙස වාසස්ථාන ආරක්ෂා කර ගැනීම සඳහා ගොතටුව තෙත් බිම වටා පරිධියේ ඇළ මාර්ගයක් ඉදිකරන ලද අතර, එය යම් සාධනීය ප්‍රතිඵල ඇති කළත් අනවසර අත්පත් කර ගැනීම් නැවැත්වීමට ප්‍රමාණවත් නොවීය. තෙත් බිම පොදු ස්ථානයක් බවට පත් කිරීමේ උපක්‍රමයක් ලෙස තෙත් බිම වටා කිලෝමීටර් 4ක මුළු දිග පර්යන්ත මාර්ගයක් ඉදිකිරීම මෙහි ප්‍රතිඵලයක් විය. නාගරික තෙත්බිම් සහ මිනිසුන් අතර ගිලිහී ගිය සම්බන්ධය ඔවුන් නැවත තෙත් බිමට ගෙන ඒම තුළින් නැවත ගොඩ නැගීම මෙහි අරමුණ විය. මෙය අනවසරයෙන් අත්පත් කර ගැනීම් නැවැත්වීම සඳහා ඵලදායී උපාය මාර්ගයක් ලෙස හඳුනාගෙන ඇත. මෙම උපායමාර්ගය තවදුරටත් ශක්තිමත් කිරීම සඳහා, නාගරික තෙත්බිම් සඳහා ඥානවන්ත භාවිත සංකල්පය ප්‍රවර්ධනය කරන අතරම, SLLDC මේ වනවිට ගොතටුව තෙත්බිම තෙත්බිම් උද්‍යානයක් බවට පත් කිරීමට සැලසුම් කරයි.

පළමු අදියර ලෙස, ඇවිදීමේ මාර්ගය නිම කිරීම සඳහා කිලෝමීටර 1.8 ක වට ප්‍රමාණයේ කවයක් තෝරා ගන්නා ලදී. 2023 වර්ෂයේදී පැති කාණු ඇතුළුව කිලෝමීටර් 1.8ක මුළු දිගින් කි.මී. 1ක් සම්පූර්ණ කරන ලදී. රට තුළ පවතින වත්මන් මූල්‍ය අර්බුදය හමුවේ තෙත් බිම සංරක්ෂණය කරමින් අන්‍යෝන්‍ය වශයෙන් වාසිදායක, ජයග්‍රාහී තත්ත්වයක් ඉලක්ක කර ගනිමින් මූල්‍ය ආධාර සඳහා පුද්ගලික සහ රාජ්‍ය හවුල්කාරිත්වයක් ලබා ගැනීමට තීරණය කර ඇත.









**කොළඹ ජල තත්ත්වය වැඩි දියුණු කිරීමේ වැඩසටහන**

ඉහළ යන ජනගහනය, සීමිත සම්පත් සහ දේශගුණික විපර්යාසවල වර්ධනය වන බලපෑම් හේතුවෙන් කොළඹ නගරය වැඩිවන පීඩනයකට මුහුණ දෙයි. ජල දූෂණය, නගරය තුළ සෞඛ්‍ය සම්පන්න සහ තිරසර ජීවන පරිසරයක් ඇති කිරීම සඳහා ඉක්මනින් විසඳිය යුතු ප්‍රධාන අභියෝගයකි.

SLLDC හට ඇළ මාර්ග පිළිබඳ අධිකරණ බලය ඇති අතර ඒවායේ සාමාන්‍ය නඩත්තුව, මූලික වශයෙන් වැසි ජලය බැස යෑම සහ දූෂණයෙන් තොර ජල මාර්ග නඩත්තු කිරීම සඳහා වගකීම දරයි. දූෂණයෙන් තොර ජල මාර්ග පවත්වා ගෙන යෑම සඳහා SLLDC විසින් දරන ලද සියලු උත්සාහයන් හමුවේ වුවද, කොළඹ ඇළ මාර්ග පද්ධතිය දූෂණය වී ඇත. කොළඹ පුරවර කලාපයේ (CMR) ජලාපවහන ජල පෝෂක ප්‍රමාණයෙන් 65% කට වඩා ප්‍රමාණයක ජලයේ තත්ත්වය නුසුදුසු මට්ටමේ සිට ඉතා නුසුදුසු මට්ටම දක්වා පරාසයක පවතින බව 2016 දී සිදු කරන ලද තෙත්බිම් කළමනාකරණ උපායමාර්ග (WMS) අධ්‍යයනයේ නිගමනය විය.

එබැවින්, වැඩිවන පරිසර දූෂණය සහ ඒ ආශ්‍රිත බලපෑම් අවම කිරීම සඳහා, කොළඹ පුරවර කලාපය සඳහා දිගුකාලීන තිරසර ජල තත්ත්ව කළමනාකරණ වැඩසටහනක් ක්‍රියාත්මක කිරීමේ අවශ්‍යතාවය හඳුනාගෙන ඇත.

ඒ අනුව, CWQM වැඩසටහන පියවර හයකින් සැලසුම් කර ක්‍රියාත්මක කර ඇත, එනම් (1) හවුල්කාරිත්වයන් ගොඩනැගීම, (2) ගැටලු හඳුනාගැනීම සඳහා කොළඹ ජල පෝෂක ප්‍රදේශය විදහා දැක්වීම (3) අභිමතාර්ථ සකස් කිරීම සහ ගැටලු හඳුනාගැනීම, (4) ක්‍රියාත්මක කිරීමේ වැඩසටහනක් සැලසුම් කිරීම, (5) සැලැස්ම ක්‍රියාත්මක කිරීම සහ, (6) ප්‍රගති සමාලෝචනය සහ ගැලපීම් සිදු කිරීම.

වැඩිවන ජනගහනය සහ නාගරීකරණය හේතුවෙන් පාර්ලිමේන්තු වැව ජල පෝෂක ප්‍රදේශය ද කාලයත් සමඟ විවිධ පාරිසරික, සමාජීය සහ ආර්ථික වෙනස්කම්වලට ලක්ව ඇත. කෙසේවෙතත්, 2016 දී තෙත්බිම් කළමනාකරණ උපායමාර්ගයේ දක්වා ඇති පරිදි, පාර්ලිමේන්තු වැවේ ජල පෝෂක ප්‍රදේශය "හොඳ" තත්ත්වයේ ජලය සහිත ලෙස වර්ගීකරණය කර ඇත. ජල පෝෂක ප්‍රදේශයේ ජල මාර්ග දූෂණය වීම මෑත අතීතයේ දී ප්‍රකට වූ එවැනි ගැටලුවකි.

2021 මාර්තු දෙවන සතියේදී පාර්ලිමේන්තු ජලාශයේ සහ ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත සහ බත්තරමුල්ල ආරක්ෂක අමාත්‍යාංශය මාර්ගය ඔස්සේ වැවට ගලා බසින සම්බන්ධිත ජල මාර්ගවල කහ-දුඹුරු පැහැති මණ්ඩියක් ලෙස දිස්වන ඇල්ගී පිපීම නිරීක්ෂණය විය. අනතුරුව, ශ්‍රී ලංකා ප්‍රජාතන්ත්‍රවාදී සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තු සංකීර්ණය අසලින් ගලා බසින දියවන්නා ඔය ආශ්‍රිත ජල මාර්ගවල පරිසර දූෂණය පාලනය කිරීම සහ ගුණාත්මක බව ඉහළ නැංවීම සඳහා කාර්ය සාධක බලකාය විසින් පාර්ලිමේන්තු වැව් පෝෂක ප්‍රදේශයේ ජලයේ ගුණාත්මක තත්ත්වය යථා තත්ත්වයට පත් කිරීම සඳහා කළමනාකරණ සැලැස්මක් සකස් කරන ලදී. SLLDC තාක්ෂණික සම්බන්ධීකාරක සහ කාර්ය සාධක බලකායේ සාමාජිකයෙකු ලෙස කළමනාකරණ සැලසුම් සකස් කිරීමේ ක්‍රියාවලියට සම්බන්ධ විය. කළමනාකරණ සැලැස්මට ඉලක්ක හතක්, අරමුණු සහ වගකීම් සමඟ ක්‍රියාකාරකම්, කාල නියමයක් සහ අවශ්‍ය සම්පත් ඇතුළත් විය. කළමනාකරණ සැලැස්මේ අරමුණු පහත පරිදි වේ;

අභිමතාර්ථය 1: ඇල්ගී ඇති වන වාර ගණන සහ තීව්‍රතාවය අඩු කිරීම
අභිමතාර්ථය 2: ජලාශයෙහි සෞන්දර්යාත්මක වටිනාකම සහ විනෝදාස්වාද විභවය වැඩිදියුණු කිරීම
අභිමතාර්ථය 3: සෞඛ්‍ය සම්පන්න සහ විවිධ ජලජ ජීව විද්‍යාත්මක ප්‍රජා ව්‍යුහයක් පවත්වා ගැනීම
අභිමතාර්ථය 4: ඉවුරු තීරය යථා තත්ත්වයට පත් කිරීම සහ ආරක්ෂා කිරීම
අභිමතාර්ථය 5: කළමනාකරණ සැලසුම් සහ ක්‍රියාවන් ක්‍රියාත්මක කිරීම සඳහා අරමුදල් ලබා ගැනීම සහ සම්පත් සංවර්ධනය කිරීම
අභිමතාර්ථය 6: පර්යේෂණ ප්‍රජාව, පෞද්ගලික අංශය සහ වෙනත් උනන්දුවක් දක්වන කණ්ඩායම්වල සහභාගීත්වය සහ දායකත්වය ප්‍රවර්ධනය කිරීම
අභිමතාර්ථය 7: කළමනාකරණ අරමුණු සහ උපාය මාර්ග සුදුසු පරිදි යාවත්කාලීන කිරීමට ප්‍රගතිය අධීක්ෂණය කිරීම

කළමනාකරණ සැලැස්මේ දක්වා ඇති ක්‍රියාකාරකම් කෙටි කාලීන, මධ්‍ය කාලීන සහ දිගු කාලීන වශයෙන් වර්ගීකරණය කර ඇති අතර SLLDC ඇතුළු සියලුම පාර්ශ්වකරුවන් විසින් මෙම ක්‍රියාකාරකම් ක්‍රියාත්මක කරනු ලැබේ. SLLDC 2023 වර්ෂයේදී පහත ක්‍රියාකාරකම් ආරම්භ කර ඇත.

පාවෙන පිරිපහදු තෙත් බිම්: පාවෙන පිරිපහදු තෙත් බිම (FTW) යනු අපජලය පිරිපහදු කිරීම සඳහා ඵලදායී සහ තිරසර තාක්ෂණයකි. කෘෂිකාර්මික අපජලය, වැසි ජලය සහ කාර්මික අපජලය ඇතුළු විවිධ දූෂිත ජලය පිරිපහදු කිරීම සඳහා එය පුළුල් ලෙස භාවිතා කර ඇත. 2022 වර්ෂයේදී, ශ්‍රී ලංකා යුද හමුදාවේ සහය ඇතිව SLLDC විසින් පාර්ලිමේන්තු ජලාශය 01 උප ජල පෝෂකයේ හඳුනාගත් ස්ථානවල පාවෙන ප්‍රතිකාර තෙත්බිම් 500 ක් තැන්පත් කරන ලදී. ජලාශය තුළ ජීව විද්‍යාත්මක පාලන ක්‍රම යටතේ FTW හි නඩත්තු කටයුතු 2023 දී ක්‍රියාත්මක කරන ලද සිදු කරන ලදී. (අභිමතාර්ථය: 01- ඇල්ගී පිපෙන වාර ගණන සහ තීව්‍රතාවය අඩු කිරීම).

ප්‍රතිසංස්කරණය කිරීම සඳහා පාර්ලිමේන්තුවේ වැව් ජල පෝෂක ප්‍රදේශයේ බාදනය වූ ඇළ ඉවුරු හඳුනා ගැනීම: ජල පෝෂක ප්‍රදේශය තුළ පවතින ඇළ ඉවුරු ආරක්ෂණ හඳුනාගෙන සිතියම් ගත කිරීම, ප්‍රතිසංස්කරණය කිරීම අවශ්‍ය වන කොටස්වල දිග ප්‍රමාණය හඳුනාගැනීම සහ ක්‍රමය, පිරිවැය සහ කාල ඇස්තමේන්තු තීරණය කිරීම සහ සමස්ත ඉවුරු තීරයේ බාදනය පාලනය කිරීම සඳහා පාර්ලිමේන්තු ජලාශයේ පෝෂක ප්‍රදේශයේ ඇළ ඉවුරු ඇගයීම පිණිස ක්ෂේත්‍ර සමීක්ෂණයක් සිදු කරන ලදී.

ජල තත්ත්ව අධීක්ෂණය: SLLDC හි EMT රසායනාගාරය මගින් 01 වන උප ජලපෝෂකයෙහි තෝරාගත් නියැදි ස්ථාන අටක ජල තත්ත්වය මාසිකව පරීක්ෂා කරනු ලැබේ. මෙම දත්ත තෙත්බිම් කළමනාකරණ අංශය මගින් විශ්ලේෂණය කර අර්ථදක්වනු ලැබේ.

පර්යේෂණ ප්‍රජාව, පෞද්ගලික අංශය සහ වෙනත් උනන්දුවක් දක්වන කණ්ඩායම්වල සහභාගීත්වය සහ දායකත්වය ප්‍රවර්ධනය කිරීම (ඉලක්කය 6)

පිරිපහදු කළ අපජලය බැහැර කිරීම සඳහා අනුමැතීන් ලබා දීම: ඕනෑම මහල් නිවාසයකින්, නිෂ්පාදන කම්හලකින්, කාර්යාලයකින්, පාසලකින් හෝ මිශ්‍ර සංවර්ධනයකින් කොළඹ පුරවර කලාපයේ (SLLDC ඇළ මාර්ග) ඕනෑම ඇළ මාර්ග ජාලයකට පිරිපහදු කළ අපජලය මුදා හැරීම සඳහා අයදුම් කිරීමේ ක්‍රියාවලියට සහාය වීම. 2023 වර්ෂයේදී ඉල්ලීම් 08ක් ලැබී ඇති අතර දැනටමත් බලපත්‍ර 02ක් නිකුත් කර ඇත. ප්‍රමාණවත් ලියකියවිලි ඉදිරිපත් නොකිරීම හේතුවෙන් බලපත්‍ර 04ක් නිකුත් කිරීමට තීරණාපේක්ෂිතව ඇත. අපගේ භාරයේ නොමැති බැවින් අනෙක් ඉල්ලීම් 02 ප්‍රතික්ෂේප කරන ලදී.








**රූපය 01: පාර්ලිමේන්තු ජලාශයේ උප ජල පෝෂක 01 හි පාවෙන ප්‍රතිකාර තෙත් බිම්**






| Location | QR Code | Location | QR Code |
|---|---|---|---|
| Pinniyara Canal (P-1) | | | |
| P1 LHS 0m | | P1 RHS 0m | |
| P1 LHS 100m | | P1 RHS 100m | |
| P1 LHS 200m | | P1 RHS 200m | |

**රූපය 02: ප්‍රතිසංස්කරණය කිරීම සඳහා ඇළ ඉවුරු හඳුනා ගැනීම පිණිස ඇළ ඉවුරු සමීක්ෂණය**

# විශේෂ ව්‍යාපෘති අංශය

විශේෂ ව්‍යාපෘති අංශය SLLDC හි ප්‍රධාන තාක්ෂණික අංශයකි. ජල විද්‍යාත්මක, ජල ගතික ආකෘති නිර්මාණය, සවිස්තර ජලාපවහන අධ්‍යයනයන් සිදු කිරීම, රජයේ සහ පෞද්ගලික අංශයේ සේවාදායකයින් සඳහා ප්‍රධාන ජලාපවහන සැලසුම් සකස් කිරීම, ඉඩම් සංවර්ධනය සඳහා නිෂ්කාශන නිකුත් කිරීම සහ ඉදිකිරීම් ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම විශේෂ ව්‍යාපෘති අංශයේ ප්‍රධාන කාර්යයන් වේ.
විශේෂ ව්‍යාපෘති අංශය 2023 වර්ෂය තුළ ඉහත විවිධ ක්ෂේත්‍රවල සිය මෙහෙයුම් පහත පරිදි ක්‍රියාත්මක කර ඇත.

- ඉඩම් සංවර්ධනය සඳහා නිෂ්කාශන නිකුත් කිරීම.
- සේවාදායක ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම

I. කුරුණෑගල සිට අනුරාධපුරය දක්වා වැව් අලංකරණය කිරීම සහ සංවර්ධනය කිරීම
II. දේශගුණ සුහුරු වාරි කෘෂිකර්ම ව්‍යාපෘතිය (CSIAP)
අ. කුරුණෑගල දිස්ත්‍රික්කය - කොන්ත්‍රාත්තු 1 (වැව් 7ක්)
ආ. අනුරාධපුර දිස්ත්‍රික්කය - කොන්ත්‍රාත්තු 3ක් (වැව් 5ක්)
ඇ. ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කය - කොන්ත්‍රාත් 1ක් (වැව් 3ක්)

**සැලසුම් කිරීම සහ ක්‍රියාත්මක කිරීම**
III. රාජ්‍ය ඖෂධ නිෂ්පාදන නීතිගත සංස්ථා (SPMC) පරිශ්‍රයේ සිට බොල්ගොඩ වැව දක්වා වැසි ජල අපවහන පද්ධතිය

1. ඉඩම් සංවර්ධනය කිරීම සඳහා නිෂ්කාශන නිකුත් කිරීම. (සැලසුම් කමිටුව හරහා)

## 1. ඉඩම් සංවර්ධනය කිරීම සඳහා නිෂ්කාශන නිකුත් කිරීම. (සැලසුම් කමිටුව හරහා)

සැලසුම් රහිත සහ අනවසර සංවර්ධනය සහ පහත් බිම් ගොඩකිරීම ස්ථානීය ගංවතුර මෙන්ම රට තුළ හදිසි ගංවතුර තත්ත්වයන්ට ප්‍රධාන හේතුවකි. එබැවින් නාගරික ගංවතුර හේතුවෙන් රටේ ආර්ථිකයට සිදුවන හානිය අවම කිරීම සඳහා කාර්යක්ෂම හා ඵලදායී ජලාපවහන පද්ධති සහිත පහත් බිම් සංවර්ධනය කිරීම ඉතා වැදගත් වේ.

විශේෂ ව්‍යාපෘති අංශය පහත් බිම් සංවර්ධනය කිරීම සඳහා සේවාදායකයින්ගේ ඉල්ලීම් අනුව එක් එක් සිද්ධිය අනුව පුළුල් ජල විද්‍යාත්මක හා ජල ගතික අධ්‍යයනයන් සිදු කරමින් මෙම කාර්යය ඉටු කරයි. මෙම විස්තීර්ණ ජලාපවහන යෝජනා අනුමැතිය සඳහා SLLDC පනත යටතේ පිහිටුවා ඇති සැලසුම් කමිටුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

## 2. සේවාදායක ව්‍යාපෘති

### i. කුරුණෑගල සිට අනුරාධපුර දක්වා වැව් අලංකරණය කිරීම සහ සංවර්ධනය කිරීම

ආරම්භ කළ දිනය : 22.05.2021
සම්පූර්ණ කළ දිනය : 28.02.2023
කොන්ත්‍රාත් වටිනාකම: රු.140,341,481.99

ව්‍යාපෘති විෂය පථය
- වැවේ ධාරිතාව වැඩි කිරීම, එමඟින් වගාව සඳහා ජලය සැපයිය හැකි ප්‍රදේශය වැඩි කිරීම
- සංචාරක ආකර්ෂණය වැඩි දියුණු කිරීම සඳහා අවට පරිසරය වැඩිදියුණු කිරීම සහ අලංකාර කිරීම.
- මහජන සෞඛ්‍යය, ජීවන තත්ත්වය සහ ජීවන ගුණාත්මක බව ඉහළ නැංවීම.

භෞතික ප්‍රගතිය: 100%
මූල්‍ය ප්‍රගතිය: 99%

1. **කලගස් වැව, ඉබ්බාගමුව (කුරුණෑගල දිස්ත්‍රික්කය)**



2. **කලමුල්ල වැව, මැල්සිරිපුර (කුරුණෑගල දිස්ත්‍රික්කය)**



3. **කලහකැලේ වැව, ගලේවෙළ (මාතලේ දිස්ත්‍රික්කය)**



4. **පුවක්පිටිය වැව, ගලේවෙළ (මාතලේ දිස්ත්‍රික්කය)**



5. **සළුඅපුල්ලන වැව, දඹුල්ල (මාතලේ දිස්ත්‍රික්කය)**



**6. මාලව වැව, කැකිරාව (අනුරාධපුර දිස්ත්‍රික්කය)**



**7. උලන්කුලම වැව, මරදන්කඩවල (අනුරාධපුර දිස්ත්‍රික්කය)**



**8. තිරප්පනේ වැව, තිරප්පනේ (අනුරාධපුර දිස්ත්‍රික්කය)**



**9. ගල්කුලම වැව, ගල්කුලම (අනුරාධපුර දිස්ත්‍රික්කය)**



**ii. දේශගුණ සුහුරු වාරි කෘෂිකාර්මික ව්‍යාපෘතිය (CSIAP)**

1. කුරුණෑගල දිස්ත්‍රික්කයේ ගල්ගමුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ අඹන්පොල කෘෂි සේවා මධ්‍යස්ථාන ප්‍රදේශයේ මාම්පිටිගමවැව, කොරකහවැව, රටතරනාගස් වැව, මුතුබැන්දගේ වැව සහ නාන්නේරිය කෘෂි සේවා මධ්‍යස්ථාන ප්‍රදේශයේ හල්මිල්ලෑව වැව, උඩ තෝරව වැව සහ පින් වැව ප්‍රතිසංස්කරණය කිරීම.

ආරම්භ කළ දිනය : 27.03.2023
සම්පූර්ණ කළ දිනය : 26.03.2024
කොන්ත්‍රාත් වටිනාකම : රු. මිලියන 57.403
ව්‍යාපෘති විෂය පථය :
• වැව් බැම් වැඩිදියුණු කිරීම
• සොරොව්ව, වාන්, නාන පඩි සහ බෝක්කු ඉදිකිරීම
• වැව් පත්ලෙහි රොන්මඩ ඉවත් කිරීම
භෞතික ප්‍රගතිය: 85%
මූල්‍ය ප්‍රගතිය: 37%













2. **අනුරාධපුර දිස්ත්‍රික්කයේ නබඩවැව ගම්මානයේ කුඩා උණුකැව, උණුකැව මහවැව සහ වලස්වැව ප්‍රතිසංස්කරණය කිරීම.**

ආරම්භ කළ දිනය : 13.04.2023
සම්පූර්ණ කළ දිනය : 22.01.2024
කොන්ත්‍රාත් වටිනාකම : රු. මිලියන 43.449
ව්‍යාපෘති විෂය පථය :

- වැව් බැමි ප්‍රතිසංස්කරණය කිරීම
- සොරොව්ව, වාන් ඇළ සහ නාන පඩි ඉදි කිරීම
- වැව් පාත්ති රොන්මඩ ඉවත් කිරීම සහ ජල වල් පැලෑටි ඉවත් කිරීම.
- ගස් සිටුවීම

භෞතික ප්‍රගතිය: 98%
මූල්‍ය ප්‍රගතිය: 18%









3. **අනුරාධපුර දිස්ත්‍රික්කයේ පුලියන්කඩවල ගම්මානයේ හොරණක්කාරයාගම ප්‍රතිසංස්කරණය කිරීම**

ආරම්භ කළ දිනය : 13.04.2023
සම්පූර්ණ කළ දිනය : 11.01.2024
කොන්ත්‍රාත් වටිනාකම : රු. මිලියන 30.908
ව්‍යාපෘති විෂය පථය :

• වැව් බැම්ම ප්‍රතිසංස්කරණය කිරීම
• සොරොව්ව, වාන් සහ නාන පඩි ඉදිකිරීම
• වැව් පත්ලෙහි රොන්මඩ ඉවත් කිරීම සහ ජලජ වල් පැලෑටි ඉවත් කිරීම
• ඇළ මාර්ග සහ කෘෂි මාර්ග වැඩිදියුණු කිරීම
• ගස් සිටුවීම

භෞතික ප්‍රගතිය :99%

මූල්‍ය ප්‍රගතිය :31%













**4. අනුරාධපුර දිස්ත්‍රික්කයේ දෙමටවැව වස්සල්ලාගම වැව ප්‍රතිසංස්කරණය කිරීම.**

ආරම්භ කළ දිනය : 13.04.2023
සම්පූර්ණ කළ දිනය : 15.10.2023
කොන්ත්‍රාත් වටිනාකම : රු. මිලියන 21.495
ව්‍යාපෘති විෂය පථය :

- වැව් බැම්ම ප්‍රතිසංස්කරණය කිරීම
- සොරොව්ව, වාන්, ඇළ මාර්ග, නාන පඩිපෙළ සහ කෘෂි මාර්ගය ඉදිකිරීම
- වැව් පත්ලෙහි රොන්මඩ ඉවත් කිරීම සහ ජල වල් පැලෑටි ඉවත් කිරීම
- වාන් ඇළ පිරිසිදු කිරීම සහ කැපීම

භෞතික ප්‍රගතිය : 100%
මූල්‍ය ප්‍රගතිය : 45%









5. **නැගෙනහිර පළාතේ ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ රඹා වැව පද්ධතියේ පිහිටි කායන් වැව, කරංගහ වැව සහ බෙල්ලකඩවැව ප්‍රතිසංස්කරණය කිරීම.**

ආරම්භ කළ දිනය : 17.05.2023
සම්පූර්ණ කළ දිනය : 07.05.2024
කොන්ත්‍රාත් වටිනාකම : රු. මිලියන 93.908
ව්‍යාපෘති විෂය පථය :

• වැව් බැම්ම ප්‍රතිසංස්කරණය කිරීම
• සොරොව්ව ප්‍රතිසංස්කරණය කිරීම
• වාන් දොරටුව වැඩිදියුණු කිරීම
• බෝක්කු, ඇළ මාර්ග, කෘෂි මාර්ග, කොන්ක්‍රීට් කාණු ඉදිකිරීම

භෞතික ප්‍රගතිය: 83%
මූල්‍ය ප්‍රගතිය: 29%











iii. **රාජ්‍ය ඖෂධ නිෂ්පාදන නීතිගත සංස්ථා (SPMC) පරිශ්‍රයේ සිට බොල්ගොඩ වැව දක්වා වැසි ජල අපවහන පද්ධතිය**

ආරම්භ කළ දිනය : 07.03.2023
සම්පූර්ණ කළ දිනය : 06.05.2023
කොන්ත්‍රාත් වටිනාකම : රු. 1,803,326.80
ව්‍යාපෘති විෂය පථය :

• කොන්ක්‍රීට් කාණු - මතුපිට පිරිසිදු කිරීම, රොන්මඩ ඉවත් කිරීම සහ සුන්බුන් ස්ථිර ලෙස බැහැර කිරීම
• රොන්මඩ පිරුණු ඇළ මාර්ග - ඇල ඉවුරු සහ මතුපිට පිරිසිදු කිරීම සහ සුන්බුන් ස්ථිර ලෙස බැහැර කිරීම
භෞතික ප්‍රගතිය: 100%
මූල්‍ය ප්‍රගතිය: 95%









# ඉදිකිරීම් අංශය

## 2023 වර්ෂයේදී ඉදිකිරීම් අංශය යටතේ පැවති ව්‍යාපෘති

**ශ්‍රී ලංකා වරාය අධිකාරිය**

1. ත්‍රිකුණාමලය වරායේ ඉංජිනේරු වැඩපොළ ගොඩනැගිල්ල ඉදිකිරීම

**කෘෂිකර්ම අමාත්‍යාංශය යටතේ සිදු කළ ව්‍යාපෘති (ලෝක බැංකු අරමුදල් ලැබූ)**

2. තඹරව වැව ප්‍රතිසංස්කරණය කිරීම
3. රොටවල වැව ප්‍රතිසංස්කරණය කිරීම
4. බෙබව වැව ප්‍රතිසංස්කරණය කිරීම

**භාණ්ඩාගාර අරමුදල් යටතේ සිදු කළ ව්‍යාපෘති**

5. කොලොන්නාව වැසි ජල අපවහන සහ පාරිසරය වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය (KSW&EIP)
   - I. බෝපත්ත ප්‍රදේශයේ සතරැස් බොක්කුව ඉදිකිරීම
   - II. මජීඩියාවත්ත ප්‍රදේශයේ සතරැස් බොක්කුව ඉදිකිරීම
   - III. සදහම් මාවතේ සතරැස් බොක්කුව ඉදිකිරීම
   - IV. තුප්පාවල වැව සැකසීම
6. රත්ගම - නගර සංවර්ධන හා ජලාපවහන වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය
7. පිළියන්දල නගර සංවර්ධනය හා මහහැර යෑමේ මාර්ගය සංවර්ධනය කිරීම සඳහා ජලාපවහන වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය
8. කඩවත "සුවත උයන" හි නඩත්තු කාර්යයන්

**ස්වයං අරමුදල් ලැබූ ව්‍යාපෘති**

9. කිරිමණ්ඩල මාවතේ යෝජිත ක්‍රිකට් ක්‍රීඩාංගණය
10. නුවරඑළිය සංචාරක බංගලාවේ අලුත්වැඩියා කටයුතු
11. අත්තිඩිය EMT පරීක්ෂණාගාරයේ අලුත්වැඩියා කටයුතු

**<u>ශ්‍රී ලංකා වරාය අධිකාරිය</u>**

**1. ත්‍රිකුණාමලය වරායේ ඉංජිනේරු වැඩපොළ ගොඩනැගිල්ල ඉදිකිරීම**

මෙම ව්‍යාපෘතිය ශ්‍රී ලංකා වරාය අධිකාරිය විසින් ප්‍රදානය කරන ලදී. ව්‍යාපෘතියේ මුළු ඇස්තමේන්තුගත වටිනාකම VAT බදු හැර රු. මිලියන 252 කි.

මෙම ව්‍යාපෘතිය යටතේ භූමිය සැකසීම ඇතුළුව වැරගැන්වූ තෙමහල් ගොඩනැගිල්ලක් (වර්ග මීටර 1800) ඉදිකිරීම, පස් වැඩ, පෙදරේරු වැඩ, ඇලුමිනියම් වැඩ, ජල පවිත්‍රීකරණය, ටයිල් ඇල්ලීම, සහ පින්තාරු කිරීමේ කාර්යයන් සමඟ යකඩ වැඩපොළ (ගරාජ්) ගොඩනැගිල්ලක් ඇතුළත් වන අතර එය යකඩ කණු, යකඩ කාප්ප, වහල, බිත්ති ආවරණ, රෝලර් දොරවල් සහිත වැරගැන්වූ කොන්ක්‍රීට් ගොඩනැගිල්ලක් වේ. මීට අමතරව විදුලිය, ජලනල සහ ජලාපවහන පද්ධතිද අනෙකුත් අවශ්‍ය පහසුකම් හා සේවාවන්ද ඇතුළත් වේ.

මෙම ව්‍යාපෘතිය 2023 අප්‍රේල් 03 වන දින ආරම්භ කරන ලද අතර 2024 මැයි 26 වන දින අවසන් කිරීමට නියමිතය.

2023 වර්ෂය තුළ සිදු කරන ලද වැඩවල සමුච්චිත වටිනාකම රු. මිලියන 98 ක් වන අතර භෞතික ප්‍රගතිය 55% කි.





**<u>ලෝක බැංකු ආධාර යටතේ සිදු කරන දේශගුණ සුහුරු වාරි කෘෂිකර්ම ව්‍යාපෘතිය (CSIAP)</u>**

**2. බෙබව වැව ප්‍රතිසංස්කරණය කිරීම**

ලෝක බැංකුව විසින් අරමුදල් සපයන කෘෂිකර්ම අමාත්‍යාංශයේ දේශගුණ සුහුරු වාරි කෘෂිකර්ම ව්‍යාපෘතිය විසින් ඉහත ව්‍යාපෘතිය ප්‍රදානය කරන ලදී. VAT බදු හැර ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත වටිනාකම රු. මිලියන 67 කි. ව්‍යාපෘතිය 2023 ජූලි 10 වන දින ආරම්භ කරන ලද අතර 2024 මැයි මස අවසන් වන විට අවසන් කිරීමට සැලසුම් කර ඇත.

වාන් සහ වැව් බැම් ප්‍රතිසංස්කරණය කිරීම, සොරොව් ඉදිකිරීම, කොන්ක්‍රීට් ඇළ මාර්ග, ජල අපවහන බෝක්කු, සපත්තු පාලම, ට්‍රැක්ටර් හරස් මාර්ග, හැරවුම් සහ ජලාපවහන ඇළ මාර්ගය ආදියෙන් ව්‍යාපෘතිය සමන්විත වේ.

2023 වර්ෂය තුළ සිදු කරන ලද කාර්යයේ සමුච්චිත වටිනාකම 18%ක භෞතික ප්‍රගතියක් සමඟින් රු. මිලියන 14.51කි.





### 3. තඹරව වැව ප්‍රතිසංස්කරණය කිරීම

ලෝක බැංකුව විසින් අරමුදල් සපයන කෘෂිකර්ම අමාත්‍යාංශයේ දේශගුණ සුහුරු වාරි කෘෂිකර්ම ව්‍යාපෘතිය විසින් ඉහත ව්‍යාපෘතිය ප්‍රදානය කරන ලදී. VAT බදු හැර ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත වටිනාකම රු.මිලියන 87 කි. ව්‍යාපෘතිය 2023 ජූලි 10 වන දින ආරම්භ කරන ලද අතර 2024 මැයි මස අවසන් වන විට අවසන් කිරීමට සැලසුම් කර ඇත.

මෙම ව්‍යාපෘතිය වැව් බැම් ප්‍රතිසංස්කරණය කිරීම, ඇළ මාර්ග සහ වාන් ඉදිකිරීමෙන් සමන්විත වේ.

2023 වර්ෂය තුළ සිදු කරන ලද කාර්යයේ සමුච්චිත වටිනාකම 16%ක භෞතික ප්‍රගතියක් සහිතව රු. මිලියන 11.51ක.





### 4. රොටවැව ප්‍රතිසංස්කරණය කිරීම

ලෝක බැංකුව විසින් අරමුදල් සපයන කෘෂිකර්ම අමාත්‍යාංශයේ දේශගුණ සුහුරු වාරි කෘෂිකර්ම ව්‍යාපෘතිය විසින් ඉහත ව්‍යාපෘතිය ප්‍රදානය කරන ලදී. VAT බදු හැර ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත වටිනාකම රු.මිලියන 68 කි. ව්‍යාපෘතිය 2023 ජූලි 10 වන දින ආරම්භ කරන ලද අතර 2024 මැයි මස අවසන් වන විට අවසන් කිරීමට සැලසුම් කර ඇත.

මෙම ව්‍යාපෘතිය වැව් බැම් ප්‍රතිසංස්කරණය කිරීම, සපත්තු පාලම, වාන් ඇළ මාර්ග, ඇළ මාර්ග බැම්, කොන්ක්‍රීට් ඇළ මාර්ග, හරස් මාර්ග සහ සොරොව්වක් ඉදිකිරීම යන කාර්යයන්වලින් සමන්විත වේ.

2023 වර්ෂය තුළ සිදු කරන ලද කාර්යයේ සමුච්චිත වටිනාකම 17%ක භෞතික ප්‍රගතියක් සහිතව රු. මිලියන 18කි.





<u>**භාණ්ඩාගාර අරමුදල් ලැබූ ව්‍යාපෘති**</u>

1. <u>**කොලොන්නාව වැසි ජල අපවහන සහ පරිසරය වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය (KSW&EIP)**</u>

### 5.1. බෝපත්ත ප්‍රදේශයේ සතරැස් බොක්කුවක් ඉදිකිරීම

ඉහත ව්‍යාපෘතිය කොලොන්නාව වැසි ජල අපවහන සහ පරිසරය වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය යටතේ ක්‍රියාත්මක කරන ලදී. ව්‍යාපෘතිය කොන්ක්‍රීට් සතරැස් බෝක්කුවක් ඉදිකිරීම, හානියට පත් කොන්ක්‍රීට් මාර්ගය ප්‍රතිසංස්කරණය කිරීම සහ කොන්ක්‍රීට් මාර්ගයේ පැති කාණු ඉදිකිරීමෙන් සමන්විත වේ.

ව්‍යාපෘතියේ ඇස්තමේන්තු වටිනාකම VAT බදු හැර රු. මිලියන 12 කි. ව්‍යාපෘතිය 2023 ජනවාරි 07 වන දින ආරම්භ කර 2023 පෙබරවාරි මස අවසන් වන විට අවසන් කරන ලදී.

2023 වර්ෂය තුළ සිදු කරන ලද කාර්යයේ සමුච්චිත වටිනාකම. 100%ක භෞතික ප්‍රගතියක් සහිතව රු. මිලියන 11කි.





### 1.2. මජීඩියාවත්ත ප්‍රදේශයේ සතරැස් බොක්කුවක් ඉදිකිරීම

ඉහත ව්‍යාපෘතිය කොලොන්නාව වැසි ජල අපවහන සහ පරිසරය වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය යටතේ ක්‍රියාත්මක කරන ලදී. ව්‍යාපෘතිය කොන්ක්‍රීට් සතරැස් බෝක්කුව ඉදිකිරීම, හානියට පත් කොන්ක්‍රීට් මාර්ගය ප්‍රතිසංස්කරණය කිරීම, වානේ පෝරු ටැඹ බැම්මක් ඉදිකිරීම සහ කොන්ක්‍රීට් කාණු ඉදිකිරීමෙන් සමන්විත ඇතුළත් වේ.

ව්‍යාපෘතියේ ඇස්තමේන්තු වටිනාකම VAT බදු හැර රු. මිලියන 69 කි. ව්‍යාපෘතිය 2023 ජනවාරි 15 වන දින ආරම්භ කරන ලද අතර 2023 දෙසැම්බර් අවසානය වන විට අවසන් කරන ලදී.

2023 වර්ෂය තුළ සිදු කරන ලද කාර්යයේ සමුච්චිත වටිනාකම 100%ක භෞතික ප්‍රගතියක් සහිතව රු. මිලියන 62කි.





### 1.3. වෙන්නවත්ත ප්‍රදේශයේ සතරැස් බොක්කු ඉදිකිරීම

ඉහත ව්‍යාපෘතිය කොලොන්නාව වැසි ජල අපවහන සහ පරිසරය වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය යටතේ ක්‍රියාත්මක කරන ලදී. ව්‍යාපෘතිය සතරැස් බෝක්කු දෙකක් (ප්‍රමාණය 5m x 2.7m x 2.65m) ඉදිකිරීමෙන් සමන්විත වේ.

ව්‍යාපෘතියේ ඇස්තමේන්තු වටිනාකම VAT බදු හැර රු.මිලියන 23කි. ව්‍යාපෘතිය 2023 ජූලි 08 වන දින ආරම්භ කරන ලද අතර 2024 ජනවාරි මස අවසන් වන විට අවසන් කිරීමට නියමිතය.

2023 වර්ෂය තුළ සිදු කරන ලද කාර්යයේ සමුච්චිත වටිනාකම 98%ක භෞතික ප්‍රගතියක් සහිතව රු. මිලියන 28කි.





### 6. රත්ගම නගර සංවර්ධන සහ ජල අපවහනය වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය

මෙම ව්‍යාපෘතිය ගොඩකිරීමේ කාර්යයන් (අක්කර 14.7), රේඛීය වැවක් ඉදිකිරීම (රු. මිලියන 23.7), කාණු, බෝක්කු (12ක්) සහ ඇවිදීමේ මංතීරුවක් ඉදිකිරීමෙන් සමන්විත වේ.

ඉහත ව්‍යාපෘතිය 2021 නොවැම්බර් මස ඉදිකිරීම් අංශය විසින් ආරම්භ කරන ලද අතර භාණ්ඩාගාර ප්‍රතිපාදන යටතේ විශේෂ ව්‍යාපෘති අංශය විසින් සැලසුම් කිරීම සිදු කරනු ලබයි.

ව්‍යාපෘතියේ I අදියර සඳහා VAT බදු හැර මුළු ඇස්තමේන්තුව රු. මිලියන 409 කි. ව්‍යාපෘතිය 2021 නොවැම්බර් මස ආරම්භ කරන ලද අතර 2023 අගෝස්තු මස අවසානයේ ඉදිකිරීම් කටයුතු අර්ධ වශයෙන් අවසන් කර ඇත.

2023 වර්ෂය තුළ සිදු කරන ලද කාර්යයේ වටිනාකම රු. මිලියන 223 ක් වූ අතර සිදු කරන ලද කාර්යයේ සමුච්චිත වටිනාකම රු. මිලියන 349 කි.





**7. පිළියන්දල නගර සංවර්ධන සහ මහහැර යැමේ මාර්ගය සංවර්ධනය කිරීම සඳහා ජල අපවහනය වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය**

ව්‍යාපෘතිය කොන්ක්‍රීට් කාණු (දිග - මීටර් 25.2) සහ කළුගල් රැඳවුම් බැම්මක් (දිග මීටර් 11.50) ඉදිකිරීමෙන් සමන්විත වේ.

VAT බදු හැර ව්‍යාපෘතියේ මුළු ඇස්තමේන්තුගත වියදම රු. මිලියන 25 කි. ව්‍යාපෘතිය 2023 නොවැම්බර් මාසයේදී ආරම්භ කරන ලද අතර 2024 දී අවසන් කිරීමට නියමිතය.

2023 වර්ෂය තුළ සිදු කරන ලද කාර්යයේ සමුච්චිත වටිනාකම 60%ක භෞතික ප්‍රගතියක් සහිතව රු. මිලියන 14කි.





**8. කඩවත "සුවත උයන" නඩත්තු කිරීමේ කාර්යයන්**

ව්‍යාපෘතිය ඇළ මාර්ගය මතුපිට පිරිසිදු කිරීම, ඇළ ඉවුරු එළි පෙහෙළි කිරීම, ඇළ මාර්ගය පරීක්ෂා කිරීම, තණකොළ කැපීම, ධාවන පථ සහ ව්‍යායාම ශාලාව නඩත්තු කිරීම යන කාර්යයන්වලින් සමන්විත වේ.

2023 වර්ෂය සඳහා ඉහත ව්‍යාපෘතිය සඳහා මුළු භාණ්ඩාගාර ප්‍රතිපාදනය VAT බදු හැර රු. මිලියන 10 ක් වූ අතර නඩත්තු කටයුතු වර්ෂය පුරා සිදු කෙරේ.

2023 වර්ෂය තුළ සිදු කරන ලද කාර්යයේ වටිනාකම රු. මිලියන 10.58 කි.





**ස්වයං අරමුදල් ලැබූ ව්‍යාපෘති**

**9. කිරිමණ්ඩල මාවත යෝජිත ක්‍රිකට් ක්‍රීඩාංගණය**

ඉහත ව්‍යාපෘතිය දෙමහල් ගොඩනැගිල්ලකි ඉදිකිරීම සහ නිම කිරීමේ කාර්යයන්, විදුලිය, ජලනල සවි කිරීම සහ මලාපවහන පවිත්‍රාගාරය ස්ථාපනය කිරීම යන කාර්යයන්වලින් සමන්විත වේ.

VAT බදු හැර සිවිල් වැඩ සඳහා ඇස්තමේන්තුගත වියදම රු. මිලියන 88 කි.

ව්‍යාපෘතිය 2022 මැයි මාසයේදී ආරම්භ කරන ලද අතර 2023 පෙබරවාරි 28 වන දින අවසන් කරන ලදී.

2023 වර්ෂය තුළ සිදු කරන ලද කාර්යයේ වටිනාකම රු. මිලියන 57 ක් වූ අතර සිදු කරන ලද කාර්යයේ සමුච්චිත වටිනාකම රු. මිලියන 80කි.





## 10. නුවරඑළිය සංචාරක බංගලාවේ ප්‍රතිසංස්කරණ කාර්යයන්

ඉහත ව්‍යාපෘතිය සංචාරක බංගලාවේ ප්‍රතිසංස්කරණ කාර්යයන් සහ රියදුරු නිල නිවාස ඉදිකිරීම, උද්‍යානය සහ ඇතුල්වීමේ දොරටුව ඇතුළු බාහිර කාර්යයන්වලින් සමන්විත වේ.

VAT බදු හැර ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත වියදම රු. මිලියන 30 කි.

ප්‍රතිසංස්කරණ කටයුතු 2022 දෙසැම්බරයේ ආරම්භ කර 2023 දෙසැම්බර් අවසානය වන විට අවසන් කරන ලදී.

2023 වර්ෂය තුළ සිදු කරන ලද කාර්යයේ වටිනාකම රු. මිලියන 37 ක් සහ සිදු කරන ලද කාර්යයේ සමුච්චිත වටිනාකම රු. මිලියන 38කි.







## 11. අත්තිඩිය EMT පරීක්ෂණාගාරයේ ප්‍රතිසංස්කරණ කාර්යයන්

ඉහත ව්‍යාපෘතිය EMT රසායනාගාරයේ ප්‍රතිසංස්කරණ කටයුතු සහ මායිම් බිත්තිය ඇතුළු බාහිර වැඩවලින් සමන්විත වේ.

VAT බදු හැර ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත වියදම රු. මිලියන 17 කි.

ප්‍රතිසංස්කරණ කටයුතු 2023 ජනවාරි මාසයේදී ආරම්භ කර 2023 ඔක්තෝබර් අවසන් වන විට අවසන් කරන ලදී.

2023 වර්ෂය තුළ සිදු කරන ලද කාර්යයේ වටිනාකම රු. මිලියන 13 ක් සහ සිදු කරන ලද කාර්යයේ සමුච්චිත වටිනාකම රු. මිලියන 13කි.

2021 වර්ෂය තුළ සිදු කරන ලද කාර්යයේ වටිනාකම රු. මිලියන 20කි..









# ඔලියමුල්ල වැසි ජල අපවහන සහ පරිසරය වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය

**ව්‍යාපෘති සාරාංශය**

මෝසම් කාලවලදී වත්තල සහ කැලණිය ප්‍රදේශවලට අධික ගංවතුර තත්ත්වයක් ඇති වේ. වත්තල සහ කැලණිය ප්‍රාදේශීය ලේකම් කාර්යාලවලට මෙම ප්‍රදේශවල අවදානමට ලක්විය හැකි ප්‍රජාවන් සඳහා විශාල වන්දි මුදලක් ගෙවීමට සිදුව තිබේ. එබැවින් වත්තල සහ කැලණිය ප්‍රදේශවල ගංවතුර අවම කිරීම සඳහා ශ්‍රී ලංකා ඉඩම් සංවර්ධනය කිරීමේ සංස්ථාව ඔලියමුල්ල වැ ජල අපවහන හා පරිසරය වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය ක්‍රියාත්මක කළේය. ඉදිරි යටිතල පහසුකම් සඳහා ඉඩම් සංවර්ධනය කිරීම සහ කැලණිය සහ වත්තල ප්‍රදේශවල සිටින ජනතාවගේ ජීවනෝපාය වැඩිදියුණු කිරීම මෙම ව්‍යාපෘතියේ අනෙකුත් අරමුණු වේ. යෝජිත ඔලියමුල්ල ව්‍යාපෘතියේ ජල පෝෂක ප්‍රදේශය වර්ග කිලෝමීටර් 17 (හෙක්ටයාර 1700) පමණ වේ.

යෝජිත ව්‍යාපෘතිය ප්‍රධාන වශයෙන් 15m3/s සහ 20 m3/s ධාරිතාවයකින් යුත් පොම්පාගාර 02කින් සමන්විත වේ, පෑලියගොඩ - පුත්තලම ප්‍රධාන මාර්ගය පාලම ප්‍රතිසංස්කරණය කිරීම, වැව් බැමි සකස් කිරීම හා වැව් හෑරීම, ඇළ මාර්ග ප්‍රතිසංස්කරණය කිරීම සහ මෙම ව්‍යාපෘති ප්‍රදේශය තුළ හඳුනාගත් නිවාස නැවත ස්ථානගත කිරීම සමඟ විනෝදාත්මක ක්‍රියාකාරකම් ඇතුළත් වේ. 2023 වසර අවසානය දක්වා ව්‍යාපෘතිය සඳහා මූල්‍යමය වශයෙන් රු.මිලියන 2,348.16 ක් වැය කර ඇති අතර පොම්පාගාරය- II ඉදිකිරීම 97% ක ප්‍රගතියක් ලබා ඇත.



රූපය 1: 2023 ජනවාරි මස පොම්පාගාරය-II ඉදිකිරීමේ කාර්යයන්




රූපය 2: 2023 දෙසැම්බර් මස පොම්පාගාරය-II ඉදිකිරීමේ කාර්යයන්



රූපය 3: ඇලුමිනියම් ජනේල සහ රෝලර් දොරවල් සවි කිරීම



රූපය 4: EOT දොඹකරය ස්ථාපිත කිරීම




රූපය 5: සතරැස් බෝක්කුව ඉදිකිරීම



රූපය 6: 2023 පෙබරවාරි මස දකුණු ඉවුර සකස් කිරීම




රූපය 7: 2023 දෙසැම්බර් මස දකුණු ඉවුර සකස් කිරීම




රූපය 8: 2023 ජනවාරි මස වම් ඉවුර සකස් කිරීම



රූපය 9: 2023 දෙසැම්බර් මස වම් ඉවුර සකස් කිරීම

# ඉඩම සහ අළෙවිකරණ අංශය

**ඉඩම් සහ අළෙවිකරණ අංශය**

ඉඩම් සහ අලෙවි අංශය පහත සඳහන් කාර්යයන් හරහා සංස්ථාවේ අරමුණු සාක්ෂාත් කර ගැනීමට සහාය වන එහි ප්‍රධාන ක්‍රියාකාරී අංශයකි:

- සංවර්ධන කටයුතු සඳහා සුදුසු ඉඩම් අත්පත් කර ගැනීම
- ජලය රඳවාතබා ගැනීමේ කාර්යයන් සඳහා ඉඩම් අත්පත් කර ගැනීම
- මහ කොළඹ ගංවතුර පාලන හා පරිසර වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය (GCFC&EIP) සඳහා අත්පත් කර ගත් ඉඩම්, එම ඉඩම්වල භාරකරු ලෙස කළමනාකරණය කිරීම
- ඉඩම් අන්සතු කිරීමේ මාර්ගෝපදේශ අනුව ඉඩම් බැහැර කිරීම
- 2006 අංක 35 දරන සංශෝධිත පනතට අනුව තෙත්බිම් ප්‍රකාශයට පත් කිරීම
- එවැනි සංවර්ධනයන්හි බලපෑමට ලක්වූ අනවසර පදිංචිකරුවන් නැවත පදිංචි කිරීම සහ ඔප්පු නිකුත් කිරීම
- වී සහ කෙටි කාලීන බෝග වගා කිරීමට හැකි ඉඩම් වෙන් කිරීම

සංස්ථාව විසින් කොලොන්නාව සහ ඔලියමුල්ල ප්‍රදේශවල ගංවතුර අවම කිරීම සහ ජලාපවහනය වැඩිදියුණු කිරීම සඳහා ඇළ මාර්ග සංවර්ධනය කිරීම සඳහා ඉඩම් අත්පත් කර ගැනීමට අවශ්‍ය මූලික පියවර ගෙන ඇත.

ප්‍රදේශයේ ගංවතුර අවම කිරීමේ අරමුණින් පානදුර ප්‍රදේශයේ ඉඩම් අත්පත් කර ගැනීමට අදාළ ක්‍රියාකාරකම් සංස්ථාව විසින් සිදු කර ඇත. තවද, රත්ගම නගර සංවර්ධන ව්‍යාපෘතිය යටතේ රත්ගම ප්‍රදේශයේ අක්කර 22 ක පමණ භූමි ප්‍රදේශයක් අත්පත් කර ගැනීම සංස්ථාව විසින් ආරම්භ කර ඇත.

ඉහත කරුණු වලට අමතරව, අත්පත් කර ගැනීම කඩිනම් කිරීම සහ සම්පූර්ණ කිරීම සඳහා වෙරස් ගඟ වැසි ජල අපවහන හා පරිසරය වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය (WGSWD&EIP) යටතේ ඉඩම් අත්පත් කර ගැනීම ඉඩම් සහ අලෙවි අංශය වෙත පවරා ඇත.

ශ්‍රී ලංකාවේ ආහාර සුරක්ෂිතතාව සහතික කිරීම පිළිබඳ රජයේ දැක්ම සමඟ පෙළගැසෙමින් හැකි සෑම ඉඩමක්ම වගා කිරීම සඳහා යොදා ගැනීමට සංස්ථාව මූලිකත්වය ගෙන ඇත. ඒ අනුව, මහ කොළඹ ගංවතුර පාලන සහ පරිසර වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය (GCFC සහ EIP) සහ වෙරස් ගඟ වැසි ජල අපවහන සහ පරිසර වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය (WGSWD & EIP) යටතේ අත්පත් කරගත් ඉඩම් ගිවිසුම්ගත වීමෙන් පසු වී සහ කෙටි කාලීන බෝග වගා කිරීම සඳහා පෞද්ගලික පාර්ශ්ව සඳහා වෙන් කර දී ඇත.

කොළඹ ප්‍රධාන වාණිජ කේන්ද්‍රස්ථානයට ආසන්නව පිහිටා තිබීම හේතුවෙන්, මුතුරාජවෙල ප්‍රදේශය බස්නාහිර කලාපයේ භාණ්ඩ ගබඩා සහ ප්‍රවාහන කලාපයේ කොටසක් ලෙස හඳුනාගෙන තිබේ. එසේම මුතුරාජවෙල ප්‍රදේශය සංවර්ධනය වීමත් සමඟ කොළඹ ප්‍රධාන වාණිජ කේන්ද්‍රස්ථානයට ආසන්නව පිහිටා තිබීම සැලකිල්ලට ගනිමින් බස්නාහිර කලාපයේ භාණ්ඩ ගබඩා සහ ප්‍රවාහන කලාපයේ කොටසක් ලෙස හඳුනාගෙන ඇත. කෙරවලපිටිය පිටත වටරවුම් අධිවේගී මාර්ග ව්‍යාපෘතියේ සංවර්ධනයත් සමඟ භාණ්ඩ ගබඩා සහ ප්‍රවාහනය හා සම්බන්ධ ව්‍යාපෘති සඳහා මුතුරාජවෙල ප්‍රදේශයේ ඉඩම්වල ඉල්ලුම විශාල ලෙස වැඩි විය. ඒ අනුව, සංස්ථාව විසින් මුතුරාජවෙල ප්‍රදේශයේ බොහෝ භාණ්ඩ ගබඩා සහ ප්‍රවාහන සංවර්ධන ව්‍යාපෘති ආරම්භ කර ඇත.

ඒ අනුව 2023 වර්ෂය තුළ මුතුරාජවෙල ඉඩම් අක්කර 22ක් ලංකා විදුලිබල මණ්ඩලයට සහ CA ක්‍රෂින් (පෞද්.) සමාගම වෙත ලබාදී ඇත.

පසුගිය වර්ෂ කිහිපය තුළ මුතුරාජවෙල කාර්මික කලාපයේ ඉඩම් බොහොමයක් කර්මාන්ත කිහිපයක් සහ ජාතික වශයෙන් වැදගත් ව්‍යාපෘති සඳහා බැහැර කර ඇත. ඛනිජ තෙල් ටැංකි අංගනය, ලිට්‍රෝ ගෑස් අංගනය සහ ලංවිම විදුලි බලාගාරය කලාපය තුළ පිහිටා ඇති වැදගත් ව්‍යාපෘති සමහරකි.

ඉඩම් හා අළෙවිකරණ අංශය දිගු කාලීන කල්බදු, කෙටිකාලීන කල්බදු, සෘජු විකුණුම් සහ තනි නිවාස සඳහා විකුණුම් මඟින් ඉඩම් බැහැර කිරීමේ නිරත වේ. ඒ අනුව, ඉඩම් හා අළෙවිකරණ අංශය 2023 වර්ෂය තුළ විකුණුම්/කල්බදු වලින් දළ වශයෙන් රු.බිලියන 1.6ක මුදල් ප්‍රවාහයක් සාක්ෂාත් කර ගෙන ඇත




තවද, මෑත අතීතයේ සංවර්ධනයේ නව මානයන් සමඟ සංස්ථාවේ විෂය පථය වඩාත් සංවර්ධන අරමුණු හා පරිසර සංරක්ෂණය උදෙසා වෙනස් කර ඇත. ගංවතුර පාලනය, තෙත් බිම් සංරක්ෂණය, අනවසර ඉදිකිරීම් ඉවත් කිරීමෙන් ඇළ ඉවුර අලංකාර කිරීම සහ ඇළ ඉවුර ඔස්සේ ඇවිදීමේ මංතීරු ඉදිකිරීම කෙරෙහි වැඩි අවධානයක් යොමු වී ඇත.

ඉහත කාර්යයන් සඳහා සහාය වීම සඳහා ඉඩම් හා අළෙවිකරණ අංශය දිවයිනේ තෙත්බිම් ප්‍රදේශ වශයෙන් ප්‍රකාශයට පත් කිරීමේ නිරත වේ. සංස්ථාවේ අනෙකුත් අදාළ අංශ සමඟ සහයෝගීත්වයෙන් ඇළ මාර්ග රක්ෂිත ගැසට් මඟින් ප්‍රකාශයට පත් කරමින් පවතී

ප්‍රකාශයට පත් කිරීමේ කාර්යය යටතේ බස්නාහිර, දකුණ, ඌව, මධ්‍යම, සබරගමුව සහ උතුරු මැද, වයඹ පළාත් ගැනටමත් ගැසට් කර ඇත. නැගෙනහිර, උතුරු පළාත් ප්‍රකාශයට පත් කිරීම සිදු කරමින් පවතී.

බස්නාහිර පළාතේ ඇළ රක්ෂිත දැනටමත් ප්‍රකාශයට පත් කර ඇති අතර දකුණු සහ ඌව, මධ්‍යම, සබරගමුව සහ උතුරු මැද, වයඹ නැගෙනහිර සහ උතුරු පළාත්වල පළාත්වල ඇළ මාර්ග රක්ෂිත ප්‍රකාශයට පත් කිරීම සිදු කරමින් පවතී.

සංස්ථාව විසින් ජලය රඳවාගැනීමේ අරමුණු සඳහා GCFC&EI ව්‍යාපෘතිය සඳහා අත්පත් කරගත් වගුරු බිම් නඩත්තු කිරීමද සිදු කරයි. වර්තමානයේ මෙම ඉඩම් *සංවර්ධනය කිරීමේ* සංස්ථාවේ නීති අංශය සහ විශේෂ බලාත්මක කිරීමේ ඒකකයේ සහාය ඇතිව ඉඩම් හා අළෙවිකරණ අංශය විසින් කළමනාකරණය කරනු ලැබේ.

සංස්ථාව විසින් අත්පත් කර ගත් වගුරු බිම්වල අනවසර පදිංචිකරුවන් වෙනත් ස්ථානයක පදිංචි කිරීමට ඉඩම් හා අළෙවිකරණ අංශය කටයුතු යොදා ඇත. එවැනි ව්‍යාපෘති මුතුරාජවෙල, වෙදමුල්ල, පොකුණ පාර, දෙහිවල ප්‍රදේශවල පිහිටා ඇත. එම පවුල්වලට පැවරුම් ඔප්පු නිකුත් කිරීමට කටයුතු යොදා ඇත

2024 වර්ෂය සඳහා විකුණුම් සහ කල්බදුවලින් ඇස්තමේන්තුගත ආදායම රු. මිලියන 3,135 ක් වනු ඇත.

# සැලසුම් සහ ව්‍යාපාර සංවර්ධන අංශය

## 1. දේශීය ඉදිකිරීම් කර්මාන්තය සඳහා අක්වෙරළ වැලි විකිණීම

අක්වෙරළ වැලි කෙරවලපිටියේ පිහිටි සේදීමේ සහ හැලීමේ කම්හලේදී සෝදා හැලීම සිදු කරයි. කොන්ක්‍රීට් සහ බදාම සඳහා සියුම් එකතු කිරීම සඳහා ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය (SLSI) විසින් නිකුත් කරන ලද පිරිවිතරයන්ට අනුකූලව "සංස්ථා වැලි" යන වෙළඳ නාමය යටතේ මෙම අක්වෙරළ වැලි අලෙවි කෙරේ (SLS 1397:2010). තවද “සංස්ථා වැලි” SLSI වෙතින් SLS සහතිකය සහ පරිසර හිතකාමී නිෂ්පාදනයක් ලෙස ශ්‍රී ලංකා හරිත ගොඩනැගිලි සභාව විසින් “හරිත ලේබල් සහතිකය” පිරිනමා ඇත.

එහි මිල සහ ඉදිකිරීම් කටයුතු සඳහා වැලිවල යෝග්‍යතාවය පිළිබඳව මහජනයා අතර පවතින මතය වෙනස් වීම හේතුවෙන් පසුගිය වසර කිහිපය තුළ මුහුදු වැලි සඳහා ඇති ඉල්ලුම විශාල ලෙස ඉහළ ගොස් ඇත. කෙසේවෙතත්, 2022-2023 කාලය තුළ රටේ පැවති ආර්ථික තත්ත්වය හේතුවෙන් ඉදිකිරීම් කර්මාන්තය පහත වැටුණි.

පහත ප්‍රස්ථාරයෙන් 2013 වර්ෂයේ සිට අලෙවි කරන ලද වාර්ෂික අක්වෙරළ වැලි ප්‍රමාණය දක්වා ඇත.

**2013 - 2023 කාලසීමාව තුළ අලෙවි කළ අක්වෙරළ වැලි ප්‍රමාණයන්**




පහත ප්‍රස්ථාර පසුගිය දස වසර තුළ අලෙවි රටාව නිරූපණය කරයි

ප්‍රස්ථාරය 01 – මාසික අක්වෙරළ වැලි අලෙවිය




ප්‍රස්ථාරය 02 – මාසික අක්වෙරළ වැලි විකුණුම් ප්‍රමාණයන්




සංස්ථාවට ඉහළම ආදායම් දායකත්වය අක්වෙරළ වැලි අලෙවියෙන් ලැබේ. 2023 වර්ෂයේදී, පසුගිය වසර කිහිපයට සාපේක්ෂව කියුබ් 2,496.89 ක විකුණුම් පරිමාවක් සාක්ෂාත් කර ගැනීමට සංස්ථාවට හැකි වූ අතර ආදායම අනුව එය රු. 902,142,496.26කි.

**මුළු ආදායම (2023) : රු. මිලියන 902.14**

**2023 වර්ෂයේ අලෙවි කරන ලද මාසික අක්වෙරළ වැලි ප්‍රමාණයන්**




### ➢ ආදායම් උත්පාදනය කරන ක්‍රියාකාරකම්

### 1. දියත උයන

දියවන්නා ඔය ඉවුරේ ඉදිකරන ලද දියත උයාන උද්‍යානය 2012 සැප්තැම්බර් මාසයේදී විවෘත කරන ලදී. ආරම්භයේ සිටම ආසන්නයේ ජීවත් වන ජනතාව පමණක් නොව දිවයින පුරා විසිරි සිටින සෑම තරාතිරමකම පුද්ගලයන් ආකර්ෂණය කර ගැනීමට එය සමත් වී තිබේ. වගුරු බිමක ඉදිකර ඇති මෙම උද්‍යානයට වාණිජ අගනගරයෙන් පහසුවෙන් ළඟා විය හැකිය. නගරයේ කළබලකාරි වටපිටාවෙන් මිදී යම් සහනදායී වටපිටාවක විවේකයෙන් ගත කිරීමට පවුල්වලට මෙය කදිම ස්ථානයකි.

සංගීත ජල මලෙන් විහිදෙන වර්ණවත් ජල ධාරාවන් සමස්ත පසුබිමට විචිත්‍රත්වයක් එක් කරයි.

දියවන්නා ඔයේ ජලය සන්සුන්ව ගලා බසින වටපිටාවක සශ්‍රීක හරිත හා සාමකාමී වාතාවරණයක් තුළ, ඒ අසල ඇති වතුර මලට අමතරව, දවසේ ඕනෑම වේලාවක විවේකීව සිටීමට කදිම ස්ථානයක් මහජනයාට ලබා දී තිබේ.

දියවන්නා ඔය පසුකර යන විට විවේකීව සිටීමටත්, මදක් ගිමන් හැරීමට සහ වටපිටාව භුක්ති විඳීමටත් උපාය මාර්ගික ස්ථානවල තබා ඇති හරිත උද්‍යාන පුටු මඟ හැර යෑමට කිසිවෙකු සමත් වේ යැයි සිතිය නොහැක.



නරඹන්නන්ගේ අවශ්‍යතා සපුරාලීම සඳහා ආහාර අළෙවිසැල් ද තිබේ. පැමිණෙන්නන්ට සෞඛ්‍ය සම්පන්න සහ සන්සුන් වාතාවරණයක් තුළ කෙටි කෑමක් හා පානයක් ලබා ගත හැකිය.

දියත උයන හි මින්මැදුර බොහෝ ළමයින් ආකර්ෂණය කර ගන්නා අතර සවස් කාලයේ රවුම් මින්මැදුර වටා සමූහයා එක්රැස් වන අතර එය නගර වැසියන්ගේ ජීවිතවලට මොහොතක සන්සුන් බවක් ලබා දෙයි.

ප්‍රදේශයේ ප්‍රධාන ලක්ෂණ වන්නේ;

- දියවන්නා ඔය ගං ඉවුරේ පිහිටි අලංකාර මල් වෙළඳසැල්
- ගං ඉවුරේ ඇවිද යෑමට හැකි වීම
- ගංගා බෝට්ටු හෝ රුවල් බෝට්ටු සහ පදින බෝට්ටු සවාරියක් යෑමට හැකි වීම
- ශාක පත්‍රයක හැඩයෙන් යුත් බස් නැවතුම්පොළ
- සිමෙන්ති බංකු සහ මේස
- මධ්‍යයේ පිහිටි ජල මල
- වෙනස්වන වර්ණවලින් යුත් ජල මල
- ළමයින් සඳහා සෙල්ලම් කිරීමේ ප්‍රදේශය.
- නිස්කලංක පරිසරය – ශිෂ්‍යයන්ට අධ්‍යයන කටයුතු වුවද සිදු කළ හැක
- ආහාර වෙළඳසැල් – කෙටි කෑමක් ලබා ගත හැකි වීම සහ දේශීය සහ විදේශීය පාන වර්ග පානය කිරීමට හැකි වීම
- බිම්ගල් ඇල්ලූ මංතීරු ඔස්සේ ඇවිදීම, දිව යෑම සහ පාපැදි පැදීම සිදු කළ හැකි වීම.
- වක්‍රාකාර මින් මැදුර



සුදුසු වෙළඳසැල් හිමියන් ජාතික තරඟකාරී ලංසු තැබීමේ ක්‍රියාවලිය හරහා තෝරාගෙන වසරක කාලයක් මාසික කුලී පදනම මත ප්‍රදානය කරනු ලැබේ, එක් වසරක කාලය වාර්ෂිකව වසර පහක් දක්වා අලුත් කරනු ලැබේ.

2022 නොවැම්බර් මස සිට ක්‍රියාත්මක වන පරිදි සාමාන්‍ය ජනතාව විසින් රථ ගාල් සහ වැසිකිළි භාවිතා කිරීමෙන් ලැබෙන ආදායම ඇතුළත් කර ඇත.

**මුළු ආදායම (2023) : රු. මිලියන 113.94**

## 2. බෙල්ලන්විල

කොළඹ වැසියන් මෙම ස්ථානය ගැන හොඳින් දනී. සෑම දිනකම සිය ගණනක් හෝ දහස් ගණනක් දිවීම, ඇවිදීම සහ පාපැදි පැදීම සඳහා මෙහි පැමිණේ. මෙම ස්ථානයට පැමිණීම රාත්‍රියේදී කොළඹදී කළ හැකි සිත්ගන්නා සුළු දෙයකි.

කොළඹ බොරලැස්ගමුවෙහි පිහිටා ඇති බෙල්ලන්විල උද්‍යානය, ශ්‍රී ලංකාවේ මේ දක්වා අප සාකච්ඡා කළ අනෙක් උද්‍යානවලට වඩා මදක් වෙනස් වේ.



ගංවතුර තර්ජනය පාලනය කිරීමේ අරමුණින් බෙලන්විල උද්‍යානය 2014 දී "වෙරස් ගඟ" ව්‍යාපෘතියේ පළමු පියවර ලෙස ඉදිකරන ලදී. ඇවිදීමේ මාර්ගය, පාපැදි ධාවන පථය සහ ආහාර අළෙවි සැල මෙම උද්‍යානයේ ප්‍රධාන ලක්ෂණ වේ. පවුලේ සාමාජිකයන් හෝ මිතුරන් සමඟ සන්ධ්‍යාව ගත කිරීම ඇත්තෙන්ම කදිම ස්ථානයකි.

**මුළු ආදායම (2023) : රු. මිලියන 5.29**



## 3. කිඹුලාවල

සාමාජිකයන් 103 දෙනෙකුගෙන් 2015.01.12 දින ආරම්භ කරන ලද ව්‍යායාම ශාලාවේ ක්‍රියාකාරකම් මේ වනවිට පුද්ගලයින් 396 ක් දක්වා වී ඇති අතර එමඟින් මහජනතාවගේ සෞඛ්‍ය සම්පන්න ජීවන රටාවට අමතර වටිනාකමක් ලබා දේ.



ඵලදායී, කාර්යක්ෂම සහ අභිප්‍රේරණාත්මක ව්‍යායාම වැඩසටහන් සැලසුම් කිරීම මඟින් මෙය සාක්ෂාත් කරගනු ලැබේ. අපගේ

පුහුණුකරුවන් හොඳින් සුදුසුකම් ලබා ඇති අතර කර්මාන්තයේ නව ප්‍රවණතා සමඟින් ගමන් කරයි.



වැදගත්ම දෙය නම්, ඔවුන් අලුතින් සම්බන්ධ වූ අත්දැකීම් අඩු සාමාජිකයන් පිළිබඳව ඉතා සැලකිලිමත් වීම සහ ඔවුන්ට සහාය වීමයි.

ව්‍යායාම් ශාලාවේ පළමු මහලේ සහ බිම් මහලේ කෙළවරේ 2023.06.01 දින සිට පිළිවෙලින් අවන්හල සහ පලතුරු යුෂ අළෙවි සැලක් ඇත.

ව්‍යායාම් ශාලාවේ සාමාජිකයින්ට සහ එළිමහන් ව්‍යායාම ශාලාවට පැමිණෙන පුද්ගලයින්ට පලතුරු යුෂ අළෙවි සැලෙන් සෞඛ්‍ය සම්පන්න යුෂ මිලදී ගත හැකිය. එය දිනපතා පෙරවරු 6.00 සිට රාත්‍රී 10 දක්වා ක්‍රියාත්මක වේ. එමෙන්ම දිනපතා පෙ.ව. 11 සිට ප.ව. 11 දක්වා අවන්හලෙන් රසවත් ආහාර මිලදී ගත හැක.

**මුළු ආදායම (2023) : රු. මිලියන 25.78**

### 4. සූරියමල් මාවත

ගංවතුර තර්ජනය පාලනය කිරීමේ අරමුණින් 2023 වසරේ "වේරැස් ගඟ" ව්‍යාපෘතියේ දෙවන පියවර ලෙස සූරියමල් මාවත උද්‍යානය ඉදිකරන ලදී. ඇවිදීමේ මංතීරුව සහ ආහාර අළෙවි සැල මෙම උද්‍යානයේ ප්‍රධාන ලක්ෂණ වේ. පවුලේ අය හෝ මිතුරන් සමඟ සවස් කාලය ගත කිරීමට එය ඇත්තෙන්ම කදිම ස්ථානයකි.



**මුළු ආදායම (2023) : රු. මිලියන 0.28**

### 5. කට්ටිය හන්දිය

ගංවතුර තර්ජනය පාලනය කිරීමේ අරමුණින් 2023 වසරේ "වේරැස් ගඟ" ව්‍යාපෘතියේ දෙවන පියවර ලෙස කට්ටිය හන්දිය උද්‍යානය ඉදිකරන ලදී. ඇවිදීමේ මංතීරුව සහ ආහාර අළෙවි සැල මෙම උද්‍යානයේ ප්‍රධාන ලක්ෂණ වේ. පවුලේ අය හෝ මිතුරන් සමඟ සවස් කාලය ගත කිරීමට එය ඇත්තෙන්ම කදිම ස්ථානයකි.



**මුළු ආදායම (2023) : රු. මිලියන 0.09**

### 6. කෙළිමඩල

"බොරලැස්ගමුව - කෙලිමඩළ ළමා උද්‍යානය" කොළඹ - හොරණ මාර්ගයේ පිහිටා ඇත. කෙලිමඩළ උද්‍යානය 2018 දී "වේරැස් ගඟ" ව්‍යාපෘතිය යටතේ ඉදිකර ඇත. විශේෂ අවශ්‍යතා ඇති ළමුන් සඳහා ශ්‍රී ලංකාවේ පළමු ළමා උද්‍යානය මෙයයි. මෙම උද්‍යානයේ ප්‍රධාන ලක්ෂණ වන්නේ ඇවිදීමේ මාර්ගය, ආහාර අළෙවි සැල සහ ළමා උද්‍යානයයි. එය සැබවින්ම පවුලේ අය හෝ මිතුරන් සමඟ සන්ධ්‍යාව ගත කිරීමට කදිම ස්ථානයකි.

ආබාධිත ළමුන් සඳහා නිර්මාණය කර ඇති විවිධ ආකාරයේ ක්‍රියාකාරකම් 21 ක් මෙහි ඇත. විශේෂ අවශ්‍යතා ඇති දරුවන්ට විශේෂ ආරක්ෂාවක් යටතේ හැකි තාක් දුරට සාමූහික ක්‍රියාකාරකම්වලට සහභාගි වීමට හැක.

**මුළු ආදායම (2023) : රු. මිලියන 2.93**



### 7. ඇළ මාර්ග රක්ෂිතවල ඇති වෙළඳ දැන්වීම් පුවරු

සමාගමේ එළිමහන් සලකුණ බොහෝ විට අනාගත ගනුදෙනුකරුවෙකු දකින පළමු දෙයයි. සමාගම් ලාංඡනය අවධානය ආකර්ෂණය කර ගැනීම සඳහා ප්‍රමාණවත් තරම් දීප්තිමත් හා කැපී පෙනෙන්නක් විය යුතු (අතිශය දීප්තිමත් නොවිය යුතුය) වන අතර අනාගත ගනුදෙනුකරුවන්ට එහි විකුණනු ලබන දේ පිළිබඳව දැන ගැනීමට ප්‍රමාණවත් තොරතුරු සහිත විය යුතුය. SLLDC පාලනය යටතේ ඇති ඇළ ඉවුරුවල සහ වෙනත් ස්ථානවල ඇති ඉඩ ප්‍රමාණය පෞද්ගලික පාර්ශ්වයන්ට ඔවුන්ගේ නිෂ්පාදනය, සේවාව හෝ සමාගම ප්‍රදේශයේ මහනගර සභාවේ අවසරය ඇතිව ප්‍රචාරය කිරීම සඳහා ලබා දී ඇත.







**මුළු ආදායම (2023) : රු. මිලියන 8.31**

**8. ගාර්ටන්ස් ආර්ක් අවන්හල**

ගාර්ටන්ස් ආර්ක් යනු නාවල නාගරික තෙත්බිම් උද්‍යානයට යාබදව පිහිටි දියවන්නා ඔයේ නිශ්චල ජලයේ ක්‍රියාත්මක වන ශ්‍රී ලංකාවේ විශාලතම යාත්‍රා අවන්හලයි. එය 2014 නොවැම්බර් මාසයේදී දියත් කරන ලදී.

**මුළු ආදායම (2023) : රු. මිලියන 3.86**



**9. හංස බෝට්ටු සේවය**

විවේකය සහ සන්සුන්භාවය දියවන්නා ඔයේ දායාදයන් වේ. පදින හංස බෝට්ටු මගින් විනෝදාත්මක අත්දැකීමක් ලබා දෙන අතරම එහි වගුරුබිම් ඉවුර දිගේ බෝට්ටු සවාරිය නගර වැසියන්ට සොබාදහම සමඟ නැවත සම්බන්ධ වීමට උපකාරී වේ. මෙම පහසුකම මහජනයාට ලබා දීම සඳහා පෞද්ගලික අංශයට භාර දී ඇත.

**මුළු ආදායම (2023) : රු. මිලියන 0.51**



**10. කටමාරන් -38' ඩිනර් කෘෘස් යාත්‍රාව**

38' ඩිනර් කෘෘස් යාත්‍රාව 2020 ජනවාරි 24 වන දින සිට දියත උයන අවට දියවන්නා වැවේ යාත්‍රා කරන අවන්හලකි. යාත්‍රා කරන ආපනශාලාව දුර්ලභ ශාක හා සත්ත්ව විශේෂවලින් යුත් සුන්දර දසුන් පසුකරමින් දියත ජල මාර්ගයේ පැහැදිලි ජලයේ කිලෝමීටර 12 ක් ආවරණය කරමින් යාත්‍රා කරයි. SLLDC හි පාලනය යටතේ ඇති පරිශ්‍රය සහ ජලාශය ඒෂියා කෘෘස් ලයින්ස් ඇන්ඩ් ට්‍රැවල්ස් සමාගම වෙත ඔවුන්ගේ යාත්‍රා කරන ආපන ශාලාව පවත්වාගෙන යාමට ලබා දී ඇත.





**මුළු ආදායම (2023) : රු. මිලියන 0.96 11**

**11. කිරිමණ්ඩල මාවත ක්‍රිකට් ක්‍රීඩාංගණය**

2014 වර්ෂයේදී විවිධ ක්‍රීඩා සඳහා ක්‍රීඩා සංකීර්ණයක් ඉදිකිරීම සඳහා කිරිමණ්ඩල මාවතේ අක්කර 18.5ක වගුරු බිමක් ගොඩකර ඉන් අක්කර 5.8ක් පළමු පෙළ ක්‍රිකට් ක්‍රීඩාංගණයක් ලෙස සංවර්ධනය කරන ලදී. ක්‍රීඩාංගණ ප්‍රදේශය ජාත්‍යන්තර ක්‍රිකට් ක්‍රීඩාංගණයට සමාන විය. ස්ථානයෙහි වැදගත්කම සහ ක්‍රීඩාංගණය සකස් කිරීමේ ගුණාත්මක භාවය හේතුවෙන්, SLLDC හට ශ්‍රී ලංකා ක්‍රිකට්, සුප්‍රසිද්ධ ශ්‍රී ලංකා ක්‍රිකට් ක්‍රීඩකයින් සහ ශ්‍රී ලංකාවේ පළමු පෙළ ක්‍රිකට් සමාජ වලින් ක්‍රිකට් ක්‍රීඩාංගණය දීර්ඝ කාලීනව කුලියට / බදු දීමට යෝජනා රාශියක් ලැබී ඇත.

**මුළු ආදායම (2023) : රු. මිලියන 7.88**


TOTAL
LAST WKT
WKTS
OVERS
HOME
VISITORS

# මානව සම්පත් සංවර්ධන අංශය

මානව සම්පත් සංවර්ධන සහ පරිපාලන අංශයේ දායකත්වය

**මානව සම්පත් සංවර්ධන අංශයේ ප්‍රධාන කාර්යයන්**

**01. මානව සම්පත් මෙහෙයුම් (පරිපාලනය)**
ප්‍රධාන මානව සම්පත් ක්‍රියාකාරකම්වල මනා මෙහෙයවීම සහ සේවකයන්ගේ සුබසාධනය සහතික කිරීම

**02. මානව සම්පත් සංවර්ධනය**
පුද්ගල හා ආයතනික අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා සංස්ථාව තුළ මානව ප්‍රාග්ධනය නිසි ලෙස සැලසුම් කිරීම හා සංවර්ධනය කිරීම.

**03. මානව සම්පත් පුහුණුව සහ සංවර්ධනය**
ආයතනික කාර්ය සාධනය වැඩි දියුණු කිරීම සඳහා සේවකයන්ගේ කුසලතා සාක්ෂාත් කර ගැනීම සහ වැඩිදියුණු කිරීම

| මානව සම්පත් මෙහෙයුම් | මානව සම්පත් සංවර්ධනයන් | මානව සම්පත් පුහුණුව |
|---|---|---|
| • සේවා අවශ්‍යතා මත වාර්ෂික මාරුවීම් සහ මාරුවීම්<br>• මිනිස්බල/දේපළ/වාහන/යන්ත්‍රෝපකරණ සහ උපකරණවල අනතුරු සහ හිමිකම් සමඟ වාර්ෂික රක්ෂණ හැසිරවීම<br>• විනය පරිපාලනය<br>• සේවක සුභසාධන ක්‍රියාකාරකම්<br>• සේවය අවසන් කිරීමේ ප්‍රතිලාභ<br>• ආරක්ෂක අංශය, ප්‍රවාහන හා වෛද්‍ය මධ්‍යස්ථානය සමඟ සම්බන්ධීකරණය කිරීම<br>• තැපැල් පද්ධතියේ පරිපාලනය<br>• වැටුප් හා වේතන පරිපාලනය.<br>• වාර්ෂික/වැටුප් වර්ධක<br>• වෘත්තීය සමිති කටයුතු කළමනාකරණය<br>• සේවක දුක්ගැනවිලි<br>• කාල කළමනාකරණය<br>• අභ්‍යන්තර සහ බාහිර චක්‍රලේඛ | ▪ මානව සම්පත් සැලසුම් කිරීම<br>▪ බඳවාගැනීම සහ තෝරා ගැනීම<br>▪ උසස්වීම්<br>▪ මානව සම්පත් ප්‍රතිපත්ති සංවර්ධනය, ක්‍රියාත්මක කිරීම සහ සම්බන්ධීකරණය<br>▪ අධ්‍යක්ෂ මණ්ඩල තීරණ සහ ජ්‍යෙෂ්ඨ කළමනාකරණ තීරණ ක්‍රියාත්මක කිරීම<br>▪ ආයතනික සැලැස්ම සහ වාර්ෂික අයවැය සකස් කිරීම | • දේශීය හා විදේශීය පුහුණු වැඩසටහන් පැවැත්වීම<br>• පුහුණු අවශ්‍යතා ඇගයීම් පැවැත්වීම<br>• වාර්ෂික පුහුණු සැලැස්මක් සකස් කිරීම<br>• නම් කරන ලද පුහුණු වැඩසටහන් සඳහා පුහුණු කමිටු නිලධාරින් හරහා තෝරා ගැනීම් සිදු කෙරේ<br>• පශ්චාත් පුහුණු ඇගයීම් ක්‍රමය ක්‍රියාත්මක කිරීම<br>• උසස් අධ්‍යාපනය සඳහා මූල්‍ය ආධාර ලබා දීම<br>• සංස්ථාවේ තත්ත්ව කළමනාකරණ පද්ධතිය සාක්ෂාත් කර ගැනීම සඳහා ක්‍රියාවලි, ක්‍රියා පටිපාටි අධීක්ෂණය සහ වැඩි දියුණු කිරීම |

**<u>බඳවාගැනීම් සහ තෝරාගැනීම</u>**

2023 දෙසැම්බර් 31 දක්වා සිදු කරන ලද බඳවාගැනීම් සංඛ්‍යාව

| සේවක වර්ගය | සංඛ්‍යාව |
|---|---|
| ස්ථිර සේවකයන් | 24 |
| කොන්ත්‍රාත් සේවකයන් | - |
| එකතුව | 24 |

2023 දෙසැම්බර් 31 දිනට මුළු කාර්ය මණ්ඩල සංඛ්‍යාව

| විස්තරය | සංඛ්‍යාව |
|---|---|
| ස්ථිර සේවකයන් | 1277 |
| කොන්ත්‍රාත් සේවකයන් | 25 |
| අනියම් සේවකයන් | - |
| එකතුව | 1302 |

**<u>උසස්වීම්</u>**

උසස් කිරීම ආයතනික අරමුණු, සේවකයාගේ කාර්යයන් සහ කර්තව්‍යයන් සපුරාලීම හඳුනාගැනීම මත පදනම් වේ. මෙය ලබා දෙන සංකීර්ණත්වය සහ වගකීම මත වෙනස් විය හැක. එබැවින් වගකීම් මට්ටම වැඩි වීම මගින් තරාතිරම වෙනස්වීම මත උසස්වීම් පදනම් වේ. උසස්වීම්වල අමතර ප්‍රතිලාභ වඩා හොඳ කාර්ය සාධනයක් සඳහා දිරිගැන්වීමක් ලෙස සේවය කරයි. උසස්වීම්වල අමතර ප්‍රතිලාභ වඩා හොඳ කාර්ය සාධනයක් සඳහා දිරිගැන්වීමක් ලෙස ඇති කරන අතර චිත්ත ධෛර්යය වැඩි දියුණු කිරීම සහ පුද්ගල ජයග්‍රහණයක සහ පිළිගැනීමේ හැඟීමක් ඇති කරයි.
ඒ අනුව 2023 වර්ෂය තුළ ශ්‍රේණියේ උසස්වීම් 59ක් පිරිනමන ලදී.

**<u>පුහුණුව සහ සංවර්ධනය</u>**

**මානව සම්පත් කළමනාකරණය** (HRM)
ආයතනයකට ඔවුන්ගේ ශ්‍රම ශක්තිය ප්‍රශස්ත ලෙස භාවිතා කිරීමට අවශ්‍ය වූ විට පුහුණුව සහ සංවර්ධනය වැදගත් අංගයකි. සංවිධානයේ අනුප්‍රාප්තික සැලසුම්කරණය සඳහා පුහුණුව සහ සංවර්ධනය ප්‍රධාන සාධකයක් වන අතර එය කණ්ඩායම් කළමනාකරණය සහ නායකත්වය වැනි කුසලතා වැඩිදියුණු කිරීමට උපකාරී වේ. ආයතනික දෘෂ්ටි කෝණයෙන් මානව සම්පත් පුහුණු සහ සංවර්ධන ක්‍රියාකාරකම් ලාභදායිත්වය ඉහළ නැංවීමට සහ ආයතනික ප්‍රතිරූපය ඉහළ නැංවීමට වැදගත් **කාර්ය සාධන කළමනාකරණ මෙවලමකි**.

ඒ අනුව, SLLDC 2023 වර්ෂයේදී SLLDC හි සියලුම සේවක කාණ්ඩ සඳහා ධාරිතා වර්ධනය සහ අඛණ්ඩ වෘත්තීය සංවර්ධනය සඳහා විවිධ දැනුම බෙදාගැනීමේ වැඩසටහන් ගණනාවක් පවත්වා ඇත.

**<u>SLLDC හි තත්ත්ව කළමනාකරණ පද්ධතිය</u>**

ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනයේ (SLSI) අවශ්‍යතා අනුව පහත තත්ත්ව කළමනාකරණ ප්‍රමිතීන් ලබාගෙන ඇති ප්‍රමුඛතම ආයතනය SLLDC වේ.
ISO 9001: 2015 තත්ත්ව කළමනාකරණ පද්ධතිය
ISO 14001 පාරිසරික කළමනාකරණ පද්ධතිය (EMS)
ISO 45001: වෘත්තීය සෞඛ්‍ය සහ ආරක්ෂණ කළමනාකරණ පද්ධතිය

# නීති අංශය

1968 අංක 15 දරන ශ්‍රී ලංකා ඉඩම් සංවර්ධනය කිරීමේ සංස්ථා (SLLDC) පනත හා එහි තදනන්තර සංශෝධනයන් මගින් පවරා ඇති බලතල ප්‍රකාරව නීති අංශය ක්‍රියාත්මක වේ.

**නීතිමය කාර්යයන්**:

1. ඉඩම් සංවර්ධනය කිරීම්, නැවත පදිංචි කිරීම, ප්‍රජා උපදේශන සඳහා අදාළ නීති කෙටුම්පත් ලියවිලි සකස් කිරීම සහ අඩු ආදායම්ලාභී පවුල් පදිංචි ප්‍රදේශවල ජනතාව සඳහා නීතිමය ආධාර සැපයීම.

2. සංස්ථාව මගින් හා සංස්ථාවට එරෙහි නඩු හබ ආදියේදී අධිකරණයේදී සංස්ථාව වෙනුවෙන් පෙනී සිටීම හා ආරක්ෂා කිරීම.

3. සංස්ථාවේ එදිනෙදා කටයුතු සම්බන්ධයෙන් වූ සියලු කාරණා සම්බන්ධයෙන් උපදෙස් සැපයීම.

4. සියලු ආකාරයේ අනවසර ගොඩ කිරීම්වලට එරෙහිව, ජල අපවහන සැලසුම්වල සඳහන් කොන්දේසි කඩකරන්නන්ට එරෙහිව, ශ්‍රී ලංකා ඉඩම් ගොඩකිරීමේ හා සංවර්ධනය කිරීමේ සංස්ථා පනත සහ 2006 අංක 35 හා 2021 අංක 13 දරන එහි සංශෝධනයන් මගින් ප්‍රකාශිත ප්‍රදේශයන්හි පිහිටි ඇළ මාර්ග රක්ෂිතයන්හි අනවසර පදිංචිකරුවන් සහ ඇළ මාර්ග දූෂණය කරන්නන්ට එරෙහිව නීතිමය පියවර ගැනීම සඳහා සංස්ථාව බලාත්මක වී ඇත.

5. සියලු අවබෝධතා ගිවිසුම් සැකසීම හා සහතික කිරීම, අළෙවි ගිවිසුම්, කොන්ත්‍රාත්/ උපදේශන ගිවිසුම්, දිගු කාලීන බදු දීම්, වාර්ෂික බදු දීම්, කෙටි කාලීන බදු දීම්, ඔප්පු පවරා දීම්, අදාළ නීතිමය ලියකියවිලි, විදේශ රැකියා පොරොන්දු පත්‍ර (වැටුප් සහිත/රහිත), මෝටර් රථ ණය ගිවිසුම්, ඇටෝර්නි බලපත්‍ර සහ ඉඩම් නිරවුල් සහතික පත් සඳහා ඉඩම් හිමිකම් වාර්තාවන්හි අයිතිය.

# විගණන කළමනාකරණ කමිටු වාර්තාව

විගණන හා කළමනාකරණ කමිටුව ආයතනයක මූල්‍ය වාර්තාකරණය, අභ්‍යන්තර පාලන පද්ධති, අවදානම් කළමනාකරණ පද්ධති සහ අභ්‍යන්තර හා බාහිර විගණන කාර්යයන් වැනි ක්ෂේත්‍රවල අධීක්ෂණ වගකීම් සාක්ෂාත් කර ගැනීම සඳහා මණ්ඩලයට සහාය වීම සඳහා උපාය මාර්ගික කාර්යභාරයක් ඉටු කරනු ලබන කමිටුවකි. විගණන කමිටුව සභාපතිත්වය විධායක නොවන අධ්‍යක්ෂවරයෙකු විසින් දරන අතර එය විධායක නොවන අධ්‍යක්ෂවරුන්ගෙන් පමණක් සමන්විත වේ. කමිටුවේ රාජකාරි ඵලදායී ලෙස ඉටු කිරීම සඳහා ප්‍රමාණවත් මූල්‍ය හා විගණන විශේෂඥතාවක් සහිත ජ්‍යෙෂ්ඨ සහායක කාර්ය මණ්ඩලයක සහාය කමිටුවට ලබා දී ඇත

**කමිටුවේ කාර්යභාරය**

**විගණන කමිටු ප්‍රඥප්තිය**

මහා භාණ්ඩාගාරය විසින් නිකුත් කර ඇති අංක PED 01/2021 දරන රාජ්‍ය ව්‍යවසාය චක්‍රලේඛය මඟින් පොදු ව්‍යවසායන්වල විගණන කමිටු පාලනය වේ

**ප්‍රධාන කාර්යයන්**

සංස්ථාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සහ මෙහෙයුම් කාර්යයන් පිළිබඳ ස්වාධීන හා විෂය මූලික සමාලෝචනයක් ලබා දීමෙන් මණ්ඩලයට සිය රාජකාරි ඉටු කිරීමට සහාය වීම කෙරෙහි විගණන කමිටුව මූලික වශයෙන් අවධානය යොමු කරයි.

**කමිටුවේ රැස්වීම්**

2023.12.31 දිනෙන් අවසන් වූ වර්ෂය තුළ කමිටු රැස්වීම් හතරක් පවත්වන ලදී. කමිටු රැස්වීම්වල කාර්ය සටහන් වාර්තා කර අධ්‍යක්ෂ මණ්ඩලයට නිතිපතා වාර්තා කරන ලදී. විගණකාධිපතිවරයාගේ නියෝජිතයා ලෙස විගණන අධිකාරීවරයා නිරීක්ෂකයෙකු ලෙස රැස්වීම්වලට සහභාගි විය. රේඛීය අමාත්‍යාංශයේ ප්‍රධාන අභ්‍යන්තර විගණකවරයා ආරාධනය මත රැස්වීම්වලට සහභාගි විය.

2023 වසරේ පැවති රැස්වීම් සඳහා කමිටු සාමාජිකයින්ගේ පැමිණීම පහත දැක්වේ:

| අධ්‍යක්ෂවරයාගේ නම | සහභාගි වූ රැස්වීම් සංඛ්‍යාව |
|---|---|
| එස්.ඒ.සී. කුලතිලක මිය (සභාපති)<br>(පළමු රැස්වීම් තුන සඳහා සහභාගී විය) | 3 |
| එස්. තාර්ෂාන් මහතා (සභාපති)<br>(අවසාන රැස්වීමට සහභාගී විය) | 1 |
| ගාමිණී හේවගේ මහතා (සාමාජික) | 4 |
| ධම්මික දිසානායක මහතා (සාමාජික) | 4 |

**අභ්‍යන්තර විගණනය**

සංස්ථාවට වෙනම අභ්‍යන්තර විගණන අංශයක් ඇත. අභ්‍යන්තර විගණන සැලැස්ම විගණන කමිටුවට ඉදිරිපත් කර අනුමත කරන ලද අතර කමිටුව අභ්‍යන්තර විගණන සැලැස්ම ආවරණය කිරීමේ ප්‍රගතිය සමාලෝචනය කරයි. කමිටුව එහි කාර්තුමය රැස්වීම්වලදී අභ්‍යන්තර විගණකවරුන්ගේ වාර්තා සමාලෝචනය කරන අතර එමඟින් අභ්‍යන්තර විගණන සැලැස්මේ ප්‍රගතිය අධීක්ෂණය කිරීමට කමිටුවට හැකියාව ලැබේ.

**බාහිර විගණනය**

2018 අංක 19 ජාතික විගණන පනතේ 12 වැනි වගන්තියට අනුව විගණකාධිපතිවරයා බාහිර විගණකවරයා ලෙස පත් කරන ලදී. විගණකාධිපතිවරයා විසින් පත් කරන ලද විගණන අධිකාරීවරයා සංස්ථාවේ බාහිර විගණන කටයුතු සම්බන්ධීකරණය කරයි.

**නිගමනය**

සභාපති එස්.ඒ.සී.කුලතිලක මහත්මිය විගණන කළමනාකරණ කමිටු රැස්වීම් තුනක සභාපතිත්වය දරන ලද අතර, ඇය විශ්‍රාම ගැනීමෙන් පසු, මෙම වාර්තාවෙන් ආවරණය වන කාල සීමාව තුළ, එනම් 2023දෙසැම්බර් 31 න් අවසන් වූ වර්ෂය තුළ එස්. තාර්ෂාන් මහතා සභාපතිත්වය දරන ලදී. එබැවින්, වාර්තාව එහි සත්‍යතාව සත්‍යාපනය කර සැකයකින් තොරව තහවුරු කර ඇති වාර්තා මත පදනම් වී ඇත. වත්මන් විගණන කළමනාකරණ කමිටුව එස්. තාර්ෂාන් (සභාපති), ගාමිණී හේවගේ (සාමාජික) සහ ධම්මික දිසානායක (සාමාජික) යන මහත්වරුන්ගෙන් සමන්විත වේ.

**විගණන හා කළමනාකරණ කමිටුව වෙනුවෙන්**

**එස්. තාර්ෂාන්**
**සභාපති - විගණන හා කළමනාකරණ කමිටුව**
**2024 පෙබරවාරි 22**

# මූල්‍ය සමාලෝචනය

**සංස්ථාවේ මූල්‍ය කාර්ය සාධනය**

2016 සිට පසුගිය වසර හත තුළ අඛණ්ඩව මෙහෙයුම් ලාභ වාර්තා කිරීමෙන් පසුව, ප්‍රවර්තන වර්ෂයේදී සංස්ථාව රුපියල් මිලියන 130 ක මෙහෙයුම් අලාභයක් ලබා ඇත. මෙම මෙහෙයුම් අලාභයට ඉඩමක් විකිණීමෙන් ලබාගත් රු. මිලියන 447 ක ලාභය ද ඇතුළත් වේ. මෙම මෙහෙයුම් අලාභය ව්‍යාපෘතිවල අඩු හෝ සෘණ ආන්තිකය, අඩු ක්‍රියාකාරකම් මට්ටම් සහ පොදු කාර්ය පිරිවැය ඉහළ යාමේ ප්‍රතිඵලයකි. කෙසේවෙතත්, සමාලෝචිත වර්ෂය සඳහා, බදු පෙර ලාභය එහි පෙර වසරේ රු. මිලියන 761 සිට රු. මිලියන 1,223 දක්වා ඉහළ ගොස් ඇත. 2022 වසරේ සිට 2023 වසර දක්වා ආයෝජන ආදායම රු. මිලියන 1,191 සිට රු. මිලියන 1,637 දක්වා කැපී පෙනෙන ලෙස ඉහළ ගොස් ඇත. මෙය විචක්ෂණශීලී සහ ගතික ආයෝජන කළඹ කළමණාකරණය හරහා වෙළෙඳපොළ තුළ පැවති ඉහළ පොලී අනුපාතවල වාසිය ලබා ගැනීමේ ප්‍රතිඵලයකි.




සංස්ථාවේ ආදායම පෙර වසරේ පැවති රු.මිලියන 4,290 ට වඩා ප්‍රවර්තන වර්ෂයේ රු. මිලියන 5,431 දක්වා ඉහළ ගොස් ඇත. සමාලෝචිත වර්ෂයේදී, භාණ්ඩාගාර ව්‍යාපෘතිවලින් ලැබෙන ආදායම මුළු ආදායමෙන් 46%ක් විය. වැලි විකිණීමෙන් ලැබෙන ආදායම, ඉඩම් අලෙවියෙන් ලැබෙන ආදායම සහ සේවාදායක ව්‍යාපෘතිවලින් ලැබෙන ආදායම අනෙකුත් ප්‍රධාන ආදායම් දායකයන් බවට පත් විය.




2023 වර්ෂය සඳහා සංස්ථාවේ ආදායමේ ආංශික සංයුතිය පහත දැක්වේ;




2023 වර්ෂය සඳහා සංස්ථාව විසින් රු. මිලියන 4469 ක එකතු කළ අගයක් නිර්මාණය කර ඇති අතර එය පාර්ශ්වකරුවන් අතර බෙදා හැරීම මෙම වාර්තාවේ අවසාන කොටසෙහි දැක්වේ. 2023 වර්ෂයේදී මූල්‍ය පනතට අනුව විශේෂ බද්දක් ලෙස සංස්ථාව ඒකාබද්ධ අරමුදලට රු. මිලියන 500 ක දායකත්වයක් ලබා දී ඇති බව ද අවධාරණය කළ යුතුය.

2023 වර්ෂය තුළ සංස්ථාවේ ශුද්ධ වත්කම් රු. බිලියන 11 ඉක්මවා ඇති බව සඳහන් කිරීම වැදගත් වේ. එමෙන්ම එහි මුළු වත්කම් රු. බිලියන 19 ඉක්මවයි. සංවිධානයේ ද්‍රවශීලතාවය ද සතුටුදායක මට්ටමක පවත්වා ගෙන යනු ලැබේ.

සංස්ථාව දැනට මුහුණ දී සිටින විශාලතම අභියෝගය වන්නේ එයට දැරීමට සිදුවන අධික පොදු කාර්ය පිරිවැය හේතුවෙන් ඇති වන භාරයයි. 2023 වර්ෂයේදී රු. මිලියන 2,375 ක දළ ලාභය පොදු කාර්ය වියදම් මගින් සම්පූර්ණයෙන් අවසන් වූ අතර එහි ප්‍රතිඵලයක් ලෙස රු. මිලියන 130 ක මෙහෙයුම් අලාභයක් සිදුවිය.

**සමූහයේ මූල්‍ය කාර්ය සාධනය**

2023 වර්ෂය සඳහා අනුබද්ධ සමාගම් ද්විත්වයම සමූහයේ මූල්‍ය කාර්ය සාධනය වැඩි දියුණු කරමින් ලාභ වාර්තා කළේය. REDECO පෙර වසරේ ලාභය වූ රු. මිලියන 13 ට සාපේක්ෂව රු. මිලියන 34 ක ලාභයක් උපයා ඇති අතර LRDC පෙර වර්ෂයේ ලාභය වූ රු. මිලියන 62 ට සාපේක්ෂව ප්‍රවර්තන වර්ෂය සඳහා රු. මිලියන 87 ක ලාභයක් උපයා ඇත.

# අධ්‍යක්ෂ මණ්ඩල වාර්තාව

2023 දෙසැම්බර් මස 31 වැනි දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා සංස්ථාවේ අධ්‍යක්ෂ මණ්ඩලය ඔවුන්ගේ වාර්තාව හා සංස්ථාවේ ගිණුම් සතුටින් ඉදිරිපත් කරයි.

**ප්‍රධාන කාර්යයන්**

සංස්ථාවේ ප්‍රධාන කාර්යයන්, මෙහෙයුම් සමාලෝචනයේ සහ මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන් අංක 1 හි විස්තර කර ඇත

**වර්ෂය පිළිබඳ මෙහෙයුම් සමාලෝචනය**

වර්ෂය තුළ සංස්ථාවේ කටයුතු සම්බන්ධයෙන් සවිස්තරාත්මක සමාලෝචනයක් මේ යටතේ දක්වා ඇත.

**පිරිවැටුම**

2023 වර්ෂය තුළ සංස්ථාවේ පිරිවැටුම රුපියල් මිලියන 5,431 කි. (2022: රු.මිලියන 4,290 කි)

**ලාභය**

2022 වර්ෂයේ ලාභය වන රු.මිලියන 336 හා සැසඳීමේදී සමාලෝචිත වර්ෂයේදී සංස්ථාවේ ලාභය රු.මිලියන 938 කි.

**කටයුතුවල තත්ත්වය**

සංස්ථාවේ කටයුතුවල තත්ත්වය මූල්‍ය තත්ත්ව වාර්තාවේ පෙන්නුම් කර ඇති පරිදි වේ. (පිටුව 93)

**දේපළ, පිරියත හා යන්ත්‍රෝපකරණ**

වර්ෂය තුළ දේපළ, පිරියත හා උපකරණ පිළබඳ සිදු වූ සංසරණය ගිණුම් හා සම්බන්ධ සටහන් අංක **8හි** දක්වා ඇත.

**බදුකරණය**

2017 අංක 24 දරන දේශීය ආදායම් බදු පනත සහ එකී පනතෙහි තදනන්තර සංශෝධන ප්‍රකාර බදු ගෙවීම් සඳහා කරන ගැළපුම් අනුව වර්ෂයේ ලාභය පදනම් කර ගෙන ආදායම් බදු ගෙවීම සඳහා ප්‍රතිපාදන සලසනු ලැබේ.

**කොන්ත්‍රාත් සම්බන්ධයෙන් අධ්‍යක්ෂවරුන්ගේ බැඳියාව**

මූල්‍ය ප්‍රකාශනයන්හි සටහන් අංක 22 හි අනාවරණය කර ඇති පරිදි හැර සංස්ථාවේ පවතින හෝ යෝජිත කොන්ත්‍රාත් සම්බන්ධයෙන් අධ්‍යක්ෂවරුන්ට සෘජු හෝ වක්‍ර බැඳියාවක් නොමැත.

**අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම්**

2023 වර්ෂය තුළදී අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් 12ක් පවත්වා ඇත. එක් එක් අධ්‍යක්ෂවරයාගේ සහභාගි වූ අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් සංඛ්‍යාව පහත පරිදි වේ

| අධ්‍යක්ෂවරයාගේ නම | පත් කළ දිනය | සහභාගි වීම සඳහා සුදුසුකම් ලැබූ රැස්වීම් සංඛ්‍යාව | සහභාගි වූ රැස්වීම් සංඛ්‍යාව |
|---|---|---|---|
| රියර් අද්මිරාල් හිරාන් සචේන්ද්‍ර බාලසූරිය මහතා | 14.03.2022 | 12 | 12 |
| ඉංජිනේරු දීපිකා ත්‍රිමාවිතාන මිය | 02.01.2023 | 06 | 05 |
| ඉංජි .අජිත් ගුණසේකර මහතා | 04.07.2023 | 06 | 05 |
| ඩී.ඒ.එච්.පියතිලක මහතා | 04.04.2022 | 12 | 11 |
| ගාමිණී හේවගේ මහතා | 04.04.2022 | 12 | 12 |
| එස්.ඒ.සී. කුලතිලක මිය | 03.03.2022 | 09 | 09 |
| එස්. තාර්ෂාන් මහතා | 10.10.2023 | 03 | 02 |
| ආනන්ද හරිස්චන්ද්‍ර මහතා | 09.08.2022 | 12 | 10 |
| තිස්ස ගුණවර්ධන මහතා | 09.08.2022 | 12 | 11 |
| ඩී.එස් දිසානායක මහතා | 09.08.2022 | 12 | 12 |

**අඛණ්ඩ පැවැත්ම**

අඛණ්ඩ පැවැත්මක් ලෙසින් ඉදිරියටත් පැවතීමේ හැකියාව සංස්ථාව සතු වන බවට අධ්‍යක්ෂ මණ්ඩලය සිය විශ්වාසය පළ කර සිටී.

**ව්‍යවස්ථාපිත ගෙවීම්**

ඔවුන්ගේ දැනුවත් වීම සහ විශ්වාසය අනුව රජය සහ සේවකයන් සම්බන්ධයෙන් සිදු කළ සියලු විමධ්‍යගත ගෙවීම් නියමිත කලට වේලාවට සිදු කළ බවට අධ්‍යක්ෂවරුන් සෑහීමට පත් වේ.

**සේවක මණ්ඩලය**

2023 වර්ෂයේ දෙසැම්බර් මස 31 වැනි දිනට පුද්ගලයින් 1302 දෙනෙකු සංස්ථාවේ සේවයේ නියුතුව ඇත. (2022: 1361)

**ශේෂ පත්‍රයේ දිනයට පසු සිදුවීම්**

ශේෂ පත්‍රයේ දිනට පසු සිදු වී ඇති වැදගත් සිදුවීම් සැලකිල්ලට ගෙන ඇති අතර අවශ්‍ය අවස්ථාවලදී ගිණුම්වල ගැළපීම් සිදු කර ඇත.

**අති විශේෂිත අයිතමයන්**

වෙනම අනාවරණය කළ යුතු අසාමාන්‍ය/අති විශේෂිත ස්වභාවයේ ගනුදෙනු මූල්‍ය ප්‍රකාශනය පිළිබඳ සටහන් මඟින් වාර්තා කර ඇත.

**විගණකවරු**

2023 වර්ෂය සඳහා සංස්ථාවේ ගිණුම් විගණකාධිපති දෙපාර්තමේන්තුව විසින් විගණනය කරනු ලැබේ.

මණ්ඩලයේ අණ පරිදි,

**එච්.කේ.කේ. ඩබ්ලිව්. ඒකනායක**
**අධ්‍යක්ෂ මණ්ඩල ලේකම්**
**2024 මැයි 08**

# විගණකාධිපතිවරයාගේ වාර්තාව

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය / எனது இல. / My No. } එච්යුඩී/සී/එස්එල්එල්ඩීසී/එෆ්ඒ/23/01
ඔබේ අංකය / உமது இல. / Your No. }
දිනය / திகதி / Date } 2024 ඔක්තෝබර් 24 දින

SLLDC Chairman office
0000032512

RECEIVED
Chairman's Office
28 OCT 2024
Sri Lanka Land Development Corporation

GM/Addl.GM (Impl./P&D)/
DGM(...F.....) / DGM(...IA....)
F.M.A.
28/10/2024

සභාපති

ශ්‍රී ලංකා ඉඩම් සංවර්ධනය කිරීමේ සංස්ථාව

**ශ්‍රී ලංකා ඉඩම් සංවර්ධනය කිරීමේ සංස්ථාවේ හා එහි පරිපාලිතයන්ගේ 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව**

**1. මූල්‍ය ප්‍රකාශන**

**1.1 තත්ත්වාගණය කළ මතය**

ශ්‍රී ලංකා ඉඩම් සංවර්ධනය කිරීමේ සංස්ථාවේ ("සංස්ථාව") හා එහි පරිපාලිතයන්ගේ ("සමූහය") 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාළ තොරතුරුද ඇතුළත් මූල්‍ය ප්‍රකාශන වලට අදාළ සටහන්වලින් සමන්විත 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (6) ව්‍යවස්ථාව ප්‍රකාරව මාගේ වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලැබේ.

මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණු වලින් වන බලපෑම හැර, සංස්ථාවේ සහ සමූහයේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

RECEIVED
General Manager's Office
29 OCT 2024
Sri Lanka Land Development Corporation

Internal Audit Division
30 OCT 2024
SLLDC

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව | இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை. | No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34 | +94 11 2 88 72 23 | ag@auditorgeneral.gov.lk | www.naosl.gov.lk

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

#### 1.2.1 සමූහය

ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 24 ට අනුව සහ සංකල්පනාත්මක රාමුවට අනුව සංස්ථාව හා පරිපාලිත සමාගම් අතර සිදු වන දේපළ, අනෙකුත් වත්කම් විකිණීම, කල් බදු දීම හෝ පැවරුම් පිළිබඳ අදාළ තොරතුරු විස්තරාත්මකව සහ ප්‍රමාණාත්මකව මූල්‍ය ප්‍රකාශනවල ඉදිරිපත් කර නොතිබුණි.

**1.2.2 ශ්‍රී ලංකා ඉඩම් සංවර්ධනය කිරීමේ සංස්ථාවේ පරිපාලිත සමාගම් වන ඉඩම් ගොඩකිරීමේ හා සංවර්ධනය කිරිමේ සමාගමේ හා සී/ස එල්ආර්ඩීසී සේවා (පෞද්ගලික) සමාගමේ 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විගණකාධිපති වාර්තාව අනුව විගණන මතය පහත සඳහන් කරුණු මත තත්ත්වාගණනය කරන ලදී.**

#### 1.2.2.1 සී/ස එල්ආර්ඩීසී සේවා (පෞද්ගලික) සමාගම

**කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර සඳහා වූ ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම**

(අ) ප්‍රමිතයේ 02 වගන්තිය

සංකල්ප හා ව්‍යාප්ත මූලධර්ම 2.52 ඡේදය අනුව ප්‍රමිතිය මඟින් නියමකර නොමැතිනම් ආයතනයෙහි ආදායම් හා වියදම් එකිනෙකට හිලව් නොකළ යුතු වුවත් සමාගම සේවාදායක ආයතනය අයකරනු ලැබූ දඩ මුදල් විකුණුම් ආදායමින් අඩුකර පෙන්වා තිබීම හේතුවෙන් විකුණුම් ආදායම රු.මිලියන 33.79 කින් ඌන ගණනය වී තිබුණි.

(ආ) ප්‍රමිතයේ 10 වගන්තිය

ප්‍රමිතියේ 10.21 ඡේදයට අනුව ආයතනයක් විසින් හඳුනාගන්නා ලද ප්‍රමාණාත්මක පූර්ව කාලපරිච්ඡේද වැරදි එහි (අ) සහ (ආ) වගන්ති අනුව නිවැරදි කල යුතු වුවත්, 2018 සහ 2019 වර්ෂයන් වලට අදාළ රු.මිලියන 9.21 ක ජාතිය ගොඩ නැඟීමේ බදු සමාලෝචිත වර්ෂයේදි ආදායමක් ලෙස හඳුනා ගැනීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ ආදායම එම අගයෙන් අධි ගණනය වී තිබුණි.

(ඇ) ප්‍රමිතයේ 13 වගන්තිය

ප්‍රමිතියේ 13.19 වන ඡේදයට අනුව සමාගම විසින් රු.77,968 ක් වටිනා ආදේශක තොග (Sample) අයිතම 14 ක්ද රු.මිලියන 6.77 ක් වටිනා Metal Detectors 731 ක් හා රු.මිලියන

2.4 ක් වටිනා CCTV උපකරණ 587 ක්ද වශයෙන් එකතුව රු.මිලියන 9.25 ක් වටිනා තොග වසර 05 ක් පුරාවට නොවිකිණී පැවතුණද එයට අදාළ හානිකරන අලාභය හඳුනාගෙන නොතිබුණි.

(ඈ) සමාලෝචිත වර්ෂය අවසාන වන විට සමාගමේ නොසැසඳු ණයගැති ශේෂය රු. මිලියන 1.28 ක් වූ අතර මෙම ණයගැතියන් නිශ්චිතව හඳුනාගෙන අදාළ ණයගැති ගිණුම් නිවැරදි කිරීමට සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් කටයුතු කර නොතිබූ අතර මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ ණයගැති වටිනාකමින් මෙම වටිනාකම අඩුකර ණයගැති ශේෂය දක්වා තිබුණි.

(ඉ) සමාගම විසින් මව් සංස්ථාව වෙතින් ලද CCTV ස්ථාපනය කිරීමේ කොන්ත්‍රාත්තුවකට අදාළව සංස්ථාව වෙතින් නොලැබෙන රු.මිලියන 1.59 ක් විකුණුම් වලින් අඩුකර මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබීම හේතුවෙන් විකුණුම් ආදායම් එම අගයෙන් ඌන ගණනය වී තිබුණි.

### 1.2.2.2 ඉඩම් ගොඩකිරීමේ හා සංවර්ධනය කිරීමේ සමාගම

**කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර සඳහා වූ ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම**

(අ) ප්‍රමිතයේ 02 වගන්තිය

සමාලෝචිත වර්ෂය වන විට ආර්ථික සේවා ගාස්තුව අහෝසි වී වර්ෂ 03 ක් ඉක්මවීම හේතුවෙන් ප්‍රවර්තන වර්ෂය තුල හෝ ඉන් ඉදිරියට ගෙවිය යුතු බදු සඳහා ආර්ථික සේවා ගාස්තුව හිලව් කල නොහැකි බැවින් මූල්‍ය ප්‍රකාශන වල රු.මිලියන 3.03 ක් ලෙස ලැබිය යුතු ආර්ථික සේවා ගාස්තුව දැක්වීම හේතුවෙන් සමාලෝචිත වර්ෂය අවසාන දිනට ජංගම වත්කම් එම වටිනාකමින් අධිගණනය වී තිබුණි.

(ආ) ප්‍රමිතයේ 10 වගන්තිය

(i) ප්‍රමිතයේ 10.19 ඡේදයට පටහැනිව ඉකුත් වර්ෂයට අදාළව රු. මිලියන 1.51 ක වෛද්‍ය දීමනාව සමාලෝචිත වර්ෂය තුළදි වියදමක් ලෙස හඳුනා ගැනීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ ලාභය එම අගයෙන් ඌන ගණනය වී තිබුණි.

(ii) ප්‍රමිතයේ 10.19 ඡේදයට අනුව පෙර කාලපරිච්ඡේදයේ වැරදි, අතීතයට බලපාන පරිදි ආරම්භක ශේෂ හා පෙර වර්ෂයේ සැසඳුම් අගයන් (Comparative amounts for the prior period) නැවත සකස් කළ යුතු නමුත් එලෙස කටයුතු කර නොතිබීම

හේතුවෙන් ප්‍රවර්තන වර්ෂයේ බදු ආදායම හා බදු පසු විස්තීරණ ආදායම රු. මිලියන 33.28 අධිතක්සේරුව පවතින බව නිරීක්ෂණය විය.

(ඇ) ප්‍රමිතයේ 16 වගන්තිය

සමාගම විසින් රු. මිලියන 38 ක් වටිනා කොටගල ඉඩම අනාගතයේදි බදු ආදායම් උපදවා ගැනීමේ අරමුණින් තබාගෙන ඇති අතර ප්‍රමිතයේ 16.2 ඡේදයට අනුකූලව ආයෝජිත දේපළ ලෙස ගිණුම්ගත නොකර දේපළ පිරියත උපකරණ යටතේ දක්වා තිබුණි.

(ඈ) ප්‍රමිතයේ 17 වගන්තිය

ප්‍රමිතයෙහි 17.19 ඡේදය අනුව සමාගම විසින් සමාලෝචිත වර්ෂය අවසානයට පැවති ලියාහල අගය රු.මිලියන 64.95 ක්වූ ගොඩනැගිලි පිරියත හා උපකරණ සම්බන්ධයෙන් සුන්බුන් අගය සහ ප්‍රයෝජනවත් ජීවිත කාලය නැවත සමාලෝචනය කර නොතිබුණි. තවද සමාලෝචිත වර්ෂය අවසානයට පිරිවැය රු.මිලියන 63.71 ක් වූ සම්පූර්ණයෙන් ක්ෂය කර තිබූ නමුත් තවමත් භාවිතයට ගන්නා ස්ථාවර වත්කම් 635 ක් පැවති නමුත් එම වත්කම්වල ඇස්තමේන්තුගත දෝෂය නිවැරදි කිරීම සඳහා සුදුසු පියවර ගෙන නොතිබුණි.

(ඉ) ප්‍රමිතයේ 23 වගන්තිය

ප්‍රමිතයෙහි 23.17 ඡේදය අනුව වාර්තාකරණ කාලච්ඡේදය තුළදී කොන්ත්‍රාත්තුවෙහි සම්පූර්ණ කර ඇති මට්ටම (Stage of Completion) මත කොන්ත්‍රාත් අයභාරය සහ වියදම හඳුනා ගත යුතු වුවත් සමාගමේ ඉංජිනේරුවන් සහතික කරන ලද බිල්පත් වටිනාකම පදනම් කරගනිමින් කොන්ත්‍රාත් ආදායම හඳුනාගෙන තිබුණි. ඒ අනුව සමාලෝචිත වර්ෂයට අදාළව සමාගම විසින් රු. මිලියන 79.12 ක් ලෙස ආදායම හඳුනාගෙන ඇතත් ප්‍රමිතය ප්‍රකාරව කළ වැඩ මට්ටම මත විගණනය විසින් සිදුකරනු ලැබූ ගණනය කිරීම්වලට අනුව 2023 වර්ෂයට අදාල ආදායම ආසන්න වශයෙන් රු.මිලියන 54.91 ක් වූ අතර ඒ අනුව එම ශේෂ අතර රු.මිලියන 24.21 ක වෙනසක් නිරීක්ෂණය වූ අතර සමාලෝචිත වර්ෂයේ ආදායම එම අගයෙන් අධි ගණනය වී තිබුණි.

(ඊ) ප්‍රමිතයේ 27 වගන්තිය

ප්‍රමිතයේ 27.9 (ඉ) ඡේදය අනුව මුහුදු වැලි ඇසුරුම් කිරීමේ ව්‍යාපෘතිය වෙනුවෙන් භාවිතා කළ රු. මිලියන 55.42 ක් වටිනා වත්කම් හානිකරණයකට ලක්වී තිබුණද කිසිදු හානිකරණ අලාභයක් සමාගම විසින් සමාලෝචිත වර්ෂය තුළදී හඳුනාගෙන නොතිබුණි.

(උ) ප්‍රමිතයේ 28 වගන්තිය

(i) සමාගම විසින් ප්‍රමිතය අනුව නිර්වචිත දායකත්ව සැලසුම් පිලියෙල කිරීම, නිර්වචිත ප්‍රතිලාභ වගකීම මැනීම, පැවරු හා නොපැවරු දෙයාකාර වගකීම් ඇතුළත් කිරීම, වට්ටම් කිරීම, ආයුගණක ඇගයීම යන කාර්යයන් සිදු කිරීමෙන් තොරව රු. මිලියන 1.45 ක සේවක පාරිතෝෂික වියදමක් සමාලෝචිත වර්ෂය තුළදි හදුනාගෙන තිබුණි. එමනිසා මෙම වටිනාකම සම්බන්ධයෙන් හා එයට අදාළව හදුනාගෙන තිබූ රු.මිලියන 18.74 ක් වූ ජංගම නොවන වගකීමෙහි නිරවද්‍යතාවය විගණනයට තහවුරු කරගත නොහැකි විය.

(ii) සමාගම විසින් එහි මව් සමාගම වෙත නිදහස් කර තිබූ (Man power basis) සේවකයන් 181 දෙනෙකු සඳහා 2010 වර්ෂයේ සිටම සේවක පාරිතෝෂිත වියදමක් හා වගකීමක් ගණනය කර මූල්‍ය ප්‍රකාශනවල හඳුනාගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඌ) ප්‍රමිතයේ 29 වගන්තිය

(i) ප්‍රමිතයේ 29.8 ඡේදය අනුව විලම්භිත බදු සඳහා හදුනා ගනු ලැබූ 2019/20 හා 2020/21 වර්ෂයන්ට අදාළ අලාභ වූ රු. මිලියන 99.39 මත වන විලම්භිත බදු වත්කම රු. මිලියන 29.82 ක් ඉදිරි වසර 03 තුළ අයකර ගත හැකිද යන්න විගණනයේදි ගැටළුකාරී විය. තවද ඉදිරි වසර 03 තුළ ප්‍රමාණවත් බදු ලාභයක් වාර්තා කිරීමට අපොහොසත් වුවහොත් විලම්භිත බදු වත්කම් අඩුවීමටත් ඊට සාපේක්ෂව බදු වියදම ප්‍රමාණාත්මකව ඉහළ යාම මඟින් ඉදිරි මූල්‍ය ප්‍රකාශන තුළ බදු පසු ලාභය මඟින් සමාගමේ තත්‍ය ස්වභාවයන් නොපෙන්වීමට ඉඩ ඇති බව නිරීක්ෂණය විය

(ii) ප්‍රමිතයේ 29.16 වන ඡේදය අනුව සමාගම විසින් විලම්භිත බදු වත්කම සඳහා සලකා බැලිය යුතු අඩමාන ණය රු. මිලියන 4.44 වෙනුවට වර්ෂයේ අඩමාන ණය වෙන්කිරීම් වූ රු.53,168 ක් සලකා බැලීම හේතුවෙන් විලම්භිත බදු වත්කම රු. මිලියන 1.31 කින් ඌණගණනය වී ඇති අතර මූල්‍ය ප්‍රකාශන අනුව ඉඩම් තක්සේරු කිරීමේ ලාභය රු. මිලියන 34.17 ක් වුවත් විලම්භිත බදු සඳහා සලකා බලන ලද ඉඩම් තක්සේරු කිරීමේ ලාභය රු. මිලියන 34.50 ක් වීමෙන් විලම්භිත බදු වගකීම රු.99,692 කින් අධිතක්සේරුව පවතින බව නිරීක්ෂණය විය.

(එ) සමාගම සතු රු.මිලියන 301.28 ක් වටිනා මුහුදු වැලි ඇසුරුම් කිරීමේ ගොඩනැගිල්ල රු.මිලියන 326.30 කට රජයේ තක්සේරු දෙපාර්තමේන්තුව මගින් තක්සේරු කර මව් සංස්ථාව මගින් 2021 වර්ෂයේදි පවරාගෙන තිබුණි. නමුත් ගොඩනැගිල්ලෙහි පිරිවැය ජල රැඳවුම් පොකුණුද ඇතුළත්ව රු.මිලියන 331.02 ක් ලෙස සමාගමෙහි මූල්‍ය ප්‍රකාශන තුළ දක්වා

තිබූ අතර ගොඩනැගිල්ලේ වටිනාකම පමණක් තක්සේරු වටිනාකමින් අඩු කළ යුතු වුවත් ඉහත සඳහන් සම්පූර්ණ වටිනාකමම තක්සේරු වටිනාකමට එරෙහිව කපා හැර තිබුණි. ඒ අනුව රු.මිලියන 25.03 කින් සමාගමේ රඳවා ගත් ඉපැයුම් හා ජංගම නොවන වත්කම් ඌන ගණනය වී තිබුණි.

### 1.2.3 ශ්‍රී ලංකා ඉඩම් සංවර්ධනය කිරීමේ සංස්ථාව

(අ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 01 - මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

(i) ප්‍රමිතයේ 60 ඡේදය ප්‍රකාරව, වගකීම්, ජංගම සහ ජංගම නොවන ලෙස වෙන්කර මූල්‍ය ප්‍රකාශනවල දැක්විය යුතු වුවද, ඉඩම් අත්පත්කර ගැනීම සඳහා ගෙවිය යුතු වන්දි ලෙස මූල්‍ය ප්‍රකාශනවල දක්වා ඇති රු.මිලියන 256.48 ක් ජංගම නොවන වගකීම් යටතේ පමණක් දක්වා තිබුණි. එසේම ප්‍රමිතයේ 29 ඡේදයට පටහැනිව ඉඩම් වන්දි මත ගෙවිය යුතු පොළිය රු.මිලියන 123.69 ක්ද මූල්‍ය ප්‍රකාශනවල වෙනම විෂයක්/අයිතමයක් ලෙස පෙන්වීමට කටයුතු නොකර අත්පත් කරගත් ඉඩම් සඳහා ගෙවිය යුතු වන්දි යටතේ දක්වා තිබුණි.

(ii) ප්‍රමිතයේ 33 ඡේදය ප්‍රකාරව ප්‍රමිතයෙන් අවසර දී ඇති අවස්ථාවක මිස කිසිදු විටක වත්කම් හා වගකීම් එකිනෙකට හිලව් නොකළ යුතු නමුත් සංස්ථාව විසින් කොන්ත්‍රාත් ණයහිමියන් වෙත හා වෙළඳ ණය හිමියන් වෙත වැඩිපුර හා ඉදිරියට කළ ගෙවීම් පිළිවෙලින් රු.මිලියන 15.18 ක හා රු.මිලියන 149.92 ක ශේෂයන් එකිනෙකට හිලව් කර තිබුණි. මේ හේතුවෙන් ණයහිමි ශේෂය රු.මිලියන 165.1 කින් ඌන ගණනය වී තිබුණි.

(ආ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 10 - වාර්තාකරණ කාලයට පසු සිද්ධීන්

ප්‍රමිතයේ 8 වන ඡේදය අනුව වාර්තාකරණ කාලපරිච්ඡේදයට අදාළව හඳුනා ගන්නා ලද අයිතමයන් මූල්‍ය ප්‍රකාශන තුළ ගැලපිය යුතුය. ඒ අනුව 2024 පෙබරවාරි 28 දින ලද තක්සේරු වාර්තාව අනුව 2022 වර්ෂයේ ඔක්තෝබර් 18 දින උපලබ්ධි කරන ලද රු. මිලියන 96 ක් වටිනා ඉඩම් සම්බන්ධයෙන් දේශීය ආදායම් පනත අනුව 2017 සැප්තැම්බර් 30 දිනට වටිනාකම රු. මිලියන 66 ක් ලෙස තක්සේරු කර තිබූ නමුත් ගෙවිය යුතු සියයට 30 ක් වන ප්‍රාග්ධන ලාභ බදු වියදම හා ගෙවිය යුතු බදු වටිනාකම වෙනුවෙන් රු.මිලියන 9.07 ක වෙන් කිරීමක් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 37 හි 14 වන වගන්තිය ප්‍රකාරව මූල්‍ය ප්‍රකාශන තුළ සිදු කර නොතිබුණි.

(ඇ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 12 - ආදායම් බදු

ප්‍රමිතයේ 24 වන ඡේදය අනුව, අඩු කල හැකි තාවකාලික වෙනසට අදාලව විලම්භිත බදු වත්කම් හදුනා ගත යුතු ය. ඒ අනුව ආදායම් බදු පනත ප්‍රකාරව ඉඩ නොදෙන වියදම් වන අඩමාන ණය වෙන්කිරීම, සෙමෙන් චලනය වන තොග සඳහා වෙන් කිරීම යනාදී වියදම් වෙනුවෙන් ඉඩදෙන වියදම් ලෙස පිලිවෙලින් තත්‍ය බොල් ණය හා තත්‍ය තොග කපා හැරීම් පවතින හෙයින් අඩුකළ හැකි තාවකාලික වෙනසක් නිර්මාණය වන අතර ඊට අදාලව විලම්භිත බදු වත්කමක් හදුනා ගත යුතු වුවද ඒ අනුව කටයුතු කර නොතිබුණි.

(ඈ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 16 - දේපළ, පිරියත හා උපකරණ

(i) ප්‍රමිතියේ 36 ඡේදය අනුව, දේපළ පිරියත උපකරණවලට අදාළ යම් අයිතමයක් ප්‍රත්‍යාගණනය කරනු ලබන්නේ නම් එම අයිතමයට අදාළ වත්කම් පංතියම ප්‍රත්‍යාගණනය කළ යුතු වුවද, රු. මිලියන 301.39 ක් වටිනා වාහන පමණක් 2020 ජනවාරි ප්‍රත්‍යාගණනය කර තිබූ නමුත් සංස්ථාව සතුව පැවති පිළිවෙලින් රු. මිලියන 24.74 ක් හා රු. මිලියන 26.47 ක පිරිවැය වූ මෝටර් බයිසිකල් 160 ක් හා ජීප් රථයක් සමාලෝචිත වර්ෂය තුළදීද ප්‍රත්‍යාගණනය කර නොතිබුණි.

(ii) ප්‍රමිතියේ 51 ඡේදය අනුව, ජංගම නොවන වත්කම් සඳහා ඵලදායී ජීවිත කාලය සමාලෝචනය නොකිරීම හේතුවෙන් පිරිවැය රු. මිලියන 764 ක්වූ වත්කම් 5675 ක් සම්පූර්ණයෙන් ක්ෂය කර තිබුණද තවදුරටත් ප්‍රයෝජනයට ගනිමින් පැවති එම වත්කම්වල ඇති වූ ඇස්තමේන්තුගත දෝෂය ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 8 ප්‍රකාරව ප්‍රතිශෝධනය කිරීමට සමාලෝචිත වර්ෂය තුළදීද කටයුතු කර නොතිබුණි.

(ඉ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 40 - ආයෝජිත දේපළ

(i) ප්‍රමිතයේ 5 වන ඡේදය අනුව ආයෝජිත දේපලක් යනු බදු කුලී ඉපයීම හෝ ප්‍රාග්ධන වටිනාකම වැඩි වීම හෝ ඒ අරමුණු දෙකම සඳහා තබාගෙන ඇති වත්කම් වේ. නියැදි පරීක්ෂාවේදී හෙළිදරව් වූ පරිදි කල්බදු පදනම මත ලබා දුන් ඉඩම් 02 ක් ආයෝජිත දේපළ ලෙස හදුනානොගෙන දේපළ, පිරියත හා උපකරණ යටතේ දක්වා තිබුණි.

(ii) ප්‍රමිතයේ 79 (ඉ) ඡේදයට පටහැනිව සංස්ථාව සතු පිරිවැය රු.මිලියන 622.7 ක් වූ ඉඩම් 02 ක හා ගොඩනැගිලි 04 ක සාධාරණ වටිනාකම මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කර නොතිබුණි.

(iii) 2017 ජුලි 21 දිනැති තක්සේරු දෙපාර්තමේන්තුවේ තක්සේරුව අනුව වටිනාකම රු. මිලියන 70 ක්වූ, සසකාවා භාරය ගොඩනැගිල්ල සංස්ථාව විසින් ආයෝජිත දේපළ

ලෙස මූල්‍ය ප්‍රකාශනවලට හඳුනා ගෙන නොතිබූ බැවින් ජංගම නොවන වත්කම් එම අගයෙන් ඌන ගණනය වී තිබූ අතර මෙම ගොඩනැගිල්ලට අදාළ ක්ෂය වියදමද හඳුනානොගැනීම හේතුවෙන් සංස්ථාවේ ලාභයද අධි ගණනය වී තිබුණි.

(ඊ) ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිත අංක 08 - මෙහෙයුම් ඛණ්ඩ

ප්‍රමිතයේ 11 වන ඡේදය ප්‍රකාරව ආයතනය විසින් මූල්‍ය ප්‍රකාශන පරිශීලකයන් හට තමන් නිරතවන ව්‍යාපාරික ක්‍රියාකාරකම්වල ස්වභාවය හා මූල්‍ය බලපෑම හා එය ක්‍රියාත්මක වන ආර්ථික පරිසරය ඇගයීමට හැකිවන පරිදි සිය එක් එක් මෙහෙයුම් අංශ පිළිබඳව තොරතුරු වෙන වෙනම වාර්තා කළ යුතු වුවත් සංස්ථාව විසින් පවත්වාගෙන යනු ලබන මෙහෙයුම් අතුරින් ප්‍රධාන අංශ හඳුනාගෙන ප්‍රමිතියට අනුව වෙන වෙනම වාර්තා කර නොතිබුණි.

(උ) ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිත අංක 13 - සාධාරණ අගය මැනීම

ප්‍රමිතයේ 3 ඡේදය අනුව මූල්‍ය වාර්තාකරණ අරමුණු සඳහා දේපළ පිරියත උපකරණ, ආයෝජන දේපළ සහ ජීව විද්‍යාත්මක වත්කම් අගය කිරීමක් සිදුකළ යුත්තේ සුදුසුකම්ලත් තක්සේරුකරුවන් විසින් වුවද, සංස්ථාව විසින් ආයෝජිත දේපළ ප්‍රත්‍යාගණනය කිරීමේදී ඒ අනුව කටයුතු කර නොතිබුණි. ඒ අනුව ආයෝජිත දේපළ සම්බන්ධව මූල්‍ය ප්‍රකාශනවල දක්වා ඇති රු.මිලියන 12,571.7 ක වටිනාකමේ නිරවද්‍යතාවය විගණනයේදී ගැටළු සහගත විය.

(ඌ) ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිත අංක 15 - ගණුදෙනුකරුවන් සමඟ වන ගිවිසුම්වලින් වන අයභාරය

(i) සංස්ථාව විසින්ම ක්‍රියාත්මක කරනු ලබන ව්‍යාපෘති (Own Project) වලට අදාළ බිල්පත් සහතික කිරීමේදී සංස්ථාවේ සේවයේ නියුතු ඉංජිනේරුවරුන් විසින්ම සහතික කර තිබූ අවස්ථා නිරීක්ෂණය වූයෙන් රු.මිලියන 98.74 ක කළ වැඩ සහතික කිරීම් වල නිවැරදිතාවය සහ අපක්ෂපාතිභාවය විගණනයේදී ගැටළු සහගත විය.

(ii) ප්‍රමිතයේ (ආ) පරිශිෂ්ඨයේ - 16 ඡේදයට අනුව අස්තිත්වයට ඉන්වොයිස් කිරීමට අයිතියක් ඇති වටිනාකම අස්තිත්වයේ අයභාරය ලෙස හඳුනාගත හැකිය. නමුත් සංස්ථාව විසින් කොන්ත්‍රාත් ආදායම හඳුනාගැනීම සඳහා ගෙවීමට ඉදිරිපත් කරන ලද බිල්පත් (Interim Payment Certificate) ගණුදෙනුකරු විසින් සහතික කරන අවස්ථාව තෙක් අයභාරයට හඳුනා ගැනීමට කටයුතු කර නොතිබුණි. මේ හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ සිදුකල ව්‍යාපෘති 45 කට අදාළ බිල්පත් පරීක්ෂා කිරීමේදී

රු.මිලියන 140.01 ක් අඩුවෙන් හා රු.මිලියන 351.72 ක් වැඩියෙන් ආදායමට හඳුනාගෙන තිබීම නිසා ඒ අතර වෙනස වූ රු.මිලියන 211.71 කින් කොන්ත්‍රාත් ආදායම අධි ගණනය වී තිබුණි.

(iii) ප්‍රමිතයේ 107 ඡේදය ප්‍රකාරව සහ ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිත අංක 9 ට අනුව ගිවිසුම් වත්කමක් හානිකරණය සඳහා මැනීම, ඉදිරිපත් කිරීම සහ හෙළිදරව් කිරීම කළ යුත්තේ මූල්‍ය වත්කමක් හා සමාන පදනමක් මත වුවද සංස්ථාව විසින් සේවාදායක ආයතන විසින් සහතික කළ බිල්පත් වටිනාකමෙන් සියයට 90 ක් පමණක් මූල්‍ය ප්‍රකාශනවල ගිණුම්ගත කරන අතර ඉතිරි සියයට 10 පිළිබඳ හෙළිදරව් කිරීමක් පමණක් සිදු කර තිබූ අතර මූල්‍ය ප්‍රකාශනවලට ගැලපුම් කර නොතිබුණි. එසේම මූල්‍ය වත්කම් හානිකරණ වටිනාකම මූල්‍ය ප්‍රකාශන වල දක්වා නොතිබුණි.

(iv) ප්‍රමිතියේ 16 ඡේදය ප්‍රකාරව ඉන්වොයිස් කිරීමට අයිතියක් සංස්ථාවට නොමැති 2022 වර්ෂයේ අයවැය ප්‍රතිපාදන සීමාව ඉක්මවා සිදුකළ රු. මිලියන 457.08 ක් වටිනා වැඩ වල වටිනාකම සමාලෝචිත වර්ෂයේ අයභාරයට හඳුනාගෙන තිබුණි. ඒ අනුව, එම වටිනාකමින් සමාලෝචිත වර්ෂයේ ආදායම අධි ගණනය වී තිබුණි.

(එ) ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිත අංක 16 - කල්බදු

මහ කොළඹ ගංවතුර පාලනය කිරීමේ හා පරිසරය වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතියේ සංවර්ධන කටයුතු නිසා අවතැන් වූවන් සඳහා 2001 වර්ෂයේදී ඉදිකල කොළොන්නාව පිහිටි සුදුනෙළුම්පුර නිවාස 144 ක්, පැවරුම් පත්‍රයක් මගින් අවතැන්වූවන් සඳහා ලබාදී තිබුණි. උක්ත ව්‍යාපෘතිය වෙනුවෙන් දැරූ පිරිවැය රු. මිලියන 86.1 ක් වූ අතර මෙම වටිනාකම ගිණුම් තැබීම ප්‍රමිතය ප්‍රකාරව සිදුකර නොතිබූ අතර මුළු ණයගැති වටිනාකම හා ඊට අදාළ පොලී ආදායම වෙන වෙනම හඳුනා ගැනීමට කටයුතු කළ යුතු වුවත් නිවාසලාභීන්ගෙන් අයවිය යුතු රු.මිලියන 35.83 ක වටිනාකම ණයගැතියන් හා වෙනත් ආදායම් ලෙස මූල්‍ය ප්‍රකාශනවල හඳුනාගෙන තිබුණි.

(ඒ) සංස්ථාව වෙත නිදහස් රදවා ගැනීමේ පදනම මත (Free Hold Basis) රජය විසින් ලබාදී තිබූ මුතුරාජවෙල පිහිටි අක්කර 02 ක පමණ ඉඩමක් සඳහා අමප/19/2832/16/11 අංක හා 2019 ඔක්තෝබර් 29 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය අනුව ඒ සඳහා දැරූ සංවර්ධනය කිරීමේ වියදම් අයකර ඉතිරි මුදල රජයේ ඒකාබද්ධ අරමුදලට බැර කරන ලෙසට දන්වා තිබුණද එලෙස එම ඉඩම 2019 දෙසැම්බර් 17 දින විකුණා රු. මිලියන 272.62 ක් ලබාගෙන තිබූ නමුත් දැරූ සංවර්ධන වියදම රු. මිලියන 21.02 ක් අඩුකර ඒකාබද්ධ අරමුදලට බැර කළ යුතු රු. මිලියන 251.60 ක් 2024 මැයි දක්වාම බැරකර නොතිබූ අතර එම වගකීම හඳුනාගෙන ඒ සඳහා සංස්ථාවේ මූල්‍ය ප්‍රකාශන තුළ වෙන් කිරීම් සිදුකර නොතිබුණි.

(ඔ) රු.මිලියන 6.23 ක් වටිනාකමැති Electronic Document Management System (EDMS) පද්ධතිය අස්පෘශ්‍ය වත්කමක් ලෙස හඳුනා නොගෙන කෙරීගෙන යන ප්‍රාග්ධන වැඩ යටතේ මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි.

(ඕ) ඉඩම් අංශය විසින් ඉකුත් වර්ෂයේ ඉදිරිපත් කරන ලද උපලේඛනයට අනුව සංස්ථාව සතු ඉඩම් හා ආයෝජිත දේපළ අක්කර 1075 පර්චස් 29.21ක් වූ අතර සමාලෝචිත වර්ෂයේ ඉදිරිපත් කර ඇති මූල්‍ය ප්‍රකාශනවල දේපළ පිරියත හා උපකරණ යටතේ දක්වා ඇති ඉඩම් හා ආයෝජිත දේපළ අක්කර 66 රූඩ් 03 පර්චස් 5.13ක් වුයෙන් අක්කර 1008 රූඩ් 1 ක් හා පර්චස් 24.08 ක ඉඩම් මූල්‍ය ප්‍රකාශනවල හඳුනාගෙන නොතිබුණි.

(ක) සංස්ථාව සතු මුතුරාජවෙල පිහිටි අක්කර 22 රූඩ් 02 හා පර්චස් 37.14 ක් වූ බිම් කොටස හා වර්ග අඩි 55900 ක ගොඩනැගිල්ල රු. මිලියන 2195.79 ක බදු මුදලකට පෞද්ගලික සමාගමකට වසර 50 ක දිගු කාලීන බදු පදනම මත ලබා දීමට 2021 ජුනි 02 දින අවබෝධතා ගිවිසුමකට එළඹ තිබු අතර මේ සඳහා පෞද්ගලික සමාගම විසින් රු.මිලියන 500 ක අත්තිකාරම් මුදලක් 2021 ජුනි 03 දින ගෙවා තිබුණි. ඉඩම පෞද්ගලික සමාගම වෙත ලබාදුන් දින සිට සමාලෝචිත වර්ෂය අවසානය දක්වා කිසිදු ආදායමක් මූල්‍ය ප්රකාශනවලට හඳුනා ගැනීමට කටයුතු කර නොතිබීම හේතුවෙන් නාමික බදු කුලිය වූ රු.මිලියන 0.33 ක් ද ඇතුළත්ව සමාලෝචිත වර්ෂයේ බදු ආදායම රු.මිලියන 44.24 කින්ද රඳවාගත් ඉපැයුම් ගිණුම රු.මිලියන 69.94 කින්ද අඩු වී තිබුණි.

(ග) සංස්ථාවේ කුලී ආදායම් පිළිබඳව සිදුකරන ලද නියැදි විගණන පරීක්ෂාවට අනුව කෙටිකාලීන බදු පදනම මත බාහිර පාර්ශවයන් වෙත ලබාදී තිබු ඉඩම් වලින් සමාලෝචිත වර්ෂයට අදාළව ඉඩම් 4 කින් රු.මිලියන 9.56 ක් අඩුවෙන් කුලී ආදායම හඳුනාගෙන තිබීම හේතුවෙන් කුලී ආදායම රු.මිලියන 9.56 කින් ඌන ගණනය වී තිබුණි. එසේම සමාලෝචිත වර්ෂය අවසාන වන විට එක් කල් බදු ගැණුම්කරුවකුගෙන් රු.මිලියන 12.41 ක බදු මුදලක් ලැබිය යුතුව පැවතුණද සංස්ථාව එම වටිනාකම මූල්‍ය ප්‍රකාශනවලට හඳුනා නොගැනීම හේතුවෙන් ණයගැතියෝ එම වටිනාකමින්ම ඌන ගණනය වී තිබුණි.

(ච) සංස්ථාව වෙත 2023 සැප්තැම්බර් 13 දින මුදල්, ආර්ථික ස්ථායීකරණ හා ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය වෙතින් ලද අංක PED/A/Rev –L/1/15 (ii) දරන ලිපියට අනුව රු.මිලියන 750 ක වටිනාකමක් ඒකාබද්ධ අරමුදලට ගෙවිය යුතු ලෙස නියම කර තිබු අතර සමාලෝචිත වර්ෂය තුළ සංස්ථාව විසින් රු.මිලියන 500 ක් පමණක් ගෙවා තිබු අතර ඉතිරි රු.මිලියන 250 ජංගම වගකීම් ලෙස මූල්‍ය ප්‍රකාශනවල දක්වා නොතිබීම හේතුවෙන් ජංගම වගකීම් එම අගයෙන් ඌන ගණනය වී තිබුණි.

(ජ) සංස්ථාව විසින් සමාලෝචිත වර්ෂයට අදාළ ප්‍රාග්ධන දීමනාව ගණනය කිරීමේදී, ඊට අදාළව පිළියෙල කර තිබූ ලේඛනය තුළ වර්ෂයට අදාළ ප්‍රාග්ධන දීමනා එකතු කිරීමේදී, ඉදිරියට අය කළ හැකි ශේෂය එකතුවීම හේතුවෙන් වර්ෂයේ ප්‍රාග්ධන දීමනාව රු.මිලියන 134.02 කින් අධි ගණනය වී තිබීම නිසා ඒ මත ගණනය කළ සියයට 30 ක බදු වියදම රු.මිලියන 40.26 කින් ඌන ගණනය වී තිබුණි.

(ට) සංස්ථාව විසින් සමාලෝචිත වර්ෂය තුලදී සමාජ වගකීම් සඳහා වන ක්‍රියාකාරකම් (CSR) සඳහා දැරූ රු. මිලියන 2.49 ක අයහාර වියදමක් තොග ගිණුමේ කෙරීගෙන යන වැඩ ලෙස හඳුනාගැනීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ ජංගම වත්කම් එම අගයෙන් අධි ගණනය වී තිබුණි.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3. සමූහයේ 2023 වාර්ෂික වාර්තාවේ ඇතුළත් අනෙකුත් තොරතුරු.

මෙම විගණන වාර්තාවේ දිනට පෙර මා ලබාගත් සමූහයේ 2023 වාර්ෂික වාර්තාවේ ඇතුළත් කර ඇති නමුත් මූල්‍ය ප්‍රකාශන සහ ඒ පිළිබඳව වූ මගේ විගණන වාර්තාවේ ඇතුළත් නොවන තොරතුරු, අනෙකුත් තොරතුරු යන්නෙන් අදහස් වේ . මෙම අනෙකුත් තොරතුරු සඳහා කළමනාකරණය වගකිව යුතුය.

මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් වූ මගේ මතයෙන් අනෙකුත් තොරතුරු ආවරණය නොකරන අතර මම ඒ පිළිබඳ කිසිදු ආකාරයක සහතිකවීමක් හෝ මතයක් ප්‍රකාශ නොකරමි.

මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මගේ විගණනයට අදාළව, මගේ වගකීම වන්නේ ඉහත හඳුනාගත් අනෙකුත් තොරතුරු කියවීම සහ එසේ කිරීමේදී අනෙකුත් තොරතුරු මූල්‍ය ප්‍රකාශන සමඟ හෝ විගණනයේදී හෝ වෙනත් ආකාරයකින් ලබාගත් මගේ දැනුම අනුව ප්‍රමාණාත්මක වශයෙන් නොගැලපෙනවාද යන්න සලකා බැලීමයි.

මෙම විගණක වාර්තාවේ දිනට පෙර මා ලබාගත් අනෙකුත් තොරතුරු මත හා මා විසින් කරන ලද කාර්යයන් මත පදනම්ව, මෙම අනෙකුත් තොරතුරු ප්‍රමාණාත්මක වශයෙන් වැරදි ලෙස දක්වා ඇති

බව මම නිගමනය කරන්නේ නම්, එම කරුණ මා විසින් වාර්තා කිරීමට අවශ්‍ය වේ. මේ සම්බන්ධයෙන් මට වාර්තා කිරීමට කිසිවක් නැත.

### 1.4 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, සමූහයේ අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය සමූහය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා සමූහයේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

සමූහයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) උප වගන්තිය ප්‍රකාරව, සංස්ථාවේ සහ සමූහයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

### 1.5 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාර විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මග හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් සමූහයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා සමූහයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

- ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීම සඳහා සමූහය තුළ ඇති ආයතන හෝ ව්‍යාපාර ක්‍රියාකාරකම්වල මූල්‍ය තොරතුරු සම්බන්ධයෙන් ප්‍රමාණවත් සුදුසු විගණන සාක්ෂි ලබා ගන්නා ලදී. සමූහ විගණනයේ මෙහෙයවීම, අධීක්ෂණය සහ කාර්යසාධනය සඳහා මා වගකිව යුතුය. මගේ විගණන මතය සඳහා මම සම්පූර්ණයෙන්ම වගකිව යුතුය.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දූර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරන ලදී.

## 2. වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුලත් වේ.

2.1.1 මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණුවලින් වන බලපෑම හැර, 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (අ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවන් අනුව විගණනය සඳහා අවශ්‍ය සියලු තොරතුරු සහ පැහැදිලි කිරීම් මා විසින් ලබා ගන්නා ලද අතර, මාගේ පරීක්ෂණයෙන් පෙනී යන ආකාරයට නිසි මූල්‍ය වාර්තා සංස්ථාව පවත්වාගෙන ගොස් තිබුණි.

2.1.2 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව සංස්ථාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

2.1.3 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (i) (ඈ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ 1.2.2 (අ) (i), (ඈ) (i), (ii), (ඉ) (i), (ii), (ඊ), (උ), (ඌ) (i), (එ) , (ඒ), (ඔ), (ඕ) දක්වා ඇති නිරීක්ෂණ හැර ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

2.2 අනුගමනය කරන ලද ක්‍රියාමාර්ග සහ ලබා ගන්නා ලද සාක්ෂි මත හා ප්‍රමාණාත්මක කරුණුවලට සීමා කිරීම තුළ, පහත සඳහන් ප්‍රකාශ කිරීමට තරම් කිසිවක් මාගේ අවධානයට ලක් නොවීය.

2.2.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ඇ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව සංස්ථාවේ පාලක මණ්ඩලයේ යම් සාමාජිකයෙකුට සංස්ථාව සම්බන්ධවී යම් ගිවිසුමක් සම්බන්ධයෙන් සෘජුව හෝ අන්‍යාකාරයකින් සාමාන්‍ය ව්‍යාපාරික තත්වයෙන් බැහැරව සම්බන්ධයක් ඇති බව.

2.2.2 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ඊ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණ හැර යම් අදාල ලිඛිත නීතියකට හෝ සංස්ථාවේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානවලට අනුකූල නොවන ලෙස ක්‍රියා කර ඇති බව.

| **නීති රීති /විධානයට යොමුව** | **නිරීක්ෂණය** |
|---|---|
| (අ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | |
| (i) මු. රෙ. 94 | වාර්ෂික ඇස්තමේන්තුවල මුදල් ප්‍රතිපාදන ඇත්නම් විනා කිසිම වැඩක්, සේවයක් හෝ සැපයුමක් සඳහා වියදමකට හෝ බැඳීමකට නොඑළඹිය යුතු අතර වර්ෂයේ ප්‍රතිපාදන සීමාව නොඉක්මවිය යුතුය. එමෙන්ම නියම වශයෙන් මුදල් ගෙවීමට සිදුවන කාලය වන විට අවශ්‍ය අධිකාරි බලය නැතහොත් අතිරේඛ මුදල් ප්‍රතිපාදන ලැබේ යැයි අපේක්ෂාවෙන් වියදම් හෝ බැරකම් හෝ නොදැරිය යුතු වුවත් පසුගිය වර්ෂයේ වැය විෂයයන් 03 ක රු.මිලියන 457.08 ක් හා සමාලෝචිත වර්ෂයේ වැය විෂයයන් 04 ක රු.මිලියන 196 ක් වාර්ෂික ප්‍රතිපාදන සීමාව ඉක්මවා වැයකර තිබුණි. |
| (ii) මු. රෙ. 103, 104 සහ 110 | 2021 ජුලි 22 දින PH – 4457 අංක දරන මෝටර් රථයට සිදුවූ අනතුර සම්බන්ධයෙන් අදාළ බලධාරීන් වෙත වාර්තාකර නොතිබූ අතර නියමිත පරිදි පරීක්ෂණ පවත්වා ප්‍රාරම්භක හා පූර්ණ වාර්තා ලබාදීමට සංස්ථාව විසින් කටයුතු කර නොතිබුණි. එමෙන්ම රජයේ දේපළකට අලාභහානි සිදු වීම් |

| | | |
|---|---|---|
| | | ලේඛනයක ඇතුළත් කළ යුතු වුවත් මෙම අනතුරු පිළිබඳ එලෙස සටහන් කර නොතිබුණි. |
| (ආ) | 2021 නොවැම්බර් 16 දිනැති රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛ අංක 01/2021 | |
| | (i) මාර්ගෝපදේශ සංග්‍රහය 7.5 ඡේදය | සංස්ථාව විසින් මාසික ත්‍රෛමාසික සහ වාර්ෂික කාර්ය සාධනය වාර්තා අදාළ ආකෘති ප්‍රකාරව රේඛීය අමාත්‍යාංශය සහ මහා භාණ්ඩාගාරයට යොමුකළ යුතු වුවද, සංස්ථාව ඒ අනුව කටයුතු කර නොතිබුණි. |
| | (ii) අත්පොතේ 3.2 ඡේදය | සියළු ආයතන විසින් දීමනා සඳහා වන ඉල්ලීම රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් වෙත පිටපතක් සහිතව, අදාළ ආයතනයේ අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය සහ රේඛීය අමාත්‍යාංශයේ නිර්දේශය සහිතව, කළමණාකරන සේවා දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් වෙත අනුමැතිය සඳහා ඉදිරිපත් කළ යුතුය. කෙසේ වුවද, සංස්ථාව විසින් කාලපරිච්ඡේද 3 ක් යටතේ එම සෑම කාලපරිච්ඡේදයකදීම සියයට 50 බැගින් වැඩිවන පරිදි අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය මත පමණක් වෘත්තිය දීමනා ගෙවීම සිදු කර තිබුණි. ඒ අනුව සමාලෝචිත වර්ෂයේදි ගෙවන ලද වෘත්තිය දීමනා එකතුව රු.මිලියන 7.91 ක් විය. |
| | (iii) අත්පොතේ 7.7 ඡේදය | මව් සංස්ථාවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් එහි පරිපාලිත සමාගම්වල කාර්ය සාධන අධීක්ෂණය කිරීම සඳහා පහසුකම් සැලසීමට ව්‍යුහයක් ස්ථාපිත කළ යුතු අතර එය 2007 අංක 7 දරන සමාගම් පනතේ විධි විධානවලට අනුකූල විය යුතුය. අධ්‍යක්ෂ මණ්ඩලය පරිපාලිත ආයතනවල කාර්යසාධනය පිළිබඳ සාකච්ඡාවක් අවම වශයෙන් කාර්තුවකට වරක් සිදු කළ යුතු අතර ප්‍රමාණවත් ආයෝජන මත ප්‍රතිලාභ හිමි වන බවට සහතික කළ යුතු වුවත් සංස්ථාව විසින් |

එලෙස කටයුතු කර නොතිබුණි.

(ඇ) 2022 අගෝස්තු 08 දින රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛ අංක 04/2022

(i) 2 .7 ඡේදය

සමාජ වගකීම් සඳහා වන ක්‍රියාකාරකම් (CSR), උත්සව කටයුතු වලට ආදි වියදම් අත්හිටුවීම සඳහා උපදෙස් ලබාදී තිබූ අතර එවැනි කටයුතු සිදුකරනු ලබන්නේ නම් අදාළ අමාත්‍යවරයාගේ අනුමැතිය හා එකගතාවයෙන් පමණක් සිදුකල යුතු වුවත් ඊට පටහැනිව සංස්ථාව විසින් සමාලෝචිත වර්ෂය තුළදී සමාජ වගකීම් සඳහා වන ක්‍රියාකාරකම් (CSR) උදෙසා රු.මිලියන 3.32 ක් වැය කර තිබුණි.

(ii) 2.9 ඡේදය

දේශිය අරමුදල් වියදම් කර සිදු කරන විදේශ පුහුණු වැඩ සටහන් හා විදේශ සංචාර වියදම් අත්හිටුවිය යුතු වුවත් සමාලෝචිත වර්ෂය තුළදී විදේශ පුහුණුවීම් කටයුතු වෙනුවෙන් දේශිය අරමුදලින් රු.මිලියන 1.1 ක් වියදම් කර තිබුණි.

(ඈ) 2018 පෙබරවාරි 15 දිනැති අංක 01/2018 දරන වෙළද හා ආයෝජන ප්‍රතිපත්ති චක්‍රලේඛයේ 9.6 වගන්තිය

රාජ්‍ය නිලධාරින් හට තමන් දරන තනතුරු අනුව බදු සහන වාහන ලබා ගැනීමට ලබාදී ඇති විශේෂ වරප්‍රසාදය මත මෝටර් රථ ලබා ගත් සංස්ථාවේ නිලධාරීන් 12 දෙනෙකු හට එම මෝටර් රථ ලබා ගැනීමට ලබා ගත් බැංකු ණය මුදලෙහි අදාල පොළියෙන්, 2/3 ක කොටසක් එනම් සමාලෝචිත වර්ෂය අවසානය දක්වා රු.මිලියන 2.41 ක් භාණ්ඩාගාර අනුමැතිය ලබාගැනීමකින් තොරව අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය මත පමණක් ප්‍රතිපූර්ණය කර තිබුණි.

(ඉ) 2021 නොවැම්බර් 16 දිනැති රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව විසින් නිකුත් කර ඇති අංක 01/2021 දරන

පස් අවුරුදු කාල සීමාවක් සඳහා සංයුක්ත සැලැස්මක් සංස්ථාව විසින් පිළියෙල කළ යුතු වුවද, 2023-2024 කාල සීමාව සඳහා පමණක් වන ලෙසට සංස්ථාව

| | | |
|---|---|---|
| | චක්‍රලේඛය 2.3 ඡේදය ආකෘති 1 | විසින් සංයුක්ත සැලැස්ම පිළියෙල කර තිබුණි. එම සැලැස්මේ සංස්ථාපිත පනත මඟින් පැවරී ඇති කාර්යභාරයක් වන දිවයින පුරා පිහිටි පහත් වගුරු බිම්, නිසරු හෝ මඩ ඉඩම් හඳුනාගෙන අනවසර ඉඩම් ගොඩකිරීම පාලනය කිරීම හා අධීක්ෂණය කිරීමට හැකිවන පරිදි ගැසට් නිවේදන මඟින් ප්‍රසිද්ධ කිරීම හා ඇල ඉවුරක ඇති යම් ඉඩම් ප්‍රදේශයක්, ඇල රක්ෂිත ප්‍රදේශයක් ලෙස හඳුනාගෙන එම රක්ෂිත ප්‍රදේශය තුල තාවකාලික හෝ වෙනත් ඉදිකිරීම් වැළකෙන පරිදි ගැසට් නිවේදන මඟින් ප්‍රසිද්ධ කිරීම යන කරුණු ඇතුළත්ව නොතිබුණි.<br>තවද, සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් සංයුක්ත සැලැස්ම තුළ හඳුනාගත් උපාය මාර්ග ලඟා කර ගැනීමට සංස්ථාව ප්‍රමාණවත් පියවර ගෙන නොතිබුණු අතර හඳුන්වා දුන් ප්‍රධාන කාර්ය සාධන දර්ශක (KPI) අනුව ළගා කර ගත් ප්‍රගතිය ඇගයීමට ලක්කර ද නොතිබුණි. එමෙන්ම අදාළ කාල පරිච්ඡේදයට අදාළව පුරෝකථනය කරන ලද මූල්‍ය ප්‍රකාශන සංයුක්ත සැලැස්ම තුළ අන්තර්ගතව නොතිබුණි. |
| (ඊ) | 2007 අගොස්තු මස නිකුත් කරන ලද ජාතික ප්‍රසම්පාදන ආයතනය විසින් උපදේශකයන් තෝරා ගැනීම සහ සේවයේ යෙදවීම සම්බන්ධයෙන් වන මාර්ගෝපදේශ සංග්‍රහය .<br>04 වන පරිච්ඡේදය | මිල ගණන් කැඳවීමෙන් තොරව "වෙරළෙන් ඔබ්බෙහි මුහුදුවැලි කැනීම සහ පොම්ප කිරීමේ ව්‍යාපෘතිය" සඳහා ලංසු ලේඛන සකස් කිරීමට රු.මිලියන 7.5 කට උපදේශකවරයෙකු පත් කිරීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය ලබා දී තිබුණි. සංස්ථාව හා උපදේශකවරයා අතර ලිඛිත ගිවිසුමක් අත්සන් කර නොතිබු අතර උපදේශකවරයා වෙත නිකුත් කරන ලද පිළිගැනීමේ ලිපිය (Letter of Acceptance) දෙපාර්ශවය අතර ගිවිසුමක් ලෙස සලකා කටයුතු කර තිබුණි. 2023 නොවැම්බර් 10 දින වන විට රු.මිලියන 4.75 ක් උපදේශකවරයා වෙත ගෙවා තිබුණි. |

| | | |
|---|---|---|
| (උ) | 2023 අප්‍රේල් 06 දිනැති අංක SEC/2023/E/02 දරන දේශිය ආදායම් කොමසාරිස්වරයා විසින් නිකුත් කළ චක්‍රලේඛයේ 3 (අ) වගන්තිය | සේවාදායකයා විසින් මෝටර් වාහන සපයා ඇති විටෙක වාහනය, රියදුරු, ඉන්ධන සඳහා පිළිවෙලින් රු.20,000, රු.10,000 හා රු.20,000 ලෙස ප්‍රතිලාභය තක්සේරුකර අත්තිකාරම් පුද්ගල ආදායම් බදු (APIT) ලෙස සේවකයාගේ වැටුපෙන් අඩුකර ගත යුතු වුවත් සංස්ථාවේ සභාපතිවරයා ඇතුළු නියෝජ්‍ය සාමාන්‍යාධිකාරි නිලධාරීන් වෙනුවෙන් සංස්ථාව විසින් වාහනය, රියදුරු සහ ඉන්ධන සපයා තිබුණද ඒ්ට අදාළ පුද්ගල ආදායම් බදු (APIT) අඩුකර ගෙන නොතිබූ බව නිරීක්ෂණය විය. |
| (ඌ) | 2022 දෙසැම්බර් 28 දිනැති අංක : 2312/16 දරන අතිවිශේෂ ගැසට් පත්‍රය | පුද්ගල අත්තිකාරම් බදු 2023 ජනවාරි 01 දින සිට ක්‍රියාත්මක වන නමුත් අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයන් සඳහා පුද්ගල අත්තිකාරම් ආදායම් බදු අයකර ගැනීම ආරම්භ කර තිබුයේ 2023 සැප්තැම්බර් මස සිට බව නිරීක්ෂණය විය. තවද සංස්ථාවේ සභාපතිවරයා වෙත 2023 වර්ෂයේ ජනවාරි, පෙබරවාරි සහ අප්‍රේල් සඳහා APIT අඩුකර ගැනීමකින් තොරව දීමනා ගෙවීම් සිදුකර තිබුණි. |
| (එ) | 2015 මැයි 25 දිනැති රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේක අංක PED I/2015 3.5 ඡේදය | නිල වාහනයක් වෙනකර ඇති නිළධාරීන් සහ ප්‍රවාහන දීමනාව ලබාගන්නා නිළධාරීන් සංචිත වාහන හෝ වෙනත් කාර්යාලීය වාහනයක් භාවිතා කිරීමට හිමිකම් නොමැත්තේ වුවද එවකට සිටි සංස්ථාවේ සභාපතිවරයා වෙත වාහනයක් වෙන්කර තිබියදී ඒ්ට අමතරව PH – 4457 අංක දරන අනතුරට පත් වාහනය භාවිතා කර තිබුණි. එමෙන්ම මු.රෙ.1641 හි දක්වා ඇති පරිදි නොසැලකිල්ල නිසා හෝ අනිසි පාවිච්චිය නිසා හෝ වාහන වලට අලාභ හානියක් සිදුවුව හොත් නැතහොත් වාහනවල වටිනාකම අඩුවුවහොත් රජයට එම අලාභය ගෙවන ලෙස ඔවුන්ට නියම කරනු ලැබේ. ඒ අනුව මෙම රථයට සිදු වූ අනතුර නිසා රථයට සිදු වූ පාඩුව පියවා ගැනීමට සංස්ථාව විසින් පියවර ගෙන නොතිබුණි. |

2.2.3 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ල) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණය හැර සංස්ථාවේ බලතල , කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූල නොවන ලෙස කටයුතු කර ඇති බව.

ජාතික රාජ්‍ය සභාවේ 1976 අංක 27 දරන කොළඹ දිස්ත්‍රික්කයේ (පහත් බිම් ප්‍රදේශ) ගොඩකිරීමේ සහ සංවර්ධනය කිරීමේ මණ්ඩල (සංශෝධන) පනතේ 4 (ආ) වගන්තිය අනුව ආයතනයක් සතු කර ගනු ලැබූ යම් ඉඩමක් විකුණන අවස්ථාවක, මුදල් විෂයය භාර අමාත්‍යවරයා විමසා අමාත්‍යවරයා විසින් නිශ්චය කරනු ලබන ගොඩකිරීමට පෙර ඒ ඉඩමෙහි වටිනාකම සංස්ථාව විසින් අවස්ථාවෝචිත පරිදි පළාත් පාලන ආයතනයට හෝ ඉඩම් කොමසාරිස්ට හෝ ගෙවිය යුතු වුවද සමාලෝචිත වර්ෂය අවසාන වන තෙක් සංස්ථාව විසින් විකුණා ඇති ඉඩම් අක්කර 321 පර්චස් 3.03 ට අදාළ රු. මිලියන 58.25 ක් අදාළ පාර්ශවයන් වෙත ගෙවීමට කටයුතු කර නොතිබුණි.

2.2.4 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ඍ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණ හැර සංස්ථාවේ සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ අදාළ නීතිරීති වලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර නොමැති බව

(අ) වාර්ෂික අයවැය ඇස්තමේන්තුව මගින් ප්‍රතිපාදන සලසා ගැනීමකින් තොරව 2020 දෙසැම්බර් 15 දින ආරම්භ කර තිබූ අතුරුගිරිය කොතලාවල අධිවේගී මාර්ග අන්තර් හුවමාරුව ආශ්‍රිතව රේඛීය උද්‍යානයක් ඉදිකිරීමේ සහ ජලාපවහන වැඩි දියුණු කිරීමේ ව්‍යාපෘතිය සඳහා සංසථාවේ මුදල් රු. මිලියන 195.03 ක් වැයකර තිබුණි. මෙම ව්‍යාපෘතිය සඳහා භාණ්ඩාගාර ප්‍රතිපාදන අනුමත කර ගැනීම උදෙසා ඉදිරිපත් කරන ලද අමාත්‍ය මණ්ඩල සංදේශය සඳහා වූ අමාත්‍ය මණ්ඩල තීරණයේ සඳහන් පරිදි ජාතික ක්‍රම සම්පාදන දෙපාර්තමේන්තුවේ නිර්දේශ අනුව ව්‍යාපෘති යෝජනාව සඳහා පුළුල් ශක්‍යතා අධ්‍යනයක් සිදු කර නොතිබුණි. මෙම ව්‍යාපෘතිය සඳහා සමාලෝචිත වර්ෂය දක්වා රු.මිලියන 3.06 ක පමණ නඩත්තු වියදමක් දැරීමට සංස්ථාවට සිදුවී තිබුණි. ඒ අනුව ඉහල කළමනාකරණයේ අභිමතය පරිදි සිදුකරන ලද මෙවැනි ව්‍යාපෘති හේතුවෙන් සංස්ථාවට දැරීමට සිදුවූ වියදම් සම්බන්ධයෙන් වගකිව යුතු පාර්ශවයන් හඳුනාගෙන එම අලාභ අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ආ) 1981 වර්ෂයේ සිට 2005 වර්ෂය දක්වා වූ කාල පරිච්ඡේදය තුළ සංස්ථාව විසින් පවරා ගත් ඉඩම්වලට අදාල වන්දි මුදල් ගෙවීමේ කටයුතු ප්‍රමාද වීම හේතුවෙන් එම ඉඩම්

වෙනුවෙන් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ගෙවිය යුතු වන්දි මුදල රු. මිලියන 73.02 ක් වූ අතර ඊට අදාළව ගෙවිය යුතු පොළිය රු. මිලියන 123.69 ක් විය. ඒ අනුව සමාලෝචිත වර්ෂය අවසානයට ගෙවිය යුතු වූ පොළිය ඉකුත් වර්ෂයට වඩා රු. මිලියන 5.16 කින් වැඩි වී තිබුණි. එමෙන්ම ඉඩම් පවරා ගැනීම සඳහා අවුරුදු 14 සිට අවුරුදු 40 දක්වා කාල පරාසයක් ගතවී තිබීම හේතුවෙන් මෙම ඉඩම් වල අනවසර පදිංචිකරුවන්ගේ පදිංචිවීම වැඩි වී ඇති බව වැඩි දුරටත් අනාවරණය විය.

(ඇ) කැළණිය, බියගම, වත්තල සහ පෑලියගොඩ ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශ තුළ සිදුවන ජල ගැලීම් වලදී එම ප්‍රදේශවල පදිංචි 155,000 පමණ ජනතාවට සහ කර්මාන්තශාලාවලට සිදුවන ආරක්ෂක, පාරිසරික සහ සමාජීය හානි අවම කිරීමේ අරමුණින් ව්‍යාපෘති පිරිවැය රු.මිලියන 3,000 ක් වූ මුදුන් ඇළ සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතිය භාණ්ඩාගාර ප්‍රතිපාදන යටතේ 2016 වර්ෂයේදි ආරම්භ කර 2021 වසර අවසාන වන විට නිම කිරීමේ අපේක්ෂාවෙන් සංස්ථාව විසින් ආරම්භ කර තිබූ අතර එලෙස වැඩ නිම කිරීමට අපොහොසත් වීම මත මෙම ව්‍යාපෘතිය 2025 දෙසැම්බර් 31 දක්වා දින දීර්ඝ කර තිබුණි. මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) ව්‍යාපෘතියේ ඉදිකිරීම් කටයුතු සඳහා ඉඩම් පවරා ගැනීම හේතුවෙන් නිවාස අහිමි වන්නන්ට නාගරික සංවර්ධන අධිකාරිය ඉදිකළ නිවාස 164 ක් ලබා ගැනීමට රු. මිලියන 600 ක් 2017 දෙසැම්බර් 31 දින වන විට වැයකර තිබුණද සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් ඉන් නිවාස 138 ක් පමණක් ලබාදී තිබූ අතර ඉතිරි පවුල් 26 සඳහා 2023 වර්ෂය අවසාන වන විටත් නව නිවාස ලබාදීමට කටයුතු කර නොතිබුණි.

(ii) 2020 වසර අවසාන වන විට නිම කිරීමේ අපේක්ෂාවෙන් අදියර I සහ II වශයෙන් ඔළියමුල්ල ජල පොම්පාගාර 02 ක් ඉදිකිරීමට යෝජිතව තිබූ අතර අදියර II ජලපොම්පාගාර ඉදිකිරීම් කටයුතු 2018 මාර්තු 26 දින ආරම්භ කර තිබූ නමුත් සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් එහි ඉදිකිරීම් කටයුතු නිම කිරීමට අපොහොසත් වී තිබුණි. සමාලෝචිත වර්ෂය අවසාන වන විට එහි ඉදිකිරීම් කටයුතුවල මූල්‍ය හා භෞතික ප්‍රගතිය පිළිවෙලින් සියයට 78.9 ක් හා සියයට 74 ක් පමණක් විය.

(iii) කෙසේ වෙතත් උක්ත ව්‍යාපෘතිය වෙනුවෙන් අවශ්‍ය කරන පොම්ප හා එන්ජින් පොම්පාගාරයේ වැඩ නිමවීමට ආසන්නයෙදී ඊට අදාල හා සරිලන පරිදි මිලදී ගතයුතු වුවත් සංස්ථාව විසින් පොම්පාගාරය

ඉදිකිරීමට ප්‍රථම පොම්පාගාරය ඉදිකිරීමට ඇති මුදලින් 2018 මාර්තු 12 දින රු.මිලියන 95.48ක් වටිනාකමැති ජලය මත පාවෙන පොම්ප 02 ක් (Floating pump 16VL), ජංගම පොම්ප 02 ක් (Mobile Pump) සහ රබර් හෝස් (20 Rubber Flex Hose) මිලදීගෙන තිබූ අතර එම යන්ත්‍රෝපකරන ඔලියමුල්ල ජල පොම්පාගාරය සඳහා භාවිතා කර නොතිබුණි. එමෙන්ම 2018 අගෝස්තු 20 දින රු.මිලියන 82.90 ක් වටිනා ජල පොම්ප 2 ක් හා 2020 ජනවාරි 08 දින රු.මිලියන 24.1 ක් වටිනා එන්ජින් 02 ක් මිලදී ගෙන තිබුණි.

(iv) 2018 අගෝස්තු 20 දින රු.මිලියන 82.90 ක වටිනාකමට මිලටගෙන තිබූ 5M3/S ජල පොම්ප දෙක විගණිත දින වන විටත් වසර 06 ක් පුරාවට ඌන උපයෝජිතව පැවතුණි. මේ සඳහා නිෂ්පාදන ආයතනය ලබාදුන් වසර 02 ක වගකීම් කාලයද විගණිත දින වන විට ඉක්මවා ගොස් ඇති අතර සැපයූ සැපයුම්කරු විසින් විගණිත දින වන විට පොම්පවලට අදාළ හිඟ ගෙවීම් සම්බන්ධයෙන් රු.මිලියන 153.03 ක අමතර ගාස්තුවක් ඉල්ලා බේරුම්කරුණ නඩුවක් ගොනුකර තිබුණි. මේ හේතුවෙන් පොම්පාගාරයේ වැඩ කටයුතු තවදුරටත් ප්‍රමාද වන බව නිරික්ෂණය විය.

(v) රු.මිලියන 24.1 ක වටිනාකමෙන් යුත් එන්ජින් 02 ක් මිලදී ගැනීමට 2019 ජුනි 28 වන දින ගිවිසුම්ගත වී තිබූ අතර එම ගිවිසුම් ප්‍රකාරව ගිවිසුම්ගත වී මාස 06 ක කාලයක් තුළ අදාළ සැපයුම්කරු විසින් එන්ජින් ස්ථාපිත කළ යුතුව තිබුණද මේ වන විට වසර 04 කට අධික කාලයක් ඌන උපයෝජිතව පැවතුණි .

(ඈ) 1968 අංක 15 දරන ශ්‍රී ලංකා ඉඩම් සංවර්ධනය කිරීමේ සංස්ථා පනතේ 2(ආ) 1 වගන්තිය අනුව දිවයින පුරා පළාත් මට්ටමින් පිහිටි පහත් වගුරු බිම්, නිසරු හෝ මඩ ඉඩම් හඳුනාගෙන අනවසර ඉඩම් ගොඩකිරීම් පාලනය කිරීම හා අධීක්ෂණය කිරීමට හැකිවන පරිදි ඒවා ගැසට් නිවේදන මඟින් ප්‍රසිද්ධ කිරීමට සංස්ථාව වෙත බලය පවරා තිබුණද සමාලෝචිත වර්ෂය අවසානයට සංස්ථාව විසින් එලෙස ගැසට් කරන ලද පළාත් ගණන 07 කට සීමාවී තිබුණි. මායිම් ගැසට් කර තිබුණු එම ඉඩම් ප්‍රදේශවල සිදු වන අනවසර ගොඩකිරීම් හා අනවසර පදිංචිවීම් වැළැක්වීමට සංස්ථාව අපොහොසත් වී තිබුණි. එමෙන්ම ඉහත පනතේ 8 (අ) වන වගන්තිය අනුව ගොඩකිරීමට හා සංවර්ධනය කිරීමට පවරා ගනු ලබන ඉඩම්, සංස්ථාව විසින් ගොඩනැගිලි ඉදිකිරීමට, කර්මාන්ත වාණිජ්‍ය හා කෘෂිකාර්මික කටයුතු වෙනුවෙන් වැඩි දියුණු කළ යුතු

වුවද, සංස්ථාව විසින් එලෙස 1995 වර්ෂයේදී සංවර්ධන කටයුතු සඳහා පවරාගත් මුතුරාජවෙල හා මුදුන් ඇල ප්‍රදේශවල ඉඩම් අක්කර 800ක ප්‍රමාණයෙන් සමාලෝචිත වර්ෂය අවසානයට වර්ෂ 28 ක කාලයක් ගතව තිබුණද ඉන් වැඩි දියුණු කළ ප්‍රමාණය අක්කර 400 ක් එනම්, සියයට 50 ක තරම් පහළ අගයක් විය.

(ඉ) සංස්ථාව 2010 ජුලි 14 දින නිකුත් කළ අංක 1662/17 දරන ගැසට් නිවේදනය පරිදි බස්නාහිර පළාත තුළ පිහිටි ඇල මාර්ගවල රක්ෂිත ඉඩම් (Reservation) ආරක්ෂා කිරීමට පියවර ගත යුතු වුවද සමාලෝචිත වර්ෂය අවසාන වන විට උක්ත ගැසට් පත්‍රය නිකුත් කර වර්ෂ 13 ක් ගත වුවද එම රක්ෂිත ඉඩම් හඳුනාගැනීමට හෝ රක්ෂිත ඉඩම්වල පදිංචි අනවසර පදිංචිකරුවන් ඉවත් කිරීමට සාධනීය පියවර ගෙන නොතිබුණි.

(ඊ) ගිවිසුම් ගතවීමකින් තොරව, නාගරික සංවර්ධන අධිකාරියට අයත් කිඹුලාවල පිහිටි ඉඩමක සංස්ථාව විසින් ඉදිකළ ආපන ශාලාව බදු පදනම මත පෞද්ගලික සමාගමකට 2017 වර්ෂයේදී ලබා දී තිබුණි. එහෙත් එකී ආපනශාලාව පිහිටි භූමි ප්‍රදේශය නාගරික සංවර්ධන අධිකාරියට අයත් ඉඩමක් බැවින්, සංස්ථාවට ආපනශාලාව අයිති වුවත් ඉඩමේ අයිතිය නොමැති නිසා රු.මිලියන 24.58 ක් වූ බදු මුදල අයකර ගැනීමට සමාලෝචිත වර්ෂය අවසානය දක්වාත් සංස්ථාවට නොහැකි වී තිබුණි.

(උ) ඉදිකිරීම් කර්මාන්තය සඳහා වැලි සැපයීම සඳහා වෙරළෙන් ඔබ්බෙහි පිහිටි මුහුදු වැලි කියුබික් මීටර් මිලියන 4 ක් කැණීම සහ පොම්ප කිරීම සඳහා සංස්ථාව 2018 වර්ෂයේදී විදේශීය පෞද්ගලික සමාගමක් සමඟ කොන්ත්‍රාත් ගිවිසුමකට එළඹ තිබුණි. එසේ වුවද ගිවිසුම්ගත විෂය පථය සම්පූර්ණ කර ගැනීමට පෙර සාධාරණ හේතුවකින් තොරව ඉහළ කළමනාකාරිත්වය විසින් සිය අභිමතය පරිදි 2020 අප්‍රේල් 10 දින ව්‍යාපෘතිය අත්හිටුවා තිබුණි. එහිදී ගිවිසුම කඩ කිරීම හේතුවෙන් සංස්ථාවට දැරීමට සිදුවන මූල්‍ය අලාභ පිළිබඳ සලකා බැලීමක් සිදු කර නොතිබුණි. ව්‍යාපෘතිය සඳහා වැයවන අමතර පිරිවැය, කොන්ත්‍රාත්කරු විසින් ඉටුකළ යුතු කාර්යයන් සම්බන්ධයෙන් ගිවිසුම් කොන්දේසි පරිදි කොන්ත්‍රාත්කරුට නිසි පරිදි උපදෙස් ලබා නොදීම, කොන්ත්‍රාත්කරු සමඟ පැවති ලිඛිත ගිවිසුම අවසන් වීමට ප්‍රථම කොන්ත්‍රාත්කරුවා වෙනත් ව්‍යාපෘතියකට නිදහස් කිරීම වැනි කරුණු කෙරෙහි සංස්ථාව අවධානය යොමු නොකිරීම විගණනයේදී ප්‍රශ්නකාරී විය. මේ සම්බන්ධයෙන් අගතියට පත් පාර්ශවය විසින් බේරුම්කරණයට යොමුව තිබූ අතර එම තීන්දුව මඟින් අදාළ විදේශීය පෞද්ගලික සමාගමට ඇ.එ.ජ. ඩොලර් 2,073,976 ක් (රු.මිලියන 753.08 ක්- එදිනට පැවති විනිමය අනුපාතිකය අනුව) වන්දි ලෙස ගෙවීමට සංස්ථාවට නියම කර තිබුණි. ඒ අනුව සංස්ථාව විසින් 2022 මූල්‍ය ප්‍රකාශවල

සම්පූර්ණ මුදල ගෙවිය යුතු වන්දි ලෙස හඳුනාගෙන තිබුණි. ඊට අමතරව සංස්ථාව විසින් කොන්ත්‍රාත්කරු වෙනුවෙන් දේශීය ආදායම් දෙපාර්තමේන්තුව වෙත ගෙවන ලද ආදායම් බදු මුදල් ඇ.එ.ජ.ඩො.181,484.21 ක් (රු.මිලියන 60.2) අඩුකර ගැනීමෙන් අනතුරුව, කොන්ත්‍රාත්කරු වෙත ගෙවිය යුතු වන්දි මුදල සහ අවසාන බිල්පතට අදාලව ඇ.එ.ජ. ඩොලර් 4,035,777.18 ක් (.මිලියන 1,338.87 ක්) 2023 නොවැම්බර් මාසයේදී කොන්ත්‍රාත්කරු වෙත ගෙවා තිබුණි. මෙලෙස විශාල වන්දි මුදලක් ගෙවීමට සිදුවීම සංස්ථාවේ ද්‍රවශීලතාවයට අහිතකර ලෙස බලපාන බව නිරීක්ෂණය විය. කෙසේ වුවද සංස්ථා නිලධාරීන් නොසැලකිලිමත් ලෙස කටයුතු කිරීම නිසා එළඹ තිබූ ගිවිසුමේ කොන්දේසි පරිදි මෙම වන්දි මුදල ගෙවීමට සිදුව තිබූ නමුත් මේ සඳහා වගකිව යුතු වූ පාර්ශව හඳුනා ගෙන අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. එමෙන්ම මුදල් රෙගුලාසි ප්‍රකාරව හානි හා පාඩු සම්බන්ධයෙන් අදාළ බලධාරීන් වෙත දැනුම් දී නොතිබු අතර අදාළ පාඩුව සම්බන්ධ සිදුකළ යුතු මූලික හා ද්විතික පරීක්ෂණ සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් පවත්වා නොතිබුණි.

(ඌ) සසකාවා අනුස්මරණ ශ්‍රී ලංකා හා ජපන් සංස්කෘතික මධ්‍යස්ථානය වෙත බදු දී ඇති කොල්ලුපිටිය, 22 වන පටුමගෙහි පිහිටි ඉඩම් කොටස වසර 30 ක කාල සීමාවක් සඳහා බදු දී තිබු අතර එම බදු කාලය 2017 ජුනි 30 දිනෙන් අවසන් වී තිබුණි. එම බදු ගිවිසුම දීර්ඝ කිරීම සඳහා සංස්ථාව විසින් 2017 ජූලි 21 දින රජයේ ප්‍රධාන තක්සේරුකරු මගින් ලබාගත් නව තක්සේරු වාර්තාවට අනුව 30 අවුරුදු බදු පදනම මත එම ඉඩම ලබාදීමේදි ඉඩම සඳහා පමණක් වාර්ෂික බදු මුදල රු.මිලියන 12.68 ක් වී තිබුණි. නමුත් සසකාවාහාරය විසින් එකී බදු මුදල ගෙවීමට අපහසු බව දන්වමින් අභියාචනයක් ඉදිරිපත් කර තිබූ අතර එම වටිනාකම අධ්‍යක්ෂ මණ්ඩල තීරණයකට අනුව රු.මිලියන 1.59 කට අඩු කිරීම හේතුවෙන් විශාල කුලී ආදායමක් සංස්ථාවට අහිමි වී ඇති බව විගණනයට නිරීක්ෂණය විය. තවද මෙම ඉඩම හා ගොඩනැගිල්ල සම්බන්ධයෙන් බදු ගිවිසුමකට එළඹීමට කටයුතු කර නොතිබුණි.

(එ) සංස්ථාව සතු ඉඩම් හා ගොඩනැගිලි වෙනත් පාර්ශවයන් වෙත බදු පදනම මත ලබාදී ඇති අවස්ථාවලදී, එහි බදු කාලය අවසන් වී නැවතත් එම පාර්ශවයන් වෙතම අදාළ ඉඩම් හා ගොඩනැගිලි බදු පදනම මත ලබාදෙන විට නව ගිවිසුමකට එළඹීමකින් තොරව එම දේපළ පරිහරණය කිරීමට බදුකරුවන්ට අවස්ථාව ලබාදී අදාළ හිඟ මුදල් ලබාගැනීමෙන් අනතුරුව පෙරදාතම් කල ගිවිසුම්වලට එළඹෙන බව විගණනයට නිරීක්ෂණය විය.

(ඒ) ඉඩම් අත්කරගැනීමේ පනතේ 460 වැනි පරිච්ඡේදයේ 38 වැනි වගන්තිය (අ) අතුරු විධානය යටතේ සංස්ථාව සතු කිරිමණ්ඩල මාවතේ වරිපනම් අංක 95 දරන ඉඩමෙන් පර්චස් 4.67 ක් කොළඹ මහනගර සභාව විසින් ඊට අයත් නාරාහේන්පිට පිහිටි

කිරිමණ්ඩල මාවත පුළුල් කර සංවර්ධනය කිරීම සඳහා 2014 වර්ෂයේදී භාවිතා කර ඇති අතර එම ඉඩම් කොටස වෙනුවෙන් සංස්ථාවට ලැබිය යුතු වන්දි ලබාගැනීමට සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් කටයුතු කර නොතිබුණි.

(ඔ) මුතුරාජවෙල පිහිටි අක්කර 13 රූඩ් 01 පර්චස් 0.95 ක ඉඩම පෞද්ගලික සමාගමක් වෙත රු. මිලියන 848.38 කට බදු දීම සඳහා 2019 ජූනි 26 දින තීරණ අංක 8013 මගින් අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය ලබාදී තිබූ අතර ඒ සඳහා 2019 සැප්තැම්බර් 03 දිනැති අංක අමප/19/2154/116/079 දරන අමාත්‍ය මණ්ඩල තීරණයට අනුව පළමු වාරිකය රු.මිලියන 259.39ක් ගෙවීම් කරන ලෙස පෞද්ගලික සමාගම වෙත 2019 සැප්තැම්බර් 25 දින කරන ලද දැනුම් දීමට අනුව එම සමාගම මගින් පළමු වාරිකය 2019 නොවැම්බර් අවසානයේ ගෙවීමට කල් ඉල්ලමින් 2019 නොවැම්බර් 07 දින රු.මිලියන 25ක අත්තිකාරම් මුදලක් (Commitment Fee) ගෙවා තිබුණි.

2019 ඔක්තොබර් 30 දිනැති අංක 8166 දරන අධ්‍යක්ෂ මණ්ඩල තීරණය මගින් බදු ගිවිසුම අත්සන් කරන අවස්ථාවේ ගෙවිය යුතු පළමු වාරික වටිනාකමෙන් එම අත්තිකාරම් මුදල අඩුකර ගෙවීමට අනුමැතිය ලබාදී තිබුණි.

(i) ඒ අනුව සමාගම සමඟ 2019 නොවැම්බර් මස සිට බදු ගිවිසුමකට එළඹිය යුතු වුවද බදු ගිවිසුමකට එළඹ තිබූයේ වසර 04 කට පසුව එනම් 2023 නොවැම්බර් 27 වන දිනදීය.

(ii) 2023 අගෝස්තු 18 දිනැති අදාළ සමාගම විසින් එවන ලද ලිපිය මගින් සිය ආයතනයේ මෙහෙයුම් සඳහා අක්කර 10 ක් ප්‍රමාණවත් බව දන්වා තිබූ අතර ඉඩමේ නව තක්සේරු වාර්තාවක් ලබා ගැනීමකින් තොරව පැවති තක්සේරු වාර්තාව මත බදු වටිනාකම රු.මිලියන 640 ලෙස සංශෝධනය කරමින් 2023 අගෝස්තු 29 දිනැති අංක 8923 දරන අධ්‍යක්ෂ මණ්ඩල තීරණය මගින් අනුමැතිය ලබාදී තිබුණි.

(iii) 2023 ජූලි 17 දිනැති අංක PFD/LAND/2023/CM/251 දරන මුදල් අමාත්‍යවරයාගේ නිරීක්ෂණය අනුව සංස්ථාව විසින් උක්ත සමාගම සමඟ බදු ගිවිසුමට එළඹීමේදී "ඉදිරියේදී ගෙවීමට නියමිත වාරික මුදල් නිසි කලට ගෙවීමට අපොහොසත් වන්නේ නම් කිසිදු සහන කාලයක් ලබා දීමකින් තොරව අදාළ බදු ගිවිසුම අවලංගු වේ" යන කොන්දේසිය එම ගිවිසුමට ඇතුළත් කළ යුතු වුවත් සංස්ථාව විසින් සමාගම සමඟ 2023 නොවැම්බර් 27 වන දින එළඹි බදු ගිවිසුමෙහි එම කොන්දේසිය ඇතුළත් කර නොතිබුණි. ඒ වෙනුවට බදු ගිවිසුමෙහි 2 (q) (ii) අනුව "කල්බදු ගැනුම්කරු විසින් ගිවිසුමෙහි ඇතුළත් යම් කොන්දේසියක්

කඩකළහොත් හෝ පැහැර හරිනු ලැබුවහොත් ඒ සඳහා පිළියම් යෙදීම සඳහා මාස 06 ක කාලයක් බදු දීමනාකරු විසින් බදු ගැනුම්කරු වෙත ලබා දිය යුතු අතර, එම කාලය තුළ එම කඩකිරීමට පිළියමක් නොලදහොත් මාස 06 ඉකුත් වීමෙන් පසු කල් බදු දීමනාකරු හට ගිවිසුම අවලංගු කළ හැක. " යන්න ඇතුළත් කර තිබුණි.

(ඕ) සංස්ථාව සතු අක්කර 1 රූඩ් 2 ක වපසරියකින් යුතු කෝට්ටේ 9 වන පටුමග පිහිටි ඉඩමක් රාජ්‍ය සංවර්ධන නිර්මාණ හා නීතිගත සංස්ථාව වෙත 2020 ඔක්තෝබර් 01 වන දින සිට 2022 සැප්තැම්බර් 30 දක්වා රු. මිලියන 6.48 කට වාර්ෂික බදු පදනම මත බදු දී තිබූ අතර බදු කාලසීමාව 2022 මාර්තු 31 දිනෙන් අවසන් වී තිබුණි. කෙසේ වුවද, එදින සිට සමාලෝචිත වර්ෂය අවසානය දක්වාම අදාළ ආයතනය බදු කුලී නොගෙවා බදු ගිවිසුම් රහිතව ඉඩමේ රැඳී සිටින අතර ඉඩම සංස්ථාව වෙත නිදහස් කර ගැනීමට අපොහොසත් වී තිබුණි. එසේම සංස්ථාව වෙත 2024 මැයි වන විට රු.මිලියන 15.11 ක් මෙම කල් බදු ගැණුම්කරුගෙන් ලැබිය යුතුව පැවතුණි.

(ක) සංස්ථාව විසින් මුහුදු වැලි ගොඩ දැම්මේ ව්‍යාපෘතිය වෙනුවෙන් ආරම්භ කරන ලද වැඩ අවසන් වූ පසු වසා දැමීමට කටයුතු නොකළ එක්සත් ජනපද ඩොලර් ගිණුමේ සමාලෝචිත වර්ෂයේ අවසාන දිනට ශේෂය රු.මිලියන 729.67 ක් හා යුරෝ ගිණුමේ ශේෂය රු.මිලියන 206.28 ක් වූ අතර පිළිවෙලින් සමාලෝචිත වර්ෂය තුළදී හටගත් විනිමය අලාභය රු.මිලියන 87.33 ක් හා විනිමය ලාභය රු.මිලියන 16.21 ක් වූ අතර ඒ අනුව සිදු වූ ශුද්ධ අලාභය රු.මිලියන 71.12 ක් විය.

(ග) මැදමූලන අනුස්මරණ මධ්‍යස්ථානයක් ඉදිකිරීම වෙනුවෙන් තවදුරටත් සංස්ථාවට අයවිය යුතු බවට අධිකරණය වෙත වාර්තා කළ හා සංස්ථාවේ ගිණුම්වල දැක්වුණු වටිනාකම අතර වෙනස වූ රු. මිලියන 47.37 ක මුදල එම ව්‍යාපෘතිය වෙනුවෙන් නොදැරූ වියදමක් ලෙස දක්වා තිබීම හේතුවෙන් එම අමතරව වැයකළ වියදම සම්බන්ධයෙන් වැඩිදුර පරීක්ෂා කර ඒ සඳහා වගකිවයුතු පාර්ශවයන්ගෙන් අයකර ගැනීමකින් තොරව හා මු.රෙ.113 ප්‍රකාරව මහා භාණ්ඩාගාරයෙන් අනුමැතිය ලබා ගැනීමකින් තොරව පොත්වලින් කපා හැරීම සඳහා 2021 ජූනි 28 දිනැති අංක MRW/5404 දරන අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේදි ගත් තීරණයට අනුව සංස්ථාව විසින් කටයුතු කර තිබුණි. තවද මේ සම්බන්ධයෙන් සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි.

(ච) ඇස්තමේන්තුගත පිරිවැය රු. මිලියන 8,700 ක ලෝක බැංකු ආධාර යටතේ ක්‍රියාත්මක කිරීමට සැලසුම් කළ කොළොන්නාව වැසි ජල අපවහන හා පරිසරය වැඩි

දියුණු කිරීමේ ව්‍යාපෘතිය පසුව අමාත්‍ය මණ්ඩලයේ තීරණයකට අනුව භාණ්ඩාගාර ප්‍රතිපාදන මත ක්‍රියාත්මක කිරීමට සැලැසුම් කර තිබුණි. ව්‍යාපෘතිය 2018 වර්ෂයේ සිට වසර 05 කින් නිමකළ යුතු වුවත් 2023 වර්ෂය අවසාන වන විටත් මෙම ව්‍යාපෘතියේ භෞතික ප්‍රගතිය සියයට 7.6 ක තරම් ඉතා අඩු මට්ටමක පැවතුණි.

(ජ) මාදින්නාගොඩ නිවාස ව්‍යාපෘතිය සඳහා අත්පත් කර ගැනීමට යෝජිත ඉඩම අත්පත් කර ගැනීමට පෙර එනම් 2018 වර්ෂය වන විට එම ඉඩම සඳහා රු.මිලියන 112 ක් වැය කර අතුරු ප්‍රවේශ මාර්ගයක් ඉදිකිරීමට කටයුතු කිරීම හා 2024 ජූනි දක්වා ඉඩම අත්පත් කර නොගැනීම හේතුවෙන් ඒ සඳහා වැය කළ මුදල නිෂ්කාර්ය වියදමක් වී තිබුණි.

(ට) ශ්‍රී ලංකා පරමාණුක බලශක්ති අධිකාරියෙහි රසායනාගාර ඒකක A ගොඩනැගිල්ල ඉදිකිරීමට සංස්ථාව වෙත 2014 වර්ෂයේ සිට ලැබිය යුතු රු. මිලියන 61.58 ක වටිනාකම සංස්ථාව විසින් සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් අයකරගෙන නොතිබුණි. ගොඩනැගිල්ල සැලසුම්කරණයේදී ඇති වූ දෝෂ සහගත තත්ත්වයක් හේතුවෙන් Micro piling සඳහා සංස්ථාව විසින් දරන ලද රු. මිලියන 46.40 ක වියදමක් ප්‍රතිපූර්ණය කිරීමට ශ්‍රී ලංකා පරමාණුක බලශක්ති අධිකාරිය සිය එකඟතාවය පළ කර නොතිබුණි. මේ සම්බන්ධයෙන් වගකිව යුතු පාර්ශවයන්ට එරෙහිව සංස්ථාව විසින් කිසිඳු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි.

(ඩ) ඉඩම් සංවර්ධනය කිරීමේ සමාගම විසින් වසර 30 ක කාලයක සිට හිඟුරක්ගොඩ, ත්‍රිකුණාමලය හා අම්පාර යන ප්‍රදේශවල පවත්වාගෙන යනු ලබන සිමෙන්ති ආශ්‍රිත නිෂ්පාදන මධ්‍යස්ථාන පිහිටුවා ඇති ඉඩම්වල එකතුව හෙක්ටයාර 2.1979 ක් පමණ වන අතර එම රජයට හා රජයේ වෙනත් ආයතනවලට අයත් ඉඩම්වල බදු අයිතිය හෝ හිමිකම සංස්ථාව වෙත ලබා ගැනීමට සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් අපොහොසත් වී තිබුණි.

(ත) සංස්ථාව විසින් Waste to Wealth (Pvt) Ltd නමින් නව පරිපාලිත සමාගමක් ආරම්භ කිරිමට 2019 නොවැම්බර් 04 දින ලබා දී තිබු රු.මිලියන 5ක මූලික ආයෝජිත මුදලින් සමාගමේ මෙහෙයුම් කටයුතු අත්හිටුවන විට අයවිය යුතුව තිබූ රු.මිලියන 2.46 ක මුදල අයකර ගැනීමට සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් කටයුතු කර නොතිබුණි.

(ද) හොරණ බස් නැවතුම්පළ - දෙවන අදියර ඉදිකිරීමේ ව්‍යාපෘතියට අදාලව සංස්ථාවට 2015 පෙබරවාරි 17 දිනට අය විය යුතු රු.මිලියන 5.53 ක වටිනාකම සමාලෝචිත

වර්ෂය අවසානය වන විටත් නාගරික සංවර්ධන අධිකාරියෙන් අයකර ගැනීමට සංස්ථාව අපොහොසත් වී තිබුණු අතර ව්‍යාපෘතිය අතරමග නවතා දැමීම හේතුවෙන් සංස්ථාවට රු. මිලියන 12.35 ක අලාභයක් සිදුව තිබුණි.

(න) සංස්ථාව විසින් 2020 වර්ෂයේ සිට ක්‍රියාත්මක කරන ලද කිරිමණ්ඩල මාවත කෘෂිකාර්මික සංවර්ධන ව්‍යාපෘතියෙන් 2022 වර්ෂය හා සමාලෝචිත වර්ෂයේ තුල සංස්ථාවට සිදු වූ පාඩුව පිළිවෙලින් රු. මිලියන 8.5 ක් හා 5.1 ක් වූ අතර ව්‍යාපෘතිය වෙනුවෙන් සංස්ථාව දරන ලද මුළු පිරිවැය රු. මිලියන 6.01 ක් විය. 2022 වර්ෂයේ ඉන් රු.මිලියන 9.18 ක් හෙවත් සියයට 81.02 ක් ශ්‍රම පිරිවැය වූ අතර සමාලෝචිත වර්ෂයේ ශ්‍රම පිරිවැය රු. මිලියන 3.87 ක් හෙවත් සියයට 64.29 ක් විය

(ප) 1995 වර්ෂයේදි වසර 50 කට ඇස්තමේන්තුකල වටිනාකමට රු. මිලියන 0.25 ක් එකතුකර වසර 99 කට කැළණිය වෙදමුල්ල පිහිටි ඉඩම සංස්ථාව විසින් 99 අවුරුදු බදු කාලයක් සඳහා රු.මිලියන 35.5 ක වටිනාකමට පෞද්ගලික සමාගමක් වෙත 1998 මැයි 31 දින ලබාදී තිබුණි. මෙම ඉඩම බදු දීම තුළින් සංස්ථාවට මූල්‍යමය අවාසියක් සිදුවී තිබෙන බව විගණනයේදි නිරීක්ෂණය වූ අතර වසර 50 කට ඇස්තමේන්තුකළ වටිනාකම වසර 99 කට අදාළ කර ගැනීම පිළිබඳ විගණනයට ගැටළුකාරී විය.

(බ) සංස්ථාවෙහි යාන්ත්‍රික අංශය, මෙන්ම ශ්‍රී ලංකා ඉඩම් සංවර්ධනය කිරීමේ හා ගොඩකිරීමේ සමාගම ස්ථාපිතකිරීම සඳහා සංස්ථාව විසින් සිය වියදමෙන් 2018 වර්ෂයේදි මුතුරාජවෙල ගොඩනැගිල්ලක් ඉදි කිරීමට කටයුතු ආරම්භ කර 2021 වර්ෂයේදි සම්පූර්ණකර තිබු අතර මේ සඳහා රු.මිලියන 174.91 ක වියදමක් සංස්ථාව විසින් දරා තිබුණි. කෙසේ වෙතත් උක්ත ගොඩනැගිල්ල 2021 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් වසර 03 ක් ඌන උපයෝජිතව නිෂ්කාර්යව පැවතුණි.

(ම) වේරස් ගඟ ව්‍යාපෘති අරමුදලින් බෙල්ලන්විල ව්‍යායාම මංතිරු ආශ්‍රිතව ආහාර අලෙවි සැල් 12 ක් Block – A සහ Block - B ලෙස කොටස් දෙකකට වර්ග කර එක් කොටසකට වෙළඳ කුටි 6 ක් ඇතුලත් වන පරිදි ඉදිකර තිබුණි. මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(i) 2014 සැප්තැම්බර් මාසයේ සිට මෙම Block – A කොටසේ වෙළඳකුටි 01ක් සහ Block – B කොටසේ වෙළඳ කුටි 06 ක් ඵලදායි කාර්යයකට යොදා ගැනීමට නොහැකිව වසර 08 ක වඩා වැඩි කාලයක් නඩත්තු වියදම් දරමින් පවත්වාගෙන යන බව විගණනයට

නිරීක්ෂණය විය. එමෙන්ම මෙම වෙළඳකුටි ඉදිකළ ගොඩනැගිල්ලෙහි එක් කොටසක උඩු මහලක් ඉදිකර තිබූ අතර එය විවිධ ක්‍රියාකාරකම් සඳහා බදු දීමට සකස් කර තිබුණද ආදායම ඉපයීමේ කාර්යයන් සඳහා බාහිර පාර්ශවයන් දැනුවත් කරමින් ඒ සඳහා ඉල්ලුමක් ඇතිකිරීමට ආයතනය කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි.

(ii) සක්‍යතා අධ්‍යනයක් හෝ අවශ්‍යතාවය හඳුනාගැනීමක් සිදුකිරීමකින් තොරව 2014 වර්ෂයේදී සංස්ථාව විසින් වෙළඳ කුටි සඳහා රු.මිලියන 33.28ක් වටිනා මුළුතැන්ගෙයි උපකරණ මිලදී ගෙන තිබූ අතර ටෙන්ඩර් මඟින් වෙළඳ කුටි ලබාගන්නා ගැණුම්කරුට මුළුතැන්ගෙයි උපකරණ ලබාදෙන බවට ලංසු පත්‍රිකා තුල කිසිදු එකඟතාවයක් හෝ කොන්දේසික් ඇතුළත් කර නොතිබූ අතර වෙළඳසැල්වලට ලබා දුන් උපාංග වල වටිනාකම රු. මිලියන 30.98 ක් වූ අතර 2024 මාර්තු මස වන විට පවතින උපාංග වල වටිනාකම රු.මිලියන 8.02 ක් වුයෙන් ඒ අතර වූ රු. මිලියන 22.69 ක වෙනසට හේතු වූ කරුණු විගණනයට පැහැදිලි නොකෙරුණි.

(iii) බෙල්ලන්විල වෙළඳ කුටි තුළින් සමාලෝචිත වර්ෂයේ ඇතිවූ අලාභය රු.මිලියන 3.35 ක් වූ අතර 2020 වර්ෂයේ සිට 2022 දෙසැම්බර් 31 දක්වා අලාභය රු. මිලියන 14.27 ක් වුයෙන් වසර 04 ක් සඳහා වූ මුළු අලාභය රු.මිලියන 17.62 ක් විය.

(ය) PH-4457 අංක දරන වාහනය 2023 අගොස්තු 02 දින සිට 2023 දෙසැම්බර් 14 දින දක්වා මාස 4 1/2 ක කෙටි කාලයක් තුළ කි.මී. 3,647 ක් පමණක් ධාවනය කර ඇතත් රු.මිලියන 0.88 කට සේවා වාර අවස්ථා 08 ක් සිදු කර තිබූ බව ලොග් සටහන් පොතෙහි සඳහන් වී තිබුණි. මෙසේ සේවාවන් නැවත නැවත සිදු කිරීමට හේතු විගණනයට අනාවරණය නොවූ අතර එම සේවා කිරීම සඳහා අදාළ අනුමැතිය මෝටර් රථ පරීක්ෂකවරයකුගෙන් ලබාගෙන නොතිබුණි.

(ර) දියසරු තෙත්බිම් උද්‍යානය නැරඹීම සඳහා මහජනතාව වෙත ටිකට්පත් අලෙවියෙන් හා උද්‍යානය විවිධ ක්‍රියාකාරකම් සඳහා ලබාදීමෙන් සමාලෝචිත වර්ෂයේ රු.මිලියන 25.46 ක ආදායමක් උපයාගෙන තිබූ අතර එම උද්‍යානයේ නඩත්තු කටයුතු සඳහා රු.මිලියන 22.52 ක බිල්පත් ප්‍රතිපූර්ණයට මහා භාණ්ඩාගාරය වෙත ඉදිරිපත් කර

තිබුණි. තෙත්බිම් සහ පහත්බිම් සංවර්ධනය සඳහා මහා භාණ්ඩාගාරය මගින් ලබාදෙන ප්‍රතිපාදන මුදල්, සංස්ථාව ආදායම් උපයන රේඛිය උද්‍යාන නඩත්තු කටයුතු සඳහා වැය කිරීම ද එම වියදම මත සියයට 17 ක එනම් රු.මිලියන 3.83 ක කළමණාකරණ ගාස්තුවක් සංස්ථාව අයකිරීමෙන් මහා භාණ්ඩාගාරයට විශාල වැය බරක් දැරීමට සිදු වී තිබුණි.

## 2.3 වෙනත් කරුණු

(අ) 2023 ජූනි 20 දිනැති අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකා අංක HSB/5783 ට අනුව අතුරුගිරිය රේඛිය උද්‍යාන ව්‍යාපෘතිය වෙනුවෙන් සංස්ථාව දැරූ රු.මිලියන 195.03 ක වටිනාකම අදාළ පාර්ශවයන්ගෙන් අයකර ගැනීමට කටයුතු කිරීමකින් තොරව ආයතන සමාජ වගකීම් වියදමක් ලෙස සමාලෝචිත වර්ෂයේදි ගිණුම් ගත කිරීමට තීරණය කර තිබුණි.

(ආ) 2019 අගෝස්තු 11 දිනැති අංක PFD/INF/162/CM/608 දරන මුදල් අමාත්‍යවරයාගේ නිරීක්ෂණ ලිපියේ අංක 02 හි සඳහන් පරිදි "සංස්ථාව විසින් අදාළ ඉඩම බදු දීමෙන් උපයන මුදලින් අදාළ ඉඩම සංවර්ධනය කිරීමට දැරූ වියදම අඩු කර ගැනීමෙන් පසු ඉතිරි මුදල මහා භාණ්ඩාගාරය වෙත ප්‍රේෂණය කළ යුතු බව සඳහන් කර තිබුණද සීජ් ක්‍රෂින්ග් වෙත ලබා දුන් මුතුරාජවෙල පිහිටි ඉඩම සම්බන්ධයෙන් ඒ අනුව කටයුතු කර නොතිබුණි.

(ඇ) අත්තිකාරම් ලැබීම් යටතේ රු.මිලියන 56.24 ක නිරවුල් නොවූ අත්තිකාරම් මුදලක් පැවති අතර ඒ සම්බන්ධයෙන් වැඩිදුර පරීක්ෂා කිරීම සඳහා අදාළ තොරතුරු විගණනය වෙත ඉදිරිපත් නොවුණි.

(ඈ) සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන තුළ ඇතුළත් රු. මිලියන 4,180.3 ක ණයගැති හා අනෙකුත් ලැබිය යුතු ශේෂයන් තුළ පැවති රු. මිලියන 1,150.77 ක වෙළඳ ණයගැති ශේෂ වටිනාකමින් වර්ෂ 2 ත් 5 ත් අතර අයවීමට පැවති ශේෂය රු. මිලියන 318.25 ක් වූ අතර වර්ෂ 05 ඉක්මවූ ණයගැති ශේෂය රු. මිලියන 387.25 ක් විය. ඉන් වසර 05 ඉක්මවූ ණයගැති ශේෂයෙන් රු.මිලියන 282.39 ක් සේවාදායක ව්‍යාපෘති වලින් ලැබිය යුතු ශේෂ විය.

(ඉ) මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබූ රු. මිලියන 1,333.08 ක වෙළඳ හා අනෙකුත් ගෙවිය යුතු ශේෂ තුළ ඇතුළත් රු.මිලියන 527.51 ක් වූ කොන්ත්‍රාත් ණයහිමි ශේෂයෙහි කොන්ත්‍රාත් ණයහිමි ශේෂය රු.මිලියන 428.36 ක් වූ අතර වර්ෂ 3 ත් 5 ත් අතර කාලයක සිට නිරවුල් කර නොමැති කොන්ත්‍රාත් ණය හිමි ශේෂය රු.මිලියන 2.99 ක් වූ අතර වර්ෂ 5 ට වඩා වැඩි ශේෂය රු. මිලියන 197.99 ක් විය. තවද වෙළඳ ණයහිමි ශේෂය තුළ ඇතුළත් රු.මිලියන 430.06

කින් රු.මිලියන 45.7 ක් අවුරුදු 2-3 ක කාලයක සිටද රු.මිලියන 82.82 ක් අවුරුදු 3 – 5 ක සිටද රු.මිලියන 48.1 ක් වසර 05 ක සිටද ගෙවිය යුතුව පැවතුණි.

(ඊ) 2023 දෙසැම්බර් 31 දිනට සංස්ථාවේ අනුමත කාර්ය මණ්ඩලය 1,802 ක් වූ අතර එදිනට තථ්‍ය කාර්ය මණ්ඩලය 1,340 ක් වීමෙන් සංස්ථාවේ කාර්ය මණ්ඩලයේ 462 ක පුරප්පාඩු හා අතිරික්ත 31 කි.සමාලෝචිත වර්ෂය අවසාන වන විට සංස්ථාවේ ඉහළ කළමනාකාරිත්ව තනතුරු තුළ ස්ථිර කාර්ය මණ්ඩලයේ තනතුරු 11 ක පුරප්පාඩු පැවතුණි.

(උ) සංස්ථාවේ අනුමත කාර්ය මණ්ඩලය තුළ ස්ථිර ආරක්ෂක සේවා නිලධාරින් 68 දෙනෙකු සිටියදී සමාලෝචිත වර්ෂය තුළදි රු. මිලියන 81.82 ක් එල්ආර්ඩීසී සේවා පෞද්ගලික සමාගම වෙත ගෙවා සංස්ථාව සඳහා ආරක්ෂක සේවා පහසුකම් ලබාගෙන තිබුණි. එමෙන්ම සංස්ථාවේ PL -01 බාණ්ඩය යටතේ අනුමත කම්කරු තනතුරු 412 න් 320 ක ස්ථිර කාර්යමණ්ඩලයක් සිටියදී එල්ආර්ඩීසී සේවා පෞද්ගලික සමාගම වෙතින් මිනිස් බල සේවා ලබා ගැනීමට සඳහා සමාලෝචිත වර්ෂය තුළදි රු.මිලියන 439.45 ක් සංස්ථාව විසින් වැයකර තිබුණි. එසේම සංස්ථාවේ කටයුතු ඉටුකිරීම සඳහා රෙඩෙකෝ සමාගමෙන් ලබාගන්නා ලද කාර්ය මණ්ඩලය සඳහා සමාලෝචිත වර්ෂය තුළදි රු.මිලියන 28.08 ක් සංස්ථාව විසින් වැයකර තිබුණි.

ඩබ්ලිව්.පී.සී. වික්‍රමරත්න
විගණකාධිපති

# විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය

| | | සමූහය | | සංස්ථාව | |
|---|---|---|---|---|---|
| **දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා** | Note | 2023<br>රු. 000 | 2022<br>රු. 000 | 2023<br>රු. 000 | 2022<br>Rs 000 |
| ගනුදෙනුකරුවන් සමඟ කොන්ත්‍රාත්වලින් ආදායම | 1 | 8,638,830 | 6,725,264 | 5,431,081 | 4,289,956 |
| ඍජු පිරිවැය | 2 | (6,087,067) | (4,519,055) | (3,237,072) | (2,396,713) |
| **දළ ලාභය** | | **2,551,763** | **2,206,209** | **2,194,009** | **1,893,243** |
| **වෙනත් මෙහෙයුම් ආදායම්** | 3 | 202,965 | 282,184 | 181,315 | 276,259 |
| **වෙනත් මෙහෙයුම් ආදායම් සමඟ දළ ලාභය** | | **2,754,728** | **2,488,393** | **2,375,324** | **2,169,502** |
| පරිපාලන වියදම් | | (1,603,245) | (1,443,069) | (1,333,295) | (1,225,841) |
| ක්ෂයවීම සහ ක්‍රමක්ෂය | | (373,355) | (377,745) | (355,617) | (359,975) |
| ප්‍රවර්ධන වියදම් | | (199,435) | (7,250) | (198,660) | (6,853) |
| වෙනත් මෙහෙයුම් වියදම් | | (617,624) | (233,949) | (617,623) | (233,949) |
| **මෙහෙයුම්වලින් ලත් ලාභය /(අලාභය)** | 4 | **(38,931)** | **426,380** | **(129,871)** | **342,884** |
| බේරුම්කරණයෙන් පැන නගින හිමිකම්පෑම් | | 4,149 | (753,081) | 4,149 | (753,081) |
| මූල්‍ය පිරිවැය | 5 | (401,723) | (227,176) | (394,771) | (219,972) |
| මූල්‍ය ආදායම | 6 | 1,664,405 | 1,207,643 | 1,636,819 | 1,190,633 |
| විලම්භිත ආදායම ක්ෂය කිරීම | 17 | 106,972 | 200,573 | 106,972 | 200,573 |
| **බදුකරණයට පෙර ලාභය** | | **1,334,872** | **854,339** | **1,223,298** | **761,037** |
| බදුකරණය | 7 | (264,180) | (470,760) | (260,032) | (452,884) |
| **වර්ෂය සඳහා ලාභය** | | **1,070,692** | **383,579** | **963,266** | **308,153** |
| **ආරෝපණය කළ හැකි ලාභය:** | | | | | |
| මව් සමාගමේ සමකොටස් හිමිකම් | | 1,049,207 | 368,494 | 963,266 | 308,153 |
| පාලනය නොකරන පොලිය | | 21,485 | 15,085 | - | - |
| **වෙනත් විස්තීර්ණ ආදායම්** | | | | | |
| අර්ථදැක්වූ ප්‍රතිලාභ සැලසුම් මත ආයුගණක ලාභය/(අලාභය) | 19 | (15,823) | 38,930 | (35,789) | 39,288 |
| අර්ථදැක්වූ ප්‍රතිලාභ සැලසුම් මත ආයුගණක ලාභය/(අලාභය) සඳහා ආරෝපණය කළ හැකි විලම්භිත බදු | 7.2 | 4,747 | (11,679) | 10,737 | (11,786) |
| දේපල, පිරියත හා උපකරණ ප්‍රත්‍යාගණනය කිරීමේ අතිරික්තය | | 34,168 | - | - | - |
| **වර්ෂය සඳහා මුළු වෙනත් විස්තීර්ණ ආදායම්** | | **23,092** | **27,251** | **(25,052)** | **27,502** |
| **වර්ෂය සඳහා මුළු විස්තීර්ණ ආදායම** | | **1,093,784** | **410,830** | **938,214** | **335,655** |
| **ආරෝපණය කළ හැකි මුළු විස්තීර්ණ ආදායම :** | | | | | |
| මව් සමාගමේ සමකොටස් හිමිකරුවන් | | 1,062,670 | 395,794 | 938,214 | 335,655 |
| පාලනය නොකරන පොලිය | | 31,114 | 15,035 | - | - |

පිටු අංක 96 සිට 111 දක්වා ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ සටහන් මෙම මූල්‍ය ප්‍රකාශනයන්හි ඒකාබද්ධ කොටසකි.

# මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය

| | | සමූහය | | සංස්ථාව | |
|---|---|---|---|---|---|
| දෙසැම්බර් 31 වැනි දිනට | | 2023 | 2022 | 2023 | 2022 |
| | Note | රු. 000 | රු. 000 | රු. 000 | රු. 000 |
| **වත්කම්** | | | | | |
| **ජංගම නොවන වත්කම්** | | | | | |
| දේපල,පිරියත සහ උපකරණ | 8 | 2,245,579 | 2,338,568 | 2,139,533 | 2,243,052 |
| අස්පෘශ්‍ය වත්කම් | 9 | 37,172 | 14,733 | 37,172 | 14,658 |
| දේපල ආයෝජන | 10 | 2,725,931 | 2,925,998 | 2,725,931 | 2,925,998 |
| අනුබද්ධිත ආයතනවල ආයෝජන | 11 | - | - | 2,000 | 2,000 |
| සම්බන්ධිත පාර්ශ්වවලට දුන් ණය | 14 | - | - | 126,667 | 141,233 |
| ක්‍රමක්ෂිත පිරිවැයට සිදු කළ ආයොජන | 15 | 445,208 | - | 445,208 | - |
| විලම්භිත බදු වත්කම් | | 89,256 | 58,205 | - | - |
| | | **5,543,146** | **5,337,504** | **5,476,511** | **5,326,941** |
| **ජංගම වත්කම්** | | | | | |
| තොගය | 12 | 2,190,434 | 2,813,477 | 2,097,163 | 2,717,596 |
| වෙළඳ හා වෙනත් ලැබිය යුතු මුදල් | 13 | 5,240,354 | 6,061,259 | 3,712,316 | 4,854,204 |
| අයකර ගතයුතු බදුකරණය | | 88,326 | 5,362 | 82,156 | - |
| සම්බන්ධිත පාර්ශ්වවලට දුන් ණය | 14 | - | - | 38,566 | 24,000 |
| ක්‍රමක්ෂිත පිරිවැයට සිදු කළ ආයොජන | 15 | 5,819,566 | 7,011,627 | 5,642,563 | 6,810,000 |
| මුදල් සහ මුදල් හා සමාන දෑ | 16 | 1,967,251 | 1,065,171 | 1,693,348 | 979,377 |
| | | **15,305,931** | **16,956,896** | **13,266,112** | **15,385,177** |
| **මුළු වත්කම්** | | **20,849,077** | **22,294,400** | **18,742,623** | **20,712,118** |
| **සමකොටස් හා බැරකම්** | | | | | |
| **ප්‍රාග්ධන හා සංචිත** | | | | | |
| දායක ප්‍රාග්ධනය | | 1,000 | 1,000 | 1,000 | 1,000 |
| ප්‍රාග්ධන සංචිත | | 13,461 | 13,461 | 13,461 | 13,461 |
| වත්කම් ප්‍රත්‍යාගණන සංචිත | | 286,024 | 258,690 | 212,430 | 212,430 |
| රඳවාගත් ඉපැයීම් | | 11,225,941 | 10,690,605 | 10,826,654 | 10,388,440 |
| පාලනය නොකරන පොලිය | | 118,722 | 87,608 | - | - |
| **මුළු ප්‍රාග්ධන හා සංචිත** | | **11,645,148** | **11,051,364** | **11,053,545** | **10,615,331** |
| **ජංගම නොවන බැරකම්** | | | | | |
| කාර්ය මණ්ඩල සුබසාධන අරමුදල් | | 126,709 | 107,473 | 126,709 | 107,473 |
| අත්පත් කරගත් ඉඩම් සඳහා ගෙවිය යුතු වන්දි | | 256,482 | 240,963 | 256,482 | 240,963 |
| විලම්භිත බදුකරණ බැරකම | | 149,131 | 182,660 | 149,131 | 182,660 |
| විලම්භිත ආදායම | 17 | 417,677 | 429,301 | 417,677 | 429,301 |
| පොලියක් දරන ණය සහ ලබා ගැනීම් | 18 | 1,067,436 | 1,334,519 | 1,067,436 | 1,334,295 |
| විශ්‍රාම ප්‍රතිලාභ බැඳීම් | 19 | 613,095 | 519,717 | 386,345 | 304,779 |
| | | **2,630,530** | **2,814,633** | **2,403,780** | **2,599,471** |
| **ජංගම බැරකම්** | | | | | |
| පොලියක් දරන ණය සහ ලබා ගැනීම් | 18 | 267,082 | 268,199 | 266,859 | 266,859 |
| වෙළඳ හා වෙනත් ගෙවිය යුතු | 20 | 2,436,206 | 4,019,579 | 1,333,084 | 3,230,579 |
| ගෙවිය යුතු බදු | | 345,899 | 444,499 | 241,634 | 363,594 |
| ගෙවිය යුතු ලාභාංශ | | 911 | 911 | - | - |
| ලැබූ අත්තිකාරම් | 21 | 3,503,681 | 3,680,608 | 3,443,721 | 3,636,284 |
| බැංකු අයිරා | 16 | 19,620 | 14,607 | - | - |
| | | **6,573,399** | **8,428,403** | **5,285,298** | **7,497,316** |
| **මුළු බැරකම්** | | **9,203,929** | **11,243,036** | **7,689,078** | **10,096,787** |
| **මුළු සමකොටස් සහ බැරකම්** | | **20,849,077** | **22,294,400** | **18,742,623** | **20,712,118** |

පිටු අංක 96 සිට 111 දක්වා ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ සටහන් මෙම මූල්‍ය ප්‍රකාශනයන්හි ඒකාබද්ධ කොටසකි.
ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරි ආයතනය විසින් නිකුත් කරන ලද ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන සකස් කර ඉදිරිපත් කර ඇත.

**ජේ.ඒජයසිංහ .කේ.පී.**
නියෝජ්‍ය සමාන්‍යාධිකාරි (මුදල්)

**ඉංජිමතී සේනාධීරශ්‍රී .**
සාමාන්‍යාධිකාරි

මෙම මූල්‍ය ෂෂඅධ්‍ය .කියනු ලැබේ ක්ෂ මණ්ඩලය වගකාශන සකස් කිරිම සහ ඉදිරිපත් කිරිම සම්බන්ධයෙන් අධ්‍යප්‍ර මණ්ඩල සඳහා සහ වෙනුවෙන් මූල්‍ය ප්‍රකාශන අනුමත කර සහ අත්සන් කරන ලද්දේ:

**ඉංජි. හිරාන් බාලසූරිය**
**රියර් අද්මිරාල්**
සභාපති

**ගාමිණී හේවගේ**
අධ්‍යක්ෂ

2024 මාර්තු 07 වැනි දින

# හිමිකම් වෙනස්වීම පිළිබඳ ප්‍රකාශනය

**සමූහය**

| විස්තරය | දායක ප්‍රාග්ධනය රු.000 | ප්‍රාග්ධන සංචිත රු.000 | වත්කම් ප්‍රත්‍යාගණන සංචිත රු.000 | රඳවාගත් ඉපැයීම් රු.000 | පාලනය නොකරන පොලිය රු.000 | එකතුව රු.000 |
|---|---|---|---|---|---|---|
| **2021.12.31 දිනට ශේෂය** | **1,000** | **13,461** | **258,690** | **10,319,810** | **72,573** | **10,665,534** |
| 2022 වර්ෂය සඳහා ලාභය/(අලාභය) | - | - | - | 368,494 | 15,085 | 383,579 |
| බදු හැර අර්ථදැක්වූ ප්‍රතිලාභ සැලැසුම් මත ආයුගණක ලාභය/(අලාභය) | - | - | - | 27,301 | (50) | 27,251 |
| ඒකාබද්ධ අරමුදලට දැක්වූ දායකත්වය | - | - | - | (25,000) | - | (25,000) |
| **2022.12.31 දිනට ශේෂය** | **1,000** | **13,461** | **258,690** | **10,690,605** | **87,608** | **11,051,364** |
| 2023 වර්ෂය සඳහා ලාභය/(අලාභය) | - | - | - | 1,049,207 | 21,485 | 1,070,692 |
| බදු හැර අර්ථදැක්වූ ප්‍රතිලාභ සැලැසුම් මත ආයුගණක ලාභය/(අලාභය) | - | - | - | (13,871) | 2,795 | (11,076) |
| ඒකාබද්ධ අරමුදලට දැක්වූ දායකත්වය | - | - | - | (500,000) | - | (500,000) |
| දේපල, පිරියත හා උපකරණ ප්‍රත්‍යාගණනය මත අතිරික්තය | - | - | 27,334 | - | 6,834 | 34,168 |
| **2023.12.31 දිනට ශේෂය** | **1,000** | **13,461** | **286,024** | **11,225,941** | **118,722** | **11,645,148** |

**සංස්ථාව**

| | දායක ප්‍රාග්ධනය රු.000 | ප්‍රාග්ධන සංචිත රු.000 | වත්කම් ප්‍රත්‍යාගණන සංචිත රු.000 | රඳවාගත් ඉපැයීම් රු.000 | එකතුව රු.000 |
|---|---|---|---|---|---|
| **2021.12.31 දිනට ශේෂය** | **1,000** | **13,461** | **212,430** | **10,077,785** | **10,304,676** |
| 2022 වර්ෂය සඳහා ලාභය/(අලාභය) | - | - | - | 308,153 | 308,153 |
| බදු හැර අර්ථදැක්වූ ප්‍රතිලාභ සැලැසුම් මත ආයුගණක ලාභය/(අලාභය) | - | - | - | 27,502 | 27,502 |
| ඒකාබද්ධ අරමුදලට දැක්වූ දායකත්වය | - | - | - | (25,000) | (25,000) |
| **2022.12.31 දිනට ශේෂය** | **1,000** | **13,461** | **212,430** | **10,388,440** | **10,615,331** |
| 2023 වර්ෂය සඳහා ලාභය/(අලාභය) | - | - | - | 963,266 | 963,266 |
| බදු හැර අර්ථදැක්වූ ප්‍රතිලාභ සැලැසුම් මත ආයුගණක ලාභය/(අලාභය) | - | - | - | (25,052) | (25,052) |
| ඒකාබද්ධ අරමුදලට දැක්වූ දායකත්වය | - | - | - | (500,000) | (500,000) |
| **2023.12.31 දිනට ශේෂය** | **1,000** | **13,461** | **212,430** | **10,826,654** | **11,053,545** |

පිටු අංක 96 සිට 111 දක්වා ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ සටහන් මෙම මූල්‍ය ප්‍රකාශනයන්හි ඒකාබද්ධ කොටසකි.

# මූල්‍ය ප්‍රවාහ ප්‍රකාශනය

| දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා | සමූහය | | සංස්ථාව | |
|---|---|---|---|---|
| | 2023 | 2022 | 2023 | 2022 |
| | රු. 000 | රු. 000 | රු. 000 | රු. 000 |
| **මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් මුදල් ප්‍රවාහය** | | | | |
| බදු පෙර ශුද්ධ ලාභය/(අලාභය) | 1,334,872 | 854,339 | 1,223,298 | 761,037 |
| **ගැලපීම්;** | | | | |
| ක්‍රමක්ෂය සහ ක්ෂයවීම් | 380,164 | 386,007 | 355,617 | 359,975 |
| මූල්‍ය පිරිවැය | 401,723 | 227,176 | 394,771 | 219,972 |
| මූල්‍ය ආදායම | (1,664,405) | (1,207,643) | (1,636,819) | (1,190,633) |
| විලම්භිත ආදායම් ක්‍රමක්ෂය කිරීම | (106,972) | (200,573) | (106,972) | (200,573) |
| අවිනිශ්චිත ණය සඳහා වෙන්කිරීම් | 4,013 | (38,638) | 5,807 | (38,564) |
| කපා හල බොල් ණය | - | 3 | - | 3 |
| දේපල, පිරියත සහ යන්ත්‍රෝපකරණ විකිණීමෙන් ලත් ලාභය | (447,318) | (95,361) | (447,301) | (95,281) |
| සෙමින් සංසරණය වන තොග සඳහා වෙන්කිරීම් | 10,821 | 7,817 | 10,821 | 7,817 |
| අර්ථදැක්වූ ප්‍රතිලාභ බැඳීම් සඳහා වෙන්කිරීම් | 131,237 | 113,503 | 72,406 | 56,852 |
| **කාරක ප්‍රාග්ධන වෙනස්වීම්වලට පෙර මෙහෙයුම් ලාභය** | **44,135** | **46,630** | **(128,372)** | **(119,395)** |
| **කාරක ප්‍රාග්ධන වෙනස්වීම්** | | | | |
| තොග (වැඩිවීම) / අඩුවීම | 612,572 | (518,087) | 609,962 | (540,655) |
| වෙළඳ හා වෙනත් ලැබිය යුතු මුදල් - (වැඩිවීම) / අඩුවීම | 676,932 | (217,899) | 997,521 | 191,017 |
| ගෙවිය යුතු වන්දි - වැඩිවීම/ (අඩුවීම) | (91) | 31,900 | (91) | 31,900 |
| කාර්ය මණ්ඩල සුබසාධන අරමුල - වැඩිවීම / (අඩුවීම) | 19,236 | 12,330 | 19,236 | 12,330 |
| ලැබූ අත්තිකාරම් - වැඩිවීම / (අඩුවීම) | (176,927) | (136,424) | (192,563) | (91,354) |
| වෙළඳ හා වෙනත් ගෙවිය යුතු මුදල් - වැඩිවීම / (අඩුවීම) | (1,563,880) | 1,809,327 | (1,879,002) | 1,521,945 |
| **මෙහෙයුම්වලින් ලත් මුදල්** | (388,023) | 1,027,777 | (573,309) | 1,005,788 |
| ගෙවූ ආදායම් බදු | (505,578) | (194,828) | (486,940) | (194,815) |
| ගෙවූ පාරිතෝෂික | (53,682) | (64,376) | (26,629) | (49,856) |
| ***මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින්/(යෙදවූ) ශුද්ධ මුදල්*** | **(947,283)** | **768,573** | **(1,086,878)** | **761,117** |
| **ආයෝජන ක්‍රියාකාරකම්වලින් මුදල් ප්‍රවාහය** | | | | |
| දේපල පිරියත හා යන්ත්‍රෝපකරණ අත්පත් කර ගැනීම | (243,919) | (558,909) | (243,085) | (551,463) |
| ස්ථාවර තැන්පතු ශුද්ධ ආපසු ගැනීම / (ආයෝජනය) | 749,843 | (3,141,846) | 725,219 | (3,129,998) |
| ලැබූ පොළී ආදායම | 1,801,375 | 621,028 | 1,772,389 | 601,257 |
| දේපල, පිරියත සහ යන්ත්‍රෝපකරණ විකිණීමෙන් ලැබීම් | 721,305 | 99,386 | 721,288 | 96,018 |
| ***ආයෝජන ක්‍රියාකාරකම්වලින්/(යෙදවූ) ශුද්ධ මූල්‍ය ප්‍රවාහය*** | **3,028,604** | **(2,980,341)** | **2,975,811** | **(2,984,186)** |
| **මූල්‍ය ක්‍රියාකාරකම්වලින් මූල්‍ය ප්‍රවාහය** | | | | |
| ණය නැවත ගෙවීම | (268,200) | (268,198) | (266,859) | (266,859) |
| ණය සඳහා ගෙවූ පොලිය | (416,055) | (184,821) | (408,103) | (177,861) |
| ඒකාබද්ධ අරමුදලට දැක්වූ දායකත්වය | (500,000) | (25,000) | (500,000) | (25,000) |
| ගෙවූ කල්බදු වාරික | - | (5,090) | - | - |
| ***මූල්‍ය ක්‍රියාකාරකම්වලින්/(යෙදවූ) ශුද්ධ මූල්‍ය*** | **(1,184,255)** | **(483,109)** | **(1,174,962)** | **(469,720)** |
| මුදල් සහ මුදල් හා සමාන දෑවල වැඩිවීම/(අඩුවීම) | 897,067 | (2,694,877) | 713,971 | (2,692,789) |
| වර්ෂය ආරම්භයේදී මුදල් සහ මුදල් හා සමාන දෑ | 1,050,564 | 3,745,441 | 979,377 | 3,672,166 |
| වර්ෂය අවසානයේදී මුදල් සහ මුදල් හා සමාන දෑ (සටහන 16) | **1,947,631** | **1,050,564** | **1,693,348** | **979,377** |

පිටු අංක 96 සිට 111 දක්වා ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ සටහන් මෙම මූල්‍ය ප්‍රකාශනයන්හි ඒකාබද්ධ කොටසකි.

# වැදගත් ගිණුම් ප්‍රතිපත්ති

## 1. ආයතනික තොරතුරු

### 1.1 වාර්තාකරණ ආයතනය

ශ්‍රී ලංකා ඉඩම් සංවර්ධනය කිරීමේ සංස්ථාව රාජ්‍ය සංස්ථාවක් වන අතර ශ්‍රී ලංකාවේ පිහිටා ඇත. සංස්ථාව, 1968 අංක 15 දරන පනතින් 1968 වර්ෂයේ සැප්තැම්බර් මස 22 දින සංස්ථාගත කර ඇත.

සංස්ථාවේ ලියාපදිංචි කාර්යාලය සහ ප්‍රධාන ව්‍යාපාර ස්ථානය අංක 03, ශ්‍රී ජයවර්ධනපුර මාවත, වැලිකඩ, රාජගිරිය යන ස්ථානයේ පිහිටා ඇත.

### 1.2 ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන

2023 දෙසැම්බර් මස 31 වැනි දිනට සහ එදිනෙන් අවසන් වූ වර්ෂය සඳහා ශ්‍රී ලංකා ඉඩම් සංවර්ධනය කිරීමේ සංස්ථාවේ ඒකාබද්ධ ගිණුම් ප්‍රකාශනවලට සංස්ථාවේ සහ එහි පරිපාලිත සමාගම් දෙකෙහි (එක්ව ගත්කළ "සමූහය" ලෙසින් හඳුන්වන) ගිණුම්වලින් සමන්විත වේ. සංස්ථාව සහ එහි අනුබද්ධිත ආයතනයට දෙසැම්බර් මස 31 වැනි දිනෙන් අවසන් වන පොදු මූල්‍ය වර්ෂයක් පවතී. ශ්‍රී ලංකා ඉඩම් සංවර්ධනය කිරීමේ සංස්ථාවට හඳුනාගත හැකි කිසිදු මව් සමාගමක් නොමැත. සමූහයෙහි අවසන් මව් සමාගම සංස්ථාව වේ.

### 1.3 ප්‍රධාන කාර්යයන් සහ මෙහෙයුම්වල ස්වභාවය

වර්ෂය තුළදී සංස්ථාවේ සහ එහි පරිපාලිත සමාගම්වල ප්‍රධාන ක්‍රියාකාරකම් පහත පරිදි වේ.

| ආයතනයේ නම | ව්‍යාපාරවල ස්වභාවය |
|---|---|
| ශ්‍රී ලංකා ඉඩම් සංවර්ධනය කිරීමේ සංස්ථාව | අපවහන වැඩි දියුණු කිරීම්, ඉඩම් සංවර්ධනය කිරීම්, නාගරික භූමි අලංකරණ, තෙත් බිම් කළමනාකරණය, අක්-වෙරළ වැලි හැරීම සහ විකිණීම, කසළ කළමනාකරණය, සිවිල් ඉදිකිරීම සහ සම්බන්ධිත ඉංජිනේරු සේවාවන් සැපයීම |
| ඉඩම් ගොඩකිරීමේ හා සංවර්ධනය කිරීමේ සමාගම | සිමෙන්ති ගල් සහ පෙරදි අයිතම නිෂ්පාදනය කිරීම, අක්-වෙරළ වැලි පැකට් කිරීම සහ අලෙවි කිරීම, සිවිල් ඉදිකිරීම් |
| LRDC සර්විසස් (පෞද්.) සමාගම | ආරක්ෂක සහ මිනිස්බල සේවා සැපයීම |

සංස්ථාවේ පරිපාලිත සමාගම් දෙකම සමාගම් පනත යටතේ ශ්‍රී ලංකාවේ සංස්ථාගත කර ඇත.

## 2. වැදගත් ගිණුම් ප්‍රතිපත්තිවල සාරාංශය

### 2.1 පොදු ගිණුම්කරණ ප්‍රතිපත්ති

#### 2.1.1 සකස් කිරීමේ පදනම

ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය විසින් නිකුත් කරන ලද ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතවලට අනුකූලව සමූහයේ ඒකාබද්ධ ගිණුම්කරණ ප්‍රකාශන සකස් කර ඇත.

#### 2.1.2 අගය කිරීමේ පදනම

ලාභය හෝ අලාභය හරහා සාධාරණ අගයට අගය කරන ලද මූල්‍ය වත්කම් සඳහා හැර ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන ඓතිහාසික පිරිවැය පදනම මත සකස් කර ඇත

#### 2.1.3 ඉදිරිපත් කිරීමේ හා ක්‍රියාකාරී මුදල් වර්ගය

සමූහයේ ක්‍රියාකාරී සහ ඉදිරිපත් කිරීමේ මුදල් වර්ගය වන ශ්‍රී ලංකා රුපියල්වලින් ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කර ඇත

#### 2.1.4 අනුකූලවීමේ ප්‍රකාශනය

2023 දෙසැම්බර් 31 දිනට සහ එදිනෙන් අවසන් වූ වර්ෂය සඳහා සංස්ථාවේ සහ සමූහයේ මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය, විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රවාහය සමඟ ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ සටහන් ("මූල්‍ය ප්‍රකාශන") ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය විසින් නිකුත් කරන ලද ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතවලට අනුකූලව සකස් කර ඇත

#### 2.1.5 අඛණ්ඩ පැවැත්ම

අඛණ්ඩ පැවැත්මක් ලෙසින් ඉදිරියටත් පැවතීමේ හැකියාව සම්බන්ධයෙන් අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සංස්ථාව සහ එහි පරිපාලිත සමාගම් පිළිබඳව ඇගයීමක් සිදු කර ඇති අතර මෙහෙයුම් ඇවර කිරීමට හෝ අඩු කිරීමට ඔවුන්ගේ අදහසක් නොමැත

#### 2.1.6 සංසන්දනාත්මක තොරතුරු

"මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම" සම්බන්ධයෙන් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත– LKAS 01 ට අනුකූලව සංස්ථාව සහ සමූහය විසින් පසුගිය වර්ෂයේ ගිණුම්කරණ ප්‍රතිපත්ති සමඟ ගිණුම්කරණ ප්‍රතිපත්ති ඒකාකාරව යොදාගෙන ඇත. වර්තමාන ඉදිරිපත් කිරීම හා අනුකූල වන පරිදි සංසන්දනාත්මක තොරතුරු අවශ්‍ය අවස්ථාවලදී නැවත වර්ගීකරණය කර ඇත.

#### 2.1.7 ද්‍රව්‍ය සමූහනය සහ හිලව් කිරීම

ගිණුම්කරණ ප්‍රමිතයකින් අවශ්‍ය කරන්නේ නම් හෝ අවසර දෙන්නේ නම් මිස වත්කම් සහ බැරකම්, ආදායම සහ වියදම් හිලව් කිරීම සිදු කරනු නොලැබේ.

එක් එක් අයිතම ද්‍රව්‍ය වර්ගය මූල්‍ය ප්‍රකාශනවල වෙන් වෙන්ව ඉදිරිපත් කර ඇත. අදාළ වන්නේ නම් පමණක් සමාන ස්වභාවයේ අයිතම හෝ කාර්යයන් එක් කර ඉදිරිපත් කරනු ලැබේ.

#### 2.1.8 සැලකිය යුතු ගිණුම්කරණ තීරණ, ඇස්තමේන්තු සහ උපකල්පන

සමූහයේ මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේදී වාර්තා කර ඇති ආදායම, වියදම්, වත්කම් සහ බැරකම් වටිනාකම් සහ අනාවරණය කිරීම් සඳහා බලපෑම් ඇති කරනු ලබන තීරණ, ඇස්තමේන්තු සහ උපකල්පන සිදු කිරීමට කළමනාකාරිත්වයට සිදු වේ. මෙම තීරණ, ඇස්තමේන්තු සහ උපකල්පන හේතුවෙන් වත්කම් හා බැරකම්වල පවතින වටිනාකමට සිදුවන කවර හෝ සැලකිය යුතු ගැලපීමක් ඉදිරි මූල්‍ය වර්ෂයේදී සලකා බලනු ලැබේ.

## වැදගත් ගිණුම් ප්‍රතිපත්ති (ඉදිරියට.,)

### 2.2 ඒකාබද්ධ වීමේ පදනම

ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන, 2023 දෙසැම්බර් මස 31 වැනි දිනට සංස්ථාවේ සහ එහි පරිපාලිත සමාගම්වල මූල්‍ය ප්‍රකාශනවලින් සමන්විත වේ. අත්පත් කරගත් දින සිට පරිපාලිත සමාගම් ඒකාබද්ධ වන අතර එදින සිට සමූහය විසින් පාලනය ලබා ගන්නා අතර එම පාලනය අවසන් වන දින දක්වා ඒකාබද්ධ වී සිටී

**a) පරිපාලිත සමාගම්**

පරිපාලිත සමාගම් යනු මූල්‍ය සහ මෙහෙයුම් ප්‍රතිපත්ති සෘජුව පාලනය කිරීම සඳහා සමූහයට බලය පවතින සාමාන්‍යයෙන් ඡන්ද හිමිකමෙන් අඩකට වඩා වැඩි කොටස් හිමිකාරිත්වයක් දරන සියලු ආයතන වේ. සමූහය විසින් වෙනත් ආයතනයක් පාලනය කරනු ලබන්නේද යන්න ඇගයීමේදී, වර්තමානයේදී ක්‍රියාවේ යෙදවිය හැකි හෝ පරිවර්තනය කළ හැකි භව්‍ය ඡන්ද හිමිකාරිත්වයේ පැවතීම සහ බලපෑම සළකා බලනු ලැබේ. පාලනය සමූහයට මාරු කරන ලද දින සිට පරිපාලිත සමාගම් සම්පූර්ණයෙන් ඒකාබද්ධ වේ. එම පාලනය අවසන් වන දිනෙන් ඒවා ඒකාබද්ධතාවයෙන් ඉවත් වේ

| ආයතනයේ නම | ඵලදායී අයිතිය |
|---|---|
| ඉඩම් ගොඩකිරීමේ සහ සංවර්ධනය කිරීමේ සමාගම (REDECO) | 80% |
| LRDC සර්විසස් (පෞද්.) සමාගම | 80% |

සංස්ථාවේ සහ එහි පරිපාලිත සමාගම්වල මුළු ලාභ සහ අලාභ ඒකාබද්ධ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනයෙහි ඇතුලත් කර ඇත. සංස්ථාවේ මෙන්ම එහි පරිපාලිත සමාගම්වල සියලු වත්කම් සහ බැරකම් ඒකාබද්ධ මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයෙහි ඇතුලත් කර ඇත.

**b) සුළු කොටස් හිමි අයිතිය**

සමූහයේ ශුද්ධ වත්කම්වල පිටස්තර කොටස් හිමියන්ගේ බැදියාව සහ පිටස්තර කොටස් හිමියන් සඳහා යෙදිය හැකි බදු පසු ලාභයෙහි ප්‍රමාණය "සුළු කොටස් හිමි අයිතිය" යන මාතෘකාව යටතේ ඒකාබද්ධ මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයෙහි සහ ඒකාබද්ධ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනයෙහි වෙන් වෙන් වශයෙන් දක්වනු ලැබේ.

**c) ඒකාබද්ධ වීම මත ඉවත් කරනු ලබන ගනුදෙනු**

අන්තර් සමූහ ගනුදෙනුවලින් පැන නඟින සියලු අන්තර් සමූහ ශේෂයන්, ආදායම සහ වියදම සහ උපලබ්ධි නොවූ ලාභ සහ අලාභ සම්පූර්ණයෙන් ඉවත් කරනු ලැබේ

### 2.3 වත්කම් සහ ඒවා තක්සේරු කිරීමේ පදනම

#### 2.3.1 දේපල, පිරියත සහ යන්ත්‍රෝපකරණ

දේපල, පිරියත සහ යන්ත්‍රෝපකරණ මිලදී ගත් හෝ ඉදිකළ පිරිවැය අඩු කිරීම සමුච්චිත ක්ෂය වීම දක්වනු ලැබේ. එමගින් අපේක්ෂිත භාවිතය සඳහා වත්කම ක්‍රියාකාරී තත්ත්වයට පත් කිරීම සඳහා ආරෝපණය කළ හැකි කවර හෝ පිරිවැයක් මිලදී ගැනීමේ හෝ ඉදිකිරීමේ පිරිවැයට ඇතුලත් වේ.

**ක්ෂය වීම**

දේපල, පිරියත සහ උපකරණවල අපේක්ෂිත ප්‍රයෝජ්‍ය ජීව කාලය තුළ සරල රේඛීය පදනමින් ඒවායේ පිරිවැය කපා හැරීම සඳහා පහත සඳහන් කර ඇති පරිදි ක්ෂය සපයනු ලැබේ.

| බදු ඉඩම් | කල්බදු කාලසීමාව තුළ |
|---|---|
| සින්නක්කර ඉඩම්වල ගොඩනැගිලි | වර්ෂ 10 සිට 20 දක්වා |
| බර පිරියත සහ යන්ත්‍රෝපකරණ | වර්ෂ 10 |
| කුඩා පිරියත සහ යන්ත්‍රෝපකරණ | වර්ෂ 10 |
| සැහැල්ලු මෝටර් රථ | වර්ෂ 5 |
| බර මෝටර් රථ | වර්ෂ 5 |
| කාර්යාල උපකරණ | වර්ෂ 8 |
| මුළුතැන්ගෙයි සහ සුභසාධන උපකරණ | වර්ෂ 10 |
| ගෘහ භාණ්ඩ සහ උපාංග | වර්ෂ 10 |
| රසායනාගාර සහ සමීක්ෂණ උපකරණ | වර්ෂ 10 |
| බෝට්ටු එන්ජින් සහ උපාංග | වර්ෂ 10 |
| පාපැදි | වර්ෂ 2 |
| කන්ටේනර් | වර්ෂ 10 |
| ව්‍යායාම් උපකරණ | වර්ෂ 10 |
| සූර්ය පද්ධති | වර්ෂ 10 |
| වෙනත් ස්ථාවර වත්කම් | වර්ෂ 10 |
| සන්තකයේ ඇති ඉඩම්වල කන්ටේනර් | වර්ෂ 10 |

සින්නක්කර ඉඩම්වල පිරිවැය කපා හැරීම සඳහා ක්ෂය කිරීම් සපයා නොමැත.

වත්කමක ක්ෂය, වත්කම භාවිතයට ගැනීම සඳහා පවතින දින සිට ආරම්භ වන අතර වත්කම හඳුනානොගන්නා දිනෙන් අවසන් වේ.

#### 2.3.2 අස්පෘශ්‍ය වත්කම්

වත්කම් ආශ්‍රිත අනාගත ආර්ථික ප්‍රතිලාභ ආයතනය වෙත ගලා ඒමට සම්භාවිතාවක් ඇති විට සහ වත්කම්වල පිරිවැය විශ්වාසදායක ලෙස මැනිය හැකි විට අස්පෘශ්‍ය වත්කමක් හඳුනාගනු ලැබේ.

වෙන වෙනම අත්පත් කරගත් අස්පෘශ්‍ය වත්කමක පිරිවැයට, වෙළඳ වට්ටම් සහ අඩු කිරීම් සහ වත්කම් එහි අපේක්ෂිත භාවිතය සඳහා සකස් කිරීමට සෘජුව ආරෝපණය කළ හැකි පිරිවැය අඩු කළ පසු ආනයන බදු සහ ආපසු නොගෙවන මිලදී ගැනීමේ බදු ඇතුළුව එහි මිලදී ගැනීමේ මිල ඇතුළත් වේ.

අස්පෘශ්‍ය වත්කමක්, එහි පිරිවැය අඩු කිරීම කවර හෝ සමුච්චිත ක්‍රමක්ෂයක් සහ කවර හෝ සමුච්චිත අගය අඩුවීමේ අලාභක් දරයි.

**ක්‍රමක්ෂය**

සීමිත ආයු කාලයක් සහිත අස්පෘශ්‍ය වත්කම් ක්‍රමක්ෂය කිරීම, ඒවා අපේක්ෂිත භාවිතය සඳහා ලබා ගත හැකි දින සිට අස්පෘශ්‍ය වත්කම්වල ඇස්තමේන්තුගත ප්‍රයෝජනවත් ආයු කාලය තුළ සරල රේඛා පදනමක් මත ලාභ හෝ අලාභ ප්‍රකාශනයෙහි හඳුනා ගැනේ. සංස්ථාව සතු අස්පෘශ්‍ය වත්කම්වල ඇස්තමේන්තුගත ප්‍රයෝජ්‍ය ජීව කාලය පහත පරිදි වේ:

| | |
|---|---|
| පරිගණක මෘදුකාංග | වර්ෂ 10 |
| වෙනත් අස්පෘශ්‍ය වත්කම් | වර්ෂ 10 |

## වැදගත් ගිණුම් ප්‍රතිපත්ති (ඉදිරියට.,)

### 2.3.3 ආයෝජන දේපල

ආයෝජන දේපලක් යනු කුලී ආදායමක් උපයා ගැනීම සඳහා තබා ගන්නා දේපල වන අතර සාමාන්‍ය ව්‍යාපාරයක ලෙස අළෙවි කිරීමට හෝ නිෂ්පාදනය සඳහා හෝ භාණ්ඩ හෝ සේවා සැපයීම හෝ පරිපාලන කාර්යයන් සඳහා හෝ භාවිතා කරනු ලබන ඒවා නොවේ. ආයෝජන දේපල අත්පත් කර පිරිවැය සහ ඉදිරි සංවර්ධන පිරිවැයට දක්වනු ලැබේ.

### 2.3.4 තොග

යල් පිනු සහ සෙමින් සංසරණය වන අයිතම සඳහා ගෙවිය යුතු දීමනා වෙන් කිරීමෙන් පසු පිරිවැයට සහ ඇස්තමේන්තුගත ශුද්ධ උපලබ්ධි වටිනාකම අඩු කර තොග තක්සේරු කරනු ලැබේ. සම්පූර්ණ කිරීමේ ඇස්තමේන්තුගත පිරිවැය සහ විකිණීම සිදු කිරීම සඳහා අවශ්‍ය ඇස්තමේන්තුගත පිරිවැය අඩු කර සාමාන්‍ය ව්‍යාපාරක තොග විකිණිය හැකි මිල ගණන ශුද්ධ උපලබ්ධි වටිනාකම වේ.

තොග පරිභෝජනය කරන විට හෝ විකුණන විට බර තැබූ සාමාන්‍ය පිරිවැය සූත්‍රය භාවිතා කරමින් තොග වල පිරිවැය ආදායම් ප්‍රකාශයට ඇතුලත් කරනු ලැබේ

### 2.3.5 සිදු කෙරෙමින් පවතින කාර්යයන්

මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ දිනට සිදු කෙරෙමින් පවතින දීර්ඝ කාලීන ව්‍යාපෘති හා සම්බන්ධ සිදු කෙරෙමින් පවතින වැඩ, ද්‍රව්‍ය සහ ශ්‍රමය සමන්විත වන ඍජු පිරිවැයට සහ ව්‍යාපෘති සඳහා ආරෝපණය කළ හැකි ඍජු පොදු කාර්ය පිරිවැයට තක්සේරු කරනු ලැබේ.

### 2.3.6 වෙළඳ සහ වෙනත් ලැබිය යුතු දේ

අගය අඩු වීම සඳහා වෙන් කිරීම් හැර ඉතිරි අගය ලබා ගැනීම සඳහා වෙළඳ ලැබිය යුතු දෑ ඇස්තමේන්තු කරන ලද වටිනාකමට ඒවා හඳුනාගනු ලැබේ. වෙනත් ලැබිය යුතු දෑ සහ සම්බන්ධිත පාර්ශවවලින් හිඟ මුදල් සාධාරණ අගය අඩු කිරීම අගය අඩු වීම සඳහා වෙන් කිරීමට හඳුනාගනු ලැබේ. ඒවායේ නැවත අයකරගත හැකි මට්ටම සලකා බලමින් බොල් සහ අවිනිශ්චිත ණය සඳහා ගිණුම්වල වෙන් කිරීම් සිදු කරනු ලැබේ.

### 2.3.7 මුදල් සහ මුදල් හා සමාන දෑ

දන්නා මුදල් ප්‍රමාණයක් සඳහා කඩිනමින් පරිවර්තනය කළ හැකි සහ වටිනාකමෙහි වෙනස් වීම සඳහා නොසළකා හැරිය හැකි මට්ටමේ අවදානමක් සහිත අත ඇති මුදල්, ඉල්ලුම් තැන්පතු සහ කෙටි කාලීන ඉහළ ද්‍රවශීලීතාවයක් සහිත ආයෝජන මුදල් සහ මුදල් හා සමාන දෑ ලෙස අර්ථ දක්වනු ලැබේ. මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ අවශ්‍යතාවය සඳහා මුදල් සහ මුදල් හා සමාන දෑ, අත ඇති මුදල් සහ බැංකු අයිරා හැර REPO සහ භාණ්ඩාගාර බිල්පත් ඇතුළුව බැංකු තැන්පතුවලින් සමන්විත වේ.

### 2.3.8 මූල්‍ය මෙවලම්-මූල්‍ය වත්කම්

a) **මූලික හඳුනාගැනීම සහ මැනීම**

SLFRS 9 හි විෂය පථය තුළ ඇති මූල්‍ය වත්කම් ක්‍රමක්ෂිත පිරිවැය, වෙනත් විස්තීර්ණ ආදායම් (OCI) හරහා සාධාරණ වටිනාකම සහ ලාභ හෝ අලාභ හරහා සාධාරණ වටිනාකම ලෙස වර්ගීකරණය කර ඇත.

මූලික හඳුනාගැනීමේදී මූල්‍ය වත්කම් වර්ගීකරණය මූල්‍ය වත්කම්වල ගිවිසුම්ගත මුදල් ප්‍රවාහ ලක්ෂණ සහ ඒවා කළමනාකරණය සඳහා ආයතනයේ ව්‍යාපාර ආකෘතිය මත රඳා පවතී. මෙම තක්සේරුව SPPI පරීක්ෂණය ලෙස හඳුන්වනු ලබන අතර එය මෙවලම් මට්ටමකින් සිදු කෙරේ. ගිවිසුම්ගත මුදල් ප්‍රවාහ එකතු කිරීම, මූල්‍ය වත්කම් විකිණීම හෝ ඒ දෙකෙන්ම මුදල් ප්‍රවාහයන් සිදුවේද යන්න ව්‍යාපාර ආකෘතිය තීරණය කරයි. සැලකිය යුතු මූල්‍ය සංරචකයක් අඩංගු නොවන හෝ ආයතනය ප්‍රායෝගික ප්‍රයෝජනය යොදවා ඇති වෙළඳ ලැබිය යුතු දෑ හැර ගනුදෙනු මිල අනුව මනිනු ලැබේ.

මූලික හඳුනාගැනීමේදී, ආයතනය මූල්‍ය වත්කමක් එහි සාධාරණ වටිනාකමට අමතරව මූල්‍ය වත්කම් අත්පත් කර ගැනීම සඳහා ඍජුවම ආරෝපණය කළ හැකි ගනුදෙනු පිරිවැය මනිනු ලැබේ. ලාභ හෝ අලාභ හරහා සාධාරණ අගය (FVPL) ට මනිනු ලබන මූල්‍ය වත්කම්වල ගනුදෙනු පිරිවැය ලාභ හෝ අලාභ ප්‍රකාශනයෙහි වාර්තා කරනු ලැබේ.

ආයතනයේ මූල්‍ය වත්කම්වලට මුදල් සහ කෙටි කාලීන තැන්පතු, වෙළඳ සහ අනෙකුත් ලැබිය යුතු මුදල් සහ උපුටා නොදැක් වූ මූල්‍ය මෙවලම් ඇතුළත් වේ.

ආ) තදනන්තර මැනීම

තදනන්තර මිනුම් අරමුණු සඳහා, මූල්‍ය වත්කම් කාණ්ඩ තුනකට වර්ග කෙරේ

- ක්‍රමක්ෂිත පිරිවැයට පවතින මූල්‍ය වත්කම්
- OCI හරහා සාධාරණ වටිනාකමට පවතින මූල්‍ය වත්කම්
- ලාභ හෝ අලාභ හරහා සාධාරණ වටිනාකමකට පවතින ඇති මූල්‍ය වත්කම්

*i) ක්‍රමක්ෂිත පිරිවැයට පවතින මූල්‍ය වත්කම්*

ගිවිසුම්ගත මුදල් ප්‍රවාහ එකතු කිරීම සඳහා තබා ඇති වත්කම්, එම මුදල් ප්‍රවාහයන් නියෝජනය කරන්නේ මූලික සහ පොලී පමණක් නම් ක්‍රමක්ෂිත පිරිවැයට මනිනු ලැබේ. පහත සඳහන් කොන්දේසි දෙකම සපුරාලන්නේ නම් ආයතනය විසින් මූල්‍ය වත්කම් ක්‍රමක්ෂිත පිරිවැය යටතේ මනිනු ලබයි:

- ගිවිසුම්ගත මුදල් ප්‍රවාහ එකතු කිරීම සඳහා මූල්‍ය වත්කම් තබා ගැනීමේ අරමුණින් මූල්‍ය වත්කම් ව්‍යාපාර ආකෘතියක් තුළ තබා තිබීම.
- මූල්‍ය වත්කම්වල ගිවිසුම්ගත නියමයන් නිශ්චිත දිනයන්හි හිඟව පවතින මූලික මුදල මත මූලික මුදල සහ පොලිය ගෙවීම පමණක් වන මූල්‍ය ප්‍රවාහයන් ප්‍රතිඵලය කරවීම

ක්‍රමක්ෂිත පිරිවැයට පවතින මූල්‍ය වත්කම් ඉදිරි පොලී අනුපාත (EIR) ක්‍රමය භාවිතයෙන් මනිනු ලබන අතර ඒවා අගය අඩු වීමට යටත් වේ. වත්කම් හඳුනා නොගත් විට, වෙනස් කරන ලද විට හෝ අගය අඩු වූ විට ලාභ හෝ අලාභ හඳුනා ගැනේ. ආයතනයේ ක්‍රමක්ෂිත පිරිවැයට ඇති මූල්‍ය වත්කම්වලට භාණ්ඩාගාර බැඳුම්කර සහ බැංකුවල ඇති ස්ථාවර තැන්පතු ආයෝජන ඇතුළත් වේ.

## වැදගත් ගිණුම් ප්‍රතිපත්ති (ඉදිරියට.,)

*ii) වෙනත් විස්තීර්ණ ආදායම් හරහා සාධාරණ අගය (FVOCI) හරහා සාධාරණ වටිනාකමට ඇති මූල්‍ය වත්කම්*

ගිවිසුම්ගත මුදල් ප්‍රවාහ එකතු කිරීම සහ මූල්‍ය වත්කම් විකිණීම සඳහා තබා ඇති වත්කම්, වත්කම්වල මුදල් ප්‍රවාහයන් මුලික හා පොලී ගෙවීම් පමණක් නියෝජනය කරන විට, වෙනත් විස්තීර්ණ ආදායම් හරහා සාධාරණ අගය (FVOCI) ට මනිනු ලැබේ. පහත සඳහන් කොන්දේසි දෙකම සපුරා ඇත්නම්, ආයතනය වෙනත් විස්තීර්ණ ආදායම (OCI) හරහා සාධාරණ වටිනාකමට ණය මෙවලම් මනිනු ලැබේ:

- ගිවිසුම්ගත මුදල් ප්‍රවාහ එකතු කිරීම සහ විකිණීම යන අරමුණු දෙකෙම ඇතිව මූල්‍ය වත්කම් ව්‍යාපාර ආකෘතියක් තුළ තබා ඇති විට.

- මූල්‍ය වත්කම්වල ගිවිසුම්ගත නියමයන් නිශ්චිත දිනයන්හි හිඟව පවතින මූලික මුදල මත මූලික මුදල සහ පොලිය ගෙවීම පමණක් වන මූල්‍ය ප්‍රවාහයන් ප්‍රතිඵලය කරන විට.

අගය අඩු වීමේ ලාභ හෝ අලාභ හඳුනා ගැනීම, ලාභ හෝ අලාභ ප්‍රකාශනයෙහි හඳුනාගෙන ඇති පොලී ආදායම සහ විදේශ විනිමය ලාභ සහ අලාභ හැර, පවතින වටිනාකමෙහි චලනයන් OCI හරහා ලබා ගනු ලැබේ. මූල්‍ය වත්කම් හඳුනා නොගත් විට, OCI හි කලින් හඳුනාගත් සමුච්චිත ලාභය හෝ අලාභය සමකොටස් වලින් ලාභයට හෝ අලාභයට නැවත වර්ගීකරණය කර වෙනත් ලාභ/(අලාභ) තුළ හඳුනා ගැනේ. මෙම මූල්‍ය වත්කම්වලින් ලැබෙන පොලී ආදායම ඵලදායී පොලී අනුපාත ක්‍රමය භාවිතා කරමින් මූල්‍ය ආදායමට ඇතුළත් කරනු ලැබේ. විදේශ විනිමය ලාභ සහ අලාභ වෙනත් ලාභ/(අලාභ) තුළ ඉදිරිපත් කර ඇති අතර, අගය අඩු වීමේ වියදම්, ආදායම් ප්‍රකාශයේ වෙනම රේඛීය අයිතමයක් ලෙස ඉදිරිපත් කෙරේ.

වාර්තා කරන දිනට OCI හරහා සාධාරණ වටිනාකමකින් පවත්වාගෙන යන ණය මෙවලම් කිසිවක් ආයතනයට නොමැත.

### 2.4 බැරකම් සහ වෙන්කිරීම්

### 2.4.1 බැරකම්

මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයෙහි ජංගම බැරකම් යටතේ වර්ගීකරණය කර ඇති බැරකම්, මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ දින සිට වර්ෂයක කාලයක් තුළදී හිඟ තත්ත්වයට පත්වනු ඇතැයි අපේක්ෂා කෙරේ. ජංගම නොවන බැරකම් ලෙස වර්ගීකරණය කර ඇත්තේ, වාර්තාකරණ දිනට වර්ෂයකට පසු කිසියම් අවස්ථාවකදී හිඟ වනු ඇතැයි අපේක්ෂා කරනු ලබන අයිතම වේ.

### 2.4.2 විශ්‍රාම ප්‍රතිලාභ බැඳීම්

### 2.4.2.1 අර්ථ දැක්වූ ප්‍රතිලභ සැලසුම්- පාරිතෝෂික

LKAS 19- "සේවක ප්‍රතිලාභ" මඟින් නිර්දේශිත ව්‍යාපෘති ඒකක බැර (PUC) ක්‍රමවේදය භාවිතා කරමින් ස්වාධීන ආයුගණකයන් විසින් වාර්ෂිකව ගණනය කරනු ලබන පරිදි අර්ථ දැක්වූ ප්‍රතිලාභ බැඳීම සම්බන්ධයෙන් මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයෙහි හඳුනාගත් බැරකම, අර්ථ දැක්වූ ප්‍රතිලාභ බැඳීමේ වර්තමාන වටිනාකම වේ. අර්ථ දැක්වූ ප්‍රතිලාභ සැලසුම් සඳහා ආයුගණක ලාභ සහ අලාභ ඒවා සිදු වන කාල පරිච්ඡේදයේදී වෙනත් විස්තීර්ණ ආදායමෙහි සම්පූර්ණයෙන් හඳුනාගනු ලැබේ.

කෙසේවෙතත්, 1983 අංක 12 දරන පාරිතෝෂික ගෙවීමේ පනතට අනුව, සේවකයෙකු සඳහා පාරිතෝෂික ගෙවීමේ බැරකම පැන නගින්නේ වර්ෂ පහක අඛණ්ඩ සේවා කාලයක් සම්පූර්ණ කිරීමෙන් පසුව පමණක් වේ.

### 2.4.2.2 අර්ථ දැක්වූ දායකත්ව සැලසුම

සේවකයන්, අදාල නීති සහ රෙගුලාසි ප්‍රකාරව සේවා නියුක්තයන්ගේ අර්ථ සාධක අරමුදලේ දාකත්වයට සහ සේවක භාරකාර අරමුදලේ දායකත්වයට සුදුසුකම් ලබයි.

(a) **සේවා නියුක්තයන්ගේ අර්ථ සාධක අරමුදල**

සේවා නියුක්තයන්ගේ අර්ථසාධක අරමුදල සඳහා සංස්ථාව 12% කින් සහ සේවකයින් 10% කින්ද දායක වේ.

(b) **සේවක භාරකාර අරමුදල**

සේවකයන් වෙනුවෙන් සේවක භාරකාර අරමුදල සඳහා සංස්ථාව 3%ක දායකත්වයක් දරයි.

### 2.4.3 බදුකරණය

**a) ආදායම් බදු**

මූල්‍ය ප්‍රකාශනවල වාර්තා කර ඇති පරිදි ආදායම් බදු සඳහා වෙන් කිරීම් ආදායම සහ වියදමෙහි මූලාවයව මත පදනම් වන අතර 2007 අංක 24 දරන දේශීය ආදායම් පනත සහ එහි සංශෝධිත විධිවිධානවලට අනුකූලව ගණනය කර ඇත.

b) **විලම්භිත බදු**

මූල්‍ය වාර්තාකරණ අවශ්‍යතා සඳහා වාර්තාකරණ දිනට වත්කම් හා බැරකම්වල බදු පදනම් සහ ඒවායේ පවතින වටිනාකම අතර තාවකාලික වෙනස මත බැරකම් ක්‍රමවේදය භාවිතා කරමින් විලම්භිත බදු සඳහා වෙන් කිරීම් සිදු කරනු ලැබේ.

වාර්තාකරණ දිනට පනවා ඇති හෝ සැලකිය යුතු ලෙස පනවා ඇති බදු අනුපාත (සහ බදු නීති) පදනම් කර ගනිමින්, වත්කම උපලබ්ධි වූ විට හෝ බැරකම නිරවුල් වූ විට විලම්භිත බදු වර්ෂය තුළදී යොදා ගැනීමට අපේක්ෂිත බදු අනුපාතයට අගය කරනු ලැබේ.

### 2.4.4 රජයේ ප්‍රදාන

දිගුකාලීන වත්කම් ආකාරයෙන් ලැබෙන රජයේ ප්‍රදානයන්, විලම්භිත ආදායමක් ලෙස හඳුනාගෙන ඇති අතර ප්‍රාග්ධන ප්‍රවේශය මත පදනම්ව වත්කම්වල ප්‍රයෝජනවත් ආයු කාලය ඔස්සේ ආදායමක් ලෙස වාර්ෂිකව හඳුනාගෙන ඇත.
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලට අදාළව වර්ෂය තුළ ලැබුණු රජයේ ප්‍රදාන (දිගුකාලීන වත්කම් හැර) විස්තිරණ ආදායම් ප්‍රකාශය තුළ සම්පූර්ණයෙන් හඳුනාගෙන ඇත. අදාළ පිරිවැය එම කාල සීමාව තුළ විස්තිරණ ආදායම් ප්‍රකාශනයට ඇතුළත් කරනු ලැබේ.
රජයේ ප්‍රදානවලට සම්බන්ධ කොන්දේසි සහ අනිකුත් අවිනිශ්චිතතා සලකා බලා අනාවරණය කරනු ලැබේ

### 2.5 විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය

### 2.5.1 ආදායම

කාර්ය සාධන බැඳීම් තෘප්තිමත් වනවිට සමාගම ගනුදෙනුකරුවන් සමඟ ඇති කොන්ත්‍රාත්වලින් ලැබෙන ආදායම හඳුනාගනී. ආදායම හඳුනාගැනීම සඳහා පහත සඳහන් නිශ්චිත නිර්ණායකයන් භාවිතා කරනු ලැබේ

## වැදගත් ගිණුම් ප්‍රතිපත්ති (ඉදිරියට.,)

**a) භාණ්ඩ විකිණීම**

පොරොන්දු වූ භාණ්ඩ ගනුදෙනුකරුවකුට පැවරීමෙන් කාර්ය සාධන වගකීමක් ඉටු වූ බවට සංස්ථාව තෘප්තිමත් වනවිට භාණ්ඩ විකිණීමෙන් ලැබෙන ආදායම හඳුනාගැනේ.

**b) සේවාවන් සැපයීම**

පොරොන්දු වූ සේවාවක් ගනුදෙනුකරුවකුට ලබා දීමෙන් කාර්ය සාධන වගකීමක් ඉටු වූ බවට සංස්ථාව තෘප්තිමත් වනවිට සේවාව ලබා දීමෙන් ලැබෙන ආදායම හඳුනාගැනේ.

**c) ඉඩම් විකිණීමෙන් ලැබෙන ආදායම**

ඉඩම් ටෙන්ඩර් මගින් හෝ වෙනත් ආකාරයකින් විකුණන විට, විකුණුම් ඔප්පුව ක්‍රියාත්මක වූ විට හෝ එසේ නොමැති නම් සියලු ගෙවීම් ලැබී තිබේ නම් සහ විකිණුම් ඔප්පුවකින් විකිණීම සිදු නොකිරීමේ සම්භාවිතාවක් නොමැති නම් විකුණුම් වටිනාකම සාමාන්‍යයෙන් ආදායමට ගනු ලැබේ.

**d) ඉදිකිරීම් කොන්ත්‍රාත්**

ඒවා ආදායමක් උත්පාදනය කරනු ඇති යැයි සහ විශ්වාසනීයව මැනිය හැකි යැයි යන ප්‍රමාණයට කොන්ත්‍රාත්තුවේදී එකඟ වූ මුල් වටිනාකම එකතු කිරීම කොන්ත්‍රාත් කාර්යයෙහි සිදු වූ කවර හෝ වෙනස්වීමක්, හිමිකම් සහ දිරි දීමනා ඉදිකිරීම් ආදායමට ඇතුලත් වේ.

SLRFS 15 ට අනුකූලව කාර්ය සාධන වගකීම්වල සම්පූර්ණ තෘප්තිභාවය උදෙසා ප්‍රතිදාන ක්‍රමය භාවිතා කරමින් කොන්ත්‍රාත්තුව සිදුකරන කාල සීමාව තුළ ඉදිකිරීම් කොන්ත්‍රාත්තුවලින් ලැබෙන ආදායම සංස්ථාව හඳුනාගනී. කොන්ත්‍රාත් පිරිවැය සාමාන්‍යයෙන් ඒවා හා සම්බන්ධ කාර්යයන් සිදුකරන ලද ගිණුම්කරණ කාල පරිච්ඡේදයන් තුළ හඳුනාගනු ලබයි.

කෙසේවෙතත්, නිවාස අමාත්‍යාංශයේ ස්ථාවර තාක්ෂණික කමිටුවේ (STC) අනුමැතිය අවශ්‍ය වන ඉදිකිරීම් කොන්ත්‍රාත්තුවල ආදායම හඳුනාගැනීම STC විසින් එවැනි අනුමැතියක් ලබා දෙන තෙක් ඉංජිනේරු සහතික කළ වැඩ වටිනාකමින් 90%කට සීමා වේ.

**e) පොලී ආදායම**

පොලී ආදායම උපචිත පදනම මත හඳුනාගනු ලැබේ.

**f) ලාභාංශ ආදායම**

ලාභාංශ ලැබීමට ඇති අයිතිය තහවුරු වූ විට ලාභාංශ ආදායම හඳුනාගනු ලැබේ.

**g) වෙනත් ආදායම්**

වෙනත් ආදායම් උපචිත පදනමින් හඳුනාගනු ලැබේ

**2.5.2. ණය ලබා ගැනීමේ පිරිවැය**

එහි අපේක්ෂිත භාවිතය හෝ විකිණීම සඳහා සූදානම් වීමට සැලකිය යුතු කාලයක් ගතවන වත්කමක් අත්පත් කර ගැනීම, ඉදිකිරීම හෝ නිෂ්පාදනය කිරීම සඳහා සෘජුවම ආරෝපණය කළ හැකි ණය ලබා ගැනීමේ පිරිවැය වත්කම්වල පිරිවැයේ කොටසක් ලෙස ප්‍රාග්ධනීකරණය කරනු ලැබේ. අනෙකුත් සියලුම ණය ගැනීමේ පිරිවැය ඒවා සිදුවන කාල සීමාව තුළ වියදම් කරනු ලැබේ. ණය ගැනීමේ පිරිවැය, අරමුදල් ණයට ගැනීම සම්බන්ධයෙන් ආයතනයක් විසින් දරනු ලබන පොලී සහ වෙනත් වියදම්වලින් සමන්විත වේ.

**2.5.3 අතිවිශේෂ අයිතම**

අදාල සියලු විස්තර ගිණුම් සඳහා වන සටහන්වල අනාවරණය කර ඇත.

**2.6 මූල්‍ය තත්ත්ව ප්‍රකාශන දිනය පසුව සිදු වන සිදු වීම්**

මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ දිනට පසුව සිදු වුන සියලු වැදගත් සිදුවීම් සලකා බලා ඇති අතර මූල්‍ය ප්‍රකාශන සඳහා වන සටහන්වල යෝග්‍ය ගැලපීම් හෝ අනාවරණය කිරීම් සිදු කර ඇත.

# මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්

| | | සමූහය | | සංස්ථාව | |
|---|---|---|---|---|---|
| | | 2023 | 2022 | 2023 | 2022 |
| | | රු. 000 | රු. 000 | රු. 000 | රු. 000 |
| 1 | **ආදායම** | | | | |
| | භාණ්ඩාගාර අරමුදල් ලැබූ ව්‍යාපෘතිවලින් ලත් ආදායම | 2,521,520 | 748,404 | 2,521,520 | 748,404 |
| | සේවාදායක ව්‍යාපෘතිවලින් ලත් ආදායම | 781,744 | 1,104,352 | 719,585 | 1,082,429 |
| | අක්වෙරළ වැලි විකිණීම | 916,918 | 1,896,316 | 915,237 | 1,896,290 |
| | ඉඩම් විකිණීම් | 720,000 | 96,000 | 720,000 | 96,000 |
| | ඉඩම් කල්බදු | 150,172 | 151,154 | 150,172 | 151,154 |
| | උපදේශන සේවාවන් | 33,383 | 22,203 | 33,383 | 22,203 |
| | ඉඩම් නිරවුල් සහතික නිකුත් කිරීමේ ආදායම | 62,733 | 42,509 | 62,733 | 42,509 |
| | විවේක උද්‍යානය සහ විනෝදාත්මක ප්‍රදේශයෙන් ලත් ආදායම | 155,872 | 122,247 | 155,872 | 115,913 |
| | කසළ කළමනාකරණ අංගන ආදායම | 98,234 | 113,070 | 98,234 | 113,070 |
| | ඉංජිනේරුමය ද්‍රව්‍ය පරීක්ෂණාගාර ආදායම | 2,914 | 4,579 | 2,914 | 4,579 |
| | යන්ත්‍රෝපකරණ කුලියට දීමෙන් ලත් ආදායම | 24,864 | 9,819 | 24,864 | 9,819 |
| | ආරක්ෂක සේවාවලින් ලත් ආදායම | 3,109,736 | 2,367,705 | - | - |
| | කුට්ටි සහ කුඹහ විකිණීම | 34,173 | 46,906 | - | - |
| | වෙනත් භාණ්ඩ හා සේවා විකිණීම | 26,567 | - | 26,567 | 7,586 |
| | | **8,638,830** | **6,725,264** | **5,431,081** | **4,289,956** |
| 2 | **සෘජු පිරිවැය** | | | | |
| | භාණ්ඩාගාර අරමුදල් ලැබූ ව්‍යාපෘති සඳහා පිරිවැය | 1,488,329 | 459,736 | 1,931,225 | 688,077 |
| | සේවාදායක ව්‍යාපෘති මත පිරිවැය | 599,229 | 543,827 | 676,235 | 864,283 |
| | අක්වෙරළ වැලි පිරිවැය | 302,835 | 831,362 | 312,742 | 833,491 |
| | විකුණූ ඉඩම් පිරිවැය | 273,028 | 631 | 273,028 | 631 |
| | උපදේශන සේවා පිරිවැය | 2,715 | 582 | 2,715 | 582 |
| | ආරක්ෂක සේවා සැපයීමේ පිරිවැය | 3,341,084 | 2,638,210 | - | - |
| | විකුණූ කුට්ටි සහ කුඹහ පිරිවැය | 38,720 | 35,058 | - | - |
| | විකුණූ වෙනත් භාණ්ඩ හා සේවා පිරිවැය | 41,127 | 9,649 | 41,127 | 9,649 |
| | | **6,087,067** | **4,519,055** | **3,237,072** | **2,396,713** |
| 3 | **වෙනත් මෙහෙයුම් ආදායම** | | | | |
| | කුලී ආදායම | 64,383 | 210,435 | 68,536 | 224,362 |
| | වෙළඳ දැන්වීම් පුවරු ආදායම | 15,296 | 4,140 | 15,296 | 4,140 |
| | දේපල,පිරියත හා උපකරණ විකිණීමේ ලාභය | 346 | (8) | 329 | (88) |
| | එකතු කළ නීති ගාස්තු | 3,909 | 2,877 | 3,909 | 2,877 |
| | සංචාරක බංගලාවලින් ලත් ආදායම | 6,376 | 5,035 | 6,376 | 5,035 |
| | ඇපකර මුදල් කිරීම | 6,629 | 9,662 | 6,629 | 9,662 |
| | උපයෝගිතා සහ භාණ්ඩ වියදම් අයකර ගැනීම | 20,552 | 12,694 | 20,552 | 12,694 |
| | කෘෂි ගොවිපොළ ආදායම | 918 | 1,006 | 918 | 1,006 |
| | ලිපිලේඛන ගාස්තු සහ සැපයුම්කරුවන් ලියාපදිංචි කිරීම | 2,277 | 2,435 | 2,277 | 2,435 |
| | සුදුනෙළුම්පුර ආදායම | 3,281 | 3,281 | 3,281 | 3,281 |
| | වාහන අංගනවලින් ලත් ආදායම | 33,482 | 3,337 | 33,482 | 3,337 |
| | විවිධ ආදායම් | 45,516 | 27,290 | 19,730 | 7,518 |
| | | **202,965** | **282,184** | **181,315** | **276,259** |
| 4 | **මෙහෙයුම්වලින් ලාභ/(අලාභ)**<br>*පහත වියදම් ඇතුළුව සියලු වියදම් අයකිරීමෙන් පසුව ප්‍රකාශයට පත් කර ඇත;* | | | | |
| | අධ්‍යක්ෂවරුන්ගේ වේතන | 1,508 | 1,307 | 942 | 808 |
| | විගණකවරුන්ගේ වේතන | 2,593 | 3,423 | 1,264 | 1,960 |
| | අර්ථ දැක්වූ දායකත්ව සැලැස්ම පිරිවැය-EPF සහ ETF | 130,252 | 130,084 | 119,107 | 118,192 |
| | අර්ථ දැක්වූ ප්‍රතිලාභ සැලැස්මේ පිරිවැය-විශ්‍රාම පාරිතෝෂික | 131,237 | 113,503 | 72,406 | 56,852 |
| | විනිමය ලාභ/(අලාභ) | (71,121) | 263,103 | (71,121) | 263,103 |
| | කපා හළ බොල් ණය | - | 3 | - | 3 |
| | ප්‍රදාන සහ CSR ක්‍රියාකාරකම් | 201,605 | 378 | 195,687 | 282 |
| | බොල් සහ අවිනිශ්චිත ණය සඳහා වෙන් කිරීම් / (ප්‍රත්‍යාවර්තනය) | 4,013 | (38,638) | 5,807 | (38,564) |

## මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන් (ඉදිරියට.,)

| | | සමූහය | | සංස්ථාව | |
|---|---|---|---|---|---|
| | | 2023 | 2022 | 2023 | 2022 |
| | | රු. 000 | රු. 000 | රු. 000 | රු. 000 |
| 5 | **මූල්‍ය පිරිවැය** | | | | |
| | බැංකු ණය පොළී | 394,748 | 218,532 | 389,610 | 213,107 |
| | අත් පත් කර ගත් ඉඩම් සඳහා වන්දි මත පොලිය | 5,161 | 5,900 | 5,161 | 5,900 |
| | බැංකු අයිරා පොලිය | 1,814 | 1,490 | - | - |
| | කල්බදු මත මූල්‍ය ගාස්තු | - | 244 | - | - |
| | ගෙවූ වෙනත් පොලී | - | 1,010 | - | 965 |
| | | 401,723 | 227,176 | 394,771 | 219,972 |
| 6 | **මූල්‍ය ආදායම** | | | | |
| | භාණ්ඩාගාර බිල්පත් ප්‍රති මිලදී ගැනුම් මත පොලී ආදායම | 33,595 | 154,767 | 19,259 | 146,274 |
| | ස්ථාවර තැන්පතු මත ආයෝජන ආදායම | 1,495,178 | 1,028,500 | 1,479,436 | 1,017,575 |
| | භාණ්ඩාගාර බැඳුම්කර ආයෝජන මත පොලිය | 104,654 | - | 104,654 | - |
| | විදේශ මුදල් තැන්පතු මත පොලී ආදායම | 9,563 | 14,236 | 9,563 | 14,236 |
| | සේවක ණය පොලිය | 16,416 | 8,007 | 16,148 | 7,655 |
| | සම්බන්ධිත පාර්ශ්ව ණය මත පොලිය | - | - | 2,760 | 2,760 |
| | වෙනත් ප්‍රභව මත පොලී ආදායම | 4,999 | 2,133 | 4,999 | 2,133 |
| | | 1,664,405 | 1,207,643 | 1,636,819 | 1,190,633 |
| 7 | **බදුකරණය** | | | | |
| | ප්‍රවර්තන වර්ෂයේ ආදායම් බදු සඳහා වෙන්කිරීම් (7.1) | 111,069 | 307,802 | 66,725 | 273,295 |
| | පසුගිය වර්ෂ සම්බන්ධයෙන් ඌන/(අතිරික්ත) වෙන්කිරීම | 78,853 | 145,754 | 82,007 | 145,754 |
| | විලම්භිත බදු වෙන්කිරීම් / (ප්‍රත්‍යාවර්තනය) (7.2) | (59,834) | 17,204 | (22,792) | 33,835 |
| | ප්‍රාග්ධන ඉපැයීම් බදු | 134,092 | - | 134,092 | - |
| | | 264,180 | 470,760 | 260,032 | 452,884 |
| 7.1 | **ආදායම් බදු** | | | | |
| | බදු පෙර ලාභය /(අලාභය) | **1,334,872** | **854,339** | **1,223,298** | **761,037** |
| | අඩුකළා: නිදහස් සහ අවසර දිය නොහැකි ආදායම | (2,472,260) | (1,647,621) | (2,441,897) | (1,639,148) |
| | එකතු කළා: අවසර දිය නොහැකි වියදම් | 1,067,982 | 1,156,213 | 988,314 | 1,080,850 |
| | අඩු කළා: අවසර දිය හැකි වියදම් | (775,094) | (405,839) | (730,397) | (366,932) |
| | ව්‍යාපාරවලින් ලාභය/(අලාභය) | (844,500) | (42,908) | (960,682) | (164,193) |
| | පොලී ආදායම | 1,723,839 | 1,176,396 | 1,708,097 | 1,176,396 |
| | තක්සේරු කළ හැකි ආදායම | **879,339** | **1,133,488** | **747,415** | **1,012,203** |
| | භාවිතා නොකළ බදු අලාභ | 15,890 | 14,397 | - | - |
| | අඩු කළා: සුදුසුකම් ලැබීමේ ගෙවීම | (525,000) | - | (525,000) | - |
| | බදු අය කළ හැකි ආදායම | **370,229** | **1,147,885** | **222,415** | **1,012,203** |
| | යොදාගත හැකි බදු අනුපාතය | 30% | 24% සහ 30% | 30% | 24% සහ30% |
| | ප්‍රවර්තන වර්ෂය සඳහා ආදායම් බදු වෙන්කිරීම | 111,069 | 307,802 | 66,725 | 273,295 |
| 7.2 | **විලම්භිත බදු වෙන්කිරීම/(ප්‍රත්‍යාවර්තය)** | | | | |
| | *ආදායම් ප්‍රකාශනය* | | | | |
| | විලම්බිත බදු වෙන්කිරීම /(ප්‍රත්‍යාවර්තනය) | (59,834) | 17,204 | (22,792) | 33,835 |
| | *වෙනත් විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය* | | | | |
| | අර්ථ දැක්වූ ප්‍රතිලාභ සැලසුම් මත ආයුගණක ලාභය/(අලාභය) ට ආරෝපණය කළ හැකි විලම්භිත බදු වෙන්කිරීම/(ප්‍රත්‍යාවර්තනය) | (4,747) | 11,679 | (10,737) | 11,786 |
| | | (64,581) | 28,883 | (33,529) | 45,621 |

## මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන් (ඉදිරියට.,)

### 8 A දේපල, පිරියත සහ යන්ත්‍රෝපකරණ (සමූහය)

| වත්කම් කාණ්ඩය | පිරිවැය/තක්සේරු කිරීම | | | | | ක්ෂය | | | | ශුද්ධ පොත් අගය | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | 2022.12.31 දිනට ශේෂය | ප්‍රත්‍යාගණනය හේතුවෙන් ගැලපීම | වර්ෂය තුළ එකතු කිරීම් | වර්ෂය තුළ බැහැර කිරීම් | 2023.12.31 දිනට ශේෂය | 2022.12.31 දිනට ශේෂය | වර්ෂය සඳහා අයකිරීම | බැහැරකිරීම් | 2023.12.31 දිනට ශේෂය | 2023.12.31 දිනට ශේෂය | 2022.12.31 දිනට ශේෂය |
| | රු.000 | රු.000 | රු.000 | රු.000 | රු.000 | රු.000 | රු.000 | රු.000 | රු.000 | රු.000 | රු.000 |
| **පිරිවැයට/තක්සේරු කිරීම** | | | | | | | | | | | |
| සින්නක්කර ඉඩම් | 12,005 | 34,168 | - | - | 46,173 | - | - | - | - | 46,173 | 12,005 |
| කල්බදු ඉඩම් | 27,930 | - | - | - | 27,930 | 4,750 | 782 | - | 5,532 | 22,398 | 23,180 |
| සින්නක්කර ඉඩම්වල ඇති ගොඩනැගිලි | 1,151,779 | - | 54,721 | - | 1,206,500 | 362,223 | 53,142 | - | 415,365 | 791,135 | 789,556 |
| බර යන්ත්‍රෝපකරණ සහ පිරියත | 2,709,622 | - | 15,199 | (1,177) | 2,723,644 | 1,926,578 | 123,390 | (1,143) | 2,048,825 | 674,819 | 783,044 |
| සැහැල්ලු යන්ත්‍රෝපකරණ සහ පිරියත | 98,287 | - | 20,065 | (454) | 117,898 | 63,017 | 20,715 | (332) | 83,400 | 34,498 | 35,270 |
| සැහැල්ලු මෝටර් වාහන | 491,232 | - | - | - | 491,232 | 296,727 | 82,386 | - | 379,113 | 112,119 | 194,505 |
| බර මෝටර් වාහන | 45,731 | - | - | - | 45,731 | 11,818 | 3,730 | - | 15,548 | 30,183 | 33,913 |
| කාර්යාල උපකරණ | 183,051 | - | 68,886 | (1,304) | 250,633 | 129,401 | 15,589 | (1,239) | 143,751 | 106,882 | 53,650 |
| මුළුතැන්ගෙයි සහ සුබසාධන උපකරණ | 28,076 | - | 153 | (1,939) | 26,290 | 27,971 | 10 | (1,843) | 26,138 | 152 | 105 |
| ගෘහභාණ්ඩ සහ සවිකිරීම | 117,546 | - | 20,497 | (1,322) | 136,721 | 49,090 | 9,495 | (1,017) | 57,568 | 79,153 | 68,456 |
| විද්‍යාගාර සහ මැනුම් උපකරණ | 154,426 | - | 7,345 | (4,932) | 156,839 | 102,375 | 18,654 | (4,684) | 116,345 | 40,494 | 52,051 |
| බෝට්ටු එන්ජින් සහ අමතර කොටස් | 98,053 | - | - | (1,186) | 96,867 | 72,029 | 14,213 | (1,127) | 85,115 | 11,752 | 26,024 |
| පාපැදි | 2,752 | - | - | (27) | 2,725 | 2,371 | 153 | (26) | 2,498 | 227 | 381 |
| කන්ටේනර නිවාස | 120,045 | - | 8,262 | - | 128,307 | 70,801 | 9,306 | - | 80,107 | 48,200 | 49,244 |
| ව්‍යායාම උපකරණ | 18,290 | - | - | - | 18,290 | 15,986 | 962 | - | 16,948 | 1,342 | 2,304 |
| සූර්යබල පද්ධති | 6,530 | - | 54,990 | - | 61,520 | - | 663 | - | 663 | 60,857 | 6,530 |
| වෙනත් ස්ථාවර වත්කම් | 42,592 | - | 21,538 | (578) | 63,552 | 13,449 | 7,416 | (549) | 20,316 | 43,236 | 29,143 |
| සන්තකයේ පවතින ඉඩම්වල ඇති ව්‍යුහයන් | 42,023 | - | - | - | 42,023 | 27,572 | 1,990 | - | 29,562 | 12,461 | 14,451 |
| | **5,349,970** | **34,168** | **271,656** | **(12,919)** | **5,642,875** | **3,176,158** | **362,596** | **(11,960)** | **3,526,794** | **2,116,081** | **2,173,812** |
| සිදු කෙරෙමින් පවතින ප්‍රාග්ධන කාර්යයන් | | | | | | | | | | 129,498 | 164,756 |
| | | | | | | | | | | **2,245,579** | **2,338,568** |

**8A.1** 2023 දෙසැම්බර් 31 දිනට සීමාසහිත ඉඩම් ගොඩකිරීමේ සහ සංවර්ධනය කිරීමේ සමාගමට අයත් සින්නක්කර ඉඩමේ සාධාරණ වටිනාකම රජයේ තක්සේරු දෙපාර්තමේන්තුවක් විසින් ප්‍රත්‍යාගණනය කිරීම මගින් තීරණය කරන ලදී. එම ප්‍රත්‍යාගණන ප්‍රතිඵලය එය ක්‍රියාත්මක වන දින, එනම් 2023 දෙසැම්බර් 31 දින සිට සිට මෙම මූල්‍ය ප්‍රකාශනවලට ඇතුළත් කරන ලදී. ප්‍රත්‍යාගණනයෙන් පැන නගින අතිරික්තය ප්‍රත්‍යාගණන සංචිතයකට මාරු කරන ලදී.

## මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන් (ඉදිරියට.,)

### 8B දේපල, පිරියත සහ යන්ත්‍රෝපකරණ (සංස්ථාව)

| වත්කම් කාණ්ඩය | පිරිවැය/තක්සේරු කිරීම | | | | ක්ෂය | | | | ශුද්ධ පොත් අගය | |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| | 2022.12.31 දිනට ශේෂය | ප්‍රත්‍යාගණනය හේතුවෙන් ගැලපීම | වර්ෂය තුළ එකතු කිරීම් | වර්ෂය තුළ බැහැර කිරීම් | 2023.12.31 දිනට ශේෂය | 2022.12.31 දිනට ශේෂය | වර්ෂය සඳහා අයකිරීම | බැහැරකිරීම් | 2023.12.31 දිනට ශේෂය | 2023.12.31 දිනට ශේෂය |
| | රු.000 | රු.000 | රු.000 | රු.000 | රු.000 | රු.000 | රු.000 | රු.000 | රු.000 | රු.000 |
| **පිරිවැයට/තක්සේරු කිරීම** | | | | | | | | | | |
| සින්නක්කර ඉඩම් | 8,173 | - | - | 8,173 | - | - | - | - | 8,173 | 8,173 |
| කල්බදු ඉඩම් | 10,012 | - | - | 10,012 | 2,008 | 185 | - | 2,193 | 7,819 | 8,004 |
| සින්නක්කර ඉඩම්වල ඇති ගොඩනැගිලි | 1,115,411 | 55,450 | - | 1,170,861 | 344,501 | 50,418 | - | 394,919 | 775,942 | 770,910 |
| බර පිරියත සහ යන්ත්‍රෝපකරණ | 2,653,844 | 15,199 | (1,177) | 2,667,866 | 1,889,010 | 123,390 | (1,143) | 2,011,257 | 656,609 | 764,834 |
| සැහැල්ලු පිරියත සහ යන්ත්‍රෝපකරණ | 98,287 | 20,013 | (427) | 117,873 | 63,017 | 13,867 | (305) | 76,579 | 41,294 | 35,270 |
| සැහැල්ලු මෝටර් වාහන | 429,186 | - | - | 429,186 | 255,776 | 72,373 | - | 328,149 | 101,037 | 173,410 |
| බර මෝටර් වාහන | 39,363 | - | - | 39,363 | 5,450 | 3,730 | - | 9,180 | 30,183 | 33,913 |
| කාර්යාල උපකරණ | 153,253 | 68,197 | (1,304) | 220,146 | 107,610 | 13,418 | (1,239) | 119,789 | 100,357 | 45,643 |
| මුළුතැන්ගෙයි සහ සුබසාධන උපකරණ | 28,076 | 153 | (1,939) | 26,290 | 27,970 | 10 | (1,843) | 26,137 | 153 | 106 |
| ගෘහභාණ්ඩ සහ සවිකිරීම | 111,035 | 20,404 | (1,322) | 130,117 | 44,601 | 8,982 | (1,017) | 52,566 | 77,551 | 66,434 |
| විද්‍යාගාර සහ මැනුම් උපකරණ | 154,426 | 7,345 | (4,932) | 156,839 | 102,375 | 18,654 | (4,684) | 116,345 | 40,494 | 52,051 |
| බෝට්ටු එන්ජින් සහ අමතර කොටස් | 92,135 | - | (1,186) | 90,949 | 69,408 | 12,733 | (1,127) | 81,014 | 9,935 | 22,727 |
| පාපැදි | 2,752 | - | (27) | 2,725 | 2,371 | 153 | (26) | 2,498 | 227 | 381 |
| කන්ටේනර නිවාස | 120,045 | 8,262 | - | 128,307 | 70,802 | 9,306 | - | 80,108 | 48,199 | 49,243 |
| ව්‍යායාම උපකරණ | 18,290 | - | - | 18,290 | 15,986 | 962 | - | 16,948 | 1,342 | 2,304 |
| සූර්යබල පද්ධති | 6,530 | 54,990 | - | 61,520 | - | 663 | - | 663 | 60,857 | 6,530 |
| වෙනත් ස්ථාවර වත්කම් | 38,017 | 21,538 | (578) | 58,977 | 9,390 | 7,290 | (549) | 16,131 | 42,846 | 28,627 |
| සන්තකයේ පවතින ඉඩම්වල ඇති ව්‍යුහයන් | 42,023 | - | - | 42,023 | 27,571 | 1,990 | - | 29,561 | 12,462 | 14,452 |
| | **5,120,858** | **271,551** | **(12,892)** | **5,379,517** | **3,037,846** | **338,124** | **(11,933)** | **3,364,037** | **2,015,480** | **2,083,012** |
| සිදු කෙරෙමින් පවතින ප්‍රාග්ධන කාර්යයන් | | | | | | | | | 124,053 | 160,040 |
| | | | | | | | | | **2,139,533** | **2,243,052** |

## මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන් (ඉදිරියට.,)

### 9 A අස්පෘශ්‍ය වත්කම් (සමූහය)

| වත්කම් කාණ්ඩය | පිරිවැය/තක්සේරු කිරීම | | | | ක්‍රමක්ෂය | | | | ශුද්ධ පොත් අගය | |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| | 2022.12.31 දිනට ශේෂය | වර්ෂය තුළ එකතු කිරීම් | වර්ෂය තුළ බැහැර කිරීම් | 2023.12.31 දිනට ශේෂය | 2022.12.31 දිනට ශේෂය | වර්ෂය සඳහා අයකිරීම | බැහැර කිරීම | 2023.12.31 දිනට ශේෂය | 2023.12.31 දිනට ශේෂය | 2022.12.31 දිනට ශේෂය |
| | රු.000 | රු.000 | රු.000 | රු.000 | රු.000 | රු.000 | රු.000 | රු.000 | රු.000 | රු.000 |
| **පිරිවැයට** | | | | | | | | | | |
| පරිගණක මෘදුකාංග | 21,222 | 24,550 | - | 45,772 | 6,489 | 2,111 | - | 8,600 | 37,172 | 14,733 |
| වෙනත් අස්පෘශ්‍ය වත්කම් | 1,690 | - | - | 1,690 | 1,690 | - | - | 1,690 | - | - |
| | **22,912** | **24,550** | **-** | **47,462** | **8,179** | **2,111** | **-** | **10,290** | **37,172** | **14,733** |

### 9 B අස්පෘශ්‍ය වත්කම් (සංස්ථාව)

| වත්කම් කාණ්ඩය | පිරිවැය/තක්සේරු කිරීම | | | | ක්‍රමක්ෂය | | | | ශුද්ධ පොත් අගය | |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| | 2022.12.31 දිනට ශේෂය | වර්ෂය තුළ එකතු කිරීම් | වර්ෂය තුළ බැහැර කිරීම් | 2023.12.31 දිනට ශේෂය | 2022.12.31 දිනට ශේෂය | වර්ෂය සඳහා අයකිරීම | බැහැර කිරීම | 2023.12.31 දිනට ශේෂය | 2023.12.31 දිනට ශේෂය | 2022.12.31 දිනට ශේෂය |
| | රු.000 | රු.000 | රු.000 | රු.000 | රු.000 | රු.000 | රු.000 | රු.000 | රු.000 | රු.000 |
| **පිරිවැයට** | | | | | | | | | | |
| පරිගණක මෘදුකාංග | 18,905 | 24,550 | - | 43,455 | 4,247 | 2,036 | - | 6,283 | 37,172 | 14,658 |
| වෙනත් අස්පෘශ්‍ය වත්කම් | 1,690 | - | - | 1,690 | 1,690 | - | - | 1,690 | - | - |
| | **20,595** | **24,550** | **-** | **45,145** | **5,937** | **2,036** | **-** | **7,973** | **37,172** | **14,658** |

### 10 A ආයෝජන දේපල (සමූහය)

| වත්කම් කාණ්ඩය | පිරිවැය/තක්සේරු කිරීම | | | | ක්‍රමක්ෂය | | | | ශුද්ධ පොත් අගය | |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| | 2022.12.31 දිනට ශේෂය | වර්ෂය තුළ එකතු කිරීම් | වර්ෂය තුළ බැහැර කිරීම් | 2023.12.31 දිනට ශේෂය | 2022.12.31 දිනට ශේෂය | වර්ෂය සඳහා අයකිරීම | බැහැර කිරීම | 2023.12.31 දිනට ශේෂය | 2023.12.31 දිනට ශේෂය | 2022.12.31 දිනට ශේෂය |
| | රු.000 | රු.000 | රු.000 | රු.000 | රු.000 | රු.000 | රු.000 | රු.000 | රු.000 | රු.000 |
| **පිරිවැයට** | | | | | | | | | | |
| පරිගණක මෘදුකාංග | 2,615,145 | 10,954 | (273,028) | 2,353,071 | - | - | - | - | 2,353,071 | 2,615,145 |
| වෙනත් අස්පෘශ්‍ය වත්කම් | 335,705 | 77,464 | - | 413,169 | 24,852 | 15,457 | - | 40,309 | 372,860 | 310,853 |
| | **2,950,850** | **88,418** | **(273,028)** | **2,766,240** | **24,852** | **15,457** | **-** | **40,309** | **2,725,931** | **2,925,998** |

### 10 B ආයෝජන දේපල (සංස්ථාව)

| වත්කම් කාණ්ඩය | පිරිවැය/තක්සේරු කිරීම | | | | ක්‍රමක්ෂය | | | | ශුද්ධ පොත් අගය | |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| | 2022.12.31 දිනට ශේෂය | වර්ෂය තුළ එකතු කිරීම් | වර්ෂය තුළ බැහැර කිරීම් | 2023.12.31 දිනට ශේෂය | 2022.12.31 දිනට ශේෂය | වර්ෂය සඳහා අයකිරීම | බැහැර කිරීම | 2023.12.31 දිනට ශේෂය | 2023.12.31 දිනට ශේෂය | 2022.12.31 දිනට ශේෂය |
| | රු.000 | රු.000 | රු.000 | රු.000 | රු.000 | රු.000 | රු.000 | රු.000 | රු.000 | රු.000 |
| **පිරිවැයට** | | | | | | | | | | |
| පරිගණක මෘදුකාංග | 2,615,145 | 10,954 | (273,028) | 2,353,071 | - | - | - | | 2,353,071 | 2,615,145 |
| වෙනත් අස්පෘශ්‍ය වත්කම් | 335,705 | 77,464 | - | 413,169 | 24,852 | 15,457 | - | 40,309 | 372,860 | 310,853 |
| | **2,950,850** | **88,418** | **(273,028)** | **2,766,240** | **24,852** | **15,457** | **-** | **40,309** | **2,725,931** | **2,925,998** |

**10.1** ආයෝජන දේපල සඳහා සංස්ථාව ගිණුම්කරණ පිරිවැය ආකෘතිය යොදා ගනු ලැබේ.

## මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන් (ඉදිරියට.,)

**10.2** 2023.12.31 දිනට සංස්ථාව සතුව පවතින ආයෝජන දේපලවල විස්තර පහත පරිදි වේ..

| දේපල | ප්‍රමාණය | | | 2023 පවතින වටිනාකම රු. 000<br>රු. 000 | 2023 ඇස්තමේන්තුගත සාධාරණ වටිනාකම රු. 000<br>රු. 000 | 2022 පවතින වටිනාකම රු. 000<br>රු. 000 | 2022 ඇස්තමේන්තුගත සාධාරණ වටිනාකම රු. 000<br>රු. 000 |
|---|---|---|---|---|---|---|---|
| මුතුරාජවෙල පිහිටි ඉඩම | 54A | 1R | 24.7P | 1,496,346 | 4,104,000 | 1,758,419 | 4,104,000 |
| ලේක් ඩ්‍රයිව් ඉඩම | 1A | 0R | 12P | 3,081 | 14,068 | 3,081 | 14,068 |
| වෙදමුල්ල පිහිටි ඉඩම | 9A | 3R | 38P | 208,438 | 1,118,494 | 208,439 | 1,118,494 |
| අම්බලන්ගොඩ පිහිටි ඉඩම | 14A | 3R | 45.04P | 38,556 | 1,115,300 | 38,556 | 1,115,300 |
| කිරිමණ්ඩල මාවත ඉඩම | 17A | 3R | 18.13P | 169,771 | 5,626,099 | 169,771 | 5,626,099 |
| අත්තිඩිය පිහිටි ඉඩම | 2A | 1R | 20.43P | 2,695 | 9,978 | 2,695 | 9,978 |
| නාරාහේන්පිට ආදර්ශ ගොවිපොළ ඉඩම | 1A | 1R | 14.5P | 5,326 | 17,544 | 5,326 | 17,544 |
| මුදුන් ඇළ ඉඩම | 139A | 1R | 17.49P | 138,520 | 539,060 | 138,520 | 539,060 |
| කෝට්ටේ 9 වැනි මාවත ඉඩම | 2A | 3R | 19.69P | 80,839 | 27,199 | 80,839 | 27,199 |
| රාගම පිහිටි ඉඩම | 51A | 1R | 33P | 209,499 | ** | 209,499 | ** |
| සින්නක්කර ඉඩම්වල ඇති ගොඩනැගිලි | - | - | - | 372,860 | - | 310,853 | - |
| **එකතුව** | | | | **2,725,931** | | **2,925,998** | |

ඉහත ඇස්තමේන්තුගත සාධාරණ වටිනාකම් ප්‍රධාන තක්සේරුකරු විසින් ප්‍රදේශයේ ඉඩම් පිළිබඳව සිදු කර ඇති තක්සේරු කිරීමට අනුව තීරණය කර ඇත.
** රාගම ඉඩම සහ ලේක් ඩ්‍රයිව් සහ සින්නක්කර ඉඩම්වල ඇති ගොඩනැගිලි සඳහා තක්සේරු කිරීම් නොමැත.

| | | සමූහය | | සංස්ථාව | |
|---|---|---|---|---|---|
| | | 2023<br>රු. 000 | 2022<br>රු.000 | 2023<br>රු. 000 | 2022<br>රු.000 |
| 11 | **අනුබද්ධිත සමාගම්වල ආයෝජන** | | | | |
| | ඉඩම් ගොඩකිරීම් හා සංවර්ධනය කිරීමේ සමාගම | - | - | 2,000 | 2,000 |
| | | - | - | 2,000 | 2,000 |

**11.1** සීමාසහිත ඉඩම් ගොඩකිරීමේ හා සංවර්ධන සමාගමේ නිකුත් කළ කොටස් ප්‍රාග්ධනයෙන් 80% ක් ශ්‍රී ලංකා ඉඩම් සංවර්ධනය කිරීමේ සංස්ථාවට සතු වේ

| | | සමූහය | | සංස්ථාව | |
|---|---|---|---|---|---|
| | | 2023<br>රු. 000 | 2022<br>රු. 000 | 2023<br>රු. 000 | 2022<br>රු.000 |
| 12 | **තොගය** | | | | |
| | පොදු තොගය | 606,579 | 528,524 | 573,206 | 486,426 |
| | මුහුදු වැලි තොගය | 89,967 | 153,933 | 89,967 | 153,933 |
| | විකිණීම සඳහා ඇති ඉඩම් | 12,401 | 12,401 | 12,401 | 12,401 |
| | ඉන්වෙන්ටරි සහ මෙවලම් | 172,829 | 149,419 | 172,829 | 149,412 |
| | කෙරෙමින් පවතින වැඩ -භාණ්ඩාගාර ව්‍යාපෘති | 299,497 | 557,224 | 299,497 | 557,224 |
| | කෙරෙමින් පවතින වැඩ -ස්වයං ව්‍යාපෘති | 687,279 | 930,546 | 687,279 | 930,546 |
| | කෙරෙමින් පවතින වැඩ -සේවාදායක ව්‍යාපෘති | 397,918 | 546,645 | 338,020 | 492,869 |
| | | **2,266,470** | **2,878,692** | **2,173,199** | **2,782,811** |
| | සෙමින් සංසරණය වන තොග සඳහා වෙන් කිරීම් | (76,036) | (65,215) | (76,036) | (65,215) |
| | | **2,190,434** | **2,813,477** | **2,097,163** | **2,717,596** |
| 13 | **වෙළඳ සහ වෙනත් ලැබිය යුතු දේ** | | | | |
| | වෙළඳ ණයගැතියන් | 2,564,574 | 3,067,999 | 1,150,770 | 1,922,115 |
| | භාණ්ඩාගාර අරමුදල් ව්‍යාපෘති සඳහා භාණ්ඩාගාරයෙන් ලැබිය යුතු (13.1) | 1,755,451 | 1,996,572 | 1,755,451 | 1,996,572 |
| | කොන්ත්‍රාත්කරුවන්ට ගෙවූ සේවයේ යෙදවීමේ අත්තිකාරම් | 83,226 | 59,441 | 64,960 | 64,566 |
| | කාර්ය මණ්ඩල ණය සහ අත්තිකාරම් | 391,628 | 378,135 | 391,628 | 378,135 |
| | ලැබිය යුතු පොලිය | 562,941 | 702,901 | 574,685 | 713,245 |
| | සුදු නෙළුම්පුර නිවාස සංකීර්ණයෙන් ලැබිය යුතු වාරික | 34,766 | 32,615 | 34,766 | 32,615 |
| | වෙනත් ණය ගැතියන් | 179,146 | 143,808 | 117,931 | 79,779 |
| | තැන්පතු, පෙර ගෙවීම් සහ අත්තිකාරම් | 154,449 | 161,602 | 90,109 | 129,354 |
| | | **5,726,181** | **6,543,073** | **4,180,300** | **5,316,381** |
| | බොල් සහ අවිනිශ්චිත ණය සඳහා වෙන්කිරීම් | (485,827) | (481,814) | (467,984) | (462,177) |
| | | **5,240,354** | **6,061,259** | **3,712,316** | **4,854,204** |

## මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන් (ඉදිරියට.,)

13.1 භාණ්ඩාගාර අරමුදල් ලැබූ ව්‍යාපෘති සඳහා මහා භාණ්ඩාගාරයෙන් ලැබිය යුතු මුදලට වේරැස් ගඟ වැසි ජල අපවහන හා පරිසරය වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා NSB වෙතින් ලබාගත් ණය ගෙවීම සඳහා ලැබිය යුතු රු. 1,334,295,318/-(2022:රු.1,601,154,382) ක මුදල ඇතුලත් වේ. (වැඩිදුර විස්තර සඳහා සටහන 18B බලන්න)

| | | සමූහය | | සංස්ථාව | |
|---|---|---|---|---|---|
| | | 2023 | 2022 | 2023 | 2022 |
| | | රු. 000 | රු.000 | රු. 000 | රු.000 |
| 14 | **සම්බන්ධිත පාර්ශ්වයන්ට ණය** | | | | |
| | **ජංගම** | | | | |
| | REDECO සඳහා ලබා දුන් කාරක ප්‍රාග්ධන ණය (14.1) | - | - | 24,000 | 24,000 |
| | REDECO සඳහා කෙටි කාලීන ණය (14.2) | - | - | 14,567 | - |
| | | **-** | **-** | **37,567** | **24,000** |
| | **ජංගම නොවන** | | | | |
| | REDECO සඳහා කෙටි කාලීන ණය (14.2) | - | - | 126,666 | 141,233 |
| | | **-** | **-** | **126,666** | **141,233** |
| | | **-** | **-** | **165,233** | **165,233** |

14.1 සංස්ථාව විසින් 2017 වර්ෂයේදී ඉඩම් ගොඩකිරීමේ හා සංවර්ධනය කිරීමේ සමාගමට (REDECO) 13% ක වාර්ෂික පොලී අනුපාතයක් යටතේ රු.මිලියන 25 ක කාරක ප්‍රාග්ධන ණයක් ලබා දී ඇත. පසුව පොලී අනුපාතය 2018.01.01 දින සිට බලපැවැත්වෙන පරිදි 11.5% දක්වා අඩු කරන ලදී. 2017.04.21 දින සිට ආරම්භ කර මසකට රු.500,000/- ක සමාන වාරික 50 කින් ණය ආපසු ගෙවිය යුතුය.

14.2 සංස්ථාව විසින් 2019 වර්ෂයේදී මුහුදු වැලි සේදීම, හැලීම, ඇසුරුම් කිරීම සහ විකිණීමේ ව්‍යාපාරයේ ආයෝජනය කිරීම සඳහා ඉඩම් ගොඩකිරීමේ හා සංවර්ධන කිරීමේ සමාගමට (REDECO) 12% ක වාර්ෂික පොලී අනුපාතයක් යටතේ රු. මිලියන 200 ක් කෙටි කාලීන ණය පහසුකමක් ලබා දී ඇත. 2021 මැයි මාසයෙන් ආරම්භ කර මසකට රු.1,666,666.67 බැගින් වූ සමාන වාරික 120 කින් ණය මුදල ආපසු ගෙවිය යුතුය. කෙසේ වෙතත්, මෙම ව්‍යාපෘතිය සාර්ථක නොවූ බැවින්, REDECO හි ඉල්ලීම මත, 2021.01.01 දින සිට ක්‍රියාත්මක වන පරිදි වසර 5ක කාලයක් සඳහා මෙම ණය සඳහා පොලී අය කිරීම කල් දැමීමට සංස්ථාවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් තීරණය කරන ලදී.

| | | සමූහය | | සංස්ථාව | |
|---|---|---|---|---|---|
| | | 2023 | 2022 | 2023 | 2022 |
| | | රු. 000 | රු.000 | රු. 000 | රු.000 |
| 15 | **ක්‍රමක්ෂිත පිරිවැයට සිදු කළ ආයෝජන** | | | | |
| | **ජංගම** | | | | |
| | ස්ථාවර තැන්පතු මත ආයෝජන | 5,819,566 | 7,011,627 | 5,642,563 | 6,810,000 |
| | | 5,819,566 | 7,011,627 | 5,642,563 | 6,810,000 |
| | **ජංගම නොවන** | | | | |
| | භාණ්ඩාගාර බැඳුම්කරවල ආයෝජන | 445,208 | - | 445,208 | - |
| | | 445,208 | - | 445,208 | - |
| | | **6,264,774** | **7,011,627** | **6,087,771** | **6,810,000** |
| 16 | **මුදල් සහ මුදල් හා සමාන දේ** | | | | |
| | බැංකුවේ ඇති මුදල් | 1,484,068 | 1,051,257 | 1,214,416 | 969,709 |
| | අතේ ඇති මුදල් | 18,183 | 13,121 | 13,932 | 9,668 |
| | භාණ්ඩාගාර බිල්පත් ප්‍රති මිලදී ගැනුම් ආයෝජන | 465,000 | - | 465,000 | - |
| | සංසරණයේ පවතින මුදල් | - | 793 | - | - |
| | | 1,967,251 | 1,065,171 | 1,693,348 | 979,377 |
| | බැංකු අයිරා | (19,620) | (14,607) | - | - |
| | මූල්‍ය ප්‍රවාහ ප්‍රකාශනය සඳහා මුදල් සහ මුදල් හා සමාන දෑ | **1,947,631** | **1,050,564** | **1,693,348** | **979,377** |

17 **විලම්බිත ආදායම**

| | | 2022.12.31 දිනට රු.000 | නව ප්‍රදාන රු.000 | ක්‍රමක්ෂය රු.000 | 2023.12.31 දිනට රු.000 |
|---|---|---|---|---|---|
| 17A | **සමූහය** | | | | |
| | දේපල,පිරියත හා උපකරණ ගිණුම මත GCFC&EI ව්‍යාපෘතියෙන් නොමිලේ ලැබුණු | 28,367 | | (18,168) | 10,199 |
| | දේපල,පිරියත හා උපකරණ ගිණුම මත LEI&EI ව්‍යාපෘතියෙන් නොමිලේ ලැබුණු | 10,081 | 57 | (8,151) | 1,987 |
| | දේපල,පිරියත හා උපකරණ ගිණුම මත MCUD ව්‍යාපෘතියෙන් නොමිලේ ලැබුණු | 215,707 | 88,664 | (68,570) | 235,801 |
| | දේපල,පිරියත හා උපකරණ ගිණුම මත භාණ්ඩාගාර අරමුදල් ලැබූ ව්‍යාපෘතියෙන් ලැබුණු | 23,865 | 56 | (342) | 23,579 |
| | දේපල,පිරියත හා උපකරණ ගිණුම මත ජනාධිපති කාර්යාලයෙන් නොමිලේ ලැබුණු | 3,831 | - | (1,298) | 2,533 |
| | දේපල,පිරියත හා උපකරණ ගිණුම මත වෙනත් ආයතනවලින් නොමිලේ ලැබුණු | 34,520 | 6,571 | (3,788) | 37,303 |
| | කෙරවලපිටිය අපද්‍රව්‍ය කළමනාකරණ අංගනයේ වැඩිදියුණු කිරීම් සඳහා ජනාධිපති ලේකම් කාර්යාලයෙන් ලැබුණු ප්‍රදානය | 112,930 | - | (6,655) | 106,275 |
| | | **429,301** | **95,348** | **(106,972)** | **417,677** |

## මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන් (ඉදිරියට.,)

| 17B | සංස්ථාව | 2022.12.31 දිනට රු.000 | නව ප්‍රදාන රු.000 | ක්‍රමක්ෂය රු.000 | 2023.12.31 දිනට රු.000 |
|---|---|---|---|---|---|
| | දේපල,පිරියත හා උපකරණ ගිණුම මත GCFC&EI ව්‍යාපෘතියෙන් නොමිලේ ලැබුණු | 28,367 | - | (18,168) | 10,199 |
| | දේපල,පිරියත හා උපකරණ ගිණුම මත LEI&EI ව්‍යාපෘතියෙන් නොමිලේ ලැබුණු | 10,081 | 57 | (8,151) | 1,987 |
| | දේපල,පිරියත හා උපකරණ ගිණුම මත MCUD ව්‍යාපෘතියෙන් නොමිලේ ලැබුණු | 215,707 | 88,664 | (68,570) | 235,801 |
| | දේපල,පිරියත හා උපකරණ ගිණුම මත භාණ්ඩාගාර අරමුදල් ලැබූ ව්‍යාපෘතියෙන් ලැබුණු | 23,865 | 56 | (342) | 23,579 |
| | දේපල,පිරියත හා උපකරණ ගිණුම මත ජනාධිපති කාර්යාලයෙන් නොමිලේ ලැබුණු | 3,831 | - | (1,298) | 2,533 |
| | දේපල,පිරියත හා උපකරණ ගිණුම මත වෙනත් ආයතනවලින් නොමිලේ ලැබුණු | 34,520 | 6,571 | (3,788) | 37,303 |
| | කෙරවලපිටිය අපද්‍රව්‍ය කළමනාකරණ අංගනයේ වැඩිදියුණු කිරීම් සඳහා ජනාධිපති ලේකම් කාර්යාලයෙන් ලැබුණු ප්‍රදානය | 112,930 | - | (6,655) | 106,275 |
| | | **429,301** | **95,348** | **(106,972)** | **417,677** |

17.1 රජය විසින් පවරා ඇති ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය දිගුකාලීන වත්කම් අත්පත් කර ගැනීම සඳහා රජයෙන් ලැබෙන ප්‍රදානයන් මඟින් විලම්භිත ආදායම නියෝජනය වේ. ශේෂ පත්‍ර දිනට මෙම ප්‍රදාන සඳහා සම්පූර්ණ නොකළ කොන්දේසි හෝ වෙනත් අවිනිශ්චිතතාවයන් නොමැත.

### 18 පොලියක් දරන ණය සහ ලබා ගැනීම්

| 18A | සමූහය | 2023 1 වන වර්ෂය තුළ ගෙවිය යුතු මුදල රු.000 | 2023 1 වන වර්ෂයෙන් පසු ගෙවිය යුතු රු.000 | 2023 එකතුව රු.000 | 2022 1 වන වර්ෂය තුළ ගෙවිය යුතු මුදල රු.000 | 2022 1 වන වර්ෂයෙන් පසු ගෙවිය යුතු රු.000 | 2022 එකතුව රු.000 |
|---|---|---|---|---|---|---|---|
| | බැංකු ණය (18A) | 267,082 | 1,067,436 | 1,334,518 | 268,199 | 1,334,519 | 1,602,718 |
| | | **267,082** | **1,067,436** | **1,334,518** | **268,199** | **1,334,519** | **1,602,718** |

| 18A | බැංකු ණය | 2022.12.31 දිනට රු.000 | ලබා ගත් ණය රු.000 | නැවත ගෙවීම් රු.000 | 2023.12.31 දිනට රු.000 |
|---|---|---|---|---|---|
| | NSB වෙතින් ලබා ගත් කෙටි කාලීන ණය | 1,601,154 | - | (266,859) | 1,334,295 |
| | BOC වෙතින් ලබා ගත් කෙටි කාලීන ණය (18.A.1) | 1,564 | - | (1,341) | 223 |
| | | **1,602,718** | **-** | **(268,200)** | **1,334,518** |

18A.1 සීමාසහිත ඉඩම් ගොඩකිරීමේ සහ සංවර්ධනය කිරීමේ සමාගම (REDECO) ඩබල් කැබ් රථ දෙකක් මිලදී ගැනීම සඳහා ලංකා බැංකුවෙන් 6,700,000/- ක කෙටි කාලීන ණය පහසුකමක් ලබා ගත්තේය. මෙම ණය පහසුකම සඳහා සමාගම සතු ස්ථාවර තැන්පතු සුරක්ෂණයක් ලෙස තබා ඇත. 2018.08.29 දින සිට ආරම්භ කර මසකට රු. 111,667/- බැගින් වූ සමාන වාරික 50 කින් ණය මුදල ආපසු ගෙවිය හැක. ණය සඳහා අදාළ පොලී අනුපාතය ස්ථාවර තැන්පතු සඳහා පොලියට වඩා 2% කින් වැඩි වේ.

| 18B | සංස්ථාව | 2023 1 වන වර්ෂය තුළ ගෙවිය යුතු මුදල රු.000 | 2023 1 වන වර්ෂයෙන් පසු ගෙවිය යුතු රු.000 | 2023 එකතුව රු.000 | 2022 1 වන වර්ෂය තුළ ගෙවිය යුතු මුදල රු.000 | 2022 1 වන වර්ෂයෙන් පසු ගෙවිය යුතු රු.000 | 2022 එකතුව රු.000 |
|---|---|---|---|---|---|---|---|
| | බැංකු ණය (18B.1) | 266,859 | 1,067,436 | 1,334,295 | 266,859 | 1,334,295 | 1,601,154 |
| | | **266,859** | **1,067,436** | **1,334,295** | **266,859** | **1,334,295** | **1,601,154** |

| 18B.1 | බැංකු ණය | 2022.12.31 දිනට රු.000 | ලබා ගත් ණය රු.000 | නැවත ගෙවීම් රු.000 | 2023.12.31 දිනට රු.000 |
|---|---|---|---|---|---|
| | NSB වෙතින් ලබා ගත් කෙටි කාලීන ණය (18 B.1.1) | **1,601,154** | - | (266,859) | **1,334,295** |
| | | **1,601,154** | **-** | **(266,859)** | **1,334,295** |

18B.1.1 වේරැස් ගඟ වැසි ජල අපවහන සහ පරිසර වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතියට අරමුදල් සැපයීම සඳහා සංස්ථාව ජාතික ඉතිරි කිරීමේ බැංකුවෙන් රු.මි.2,802ක කෙටි කාලීන ණය පහසුකමක් ලබා ගන්නා ලදී. ණය ගිවිසුමට අනුව, 2018.10.24 දින සිට රු.133,429,531.80 ක් බැගින් වූ ද්වි-වාර්ෂික වාරික 21කින් ණය මුදල ආපසු ගෙවිය යුතු වේ. මෙම ණය මුදල මහා භාණ්ඩාගාරය විසින් නිකුත් කරන ලද රු.මිලියන 3,500ක භාණ්ඩාගාර ඇපකරකින් සුරක්ෂිත කර ඇත. මෙම ණය මුදල සඳහා අදාල පොලිය මාස හයක AWPLR + 2.5% වේ.

## මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන් (ඉදිරියට.,)

### 19 විශ්‍රාම ප්‍රතිලාභ බැඳීම

| | සමූහය | | සංස්ථාව | |
|---|---|---|---|---|
| | 2023<br>රු. 000 | 2022<br>රු. 000 | 2023<br>රු. 000 | 2022<br>රු. 000 |
| වර්ෂය ආරම්භයේදී | 519,717 | 509,520 | 304,779 | 337,071 |
| වර්ෂය තුළ සිදු කළ වෙන් කිරීම් (19.1) | 147,060 | 74,573 | 108,195 | 17,564 |
| වර්ෂය තුළ සිදු කරන ලද ගෙවීම් | (53,682) | (64,376) | (26,629) | (49,856) |
| වර්ෂය අවසානයේදී | **613,095** | **519,717** | **386,345** | **304,779** |
| **19.1 වර්ෂය තුළ සිදු කළ වෙන් කිරීම්** | | | | |
| වර්තමාන සේවා පිරිවැය | 60,483 | 62,235 | 17,546 | 18,088 |
| පොලී පිරිවැය | 70,754 | 51,268 | 54,860 | 38,764 |
| | 131,237 | 113,503 | 72,406 | 56,852 |
| ශුද්ධ ආයුගණක (ලාභය)/ අලාභය | 15,823 | (38,930) | 35,789 | (39,288) |
| වර්ෂය තුළ සිදු කළ වෙන් කිරීම් | **147,060** | **74,573** | **108,195** | **17,564** |

**19.2 පාරිතෝෂික වෙන් කිරීමේ ආයුගණක තක්සේරු කිරීම් සඳහා යොදා ගත් උපකල්පන**

**i). මරණ අනුපාතිකය**

සේවය යෙදී සිටියදී: ලන්ඩන්හි ආයුගණක ආයතනය විසින් නිකුත් කර ලද A 1967/70 මරණ අනුපාත වගුව. මෙම වගුවෙහි දක්වා ඇති අගයන් මඟින් දී ඇති කවර හෝ වයසක එක් වර්ෂයකදී සිදු විය හැකි මරණවල සම්භාවිතාවන් නියෝජනය වේ.

**ii). කාර්ය මණ්ඩල පිරිවැටුම**

මෙම තක්සේරු කිරීමේදී යොදා ගන්නා කාර්ය මණ්ඩල පිරිවැටුම් අගයන් සංස්ථාවේ කාර්ය මණ්ඩල පිරිවැටුම් සංඛ්‍යාලේඛන මත පදනම් වේ..

**iii). අබලතාවය**

මෙම තක්සේරු කිරීමේදී යොදා ගන්නා අබලතා අනුපාත මරණ වගුවෙන් 10% කි.

**iv). විශ්‍රාම ගැන්වීමේ වයස**

සංස්ථාව විසින් දක්වා ඇති පරිදි වර්ෂ 60කි. සඳහන් කර ඇති විශ්‍රාම ගැන්වීමේ වයසට වඩා වයසින් වැඩි සේවකයන් ඔවුන්ගේ ඊළඟ උපන් දිනයන්හිදී විශ්‍රාම යනු ඇතැයි උපකල්පනය කර ඇත.

**v). වට්ටම් අනුපාතය**

වර්ෂයක් සඳහා 13.00%ක දීර්ඝ කාලීන වට්ටම් අනුපාතයක් ආයුගණකයින් විසින් භාවිතා කරනු ලැබේ..

**vi). වැටුප් වැඩි වීම්**

උපකල්පනය කරන ලද සාමාන්‍ය දිගු කාලීන වැටුප් වැඩිවීමේ අනුපාතය වර්ෂයකට 10.00%.

**19.3 ආයුගණක තක්සේරු සඳහා යොදා ගත් උපකල්පනවල සංවේදීතාවය**

සේවක ප්‍රතිලාභ බැරකම් ඇගයීමේදී ස්ථාවරව පවත්වා ගත් අනෙකුත් සියලු විචල්‍යයන් සමඟ ඒ සඳහා යොදා ගත් ප්‍රධාන උපකල්පනවල සිදු විය හැකි වෙනස්කම් සඳහා සංවේදීතාවය පහත වගුවෙහි දක්වා ඇත

| වට්ටම් අනුපාතයේ වැඩිවීම/ (අඩුවීම) | වැටුප් වැඩිවීමේ අනුපාතයේ වැඩිවීම/(අඩුවීම) | සේවක ප්‍රතිලාභ බැඳීම මත බලපෑම සංස්ථාව | |
|---|---|---|---|
| | | 2023<br>රු. 000 | 2022<br>රු. 000 |
| +1% | * | 358,347 | 285,608 |
| -1% | * | 418,385 | 326,391 |
| * | +1% | 418,647 | 327,185 |
| * | -1% | 357,697 | 284,674 |

**19.4** ශ්‍රී ලංකා ඉඩම් සංවර්ධනය කිරීමේ සංස්ථාවේ විශ්‍රාම ප්‍රතිලාභ බැඳීම, සී/ස ඇක්චුරියල් ඇන්ඩ් මැනේජ්මන්ට් කන්සල්ටන්ට්ස් (පෞද්.) සමාගම මඟින් සිදු කරන ලද ආයුගණක තක්සේරු මත පදනම් වේ. LKAS 19 මඟින් නිර්දේශ කර ඇති පරිදි විශ්‍රාම ප්‍රතිලාභ බැඳීමේ වර්තමාන වටිනාකම තීරණය කිරීම සඳහා ව්‍යාපෘති ඒකක බැර ක්‍රමවේදය සංස්ථාව විසින් යොදා ගෙන ඇත.

**19.5** සංස්ථාව, පාරිතෝෂික වගකීමට බාහිරව අරමුදල් සපයා නොමැත. කෙසේවෙතත්, අනාගත පාරිතෝෂික ගෙවීම් සපුරාලීම සඳහා ප්‍රමාණවත් ස්ථාවර තැන්පතු ආයෝජන පවත්වාගෙන යනු ලැබේ.

# මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන් (ඉදිරියට.,)

| | | සමූහය | | සංස්ථාව | |
|---|---|---|---|---|---|
| | | 2023 | 2022 | 2023 | 2022 |
| | | රු. 000 | රු. 000 | රු. 000 | රු. 000 |
| 20 | **වෙළඳ සහ වෙනත් ගෙවිය යුතු දේ** | | | | |
| | වෙළඳ ණය හිමියන් | 227,632 | 267,434 | 351,167 | 387,258 |
| | කොන්ත්‍රාත් ණය හිමියන් | 468,286 | 1,502,151 | 527,507 | 1,574,191 |
| | උපචිත වියදම් ඇතුළු විවිධ ණයහිමියන් | 1,357,449 | 1,784,747 | 131,312 | 860,869 |
| | ආපසු ගෙවිය යුතු තැන්පතු | 140,658 | 139,132 | 91,376 | 94,259 |
| | දීර්ඝ කාලීන ණය සඳහා ගෙවිය යුතු පොලිය | 52,575 | 71,068 | 52,575 | 71,068 |
| | කාර්ය මණ්ඩල ණය හිමියන් | 15,190 | 33,858 | 15,190 | 33,858 |
| | ගෙවිය යුතු ව්‍යවස්ථාපිත බැරකම් | 174,416 | 221,189 | 163,957 | 209,076 |
| | | **2,436,206** | **4,019,579** | **1,333,084** | **3,230,579** |
| 21 | **ලැබුණු අත්තිකාරම්** | | | | |
| | කල්බදු ඉඩම් සඳහා ලැබුණු අත්තිකාරම් | 3,121,917 | 3,021,493 | 3,121,917 | 3,021,493 |
| | ඉඩම් විකිණීමේ අත්තිකාරම් | 4,178 | 314,183 | 4,178 | 314,183 |
| | මුහුදු වැලි විකිණීම සඳහා ලැබුණු අත්තිකාරම් | 93,224 | 164,479 | 93,224 | 164,479 |
| | ලැබුණු සේවයේ යෙදවීමේ අත්තිකාරම් | 188,963 | 103,640 | 134,280 | 59,316 |
| | ලැබුණු වෙනත් අත්තිකාරම් | 95,399 | 76,813 | 90,122 | 76,813 |
| | | **3,503,681** | **3,680,608** | **3,443,721** | **3,636,284** |

## 21. ඇපයට තබා ඇති වත්කම්

රු. මිලියන 500 දක්වා බැංකු ඇපකර ලබා ගැනීමට සංස්ථාවට ලංකා බැංකුව සමඟ වැඩපිළිවෙළක් ඇත. රු. මිලියන 500 ක් වන සංස්ථාව සතු ස්ථාවර තැන්පතු ප්‍රමාණය මෙම පහසුකමට එරෙහිව සුරක්ෂණයක් ලෙස ඇපයට තබා ඇත.

## 22 . සම්බන්ධිත පාර්ශ්වයන් අනාවරණය කිරීම

### 22.1 මව් සහ පරම මව් පාලන පක්ෂය

සංස්ථාවට තමන්ගේම කියා හඳුනාගත හැකි මව් සමාගමක් නොමැත

### 22.2 අනුබද්ධිත සමාගම් සමඟ ගනුදෙනු

සංස්ථාව සහ සමූහය තුළ ඇති සමාගම් අදාළ වාණිජ නියමයන් සහ කොන්දේසි යටතේ වෙළෙඳ ගනුදෙනුවල නිරත වේ

**22.2.1** ඉඩම් ගොඩකිරීමේ හා සංවර්ධනය කිරීමේ සමාගම (REDECO) සංස්ථාවේ අනුබද්ධ සමාගමකි. සංස්ථාවේ සභාපති රියර් අද්මිරාල් හිරාන් ශෂීන්ද්‍ර බාලසූරිය මහතා සහ සංස්ථාවේ සාමාන්‍යාධිකාරිනී එම්.ඒ.එස්.එම්.කේ.සේනාධීර මහත්මිය REDECO හි ද අධ්‍යක්ෂවරුන් වේ.

2023 වර්ෂය තුළදී REDECO සමඟ සංස්ථාවට පහත සඳහන් ගනුදෙනු තිබුණි.

අ) රු. 27,008,828/-ක (2022 - රු. 17,951,139/-) වටිනාකමකට සිමෙන්ති කුට්ටි සහ කොන්ක්‍රීට් නිෂ්පාදන මිලදී ගැනීම.
ආ) රු. 16,958,120 /-ක (2022 - රු. 127,135,849 /-) ඉදිකිරීම් ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම.
ඇ) රු. 54,335,224/-ක මුහුදු වැලි සේදීමේ සහ හැලීමේ සේවාවන් ලබා ගැනීම (2022: රු. 32,416,586/-)
ඈ) කිරිමණ්ඩල මාවතේ කාර්යාල ගොඩනැගිල්ල සහ ඉඩම් කට්ටි දෙකක් කුලියට දීම. 2023 වර්ෂය සඳහා ලැබුණු බදු කුලිය රු. 615,385/- (2022 - රු. 606,410/-)
ඉ) ලබා දී ඇති ණය සඳහා පොලිය රු. 2,760,000/- (2022: රු. 2,760,000/-)
ඊ) සංස්ථාව විසින් REDECO හි සේවකයින් සේවයේ යොදා ගන්නා අතර ඒ සඳහා සංස්ථාව විසින් වර්ෂය තුළ REDECO වෙත පහත සඳහන් මුදල් ප්‍රතිපූරණය කර ඇත.
- වැටුප් පිරිවැය රු. 118,599,199 /- (2022: රු. 93,378,239/-)
- පරිපාලන ගාස්තු රු. 8,415,672/- (2022: රු. 7,052,721/-)

**22.2.2** LRDC සර්විසස් (පෞද්) සමාගම සංස්ථාවේ අනුබද්ධ සමාගමකි. සංස්ථාවේ සභාපති රියර් අද්මිරාල් හිරාන් ශෂීන්ද්‍ර බාලසූරිය මහතා සහ සංස්ථාවේ සාමාන්‍යාධිකාරිනී එම්.ඒ.එස්.එම්.කේ.සේනාධීර මහත්මිය REDECO හි ද අධ්‍යක්ෂවරුන් වේ.

2023 වර්ෂය තුළදී LRDC සර්විසස් (පෞද්.) සමාගම සමඟ සංස්ථාවට පහත සඳහන් ගනුදෙනු තිබුණි.

a) රු. 81,818,702 /- ක් වටිනාකමක් සඳහා ආරක්ෂක සේවා ලබා ගන්නා ලදී. (2022: රු. 73,330,305/-)
b) රු. 439,445,172/-ක මිනිස්බල සේවාවන් ලබා ගන්නා ලදී. (2022: රු. 430,179,731/- )
c) සංස්ථාවට අයත් දේපල භාවිතා කිරීම වෙනුවෙන් ලැබුණු කුලිය රු. 3,538,462/- (2022: රු. 13,320,213/-)

# මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන් (ඉදිරියට.,)

**22.3 ප්‍රධාන කළමනාකරණ නිලධාරීන් සමඟ ගනුදෙනු**

සංස්ථාවේ ප්‍රධාන කළමනාකරුවන් වන්නේ එහි අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයින්, සාමාන්‍යාධිකාරිවරයා සහ අතිරේක සාමාන්‍යාධිකාරිවරුන් දෙදෙනා වේ. ප්‍රධාන කළමනාකරණ නිලධාරීන් සමඟ ගනුදෙනු පහත දැක්වෙන පරිදි වේ.

| | සංස්ථාව | |
|---|---|---|
| | 2023 | 2022 |
| | රු. 000 | රු. 000 |
| ගෙවන ලද කෙටි කාලීන සේවක ප්‍රතිලාභ | 11,704 | 11,169 |
| ගෙවූ රැස්වීම් දින ගාස්තු | 942 | 808 |

**22.4 අනුබද්ධිත සමාගම්වලින් ලැබිය යුතු**

අනුබද්ධිත ආයතනවලින් ලැබිය යුතු මුදල්, මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ අදාළ වත්කම් කාණ්ඩවලට ඇතුළත් කර ඇත. ශේෂ පත්‍ර දිනට අනුබද්ධිත ආයතනවලින් ලැබිය යුතු මුදල් පහත පරිදි වේ;

| | | සංස්ථාව | |
|---|---|---|---|
| | | 2023 | 2022 |
| | | රු. 000 | රු. 000 |
| ඉඩම් ගොඩකිරීමේ හා සහ සංවර්ධනය කිරීමේ සමාගම (REDECO) | - ලැබිය යුතු ණය | 165,233 | 165,233 |
| | - ලැබිය යුතු වෙනත් | 59,589 | 73,635 |
| LRDC සර්විසස් (පෞද්) සමාගම | | 16,550 | 14,010 |
| | | **241,372** | **252,878** |

REDECO වෙත ලබා දී ඇති ණය සඳහා මූලික නියමයන් සහ කොන්දේසි මෙම මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන 14 යටතේ අනාවරණය කර ඇත.

**22.5 අනුබද්ධිත සමාගම් වෙත හිඟ**

අනුබද්ධිත ආයතනවලට ගෙවිය යුතු මුදල්, මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ අදාළ වත්කම් කාණ්ඩවලට ඇතුළත් කර ඇත. ශේෂ පත්‍ර දිනට අනුබද්ධිත ආයතනවලට ගෙවිය යුතු මුදල් පහත පරිදි වේ;

| | සංස්ථාව | |
|---|---|---|
| | 2023 | 2022 |
| | රු. 000 | රු. 000 |
| ඉඩම් ගොඩකිරීමේ හා සහ සංවර්ධනය කිරීමේ සමාගම (REDECO) | 100,241 | 96,949 |
| LRDC සර්විසස් (පෞද්) සමාගම | 143,719 | 134,772 |
| | **243,960** | **231,721** |

## 23. පශ්චාත් ශේෂ පත්‍ර සිදුවීම්

ශේෂ පත්‍ර දිනයෙන් පසු මූල්‍ය ප්‍රකාශනවල ගැලපීම් හෝ හෙළිදරව් කිරීම අවශ්‍ය වන සිදුවීම් කිසිවක් සිදුවී නොමැත.

## 24. බැඳීම් සහ අවිනිශ්චිතතා

### 24.1 අවිනිශ්චිතතා බැරකම්

අලාභහානි සහ වන්දි සඳහා ඉල්ලීම් කරමින් 2023.12.31 වැනි දින වනවිට සංස්ථාවට එරෙහිව ගොනු කරන ලද නඩු එකොළහක් (11) තිබුණි. විස්තර පහත පරිදි වේ.

a) නියමිත දිනට ගෙවීම් නිරවුල් නොකිරීම හේතුවෙන් කොන්ත්‍රාත්කරුවෙකු විසින් රුපියල් 155,030,868/- ක පොලී, අමතර වියදම් සහ අලාභ ඉල්ලා සංස්ථාවට එරෙහිව බේරුම්කරණ ක්‍රියාදාමයකට එළඹ ඇත.

b) රු. 1,409,425/-ක පෙර වේතන ඉල්ලමින් සංස්ථාවේ හිටපු සාමාන්‍යාධිකාරිවරයෙකු විසින් ගොනු කරන ලද නඩුව.

c) වන්දි ඉල්ලමින් සංස්ථාවට එරෙහිව ගොනු කරන ලද තවත් නඩු නවයක් (09) විභාගයට ගැනීමට නියමිතව පවතී. හිමිකම් ඉල්ලා සිටින මුළු මුදල රු. 1,310,600,000/- කි.

ඉහත සඳහන් කළ මුදල් ප්‍රමාණයන් පැමිණිලිකරුවන් විසින් ඉල්ලා සිටින ලද මුදල් ප්‍රමාණයන් වන අතර සත්‍ය හිමිකමක් තිබේ නම්, එම මුදල අධිකරණය හෝ අදාළ විනිශ්චය සභාව විසින් තීරණය කරනු ඇත.

### 24.2 බැඳීම්

| | සමූහය | | සංස්ථාව | |
|---|---|---|---|---|
| | 2023 | 2022 | 2023 | 2022 |
| | රු. 000 | රු. 000 | රු. 000 | රු. 000 |
| අනුමත කර ඇතත් කොන්ත්‍රාත් ලබා දී | - | - | - | - |
| කොන්ත්‍රාත් ලබා දී ඇතත් වෙන් කර නොමැති | - | - | - | - |
| | - | - | - | - |

## 25. සංසන්දනාත්මක තොරතුරු

සමාලෝචිත වර්ෂයේ ඉදිරිපත් කිරීම සමග සැසඳීම සහතික කිරීම සඳහා පෙර වර්ෂය තුළ (2022) වාර්තා කර ඇති පහත සඳහන් අයිතමයන් ඉදිරිපත් කිරීම හා වර්ගීකරණය කිරීම සංශෝධනය කරනු ලැබේ.

a) අ) විස්තීරණ ආදායම් ප්‍රකාශයේ ආදායම් බදු වියදම් යටතේ කලින් වර්ගීකරණය කරන ලද ඒකාබද්ධ අරමුදලට දායක වීම සමකොටස් වෙනස්වීම් ප්‍රකාශයේ ලාභයෙන් බෙදා හැරීම ලෙස නැවත වර්ගීකරණය කරන ලදී.

# එකතු කළ අගය පිළිබඳ ප්‍රකාශනය

| | සමූහය | | සංස්ථාව | |
|---|---|---|---|---|
| | 2023 | 2022 | 2023 | 2022 |
| | රු. 000 | රු. 000 | රු. 000 | රු. 000 |
| **උත්පාදිත අගය** | | | | |
| ගනුදෙනුකරුවන් සමඟ කොන්ත්‍රාත්වලින් ලත් ආදායම | 8,638,830 | 6,725,264 | 5,431,081 | 4,289,956 |
| වෙනත් මෙහෙයුම් ආදායම | 202,965 | 282,184 | 181,315 | 276,259 |
| අඩු කළා: ද්‍රව්‍ය සහ සේවා පිරිවැය (ක්ෂයවීම් සහ සේවකයින් සඳහා වේතන හැර) | (5,651,549) | (4,231,702) | (2,763,651) | (2,064,689) |
| **මෙහෙයුම්වලින් අගය එකතු කිරීම** | **3,190,246** | **2,775,746** | **2,848,745** | **2,501,526** |
| මූල්‍ය ආදායම | 1,647,989 | 1,199,636 | 1,620,671 | 1,182,978 |
| **එකතු කළ මුළු අගය** | **4,838,235** | **3,975,382** | **4,469,416** | **3,684,504** |

| **එකතු කළ අගය බෙදාහැරීම** | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|
| වැටුප් ලෙස සේවකයන්ට | 55% | 2,652,350 | 62% | 2,464,184 | 55% | 2,478,038 | 62% | 2,296,690 |
| බදු ලෙස ශ්‍රී ලංකා රජයට | 8% | 356,352 | 13% | 502,357 | 7% | 307,937 | 13% | 479,077 |
| ප්‍රාග්ධනය ලබා දෙන්නන්ට | 8% | 396,562 | 6% | 220,266 | 9% | 389,610 | 6% | 213,107 |
| ඒකාබද්ධ අරමුදලට දායකත්වය | 10% | 500,000 | 1% | 25,000 | 11% | 500,000 | 1% | 25,000 |
| වැඩි දියුණු කිරීම සහ වර්ධනය සඳහා ව්‍යාපාරය තුළ රඳවාගත් අගය (ක්ෂය ඇතුළුව) | 19% | 932,971 | 19% | 763,575 | 18% | 793,831 | 18% | 670,630 |
| | **100%** | **4,838,235** | **100%** | **3,975,382** | **100%** | **4,469,416** | **100%** | **3,684,504** |






# සංස්ථාවේ මූල්‍යමය විශේෂතා

| | 2023 | 2022 | 2021 | 2020 | 2019 | 2018 | 2017 | 2016 | 2015 | 2014 |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| | රු.මි. | රු.මි. | රු.මි. | රු.මි. | රු.මි. | රු.මි. | රු.මි. | රු.මි. | රු.මි. | රු.මි. |
| **ලාභය සහ අලාභය** | | | | | | | | | | |
| භාණ්ඩාගාර අරමුදල් සැපයූ ව්‍යාපෘති ආදායම | 2,522 | 748 | 2,352 | 2,379 | 2,786 | 2,367 | 2,969 | 5,629 | 1,306 | 1,620 |
| වෙනත් ව්‍යාපෘති සහ ප්‍රභවවලින් ලත් ආදායම | 2,909 | 3,542 | 4,441 | 4,926 | 4,555 | 5,183 | 4,780 | 2,420 | 1,572 | 2,545 |
| අන්තර්ඛණ්ඩ ආදායම | - | - | - | - | (766) | (453) | (406) | (239) | (362) | (459) |
| **මුළු ආදායම** | **5,431** | **4,290** | **6,793** | **7,305** | **6,575** | **7,097** | **7,343** | **7,810** | **2,516** | **3,706** |
| සෘජු පිරිවැය | (3,237) | (2,397) | (4,131) | (3,141) | (4,682) | (4,499) | (4,966) | (5,602) | (2,224) | (3,247) |
| **දළ ලාභය** | **2,194** | **1,893** | **2,661** | **4,164** | **1,893** | **2,598** | **2,377** | **2,208** | **292** | **459** |
| වෙනත් මෙහෙයුම් ආදායම | 181 | 276 | 94 | 76 | 100 | 96 | 190 | 50 | 61 | 48 |
| පොදු කාර්ය පිරිවැය | (2,505) | (1,827) | (1,632) | (1,661) | (1,260) | (1,369) | (1,224) | (926) | (1,010) | (676) |
| **මෙහෙයුම් ලාභය/(අලාභය)** | (130) | 342 | 935 | 2,426 | 733 | 1,325 | 1,338 | 1,333 | (657) | (169) |
| බේරුම්කරණයෙන් පැන නගින හිමිකම්පෑම් | 4 | (753) | - | - | - | - | - | - | - | - |
| ශුද්ධ මූල්‍ය ආදායම | 1,349 | 1,172 | 328 | 75 | 91 | 296 | 162 | 144 | 503 | 600 |
| **බදු සහ අයකිරීම් පෙර ලාභය** | **1,223** | **761** | **1,263** | **2,501** | **824** | **1,621** | **1,500** | **1,476** | **(154)** | **431** |
| බදුකරණය | (260) | (453) | (240) | 4 | 54 | (472) | (359) | (283) | (3) | (85) |
| **වර්ෂය සඳහා ලාභය/(අලාභය)** | **963** | **308** | **1,023** | **2,505** | **878** | **1,149** | **1,141** | **1,193** | **(157)** | **346** |
| ඒකාබද්ධ අරමුදලට දැක්වූ දායකත්වය | (500) | (25) | - | (9) | (200) | - | - | - | - | - |
| **ආයතනය තුළ රඳවාගත් ලාභය** | **463** | **283** | **1,023** | **2,496** | **678** | **1,149** | **1,141** | **1,193** | **(157)** | **346** |
| **මූල්‍ය තත්ත්වය** | | | | | | | | | | |
| මුළු වත්කම් | 18,743 | 20,712 | 19,482 | 20,664 | 18,068 | 17,502 | 14,733 | 13,100 | 9,181 | 8,393 |
| ප්‍රාග්ධන සහ සංචිත | 11,054 | 10,615 | 10,400 | 9,357 | 6,897 | 5,896 | 4,690 | 3,572 | 2,373 | 2,544 |
| ජංගම නොවන බැරකම් | 2,404 | 2,599 | 2,724 | 4,180 | 4,236 | 4,529 | 1,551 | 2,486 | 1,320 | 1,217 |
| ජංගම බැරකම් | 5,285 | 7,498 | 6,358 | 7,126 | 6,935 | 7,075 | 8,492 | 7,041 | 5,487 | 4,632 |
| **මූල්‍ය ප්‍රවාහය** | | | | | | | | | | |
| මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් මුදල් ප්‍රවාහය | (1,087) | 761 | 1,555 | 4,693 | (744) | 1,467 | 579 | 2,272 | 444 | 231 |
| ආයෝජන ක්‍රියාකාරකම්වලින් මුදල් ප්‍රවාහය | 2,976 | (2,984) | 249 | (227) | 666 | (1,025) | (1,646) | 5 | (245) | (98) |
| මූල්‍ය ක්‍රියාකාරකම්වලින් මුදල් ප්‍රවාහය | (1,175) | (469) | (2,107) | (1,038) | (170) | (438) | (386) | (301) | (10) | (2) |
| **මුදල් සහ මුදල් හා සමාන දෑවල වැඩිවීම/(අඩුවීම)** | **714** | **(2,693)** | **(303)** | **3,428** | **(248)** | **04** | **(1,453)** | **1,976** | **189** | **130** |
| **වෙනත් තොරතුරු** | | | | | | | | | | |
| සේවකයන් සංඛ්‍යාව | 1,302 | 1361 | 1334 | 1450 | 1408 | 1432 | 1448 | 1432 | 1411 | 1477 |